# රාජ්‍යයේ පිවත්වීම

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


| | | |
|---|---|---|
| මෙම අත්පොත භාවිත කරන ආකාරය | | 3 |
| කණ්ඩායම් වැඩ සඳහා යෝජනා | | 4 |
| හැඳින්වීම | | 5 |
| පාඨමාලාවේ අරමුණු | | 7 |
| 1. | අදෘශ්‍යමාන රාජ්‍යයයන් | 8 |
| 2. | රජුන්ගේ රජු | 17 |
| 3. | රාජ්‍යය: අතීතය, වර්තමානය, අනාගතය | 35 |
| 4. | දේවරාජ්‍යයට ඇතුළුවීමට යතුරු | 54 |
| 5. | දේවරාජ්‍යයෙන් පිටමංකිරීම | 68 |
| 6. | රටා හා මුලධර්ම පිළිබඳ හැඳින්වීමක් | 80 |
| 7. | දේවරාජ්‍යයේ සංස්කෘතිය : දේවරාජ්‍යයේ මුලධර්මය - 1 කොටස | 90 |
| 8. | දේවරාජ්‍යයේ සංස්කෘතිය : දේවරාජ්‍ය මුලධර්ම - 2 කොටස | 101 |
| 9. | දේවරාජ්‍යයේ සංස්කෘතිය : දේවරාජ්‍යයේ මුලධර්ම - 3 කොටස | 114 |
| 10. | දේවරාජ්‍යය පිළිබඳ උපමා | 121 |
| 11. | දේවරාජ්‍යයේ තනාපතිවරු | 131 |
| ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු | | 143 |

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ'

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඩමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයනය කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඩමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඩමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය : නියෝජනය කිරීම**
**පාඨමාලාව : රාජ්‍යයේ ජීවත්වීම : රටා හා මුලධර්ම**

# හැඳින්වීම

සියලු මනුෂ්‍යයන් මේ ලෝකයේ ස්වභාවික රාජ්‍යයක ජීවත්වෙති. ඔවුන් නගරයක හෝ ගමක ජීවත්වෙන අතර ඒ නගරය හා ගම දේශයක කොටසක් වේ. දේශය ලෝකයේ  රාජ්‍යයක් වේ.

මෙම ස්වභාවික රාජ්‍යයට අමතරව මේ ලෝකයේ ආත්මික රාජ්‍යයන් දෙකක් පවතී. මේ ලෝකයේ ජීවත්වන සෑම කෙනෙක්ම මේ රාජ්‍යයන් දෙකෙන් එකක පුරවැසියන් වෙති. ඒ සාතන්ගේ රාජ්‍යය හා දෙවියන්වහන්සේගේ රාජ්‍යය වේ.

මෙම පාඨමාලාව දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිළිබඳවය. එය ආත්මික රාජ්‍යයන් දෙක ද ඒවායේ පාලකයින් හා වැසියන් ද හඳුන්වා දෙයි. එය දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ප්‍රවේශවීමේ ආත්මික යතුරු සපයන අතර දේවරාජ්‍යයෙන් පලවා හැරීමට තුඩුදෙන දේවල් පිළිබඳව අනතුරු හඟවයි. එමෙන්ම මෙම රාජ්‍යයේ අතීතය "වර්තමානය හා අනාගතය විමසා බලයි' දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිළිබඳ උපමා පැහැදිලි කර දෙයි" ජීවත්වීමේ රටා හා මුලධර්ම අවධාරණය කරයි.

දෙවියන්වහන්සේගේ රාජ්‍යය අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ මන්ද?

යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට මෙසේ පැවසු සේක.

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොවමුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

අවසානයේ තමන්වහන්සේගේ රාජ්‍යය පිහිටුවීමට යේසුස්වහන්සේ නැවත පැමිණීමට පෙර" රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලොව පුරා සියලු ජාතීන් වෙත පැතිරිය යුතුය.

රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කිරීමට පෙර" ඔබ දෙවියන්වහන්සේ රාජ්‍යය අවබෝධ කර ගත යුතුය. ඔබ මේ රාජ්‍යයේ යතුරු බාර ගැනීමට පෙර ඒ රාජ්‍යය පුද්ගලිකව අත්දැකිය යුතුය.

අතීතයේදී වැඩි අවධානයක් දෙන ලද්දේ මේ රාජ්‍යයේ රජතුමා වු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය හා සේවය පිළිබඳව වේ. එය නිවැරදිය. එහෙත් දේවරාජ්‍යයේ ශුභාරංචිය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් නොකෙරිනි. යේසුස්වහන්සේ උන්වහන්සේගේ කාලයේ සිට ආගමික නායකයන්ට මෙසේ පැවසු සේක.

> **ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවු නුඹලාට දුක්වේ ! මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට එන්ට නොදී සවර්ගරාජ්‍යය වසා, නුඹලා ඇතුල්වෙන්නේවත් ඇතුල්වෙමින් සිටින්නන්ට ඇතුල්වෙන්ට ඉඩදෙන්නේවත් නැත. (මතෙව් 23:13)**

ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන පරමාර්ථය වුයේ රාජ්‍යය පිළිබඳ මෙම ශුභාරංචිය වේ. යේසුස්වහන්සේ" උන්වහන්සේගේ මෙලොව මෙහෙය ආරම්භ කළේ මෙම රාජ්‍යයේ පැමිණීම ගැන ප්‍රකාශ කිරීමෙනි (මතෙව් 4:17). උන්වහන්සේ" උන්වහන්සේගේ මෙලොව මෙහෙය අවසන් කළේ මේ රාජ්‍යයට අදාළ දේ පිළිබඳව කතා කිරීමෙනි (ක්‍රියා 1:3). මෙලොව මෙහෙය ආරම්භය හා අවසානය අතරතුර වැඩිවශයෙන් අවධාරණය කළේ මෙම රාජ්‍යය ගැන වේ.

> **නුමුත් උන්වහන්සේ : මා විසින් අනික් නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනැය. මක්නිසාද ඒ පිණිස එවනලද්දෙමියි ඔවුන්ට කීසේක.  (ලුක් 4:43)**

යේසුස්වහන්සේ වඩාත් සැලකිලිමත් වුයේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිළිබඳවය. උන්වහන්සේගේ ඉගැන්වීම් හා උපමා යොමු වුයේ දේවරාජ්‍යය කෙරෙහිය. උන්වහන්සේගේ හාස්කම්" දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ක්‍රියාවන් ප්‍රදර්ශනය කිරිමකි.

"දෙවියන්වහන්සේගේ රාජ්‍යය" හා "ස්වර්ග රාජ්‍යය" යන වාක්‍ය ඛණ්ඩ" මතෙව්" මාර්ක්" ලුක් හා යොහන් යන ශුභාරංචිවල 100 වරකට වඩා සඳහන් වේ. අපට පවසා ඇත්තේ පළමුව ස්වර්ග රාජ්‍යය සෙවීමටත්" ඒ පිළිබඳව යාච්ඤා කිරිමට හා එය දේශනා කිරිමට වේ. මෙම රාජ්‍යයට ඇතුළු විය හැකි අන්දම අපට පවසා ඇති අතර එහි ජිවත් වන පුද්ගලයන්ට අලුත් ජීවන රටාවක් අවශ්‍ය බව උගන්වා ඇත.

මෙම රාජ්‍යයට ඇතුළු වීමටත්" එහි ජිවත්වීමටත්" ලෝකයාට ශුභාරංචිය දේශනා කිරිමේ නියෝගය ඉටු කිරිමටත් මේ රාජ්‍යයේ රටා හා මුලධර්ම අවබෝධ කරගත යුතුය. මේ පාඨමාලාවේ පරමාර්ථය එය වේ.

එහෙත් රාජ්‍ය මුලධර්ම අවබෝධ කරගැනිමට වඩා ශ්‍රේෂ්ඨ පරමාර්ථයක් තිබේ. ඔබ මෙම රාජ්‍යය සැබවින්ම අත්දැකිමට හා එය ඔබගේ ජිවිතයේ කේන්ද්‍රස්ථානය කර ගැනීමට දැනුමට වඩා ඔබ්බට යා යුතුය.

මනුෂ්‍යයා ජිවිතය සඳහා තේරුමක් සොයති. ඔවුන්ට ජිවත්වීමට හා මියයෑමට හේතුවක් අවශ්‍යය. ජිවිතයේ හා සේවයේ ප්‍රධාන පරමාර්ථය දෙවියන්වහන්සේගේ රාජ්‍යය කරගන්න. මෙම රාජ්‍යය සතුරාට සෙලවිය නොහැකි රාජ්‍යයකි. එය ඔබට පුර්ණ පක්ෂපාතකමක් දැක්විය හැකි සදාතනික හේතුවක් වේ.

# පාඨමාලාවේ අරමුණ

මෙම පාඨමාලාවේ අවසානයේදී ඔබට

- අදෘශ්‍යමාන ආත්මික රාජ්‍යයන් හඳුනා ගැනීමට.
- අදෘශ්‍යමාන රාජ්‍යවල පාලකයන් හඳුනා ගැනීමට.
- අදෘශ්‍යමාන රාජ්‍යවල වැසියන් හඳුනා ගැනීමට.
- දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට.
- දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ අතීතය" වර්තමානය හා අනාගතය සාරාංශගත කිරීමට.
- දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීම වළක්වාලන පාප ලැයිස්තුගත කිරීමට.
- ආත්මික රටා හා මූලධර්මවල වැදගත්කම හඳුනා ගැනීමට.
- දේවරාජ්‍යයේ මූලික මූලධර්ම අවබෝධකරගත් බව ප්‍රදර්ශනය කිරීමට.
- දේවරාජ්‍යය පිළිබඳ උපමා අවබෝධ කරගත් බව ප්‍රදර්ශනය කිරීමට.
- දේවරාජ්‍යයේ ශුභාරංචිය පැතිරවීමෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ තානාපතියෙක් වීමට.
- දේවරාජ්‍යය පිළිබඳ ස්වාධීනව අඛණ්ඩව අධ්‍යයනය කිරීමට.
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් හා මෙහෙය පිළිබඳව ස්වාධීන අධ්‍යයනයක් අඛණ්ඩව කරගෙන යාමට හැකි වනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

# අදෘශ්‍යමාන රාජ්‍යයයන්

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ස්වාභාවික හා ආත්මික ලෝක අවබෝධ කරගත් බව ප්‍රදර්ශනය කිරීමට
- "රාජ්‍යය" යන වචනය අර්ථ විග්‍රහ කිරීමට
- ආත්මික රාජ්‍යයන් දෙක හඳුනාගැනීමට
- ආත්මික රාජ්‍යයන්හි පාලකයන් හඳුනාගැනීම
- ආත්මික රාජ්‍යයන්හි වැසියන් හඳුනාගැනීම
- "සාතන්ගේ රාජ්‍යය" යන්න අර්ථවිග්‍රහ කිරීමට
- "දෙවියන්වහන්සේගේ රාජ්‍යය" යන්න අර්ථවිග්‍රහ කිරීමට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොවමුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් සලකා බැලෙන්නේ ස්වාභාවික හා ආත්මික රාජ්‍යයන් පිළිබඳව වේ. ස්වාභාවික ලෝකය යනු ඔබ දකින, සවන්දෙන, ස්පර්ශකරන, හෝ රසබලන ලෝකය වේ. එය ඔබ වටා ඇති දෘශ්‍යමාන ලෝකයයි.

එහෙත් ඔබද කොටස්කාරයෙකු වන තවත් ලෝකයක් ඔබ වටා ඇත. එය ආත්මික රාජ්‍යයන් දෙකකින් සමන්විත අදෘශ්‍යමාන ලෝකයක් වේ. මෙම පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගන්නේ මේ රාජ්‍යයන් ගැනත්, එහි පාලකයන් හා වැසියන් ගැනත් වේ. ඔබ සාතන්ගේ රාජ්‍යය හා දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඉගෙනගනු ඇත.

## ස්වාභාවික හා ආත්මික

මිනිසා ලෝක දෙකක ජිවත් වේ: ඒ ස්වාභාවික ලෝකය හා ආත්මික ලෝකයයි. ස්වාභාවික ලෝකය යනු දැකිය හැකි, දැනෙන, ස්පර්ශ කළ හැකි, සවන්දිය හැකි හා රසබැලිය හැකි එකකි. එය දෘශ්‍යමානය, ඇල්ලිය හැකිය. ඔබ ජිවත්වන රට, දේශය, නගරය හෝ ගම මේ ස්වාභාවික ලෝකයේ කොටසකි. ඔබ ලෝකයේ මහද්වීපවලින් එකක පිහිටි ස්වාභාවික රාජ්‍යයක වැසියෙකි. ඔබගේ පරිසරයේ කොටසක් වු සෙනග ඔබට දැකිය හැකිය. ඔබට ඔවුන් සමග සන්නිවේදනයේ යෙදිය හැකිය. ඔබට, ඔබ වටපිටාවේ ඇති දේ දැකිය හැකිය, ඇසිය හැකිය, සුවඳ බැලිය හැකිය.

එහෙත් ඔබ ජීවත්වන තවත් ලෝකයක් ඇත. එය ආත්මික ලෝකයකි. ඔබට ඔබගේ ශාරීරික ඇස්වලින් එය දැකිය නොහැකිය. එහෙත් එය ස්වාභාවික ලෝකය මෙන්ම තාත්විකය. පාවුලුතුමා මේ ස්වාභාවික හා ආත්මික බෙදීම් ගැන මෙසේ පවසයි.

> **ස්වර්ගික ශරීරද, භූමික ශරීරද ඇත්තාහ. නුමුත් ස්වර්ගිකයන්ගේ තේජස එකක්ය, භූමිකයන්ගේ තේජස අනිකක්ය.** (1 කොරින්ති 15:40)

සියලුම මනුෂ්‍යයන්ට ස්වාභාවික ලෝකයේ ජීවත්වන ස්වාභාවික ශරීරයක් ඇත. එහෙත් මනුෂ්‍යයා සදාතනික ප්‍රාණයක් හා ආත්මික සත්වයෙකුද වේ. මනුෂ්‍යයා ශරීරයක්ද, ප්‍රාණයක්ද, ආත්මයක්ද වේ. ඔබගේ ස්වාභාවික ශරීරය, ස්වාභාවික ලෝකයේ කොටසක් වන්නා සේම ඔබගේ ආත්මික පැවැත්මද (ප්‍රාණය හා ආත්මය) ආත්මික ලෝකයේ කොටසක් වේ.

## ආත්මික රාජ්‍යයන් දෙක

මේ ලෝකයේ ස්වාභාවික රාජ්‍යයන් ඇත. ස්වාභාවික රාජ්‍යයක් යනු රජකෙනෙකු පාලනය කරන ප්‍රදේශයක් හෝ සෙනගක් හෝ වේ. ලෝකයේ රාජ්‍යයන් ගැන බයිබලය කතා කරයි. ලෝකයේ රාජ්‍යයන් දැනට පවතින්නේ සාතන් යටතේය.

> **නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයද උන්වහන්සේට පෙන්වා: ඔබ බිම වැටී මට නමස්කාරකරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය.** (මතෙව් 4:8-9)

අනාගතයේ දී ලෝකයේ සියලුම රාජ්‍යයන්, දෙවියන්වහන්සේගේ රාජ්‍යයන් බවට පවත්වන අතර දෙවියන්වහන්සේ ඒවා පාලනය කරන සේක.

> **සත්වෙනි දේවදූතයාද පිම්බේය: එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වුයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම්කරනසේකැයි කියන මහත් ශබ්ද සවර්ගයෙහි විය.** (එළිදරව් 11:15)

ස්වාභාවික ලෝකයේ රාජ්‍යයක සර්වබලධාරී පාලකයා වන්නේ රජුය. මුළු දේශයත් එහි සෙනගත් ඔහුට අයත්ය. ඔහුගේ යටත්වැසියන්ගේ ජීවිතය හා මරණය ඔහු අත වේ.

ආත්මික ලෝකය, ආත්මික රාජ්‍යයන් දෙකකින් සමන්විතය. ඒ සාතන්ගේ රාජ්‍යය හා දෙවියන්වහන්සේගේ රාජ්‍යය වශයෙනි. සාතන්ගේ රාජ්‍යයට අයත්වන්නේ සාතන්ද, යක්ෂයන් ලෙස හැඳින්වෙන ආත්මික පුද්ගලයන්ද හා පාපයෙන් හා දේවවචනයට එරෙහිව ජීවත්වන සියලුම මනුෂ්‍යයන්ද වේ. දේවරාජ්‍යයට අයත්වන්නේ පියවූ දෙවියන්වහන්සේද, යේසුස් ක්‍රිස්තුස්වහන්සේද, ශුද්ධාත්මයාණන්වහන්සේද, දේවදූතයන් ලෙස හැඳින්වෙන ආත්මික පුද්ගලයන්ද දේවවචනයට කීකරුව, ධර්මිෂ්ඨ ජීවිතයක් ගතකරන සියලු දෙනාද වේ.

## දේවරාජ්‍යය

දේවරාජ්‍යයන් ඇත්තේ එකකි. එහෙත් එය ශුද්ධලියවිල්ලේ විවිධාකාරයෙන් විස්තර කර තිබේ. "ස්වර්ග රාජ්‍යය" යන්නෙන් හැඳින්වෙන්නේද දේවරාජ්‍යයම වේ.

මෙම රාජ්‍යය, පියාණන්ගේ (මතෙව් 26:29), යේසුස්වහන්සේගේ (එළිදරව් 1:9), ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ (2 තිමෝති 4:1), ක්‍රිස්තුස්වහන්සේගේ හා දෙවියන්වහන්සේගේ (එපීස 5:5), 'අපගේ ස්වාමින්වහන්සේගේද තමන් ක්‍රිස්තුස්වහන්සේගේද' (එළිදරව් 11:15), 'අපගේ දෙවියන්වහන්සේගේ ...... හා තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩු බලයේද" (එළිදරව් 12:10), සහ

''තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ'' (කොලොස්සි 1:13) රාජ්‍යයට සෑම අතින්ම සමානය. මේ සියල්ල දේවරාජ්‍යය හැඳින්වෙන නම් වේ. පහසුව සඳහා මෙම පාඨමාලාවේ භාවිතා කෙරෙන්නේ ''දේවරාජ්‍යය'' යන්නය.

දේවරාජ්‍යය නිකායක් නොවේ. නිකායන් යනු මිනිසා විසින් නිර්මාණය කරන ලද සභා කණ්ඩායම්වල සංවිධානය. ඒවා සංවිධානය කිරීමේ හා කළමනාකරණය කිරීමේ පහසුව සඳහා පිහිටුවන ඇත. නිකායන් බැප්ටිස්ට්, එසෙම්බ්ලිස් ඔෆ් ගෝඩ්, මෙතෝදිස්ත, ලූතරන් වැනි විශාල සභා සංවිධානය වේ.

බයිබලය කතා කරන්නේ නිකායක් හෝ ආගමික සංවිධානයක් හෝ නොවන සැබෑ සභාව ගැනය. දේවරාජ්‍යයේ වාසය කරන සියලු දෙනාගෙන් සැබෑ සභාව සමන්විත වේ. ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය පැතිරවීම සඳහා දෙවියන්වහන්සේ පිහිටුවා ඇති සාමූහික ආත්මික සංවිධානය සැබෑ සභාව වේ. මෙම සභාව සමන්විත වන්නේ දේවරාජ්‍යයේ වාසය කරන සියලුම ස්ත්‍රීන් හා පුරුෂයන්ගෙනි.

සභාවේ කාර්යය වන්නේ දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කිරීම හා ඉගැන්වීම පමණක්ම නොවේ, එය දේවරාජ්‍යයේ ජීවිතය පිළිබඳ ආකෘතියක්ද විය යුතුය. සභාව එම රාජ්‍යයේ රටා හා මූලධර්ම අනුව ක්‍රියා කළ යුතු අතර, එහි රජතුමා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව පැවතිය යුතුය.

දේවරාජ්‍යය අතීතයේ පැවති අතර, වර්තමානයේද පැවතෙන්නේය, අනාගතයේදීද පැවතෙනු ඇත. එහෙත් ඒ විවිධාකාරයෙන් වේ. වර්තමානයේ මේ ස්වාභාවික ලෝකයේ දේවරාජ්‍යය පවතින්නේ, යේසුස්වහන්සේ තම ජීවිතයේ රජතුමා කරගත් සෑම පුරුෂයෙකුම, ස්ත්‍රියකම, පිරිමි ළමයෙකුම හෝ ගැහැණු ළමයෙකුම තුළ වේ. අනාගතයේදී දේවරාජ්‍යය සැබවින්ම දෘශ්‍යමාන ලෙස එළිදරව් වනු ඇත. දේවරාජ්‍යයේ අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳව ඔබ මෙම පාඨමාලාවෙන් ඉදිරියේ දී ඉගෙන ගන්නවා ඇත.

දේවරාජ්‍යය මේ ලෝකයේ ස්වාභාවික රාජ්‍යයක් නොව ආත්මික රාජ්‍යයක් බැවින් එය ආත්මික මනසකින් අවබෝධ කරගත යුතුය.

> **නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැන ගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

## රාජ්‍යයන්හි පාලකයෝ

සාතන්ගේ රාජ්‍යය, සාතන් විසින් පාලනය කරනු ලැබේ. ඔබ මේ පරිච්ඡේදයේ ''තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා'' යන කොටසින් ඔහු හා ඔහුගේ රාජ්‍යය පිළිබඳව අධ්‍යයනය කරන්නෙහිය. සාතන්, ආරම්භයේදී දේවරාජ්‍යයේ කොටසක් ලෙස දෙවියන්වහන්සේ මැවූ ලස්සන දේවදූතයෙක් විය. එහෙත් ඔහු දෙවියන්වහන්සේගේ රාජ්‍යය අත්පත් කර ගැනීමට උත්සාහ කළේය. ඔහුගේ මේ කැරැල්ල පිළිබඳව ඔබට යෙසායා 14: 12-17 හි හා එසකියෙල් 28: 12-19 හි කියවිය හැකිය. මෙම කැරැල්ල සඳහා දේවදූතයන් කිහිප දෙනෙක් සාතන් සමග එක්වූ අතර ඔවුන් සියලු දෙනාම දේවරාජ්‍යයෙන් පහ කෙරිනි. ඔවුහු සාතන්ගේ රාජ්‍යය නමින් හැඳින්වෙන ඔවුන්ගේම රාජ්‍යය පිහිටුවා ගත්හ.

දේවරාජ්‍යය පාලනය කරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයෙනි. එය පියාණන්ද, පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද, ශුද්ධාත්මයාණන්වහන්සේද වේ. මෙම රාජ්‍යයේ පාලකයා පිළිබඳව ඔබ මෙම පාඨමාලාවේ දෙවැනි පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නවා ඇත.

## රාජ්‍යවල වාසයකරන්නෝ

මේ ආත්මික රාජ්‍යයන් දෙකෙහි පාලකයන්ට අමතරව තවත් අය වාසය කරති. සාතන්ගේ රාජ්‍යයේ යක්ෂයන් නමින් හැඳින්වෙන නපුරු ආත්ම වාසය කරති. මේ ආත්මවලට, සාතන්ගේ රාජ්‍යයට අයත් මනුෂ්‍යයන් තුළට ඇතුළු වන්නටද, වද දෙන්නටද, ඔවුන් පාවිච්චි කරන්නටද හැකිය. මනුෂ්‍යයන් විසින් කරනු ලබන බොහෝ නපුරු ක්‍රියා පොලඹවන්නේ මොවුන්ය.

ලෝකයේ අවසාන විනාශයට පෙර සාතන්, ඔහුගේ රාජ්‍යයේ සිටින අන්ත ක්‍රිස්තුස් හා ව්‍යාජ දිවැසිවරුන් ලෙස හැඳින්වෙන විශේෂ ආත්මයන් දෙකක් භාවිතා කරනු ඇත. ඔවුන් දේවරාජ්‍යය පෙරළා දැමීමේ, සාතන්ගේ රැවටිලිකාර අවසාන සැලැස්මේ කොටස්කරුවන් වේ. දේව රාජ්‍යයේද වාසය කරන්නන් ඇත. මිනිසුන්ට හා ගැහැණුන්ට සේවය කරන, ආත්මික අයවන මොවුහු දේවදූතයෝ වෙති. මේ ලෝකයේ සාතන්ට අවශ්‍ය දේ යක්ෂයන් කරන්නාසේම දෙවියන්වහන්සේට අවශ්‍යදේ දේවදූතයෝ කරති.

දේවදූතයන් හා යක්ෂයන් ආත්මයන් වුවද සමහර අවස්ථාවන්වල ස්වාභාවික ලෝකයේ ඔවුහු දෘශ්‍ය හා වාචික ආකාරයෙන් එළිදරව් වන්නෝය. මනුෂ්‍යයන්ට වැහෙන යක්ෂයන් ඔවුන් තුළින් නපුරු ලෙස කතා කරන හා ක්‍රියා කරන අතර දේවදූතයෝ ඇතැම් විට දෘශ්‍යාකාරයෙන් පෙනී සිටිති.

මේ ආත්මයන්ට අමතරව සියලුම දෙනා සාතන්ගේ රාජ්‍යයේ හෝ දේවරාජ්‍යයේ හෝ වැසියෝ වෙති.

## රාජ්‍යයන්ට ඇතුළුවීම

යේසුස්වහන්සේ විසින් පවසන ලද එක් උපමා කතාවකින් පෙන්නුම් කෙරෙන්නේ සියලුම මිනිසුන් සාතන්ගේ රාජ්‍යයේ හෝ දේවරාජ්‍යයේ හෝ වැසියන් බවය. යේසුස්වහන්සේ ලෝකය කෙතකට සමාන කළසේක. කෙතේ තිබූ හොඳ බීජ දේවරාජ්‍යයේ දරුවෝ විය. කිරිඳි (වල් පැලෑටි) ලෙස වැවුනු බීජ නපුරාගේ දරුවෝ විය.

> **කෙත නම් ලෝකයය. හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයෝය. කිරිඳි නම් නපුරාගේ පුත්‍රයෝය........(මතෙව් 13:38. 39)**

මිනිසුන් සාතන්ගේ රාජ්‍යයට ඇතුළු වන්නේ ස්වාභාවික උපතිනි. සියලුම මනුෂ්‍යයන් පාපයෙන් උපත ලබා ඇති බව බයිබලය උගන්වයි. මින් අදහස්වන්නේ ස්වාභාවයෙන්ම ඔවුන් තුළ පාපිෂ්ට ස්වභාවයක් එනම් පාපයේ ”බීජය” ඇති බවය. ඔවුන්ගේ ස්වාභාවික නැඹුරුව නපුරු කිරීමට වේ.

> **බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි, මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ් ගත්තාය. (ගීතාවලිය 51:5)**

> **එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක්මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය. (රෝම 5:12)**

**මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

අප මුලික පාපී ස්වභාවය ඇතිව ඉපදී ඇති බැවින්, අපි සියලු දෙනාම යම් අවස්ථාවක හෝ සාතන්ගේ රාජ්‍යයේ කොටස්කරුවන් වී සිටියෝය. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ, ශුද්ධවූ බයිබලයේ, මුළු පණිවිඩයම, සාතන්ගේ නපුරු රාජ්‍යයෙන් ඉවත්ව දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ රාජ්‍යයට ඇතුළුවන ලෙස මනුෂ්‍යයාට කරනු ලබන ඉල්ලීම වේ.

මනුෂ්‍යයන් සාතන්ගේ රාජ්‍යයට ඉපදෙන්නේ ස්වාභාවික ඉපදීම තුළිනි. ඔවුන් ආත්මික ඉපදීම තුළින් දේවරාජ්‍යයට නැවත ඉපදිය යුතුය. ඔබ මේ පිළිබඳව වැඩිදුරට හතරවන පරිච්ඡේදයෙන්, "දේවරාජ්‍යයට ඇතුළුවීමට යතුරු" මගින් ඉගෙනගන්නෙහිය.

නැවත ඉපදුනු අය ඔවුන්ගේ පදිංචිය, සාතන්ගේ රාජ්‍යයෙන් දේවරාජ්‍යයට වෙනස් කර ගනිති. ඔවුන්ගේ පක්ෂපාතකම සාතන් වෙතින් දෙවියන්වහන්සේ වෙතට මාරු වේ. ඔවුන් දේවරාජ්‍යයට ඇතුළු වූ විට, එම රාජ්‍යය පාලනය කෙරෙන මූලධර්ම ඉගෙන ගත යුතුය. එය ඔබ ගමන් කළාවූ අලුත් රටක ජීවන රටාව ඉගෙන ගන්නාක් මෙනි. මෙම වැදගත් මූලධර්ම පිළිබඳව, මෙම පාඨමාලාවේ අනෙකුත් පාඩම් මගින් ඔබ වැඩිදුරට ඉගෙනගනු ඇත.

## රාජ්‍යයන් අතර සබඳතා

සාතන්ගේ කැරැල්ලේ කාලයේ පටන්ම, සාතන්ගේ රාජ්‍යය හා දේවරාජ්‍යය අතර ආත්මික යුද්ධයක් දිගටම පැවතේ. මේ රාජ්‍යය දෙක අතර සටනේ ලිඛිත වාර්තාව බයිබලය වේ.

ලෝකය මුළුල්ලේම පවතින මේ ආත්මික සටන මනුෂ්‍ය වර්ගයාගේ මනස, ප්‍රාණය හා ආත්මය සමග පැවැත්වෙන්නකි. සාතන් උත්සහ කරන්නේ, මනුෂ්‍යයන් පාපයට ග්‍රහණය කරගනිමින් ඔහුගේ රාජ්‍යයෙහි තබාගැනීමටය. රැවටිලිකාර ක්‍රම මගින් පාපී ජීවිතයේ තාවකාලික ආශාවන්වල නියැලීමට ඔහු පුරුෂයන්ට හා ස්ත්‍රීන්ව පොලඹවයි. ඔහු දෙවියන්වහන්සේට නිත්‍යානුකූලව අයත් ආත්මයේ හා ප්‍රාණයේ ඇල්ම ඉලක්ක කර ගනිති.

**සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

අප දැන් දන්නා පරිදි, ආත්මික ලෝකය සටන යුගයේ අවසානය දක්වාම පවතින්නේය. ආත්මික සටන ගැඹුරින් අධ්‍යයනය කළ යුතු විෂයක් බැවින්, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ආත්මික උපක්‍රම : ආත්මික සටන සඳහා අත්පොත"* නමැති පාඨමාලාව මේ සඳහාම වෙන් කර ඇත. එම පාඨමාලාව අවධාරණය කර ඇත්තේ සාතන්ගේ රාජ්‍යය, ඔහුගේ උපක්‍රම, හා නපුරු බලවේග පරාජය කිරීමේ ආත්මික උපාය මාර්ග ගැන වේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. 1 කොරින්ති 15: 44- 49 හි සඳහන් කර ඇති බෙදීම් දෙක කවරේද?

3. අද ලෝකයේ පවතින අදෘශ්‍යමාන රාජ්‍යයන් දෙක මොනවාද?

4. අදෘශ්‍යමාන රාජ්‍යය දෙකේ පාලකයෝ කවරහුද?

5. සාතන්ගේ රාජ්‍යයේ වැසියෝ කවරහුද?

6. දේවරාජ්‍යයේ වැසියෝ කවරහුද?

7. "දේවරාජ්‍යය" හා "ස්වර්ග රාජ්‍යය" යන වාක්‍ය ඛණ්ඩ දෙකේ වෙනස කවරේද?

8. "රාජ්‍යය" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පාඨමාලාව දේවරාජ්‍යය අධ්‍යයනය කිරීම සඳහා සැපකර ඇත. එහෙත් ඔබ මෙම පරිච්ඡේදයෙන් උගත් පරිදි තවත් අදෘශ්‍යමාන රාජ්‍යයක් ඇත. ඒ සාතන්ගේ ආත්මික රාජ්‍යය වේ. ඔබ මෙම රාජ්‍යයන් දෙකම පිළිබඳව තේරුම් ගැනීම වැදගත් වේ.

මේ රාජ්‍යය පිළිබඳව හා සාතන් සමග කටයුතු කිරීමේ ආත්මික උපක්‍රම පිළිබඳව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ආත්මික උපක්‍රම : ආත්මික සටන සඳහා අත්පොත"* නැමැති පාඨමාලාවෙන් තවදුරටත් තොරතුරු සපයනු ඇත. *"රාජ්‍යයේ පිළිවෙත්වීම"* නැමැති මෙම පාඨමාලාවට සහාය වීමට ඉහත අත්පොත ලබාගන්න. මෙම පාඨමාලාව සඳහා පහත දැක්වෙන සංක්ෂිප්තය, සාතන් හා ඔහුගේ රාජ්‍යය පිළිබඳ මූලික තොරතුරු සපයයි.

## සාතන්ගේ රාජ්‍යය

1. සාතන්ගේ රාජ්‍යයේ පාලකයා : සාතන්.

A. ඔහුගේ මූලාරම්භය : සියලු සත්වයන් දෙවියන්වහන්සේ විසින් මැවූ සේක. යොහන් 1:3 ; කොලොස්සි 1: 16-17
B. පෙර තිබූ ඔහුගේ මහිමය: යෙසායා 14:12-15; එසකියෙල් 28:12-17
C. ඔහුට පෙර තිබූ තත්වය: එසකියෙල් 28:14
D. ඔහුගේ වැටීම : එසකියෙල් 28: 12-19
E. ඔහුගේ නම් :
1. ලෝකයේ දෙවියා : 2 කොරින්ති 4:4
2. ආලෝකයේ දූතයා : 2 කොරින්ති 11:14
3. යක්ෂයා : 1 පේත්‍රුස් 5:8; මතෙව් 4:1
4. සාතන්: යොහන් 13:27
5. දීප්තිමත් පහන් තාරකාව (ලුසිෆර්) : යෙසායා 14:12
6. රතු සර්පයා : එළිදරව් 12:3
7. මහා සර්පයා : එළිදරව් 12:9; 20:2;2 කොරින්ති 11:3;උත්පත්ති 3:4,14
8. විරුද්ධකාරයා 1 පේත්‍රුස් 5:8
9. බෙලියෙල් : 2 කොරින්ති 6:15
10. බෙල්සෙබුබ් : මතෙව් 12:24; ලූක් 11:15; මාර්ක් 3:22
11. මිනීමරුවා : යොහන් 8:44
12. පරීක්ෂකයා : මතෙව් 4:3; 1තෙසලෝනික 3:5
13. අභිෂේකලත් කෙරුබයෙක් : එසකියෙල් 28:14
14. පාතාලයේ දූතයා (විනාශකයා) :එළිදරව් 9:11
15. රවටන්නා :එළිදරව් 12:9; 20:3
16. අපොල්ලියොන් (විනාශකයාට ග්‍රීක වචනය) : එළිදරව් 9:11
17. අබද්දොන් (විනාශකාරී දූතයාට හෙබ්‍රෙව් නම): එළිදරව් 9:11
18. අන්ධකාරයේ මූලාදෑනියා : එපීස 6:12
19. පාතාලයේ දූතයා :එළිදරව් 9:11
20. සතුරා : මතෙව් 13:39
21. යක්ෂාධිපති : මතෙව් 12:24
22. බොරුකාරයෙකි, බොරුවේ පියාය : යොහන් 8:44
23. තිර්හි රජු : එසකියෙල් 28: 12-15
24. ලෝකයේ අධිපතියා : යොහන් 12:31; 14:30; 16:11
25. ආකාශයේ බලයේ අධිපති : එපීස 2:2

26. අකීකරුමේ පුත්‍රයන් තුළ ක්‍රියාකරන්නා වූ ආත්මය : එපීස 2:2
27. නපුරු තැනැත්තා : 1 යොහන් 5:9
28. ගොරවන සිංහයා : 1 පේත්‍රුස් 5:8
29. සහෝදරයන්ට වරද තබන්නා :එළිදරව් 12:10

F. ඔහුගේ ගතිලක්ෂණ

1. ඥානවන්ත හා ප්‍රයෝගකාරී : 2කොරින්ති 11:3
2. හැඟීම් සහිතය : එළිදරව් 12:17
3. ස්වයං - අධිෂ්ඨානශීලිය : 2 තිමෝති 2:26
4. අහංකාරය : 1 තිමෝති 3:6
5. බලවත්ය : එපීස 2:2
6. රැවටිලිකාරය : එපීස 6:11
7. කෲර හා භයංකරය : 1 පේත්‍රුස් 5:8
8. කපටිය : 2 කොරින්ති 11:14

G. සාතන් සඳහා යොදා ඇති වචන

1. උත්පත්ති 3:1,4 ,5
2. යෝබ් 1:7-12
3. යෝබ් 2:1-6
4. මතෙව් 4:1-11
5. ලූක් 4:1-13

II සාතන්ගේ රාජ්‍යයේ පදිංචිව සිටින්නෝ : යක්ෂාත්ම

A. යක්ෂයන් සමූහයකගේ පාලකයා සාතන් වේ. මතෙව් 12:22-28
B. මුලාරම්භය :එළිදරව් 12:7-9 ; යුද් 6
C. ඔවුන්ගේ ගති ලක්ෂණ
   1. ආත්මයන් වේ. මතෙව් 8:16; ලූක් 10:17,20
   2. කතා කරයි. මාර්ක් 5: 9,12; ලූක් 8:28; මතෙව් 8:31
   3. විශ්වාස කරයි. යාකොබ් 2:19
   4. ඔවුන්ගේ කැමැත්ත පරිදි ක්‍රියා කරයි. ලූක් 8:32 ;11:24
   5. ඥානවන්ත බව ප්‍රදර්ශනය කරයි. මාර්ක් 1:24
   6. හැඟීම් සහිතය. ලූක් 8:28; යාකොබ් 2:19
   7. හඳුනාගනී : ක්‍රියා 19:15
   8. අධිස්වභාවික ශක්තියක් ඇත : ක්‍රියා 19:16; මාර්ක් 5:2,3
   9. අධිස්වභාවික අභිමුඛයක් ඇත : දනියෙල් 9:21-23; 10: 10-14

D. ඔවුන්ගේ ව්‍යුහය
   1. එක්සත්ය : මතෙව් 12:26 ,45; ලූක් 8:30; 1තිමෝති 4:1
   2. බලවේගයන් ලෙස සංවිධානය වේ : ලූක්8:30
   3. නපුරුකමේ තරාතිරම් ඇත. මතෙව් 12:43-45
   4. සංවිධානාත්මක ව්‍යුහයක් ඇත. එපීස 1:21; 3:10; 6:12; රෝම 8:38
   5. විවිධාකාර යක්ෂයෝ සිටිති. මතෙව් 10:1; 1තිමෝති 4:1

III. සාතන්ගේ රාජ්‍යයේ වැසියෝ : දේවරාජ්‍යයේ වැසියන් නොවන සියලු දෙනාම වේ. එළිදරව් 20:15; 21:8

IV. සාතන්ගේ හා යක්ෂයන්ගේ ක්‍රියාකාරි බල ප්‍රදේශ.

A. දෙවියන්වහන්සේ වැඩසිටින තැනට ප්‍රවේශවිය හැකිය. යෝබ් 1: 6-7
B. මුළු පෘථිවියටම ප්‍රවේශවීමට හැකිය. එළිදරව් 12:10

V. සාතන්ගේ හා යක්ෂයාගේ ක්‍රියාකාරකම්.

සාතන්ගේ හා යක්ෂයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මකම, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ආත්මික උපක්‍රම : ආත්මික සටන සඳහා අත්පොත"* පාඨමාලාවේ සඳහන් කර ඇත. ඔවුන්ගේ ක්‍රියාවන් සැමවිටම දෙවියන්වහන්සේටත් උන්වහන්සේගේ පරමාර්ථවලටත්, හා උන්වහන්සේගේ සෙනගටත් එරෙහි වේ.

VI. සාතන්ට හා ඔහුගේ යක්ෂයන්ට වඩා වැඩි බලයක් ඇදහිලිවතුන්ට තිබේ.

A. මතෙව් 10:1, මාර්ක් 6:7, 9:38, 16:17 ලූක් 10:17, ක්‍රියා 5:16, 8:7, 16:16-18, 19:12
B. ආත්මික සටනේ ක්‍රම විස්තරාත්මකව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ආත්මික උපක්‍රම : ආත්මික සටන සඳහා අත්පොත"* පාඨමාලාවේ සඳහන් වේ. මේවා සාතන්ගේ රාජ්‍යය පරාජය කිරීමට ඔබට ඇති අධිකාරී බලය භාවිතා කිරීම සඳහා උපකාරී කෙරෙන බලවත් ආත්මික මාර්ගෝපදේශ වේ.

VII. සාතන්ගේ රාජ්‍යයේ අනාගතයේ ඉරණම : මතෙව්: 8:29, 25:41, 2 පේත්‍රුස් 2:4, යූද් 6, එළිදරව් 12:7-9, 20:10, 1 යොහන් 3:8, ලූක් 8:28, මතෙව් 25:41

# දෙවන පරිච්ඡේදය

# රජුන්ගේ රජු

### අරමුණ

මෙම පරිච්ජේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට.
- 'රජු' යන පදය අර්ථ දැක්වීමට.
- දේවරාජ්‍යයේ රජු යේසුස්වහන්සේ ලෙස හඳුන්වාදීමට.
- යේසුස් රජතුමාගේ ජිවිතය හා සේවය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලෙටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යයෙහි කෙළවර නොවන්නේයයි කියේය. (ලූක් 1:33)**

## හැඳින්වීම

රජතුමෙක් නොමැතිව රාජ්‍යයක් නැත. ඔබ මෙම පරිච්ජේදයෙන් ඉගෙනගනු ලබන්නේ මෙලොව පාලනය කළ ශ්‍රේෂ්ඨතම රජතුමා, රජුන්ගේ රජතුමා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන වේ.

## රජු යනු කවරෙක්ද?

රජතුමා යනු ජාතියක, ගෝත්‍රයක හෝ රටක සර්වබලධාරි පාලකයා වේ. "සර්ව බලධාරී" යන වචනයේ තේරුම ඔහුට ශ්‍රේෂ්ඨතම බලයක්, හා මහත් ආධිපත්‍යයක් ඇති අතර බාහිර පාලනයන්ගෙන් නිදහස් බව වේ.

අතිතයේ දී ස්වාභාවික ලෝකයේ බොහෝ රජවරුන් හා රාජ්‍යයන් පැවතිණි. භූමික රාජ්‍යයක මුළු දේශයම රජතුමාට අයත් වූ අතර සෙනග ඇතුළුව රාජ්‍යයේ තිබූ සෑම දෙයකම ආධිපත්‍යය රජතුමා සතු විය.

රාජ්‍යයේ නිති රජතුමා පැනවූ අතර වැසියෝ මේ නිතිවලට අවනත වූහ. ජිවිතය හා මරණය ඇතුළුව සෙනග කෙරෙහි බලයද රජතුමා සතු විය.

## රජුන්ගේ රජ

සියලුම රජවරුන් අතුරින් ශ්‍රේෂ්ඨතම වන්නේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. පාවුලුතුමා යේසුස්වහන්සේ හඳුන්වන්නේ රජවරුන්ගේ රජ ලෙසය.

> **ශුභාන්විත එකම අධිපතියාණන්වහන්සේ වන රජවරුන්ගේ රජව, ස්වාමිවරුන්ගේ ස්වාමිව සිටින එකම අමරණියවූ, (1 තිමෝති 6:15)**

එළිදරව් පොතද උන්වහන්සේ රජවරුන්ගේ රජ ලෙස හඳුන්වයි.

**මක්නිසාද උන්වහන්සේ ස්වාමිවරුන්ගේ ස්වාමින්වහන්සේය, රජවරුන්ගේ රජ්ජුරුවෝය, ... (එළිදරව් 17:14)**

**උන්වහන්සේගේ වස්ත්‍රයෙහිද කළවයෙහිද රජවරුන්ගේ රජය, ස්වාමිවරුන්ගේ ස්වාමින්වහන්සේය යන නාමය ලියා තිබේ. (එළිදරව් 19:16)**

යේසුස්වහන්සේ රජවරුන්ගේ රජවන්නේ උන්වහන්සේ සදාතනික හා සර්වබලධාරී රාජ්‍යයක් පාලනය කරන බැවිනි. දේවරාජ්‍යය කිසිදිනක අවසන් වන්නේ නැත. එය විප්ලවයක් මගින් පෙරලීමට නොහැක. රජවරුන්ගේ රජතුමා බවට පත් කෙරෙන තවත් පාලකයෙකු බිහිවන්නේ නැත.

## රජතුමාගේ පූර්ව පැවතිම

රජවරුන්ගේ රජ පිළිබඳ කතාව බයිබලය පවසයි. උන්වහන්සේගේ ජිවිතය හා භූමික සේවය පිළිබඳ විස්තරය එම කතාවෙන් කොටසකි. එහෙත් යේසුස්වහන්සේ, උන්වහන්සේගේ භූමික සේවයට පෙර සිටි සේක. දෙවියන්වහන්සේ සමග උන්වහන්සේගේ පූර්ව පැවතිම පිළිබඳව ඔබට යොහන් 1:1-18 හි කියවිය හැකිය (මෙම කොටසේ යේසුස්වහන්සේ හඳුන්වන්නේ "වාක්‍යාණෝ" වශයෙනි).

## රජතුමා පිළිබඳ දිවැස්වැකි

රජවරුන්ගේ රජ පිළිබඳ බොහෝ දිවැසිවැකි පරණ ගිවිසුමෙහි අඩංගුය. දිවැස්වැකියක් යනු ස්වාභාවික ප්‍රඥාවෙන් දැන ගත නොහැකි, ඉදිරියේදී සිදුවීමට ඇති දෙයක් දෙවියන්වහන්සේ වචනයෙන් එළිදරව් විමකි.

පැරණි ගිවිසුමේ දිවැස්වැකි මගින් රජතුමා ඉපදෙන ආකාරය, තැන හා කවදාද යන්න ගැනද උන්වහන්සේගේ ජිවිතය, සේවය, මරණය හා නැවත නැගිටීම ගැනද එළිදරව් කෙරුනි. අලුත් ගිවිසුමෙන් පෙන්නුම් කෙරෙන්නේ මේ දිවැස්වැකි යේසුස්වහන්සේ සාක්ෂාත් කළ ආකාරය වේ.

(මේ දිවැස්වැකි පිළිබඳ විස්තරාත්මක ලයිස්තුවක් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රමවේද"* නැමැති තවත් පාඨමාලාවක් සපයා ඇත.)

## රජතුමාගේ පෙළපත

රජවරුන්ගේ රජු, එනම් යේසුස්වහන්සේගේ පෙළපත ඔබට මතෙව් 1: 1-7 හි හා ලූක් 3: 23-28 හි කියවිය හැකිය. මේ පෙළපත මගින් යේසුස්වහන්සේගේ භූමික පියා හා මව හරහා මුතුන් මිත්තන් දක්වා ඇත. එහෙත් යේසුස්වහන්සේ ශුද්ධවූ කන්‍යමරියතුමිය මගින් ඉපදුනු දේවපුත්‍රයා බව මතක තබා ගන්න.

## රජතුමාගේ උපත

යේසුස් නම් රජතුමාගේ උපත ඔබට මතෙව් 1 හා 2 න් ද ලූක් 1 හා 2 න් ද කියවිය හැකිය.

| | |
|---|---|
| ආදම් (දෙවැනි) | 1 කොරින්ති 15:45-47 |
| මැදහත්කාරයෙක් | 1 යොහන් 2:1 |
| සර්වපරාක්‍රම වූ | එළිදරව් 1:8 |
| අල්පා සහ ඕමෙගා | එළිදරව් 21:6 |
| ආමෙන් | එළිදරව් 3:14 |
| පුරාතන කෙනෙක් | දානියෙල් 7:9 |
| උන්වහන්සේගේ අභිමුඛය වන දූත තෙමේ | යෙසායා 63:9 |

| | |
|---|---|
| පංගුකාරයන්ට වඩා ආලේප කළ සේක | ගීතාවලිය 45:7 |
| අභිෂේක ලත් | ගීතාවලිය 2:2 |
| අපේ ඇදහිල්ලේ ප්‍රේරිතයාණන් | හෙබ්‍රෙව් 3:1 |
| ස්වාමීන්වහන්සේගේ හස්තය | යෙසායා 51:9-10 |
| ඇදහිල්ලේ කතෘවරයාද සම්පූර්ණ කරන්නාද වූ | හෙබ්‍රෙව් 12:2 |
| සදාකාල ගැළවීමේ කර්තෘ | හෙබ්‍රෙව් 5:9 |
| දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින | 1 යොහන් 5:18 |
| ප්‍රේමවන්තයාණන්වහන්සේ | එපීස 1:6 |
| ආත්මවල එඬේරා, රැකවලා | 1 පේදුරු 2:25 |
| ශුභාන්විත එකම අධිපතියාණන්වහන්සේ | 1 තිමෝති 6:15 |
| පැළෑටිය | සෙකරියා 3:8 |
| (ධර්මිෂ්ඨකමේ) පැළෑටිය | යෙරෙමියා 33:15 |
| යෙස්සේගේ කඳින් අංකුරයක් | යෙසායා 11:1 |
| ජීවනදායක කෑම | යොහන් 6:48 |
| දීප්තිමත් පහන් තාරකාව | එළිදරව් 22:16 |
| ස්වාමීන්වහන්සේගේ සේනාපතියා | යෝෂුවා 5:15 |
| වඩුවාගේ පුත්‍රයා | මතෙව් 13:55 |
| කොනේ ප්‍රධානගල | 1 පේත්‍රුස් 2:6 |
| දසදහසක් අතරේ උතුම්ය. | සාලමොන්ගේ 5:10 |
| ක්‍රිස්තුස් | යොහන් 1:41 |
| ස්වාමිවූ ක්‍රිස්තුස් | ලූක් 2:11 |
| අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ | රෝම 8:39 |
| ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ බලය | 1 කොරින්ති 1:24 |
| මන්ත්‍රිවරයාය | යෙසායා 9:6 |
| සෙනගගේ ගිවිසුමක් | යෙසායා 42:6 |
| අරුණාලෝකය | ලූක් 1:79 |
| අලුයම පැමිණි පහන් - පහන් තාරකාව | 2 පේත්‍රුස් 1:19 |
| ගැළවුම්කාරයාණෝ | රෝම 11:26 |
| දොරකඩ | යොහන් 10:9 |
| තෝරාගත් තැනැත්තා | යෙසායා 42:1 |
| එම්මානුවෙල් | මතෙව් 1:23 |
| සදාකාලවූ ජීවනය | 1 යොහන් 5:20 |
| සදාකාල පියාණෝය | යෙසායා 9:6 |
| විශ්වාසය සැබෑයයි කියනු ලැබූ තැනැන්වහන්සේ | එළිදරව් 19:11 |
| විශ්වාස සාක්ෂිකාරයාවූ | එළිදරව් 1:5 |
| කුළුඳුල් පුත්‍රයා | හෙබ්‍රෙව් 1:6 |
| මාගේ කුළුඳුලා | ගීතාවලිය 89:27 |
| බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා | රෝම 8:29 |
| නාඹුල් ඵලයය | 1 කොරින්ති 15:23 |
| පළවෙනියා සහ අන්තිමයාය | එළිදරව් 22:13 |
| සියොන්හි අත්තිවාරම | යෙසායා 28:16 |
| මහිමයෙන් යුක්ත වූ ස්වාමීන්වහන්සේ | යෙසායා 33:21 |
| ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස | යෙසායා 45:15 |
| දෙවියන්වහන්සේ අප සමගය | මතෙව් 1:23 |
| මහොත්තම දෙවියන්වහන්සේ | තීතස් 2:13 |
| මහා උත්තම පූජකයෙක් | හෙබ්‍රෙව් 4:14 |
| සභාව නමැති ශරීරයට හිස | කොලොස්සි 1:18 |
| සියල්ලන් තුළ සියල්ල | එපීස 1:22 |
| කොනේ ප්‍රධාන ගල | ගීතාවලිය 118:22 |
| සියල්ලේ උරුමක්කාරයා | හෙබ්‍රෙව් 1:2 |
| ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේ | යෙසායා 41:14 |
| තේජසේ බලාපොරොත්තුව | කොලොස්සි 1:27 |
| මම සිටිමි | යොහන් 8:58 |
| අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපය | කොලොස්සි 1:15 |
| එම්මානුවෙල් | යෙසායා 7:14 |
| ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ | රෝම 1:4 |

| | |
|---|---|
| ඉශ්‍රායෙල් විනිශ්චයකාරයාණන් | මීකා 5:1 |
| තේජසේ රජ්ජුරුවෝ | ගීතාවලිය 24:7 |
| රජතුමා | සෙකරියා 9:9 |
| මුළු පොළොව කෙරෙහි රජ | සෙකරියා 14:9 |
| දෙවියන්වහන්සේගේ බැටළුපැටවාණෝ | යොහන් 1:29 |
| ලෝකයේ ආලෝකය | යොහන් 8:12 |
| මිටියාවත්වල මානෙල් මල | සාලමොන්ගේ ගී 2:1 |
| ජීවනදායක කෑම | යොහන් 6:51 |
| සර්වපරාක්‍රම ස්වාමිවූ දෙවියන්වහන්සේ | එළිදරව්ව 4:8 |
| සියල්ලන්ගේ ස්වාමීන්වහන්සේ | ක්‍රියා 10:36 |
| අපේ ධර්මිෂ්ඨකම වූ ස්වාමීන්වහන්සේ | යෙරමියා 23:6 |
| ස්වාමීන්වහන්සේ (ඔබේ මිදුම්කාරයාණෝ) | යෙසායා 43:14 |
| ප්‍රේමය | 1 යොහන් 4:8 |
| දුක දන්නා මනුෂ්‍යයා | යෙසායා 53:3 |
| නායකයාණෝ | මතෙව් 23:10 |
| මෙසියස්වහන්සේ | |
| ආලේපලත් තැනැත්තා | දානියෙල් 9:25 |
| පරාක්‍රමවත් දෙවියන්වහන්සේ | යෙසායා 9:6 |
| යාකොබ්ගේ බලවන්තයාණන්වහන්සේ | යෙසායා 60:16 |
| අති ශුද්ධ | දානියෙල් 9:24 |
| බලවන්තයාණන් | ගීතාවලිය 45:3 |
| නාසරියයා | මතෙව් 2:23 |
| එකම දෙවියන්වහන්සේ | 1 තිමෝති 1:17 |
| අපගේ පාස්කුව | 1 කොරින්ති 5:7 |
| වෙදාණන් | ලූක් 4:23 |
| සමාදානයේ කුමාරයා | යෙසායා 9:6 |
| පොළොවේ රජවරුන්ගේ අධිපතියා | එළිදරව්ව 1:5 |
| අනාගතවක්තෘ | ද්විතීය කථාව 18:15-18 |
| පව් ගණන් නොගෙන හැරීම | රෝම 3:25 |
| රබ්බි | යොහන් 1:49 |
| මිදුම්කරුවාණෝ | යෙසායා 59:20 |
| නැවත නැගිටීම | යොහන් 11:25 |
| ධර්මිෂ්ඨ සේවකයාණෝ | යෙසායා 53:11 |
| පර්වතය | 1 කොරින්ති 10:4 |
| යෙස්සේගේ අංකුරය | යෙසායා 11:10 |
| ෂාරෝන් හි පුෂ්පය | සාලමොන්ගේ ගී 2:1 |
| ලෝකයේ ගැළවුම්කරුවාණෝ | 1 යොහන් 4:14 |
| දාවිත්ගේ වංශයෙන් | යොහන් 7:42 |
| ස්ත්‍රියගේ වංශය | උත්පත්ති 3:15 |
| එඬේරා (යහපත්) | යොහන් 10:11 |
| දේව පුත්‍රයාණන් | රෝම 1:4-5 |
| මනුෂ්‍ය පුත්‍රයා | ක්‍රියා 7:56 |
| මරියාගේ පුත්‍රයා | මාක් 6:3 |
| මහෝත්මයාණන්ගේ පුත්‍රයාණෝය | ලූක් 1:32 |
| යාකොබ්ගේ තාරකාවක් | ගණන් කථාව 24:17 |
| ගල | මතෙව් 21:42 |
| ධර්මිෂ්ඨකමේ සූර්යයා | මලාකි 4:2 |
| සව් අත්තිවාරමක්වූ | යෙසායා 28:16 |
| ගුරුවරයෙක් | යොහන් 3:2 |
| සත්‍යය | යොහන් 14:6 |
| කියා නිමකළ නොහැකි දීමනාව | 2 කොරින්ති 9:15 |
| මිදිවැල | යොහන් 15 1 |
| මාර්ගය | යොහන් 14:6 |
| අපූර්වය | යෙසායා. 9:6 |
| වාක්‍යයාණෝ | යොහන් 1:14 |
| දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝ | එළිදරව් 19:13 |

## රජතුමාගේ ජීවිතය

යේසුස් රජතුමාගේ ජීවිත කතාව මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත්වල සඳහන් වේ. මේ පොත් ලියා ඇත්තේ යේසුස්වහන්සේ සමග, උන්වහන්සේගේ භූමික සේවයේ සේවය කළ ගෝලයන් හතර දෙනෙකු විසිනි.

## රජතුමාගේ සේවාව

යේසුස්වහන්සේගේ සේවය හා ඉගැන්වීම් මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත්වල වාර්තා කර ඇත. හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ තවත් පාඨමාලාවක් වන *"ඉගැන්වීමේ ක්‍රමවේද"* හි ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව සම්පූර්ණ ලැයිස්තුවක් පලවේ.

යේසුස්වහන්සේගේ ජීවිතය හා සේවය පිළිබඳව බොහෝ දේ ශුභාරංචි හතරේ වාර්තා කර තිබුණද, යොහන් මෙසේ පවසයි.

> **යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ දේවල්ද ඇත්තේය, ඒවා එකින් එක ලියන ලද්දේ නම්, ලියනු ලබන පොත් දරන්ට ලෝකයත් මදියයි සිතමි. (යොහන් 21:25)**

## ප්‍රතික්ෂේප කළ රජතුමා

ස්වාභාවික පරම්පරාව අනුව යේසුස්වහන්සේ යුදෙව්වෙකු ලෙස උපත ලැබීය. උන්වහන්සේ පළමුව රජකෙනෙකු ලෙස පැමිණියේ තමන්වහන්සේගේ සෙනග වෙතය. එහෙත් ඔවුහු උන්වහන්සේව ප්‍රතික්ෂේප කළෝය. ඔවුන් බලාපොරොත්තුවෙන් සිටි රජතුමා උන්වහන්සේදැයි, උන්වහන්සේගෙන් ඇසුවෝය (මතෙව් 27:11, මාර්ක් 15:2). උන්වහන්සේ දෙවියන්වහන්සේගෙන් නොව සාතන්ගෙන් බවට චෝදනා කළහ (මතෙව් 12:25-28, ලූක් 11: 17-20). එක් අවස්ථාවක, උන්වහන්සේ ඔවුන්ට අවශ්‍ය පරිදි දෘශ්‍යමාන රාජ්‍යයක් නොපිහිටන බැවින් බලහත්කාරයෙන් උන්වහන්සේ රජකමට පත්කිරීමට සෙනග උත්සාහ කළහ (යොහන් 6:15).

යේසුස්වහන්සේ රජකෙනෙකු බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ එක්වරක් පමණි. ඒ උන්වහන්සේ අවසාන වරට යෙරුසලමට පැමිණි අවස්ථාවෙහිය (මතෙව් 21:1-9). එහෙත් එදින උන්වහන්සේට රජකෙනෙකු ලෙස ගෞරව කළ අයම උන්වහන්සේට එරෙහි වූහ. යේසුස්වහන්සේ යෙරුසලමට පැමිනි විට "හෝසන්නා" යයි කෑගැසූ අය ටික දිනකට පසු උන්වහන්සේ "කුරුසපත් කරන්න" යයි මොර දුන්හ. රෝම රාජ්‍යය පෙරලා ශ්‍රේෂ්ඨ භූමික රාජ්‍යයක් නොපිහිටවීම ගැන ඔවුහු යේසුස් වහන්සේ සමග කළකිරී සිටියහ. විදේශිය ආධිපත්‍යයෙන් මිදීමට පුල පුලා සිටි අය, යේසුස් වහන්සේ දෘශ්‍යමාන භූමික රාජ්‍යයන් නොපිහිටවූ බැවින් උන්වහන්සේ සමග කෝපයෙන් පසුවූහ.

යේසුස්වහන්සේ යුදෙව්වරුන්ට අවශ්‍ය වූ ආකාරයේ රජකෙනෙක් නොවූ සේක. උන්වහන්සේ රෝම අධිරාජ්‍යය සුණු විසුණු කළේ නැත. උන්වහන්සේ ඔවුන් බලාපොරොත්තු වූ භූමික රාජ්‍යය පිහිටුවේ නැත. යුදෙව්වරුන්ගේ කල්පනාව අනුව උන්වහන්සේ රජතුමෙකු ක්‍රියා කළ යුතු ආකාරයට ක්‍රියා කළේ නැත. ඔවුන්ට තේරුම් ගැනීමට නොහැකි වූයේ යේසුස්වහන්සේ තම ස්වාමිත්වය බාහිර වශයෙන් ඔවුන්ට තහවුරු කිරීමට පෙර, මනුෂ්‍ය හදවතේ අභ්‍යන්තර බලකොටුව උන්වහන්සේ පාලනය කළ යුතු බවය.

යුදෙව් සෙනගගේ ප්‍රබලතම අවශ්‍යතාවය වූයේ රෝමයෙන් නිදහස ලැබීම නොව, පාපයේ දම්වැල්වලින් මිදීම ලැබීම වේ. යේසුස්වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමේ යතුර විප්ලවය නොව පසුතැවිලිවීමය (ඔබ මේ පිළිබඳව තවදුරටත් ඉදිරි පරිච්ජේදයකින් ඉගෙන ගන්නෙහිය).

දෘශ්‍යමාන භූමික රාජ්‍යයක් පිහිටුවීම සඳහා සාතන් යේසුස්වහන්සේව පරීක්ෂා කළේය (මතෙව් 4:8, ලූක් 4:5). යේසුස්වහන්සේගේ භූමික මෙහෙය අවසාන වන තෙක්ම ගෝලයෝ භූමික රාජ්‍යයක් ගැන

ආශාවෙන් සිටියහ (ක්‍රියා 1:6). එහෙත් දේව රාජ්‍යය දෘශ්‍යමාන ආකාරයෙන් පිහිටුවනු ලබන්නේ මේ අවස්ථාවේ නොවේ.

**යේසුස්වහන්සේ උත්තරදෙමින් මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ. මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව වී නම්, යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන පිණිස මාගේ සේවකයන් සටන් කරනවා ඇත. නුමුත් දැන් මාගේ රාජ්‍යය මෙලොවින් නොවේයයි කීසේක. (යොහන් 18:36)**

රජවරුන්ගේ රජ තමන්වහන්සේගේම සෙනග විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය.

**උන්වහන්සේ ස්වකීය ස්ථානවලට ආසේක, ස්වකීයයෝ උන්වහන්සේ පිළිනොගත්තෝය. (යොහන් 1:11)**

යේසුස්වහන්සේ රජකෙනෙකු ලෙස පිළිගත්තේ ස්වල්ප දෙනෙකු පමණි මොවුන්ගෙන් එක් අයෙකු වුයේ, උන්වහන්සේගේ ගෝලයකු වු නාතානියෙල්ය.

**නතානියෙල් උන්වහන්සේට උත්තරදෙමින්: රබ්බි, ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය, ඔබ ඉශ්‍රායෙල්වරුන්ගේ රජ්ජුරුවෝයයි කිවේය. (යොහන් 1:49)**

එසේ වුවත් යේසුස්වහන්සේ රජ කෙනෙකු ලෙස පිළිගත් ස්වල්ප දෙනා සමග විශේෂ සබඳතාවක් පැවැතිනි.

**නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක. (යොහන් 1:12)**

ජිවිතේ සියලු දෙය සබඳතා මත පදනම් වේ. වඩාත් වැදගත් වන්නේ ඔබ දන්නා දෙය නොව ඔබ දන්නා අය වේ. දේව රාජ්‍යයට ඇතුළු වීම සඳහා සහතිකයක් වන්නේ අප බයිබලය ගැන හෝ කිතු දහම ගැන හෝ දන්නා දෙය නොවේ. එහෙත් අප දන්නේ කවුරුන්ද යන්නය. ඔබ රජවරුන්ගේ රජ දැන ගත යුතුය. *"රාජ්‍යයට යතුර"* නම් වු සතර වැනි පරිච්ඡේදයෙන්, ඔබ දේවරාජ්‍යයට ඇතුළුවන ආකාරය හා එහි ස්ථිරත්වයේ වෙසෙන ආකාරය ඉගෙන ගන්නේය.

## රජතුමාගේ මරණය

පාපි මනුෂ්‍යයාට දේවරාජ්‍යයට ඇතුළුවිය නොහැකි වේ. දේවරාජ්‍යය අනෙකුත් සියලුම රාජ්‍යයන්ට වඩා වෙනස්ය. එය ධර්මිෂ්ඨ රාජ්‍යයකි. යේසුස් රජතුමාගේ මරණය තුලින් දේවරාජ්‍යයේ කොටස් කරුවන් වන්නට සියලුම මනුෂ්‍යයන්ට මාර්ගයක් සැපයිනි. මියයෑම සඳහා සුදුසු වු කිසිවක් යේසුස්වහන්සේ කළේ නැත. උන්වහන්සේ කිසි දිනෙක පව් කළේ නැත. එහෙත් උන්වහන්සේ පව් කළ සියලු දෙනා වෙනුවෙන් දිවි පිදු සේක. ඔවුන්ගේ පව් වෙනුවෙන් උන්වහන්සේ මරණයේ දඬුවම විදි සේක.

**මක්නිසාද පාපයේ කුලි නම් මරණයය. නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමිවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය. (රෝම 6:23)**

යේසුස් රජතුමාගේ මරණය පිළිබඳව ඔබට මතෙව් 26-27, මාර්ක් 14-15, ලුක් 22-23, හා යොහන් 18-19 පරිච්ඡේදවල කියවිය හැකිය.

## රජතුමාගේ නැවත නැගිටීම

උන්වහන්සේ කුරුසපත් කිරීමෙන් මියගිය පසු, මෙම රජතුමා භූමදාන කළේය. එහෙත් උන්වහන්සේ සොහොනට වී සිටියේ නැත. මරණයෙන් පසු උන්වහන්සේගේ මෙම ආශ්චර්යමත් නැවත නැගිටීම ගැන මතෙව් 28, මාර්ක් 16, ලූක් 24, හා යොහන් 20න් කියවිය හැකිය.

උන්වහන්සේගේ මෙම මරණයෙන් පසු නැවත නැගිටීම තුළින්, යේසුස්වහන්සේ ශාරීරික මරණයෙන් ජයගත් සේක. දේවරාජ්‍යයේ කොටස් කරුවන් වන අයද, යේසුස්වහන්සේ මෙන් ශාරීරික මරණය අත්දකිනු ඇත. එහෙත් ඔවුහුද උන්වහන්සේ මෙන් මරණයෙන් පසු නැවත නැගිටීම අත්දකින්නෝය. රජතුමා සදාතනික බැවින්, අපිද සදාතනික රාජ්‍යයක කොටස්කරුවන් වෙමු. අපටද සදාතනික ජිවනය ඇත.

## රජතුමාගේ දර්ශනය වීම

උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු පසු, බොහෝ දෙනෙක් යේසුස් රජතුමාව දුටුවෝය. උන්වහන්සේගේ දර්ශනය විම පිළිබඳව මතෙව් 28, මාර්ක් 16, ලූක් 24, යොහන් 20-21 හා ක්‍රියා 1 න් කියවන්න.

## රජතුමා ආපසු ස්වර්ගයට යෑම

යේසුස්වහන්සේ දින හතළිහක කාලයක් තුළ බොහෝ මිනිසුන්ට දර්ශනය වු පසු නැවත ස්වර්ගයට වැඩි සේක. උන්වහන්සේ නැවත පැමිණ දෘශ්‍යමාන ආකාරයෙන් දේව රාජ්‍යය පිහිටුවන තුරු එතන සිටින සේක. ඔබ දේව රාජ්‍යයේ අතිතය, වර්තමානය හා අනාගතය ගැන ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නා විට, මේ පිළිබඳව තව බොහෝ දේ ඉගෙන ගන්නෙහිය. යේසුස්වහන්සේ ස්වර්ගයට යෑම පිළිබඳව ඔබට මතෙව් 28:16-20, මාර්ක් 16: 19-20, ලූක් 24:50-53, හා ක්‍රියා 1:1-11 න් උගත හැකිය.

## රජතුමාගේ පැවරුම

නැවත ස්වර්ගයට යැමට ස්වල්ප කලකට පෙර, යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට පැවරුමක් දුන් සේක. ඒ මුළු ලොව පුරා, දේව රාජ්‍යයේ තානාපතිවරුන් වන ලෙසය. ඔබ මේ පිළිබඳව පසුව ඉගෙන ගනු ඇත.

## පැමිණෙන්නාවු රජතුමා

දේවරාජ්‍යය දෘශ්‍යමාන ආකාරයෙන් පිහිටුවීමට යේසුස්වහන්සේ මහත් බලයෙන් හා මහිමයෙන් යුක්තව නැවත පැමිණෙන බව බයිබලය එළිදරව් කරයි. උන්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳව ඔබට 1 තෙසලෝනික 4:13-18 න් කියවිය හැකිය. ඊට පෙර පිහිටුවන ලබන රාජ්‍යය හා සිදුවීම් පිළිබඳව එළිදරව් පොතෙන් කියවිය හැකිය. යේසුස්වහන්සේගේ රාජ්‍යය සදාතනික බව බයිබලය එළිදරව් කරයි.

> **උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලෙටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යයෙහි කෙළවර නොවන්නේයයි කියේය. (ලූක් 1:33)**

රජවරුන්ගේ රජතුමා පොළවේ තිබෙන සියලුම රාජ්‍යයන් හා සාතන්ගේ රාජ්‍යයද පරාජය කරනු ඇත. අවසානයේදී එක්තරා ප්‍රකාශයක් කරනු ඇත.

> **සත්වෙනි දේවදූතයාද පිම්බේය, එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වුයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම්කරනසේකැයි කියන ශබ්ද සවර්ගයෙහි විය. (එළිදරව් 11:15)**

# ඔබගේ අධ්‍යයනය ඉදිරියට ගෙනයන්න

රජවරුන්ගේ රජ පිළිබඳ කතාන්දරය මෙම අත්පොතේ එක් පරිච්ඡේදයකට සීමා කිරීමට නොහැකි තරම් ශ්‍රේෂ්ඨය. මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසින් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය විස්තරාත්මකව අධ්‍යයනය කිරීමට මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත්වල සංක්ෂිප්තයක් සපයා තිබේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. “රජු” යන පදය අර්ථ විග්‍රහ කරන්න.

3. දේවරාජ්‍යයේ රජතුමා කවුද?

4. යේසුස් රජතුමා ගේ භූමික ජීවිතය, සේවය හා ඉගැන්වීම් පිළිබඳව කතාව පවසන අලුත් ගිවිසුමේ පොත් සතර කවරේද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම සංක්ෂිප්ත තොරතුරු භාවිතයෙන් රජතුමාගේ ජීවිතය පිළිබඳව හා උන්වහන්සේගේ රාජ්‍යයේ ඉගැන්වීම් ගැන අධ්‍යයනයක යෙදෙන්න. මෙම සංක්ෂිප්තය මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් යන නව ගිවිසුම් පොත්වල වාර්තාව එකට සම්බන්ධ කර ඇත.

# රජතුමා හා උන්වහන්සේගේ රාජ්‍යය

I. රජතුමාගේ පූර්ව - පැවැත්ම : යොහන් 1:1-18

II. රජතුමාගේ හැඳින්වීම

A. රජතුමාගේ පැමිණීම

1. රජතුමාගේ පරම්පරාව : මතෙව් 1:1-17, ලූක් 3:23-28

2. රජතුමාගේ පැමිණීම.

a. යොහන්ගේ උපත දැන්වීම : ලූක් 1:5-25
b. යේසුස්වහන්සේගේ උපත මරියතුමියට දැන්වීම : ලූක් 1:26-38
c. මරියතුමී යුදා දේශයට පැමිණීම: ලූක් 1:39-45
d. මරියතුමියගේ ප්‍රශංසාව: ලූක් 1:46-56
e. යොහන්ගේ උපත : ලූක් 1:57-80
f. යේසුස්වහන්සේගේ උපත පිළිබඳව යෝසෙප්ට දැනුම් දීම: මතෙව් 1:18-25
g. යේසුස් රජතුමාගේ උපත : ලූක් 2:1-7
h. යේසුස්වහන්සේගේ උපත එඬේරුන්ට දැන්වීම : ලූක් 2:8-20

3. රජතුමාගේ බිලිඳු අවස්ථාව හා ළමා කාලය

a. රජතුමා චර්මඡේදනය කිරීම : ලූක් 2:21
b. රජතුමා පිළිගන්වනු ලැබීම : ලූක් 2:22-38
c. රජතුමාගේ බිළිඳු කාලය
(1) බෙත්ලෙහෙමේදී: මතෙව් 2:1-12
(2) මිසරයේදී : මතෙව් 2:13-18
(3) නාසරෙත්හිදී. :මතෙව් 2:19-23, ලූක් 2:39
d. රජතුමාගේ ළමා කාලය
(1) රජතුමාගේ වැඩීම: ලූක් 2:40
(2) රජතුමාගේ යෙරුසලමට යෑම: ලූක් 2:41-50
(3) රජතුමාගේ වර්ධනය : ලූක් 2:51-52

B. රජතුමාගේ පෙරටුවට යන්නා

1. යොහන්ට දුන් පණිවිඩය: මාර්ක් 1:1, ලූක් 3:1-2
2. යොහන්ගේ පණිවිඩය: මතෙව් 3:1-6, මාර්ක් 1:2-6, ලූක් 3:3-6
3. යොහන්ගේ පැහැදිලි කිරීම: මතෙව් 3:7-10, ලූක් 3:7-14
4. යොහන්ගේ පොරොන්දුව මතෙව් 3:11-12, මාර්ක් 1:7-8, ලූක් 3:15-18

III. රජතුමාගේ අනුමැතිය

A. රජතුමාගේ අනුමැතිය

1. උන්වහන්සේගේ බව්තිස්මයේදී: මතෙව් 3:13-17,මාර්ක් 1:9-11, ලූක් 3:21-23

2. උන්වහන්සේ පරික්ෂා කිරිම මගින්: මතෙව් 4:1-11,මාර්ක් 1:12-13,ලූක් 4:1-13

3. උන්වහන්සේගේ පෙරටුව යන යොහන් මගින්
   a. යොහන් නායකයන්ට දුන් සාක්ෂිය: යොහන් 1:19-28
   b. යොහන් යේසුස් වහන්සේට දුන් සාක්ෂිය: යොහන් 1:29-34

B. රජතුමා පිළිගැනිම

1. පළමු ගෝලයන්ගේ විශ්වාසය: යොහන් 1:35-51
2. පළමු හාස්කම තුළින් ඇති වු විශ්වාසය: යොහන් 2:1-12
3. දේවමාලිගාව අයත් කරගැනිම: යොහන් 2:13-22
4. යුදා දේශයේදි පිළිගැනිම: යොහන් 2:23-3:21
5. යොහන්ගේ සාක්ෂිය: යොහන් 3:22-36
6. සෙබලුම් නප්ටාලිහිදි: මතෙව් 4:12, මාර්ක් 1:14, ලූක් 3:19-20, 4:14, යොහන් 4:1-4
7. සමාරියේදි පිළිගැනිම: යොහන් 4:5-42
8. ගලිලයේදි පිළිගැනිම: යොහන් 4:43-45

C. රජතුමාගේ අධිරිකාරි බලය

1. දේශනා කිරිම සඳහා උන්වහන්සේට ඇති අධිකාරි බලය: මතෙව් 4:17, මාර්ක් 1:15, ලූක් 4:14-15
2. ලෙඩ රෝග කෙරෙහි ඇති අධිකාරි බලය: යොහන් 4:46-54
3. නාසරෙහිත්හිදි අධිකාරිබලය ප්‍රතික්ෂේප කිරිම: ලූක් 4:16-30
4. කපර්ණවුමෙහි විසිම: මතෙව් 4:13-16
5. ස්වභාව ධර්මයා කෙරෙහි ඇති උන්වහන්සේගේ අධිකාරි බලය: මතෙව් 4:18-22, මාර්ක් 1:16-20, ලූක් 5:1-11
6. යක්ෂයන් කෙරෙහි ඇති උන්වහන්සේගේ අධිකාරි බලය: මාර්ක් 1:21-28, ලූක් 4:31-37
7. රෝග කෙරෙහි ඇති අධිකාරි බලය : මතෙව් 8:14-17, මාර්ක් 1:29-34, ලූක් 4:38-41
8. දේශනා කිරිමට ඇති අධිකාරි බලය: මතෙව් 4:23-25, මාර්ක් 1:35-39, ලූක් 4:42-44
9. අපවිත්‍රකම් කෙරෙහි ඇති අධිකාරි බලය: මතෙව් 8:1-4, මාර්ක් 1:40-45, ලූක් 5:12- 16
10. පව් කමා කිරිමේ අධිකාරි බලය: මතෙව් 9:1-8, මාර්ක් 2:1-12, ලූක් 5:17-26
11. මනුෂ්‍යයන් කෙරෙහි ඇති අධිකාරි බලය: මතෙව් 9:9-13, මාර්ක් 2:13-17, ලූක් 5:27-32
12. සම්ප්‍රදායන් කෙරෙහි ඇති අධිකාරි බලය: මතෙව් 9:14-17, මාර්ක් 2:18-22, ලූක් 5:33-39
13. සබත් දින කෙරෙහි ඇති අධිකාරි බලය
    a. අංශභාගි රෝගියා සුව කිරිම මගින් :යොහන් 5:1-47

b. ධාන්‍ය පිළිබඳ විවාදයේදී: මතෙව් 12:1-8, මාර්ක් 2:23-28, ලූක් 6:1-5
c. වියළි අතක් ඇති මනුෂ්‍යයා සුවකිරීම මගින්: මතෙව් 12:9-14, මාර්ක් 3:1-6, ලූක් 6:6-11

14. සුවකිරීමට ඇති අධිකාරි බලය: මතෙව් 12:15-25, මාර්ක් 3:7-12

15. පැවරීමට ඇති අධිකාරි බලය: මාර්ක් 3:13-19, ලූක් 6:12-16

16. ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම කෙරෙහි ඇති උන්වහන්සේගේ අධිකාරි බලය: මතෙව් 5:1-7,29 ලූක් 6:17-42

a. උන්වහන්සේ සම්පූර්ණ කිරීම වේ. මතෙව් 5:17-20

b. සම්ප්‍රදානුකූලව ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම ප්‍රතික්ෂේප කරයි.

(1) මිනීමැරීම: මතෙව් 5:21-26
(2) කාමමිථ්‍යාචාරය: මතෙව් 5:27-30
(3) දික්කසාදය: මතෙව් 5:31-32
(4) දිවුරුම්දීම: මතෙව් 5:33-37
(5) පළිගැනීම: මතෙව් 5:38-42
(6) ප්‍රේමය: මතෙව් 5:43-48, ලූක් 6:27-30, 32-36

c. පරිසිවරුන්ගේ පුරුදු ප්‍රතික්ෂේප කිරීම

(1) දන්දීම: මතෙව් 6-1-4
(2) යාච්ඤාව: මතෙව් 6:5-15
(3) නිරාහාරව සිටීම: මතෙව් 6:16-18
(4) වස්තුව කෙරෙහි ඇති ආකල්ප: මතෙව් 6:19-24
(5) මද ඇදහිල්ල : මතෙව් 6:25-34
6) විනිශ්චය කිරීම: මතෙව් 7:1-6, ලූක් 6:37-42

d. දේවරාජ්‍යයට ඇතුළුවන්නන්ට උපදෙස්

(1) යාච්ඤාව. මතෙව් 7:7-11
(2) ධර්මිෂ්ඨකම. මතෙව් 7:12, ලූක් 6:31,43-45
(3) ප්‍රවේශවීමේ මාර්ගය. මතෙව් 7:13-14
(4) ව්‍යාජ ගුරුවරුන්ට අනතුරු ඇඟවීම මතෙව් 7:15-23
(5) අත්තිවාරම් දෙක. මතෙව් 7:24-8:1, ලූක් 6:46-49

17. කපර්ණවුමෙහි දි රජතුමා අධිකාරි බලය පිළිගැනීම: මතෙව් 8:5-13, ලූක් 7:1-10

18. නායින් නුවරදී රජතුමාගේ අධිකාරි බලය පිළිගැනීම :ලූක් 7:11-17

19. දේවරාජ්‍ය කෙරෙහි දොළොස්දෙනාගේ සාක්ෂිය: මතෙව් 9:35-11:1, මාර්ක් 6:6-13, ලූක් 9:1-6

IV. රජතුමා පිළිබඳ මතභේදය

A. යොහන් ප්‍රතික්ෂේප කිරීම: මතෙව් 11:2-19, ලූක් 7:18-35
   1. යොහන්ගේ මරණය. මතෙව් 14:1-12, මාර්ක් 6:14-29, ලූක් 9:7-9

B. ගලීලයේ නගරවල ශාපය: මතෙව් 11:20-30
   1. ඔවුන්ගේ අවිශ්වාසය ගැන දෝෂාරෝපණය කිරීම: මතෙව් 11:20-24
   2. ඔවුන්ගේ අවිශ්වාසය පැහැදිලි කිරීම: මතෙව් 11:25-27
   3. විශ්වාස කිරීම සඳහා කැඳවීම: මතෙව් 11:28-30

C. පව්කාරයෙකු පිළිබඳ මතභේදය: ලූක් 7:36-50

D. රජතුමාට අන් සාක්ෂිය :ලූක් 8:1-3

E. නායකයන් විසින් රජතුමා ප්‍රතික්ෂේප කරනු ලැබීම: මතෙව් 12:22-37, මාර්ක් 3:19-30

F. ලකුණක් දෙන ලෙස නායකයන් රජතුමාගෙන් ඉල්ලා සිටීම: මතෙව් 12:38-45

G. ජාතිය ප්‍රතික්ෂේප කිරීම: මතෙව් 12:46-50, මාර්ක් 3:31-35, ලූක් 8:19-21

H. ප්‍රතික්ෂේප කළ රජතුමාගේ එළිදරව් කිරීම:
   1. වර්තමානයේ දේවරාජ්‍යය. මතෙව් 13:1-53, මාර්ක් 4:1-34, ලූක් 8:4-18
   2. ස්වභාවධර්මය කෙරෙහි ඇති බලය: මතෙව් 8:18, 23-27, මාර්ක් 4:35-41, ලූක් 8:22-25
   3. යක්ෂයන් කෙරෙහි ඇති බලය :මතෙව් 8:28-34, මාර්ක් 5:1-20, ලූක් 8:26-39
   4. රෝග හා මරණය කෙරෙහි ඇති බලය: මතෙව් 9:18-26, මාර්ක් 5:21-43, ලූක් 8:40-56
   5. අන්ධ බව කෙරෙහි ඇති බලය: මතෙව් 9:27-34

I. නාසරෙහිත්දි ප්‍රතික්ෂේප කරනු ලැබීම: මතෙව් 13:54-58, මාර්ක් 6:1-6

V. රජතුමා විසින් ගෝලයන්ට උපදෙස් දීම.

A. 5000කට කන්ට දීම: මතෙව් 14:13-21, මාර්ක් 6:30-44, ලූක් 9:10-17, යොහන් 6:1-13
B. රජකෙනෙකු ලෙස පත්කිරීම ප්‍රතික්ෂේප කිරීම: මතෙව් 14:22-23, මාර්ක් 6:45-46, යොහන් 6:14-15
C. ආදර්ශයක් මගින් ගෙන්නෙසරත්හිදි උපදෙස් දීම: මතෙව් 14:34-36, මාර්ක් 6:53-56
D. ජීවනදායක ආහාර පිළිබඳ උපදෙස්: යොහන් 6:22-71
E. අපවිත්‍රකම පිළිබඳ උපදෙස්: මතෙව් 15:1-20, මාර්ක් 7:1-23,යොහන් 7:1
F. මේවා පිළිබඳ උපදෙස්
   1. තීර් හා සිදොන්: මතෙව් 15:21-28, මාර්ක් 7:24-30
   2. දෙකපොලිස්: මතෙව් 15:29-38, මාර්ක් 7:31-8:9
   3. මගදන් :මතෙව් 15:39-16:4, මාර්ක් 8:10-12
   4. ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අනතුරු ඇඟවීමක්: මතෙව් 16:5-12, මාර්ක් 8:13-26
G. පේත්‍රුස්ගේ පාපෝච්චාරණය: මතෙව් 16:13-20, මාර්ක් 8:27-30, ලූක් 9:18-21
H. රජතුමාගේ මරණය පිළිබඳ උපදෙස්: මතෙව් 16:21, 17:22-23, මාර්ක් 8:31-33, 9:30-32, ලූක් 9:22, 43-45

I. ගෝලකම පිළිබඳව: මතෙව් 16:22-28, මාර්ක් 8:34-9:1, ලූක් 9:23-27
J. රාජ්‍යය එළිදරව් කිරීම: මතෙව් 17:1-8, මාර්ක් 9:2-8, ලූක් 9:28-36
K. එලියා පිළිබඳ උපදෙස්: මතෙව් 17:9-13, මාර්ක් 9:9-13
L. රදා පැවැත්ම පිළිබඳව: මතෙව් 17:14-21, මාර්ක් 9:14-29, ලූක් 9:37-43
M. පුත්‍රබව පිළිබඳ උපදෙස් : මතෙව් 17:24-27
N. නිහතමානි බව: මතෙව් 18:1-5, මාර්ක් 9:33-37, ලූක් 9:46-48
O. අහංකාරය: මතෙව් 18:6-14, මාර්ක් 9:38-50, ලූක් 9:49-50
P. සමාවදීම: මතෙව් 18:15-35
Q.ගෝලකම: මතෙව් 8:19-22, ලූක් 9:57-62
R. රජතුමාගේ සහෝදරයන්ගේ අභියෝගය: යොහන් 7:2-9
S.යෙරුසලමට ගිය ගමන :ලූක් 9:51-56, යොහන් 7:10

VI රජතුමාට විරුද්ධවීම

A. කූඩාරම් මංගල්‍යයේදී ඇති වූ මතභේද
   1. රජතුමාගේ අධිකාරිබලය ප්‍රශ්න කිරීම: යොහන් 7:11-15
   2. රජතුමා විසින් කරන ලද පැහැදිලි කිරීම: යොහන් 7:16-24
   3. රජතුමා පුද්ගලයෙකු ලෙස ප්‍රශ්න කිරීම :යොහන් 7:25-27
   4. රජතුමා විසින් දෙන ලද පැහැදිලි කිරීම: යොහන් 7:28-30
   5. ප්‍රතිචාරය: යොහන් 7:31-36
   6. රජතුමාගෙන් ලද ආරාධනය: යොහන් 7:37-52

B. ව්‍යවස්ථාව පිළිබඳ මතභේදය: යොහන් 7:53-8:11
C. ආලෝකය පිළිබඳ මතභේද: යොහන් 8:12-20
D. රජතුමා නමැති පුද්ගලයා පිළිබඳ මතභේද: යොහන් 8:21-59
E. අන්ධයෙකු සුවකිරීම පිළිබඳ මතභේදය: යොහන් 9:1-41
F. එඬේරා පිළිබඳ මතභේදය :යොහන් 10:1-21
G. සත්දෙනාගේ සාක්ෂිය: ලූක් 10:1-24
H. සදාතන ජීවනය යන ප්‍රශ්නය පිළිබඳ මතභේදය: ලූක් 10:25-37
I. කැපකිරීමේ මංගල්‍යයේදී සිදුවූ මතභේදය: යොහන් 10:22-39
J. ගොළු මිනිසා සුවකිරීම පිළිබඳ මතභේදය: ලූක් 11:14-36
K. පිළිවෙත් පිළිබඳ මතභේදය: ලූක් 11:37-54

VII. රජතුමා විසින් ගෝලයන්ට දුන් උපදෙස්

A. සහභාගිත්වය සඳහා උදාහරණයක්: ලූක් 10:38-42
B. යාච්ඤාව ගැන දුන් උපදෙස්: ලූක් 11:1-13
C. පහත දැක්වෙන දේ පිළිබඳ රාජ්‍යමය මූලධර්ම
   1 කෛරාටිකකම: ලූක් 12:1-12
   2 තෘෂ්ණාව: ලූක් 12:13-34
   3 සූදානම්ව සිටීම: ලූක් 12:35-41
   4 විශ්වාසවන්තකම :ලූක් 12:42-48
   5 රජතුමාගේ පැමිණීමේ බලපෑම් :ලූක් 12:49-53
   6 කාලය පිළිබඳ ලකුණු: ලූක් 12:54-59
   7 පසුතැවිලිවීම: ලූක් 13:1-9
   8 ඉශ්‍රායෙල්හි අවශ්‍යතා :ලූක් 13:10-17
   9 රජ්‍යයේ වැඩසටහන: ලූක් 13:18-21

D. යුදා දේශයෙන් පිටවීම: යොහන් 10:40-42
E. රාජ්‍යයට ඇතුළුවීම පිළිබඳ උපදෙස් :ලූක් 13:22-35
F. පරිසිවරයාගේ නිවසේදී දුන් උපදෙස්: ලූක් 14:1-24
G. පහත දැක්වෙන දේ පිළිබඳව රාජ්‍යයම මුලධර්ම ගැන උපදෙස්
    1. ගෝලත්වය: ලූක් 14:25-35
    2. පව්කරුවන් කෙරෙහි දෙවියන්වහන්සේ දක්වන ආකල්පය: ලූක් 15:1-32
    3. වස්තුව: ලූක් 16:1-31
    4. කමාව: ලූක් 17:1-6
    5. සේවය: ලූක් 17:7-10
H. ලාසරස් නැගිටවීම
    1. භාස්කම්: යොහන් 11:1-44
    2. භාස්කම පිළිබඳ මතභේදය: යොහන් 11:45-54
I. පහත දැක්වෙන දේ පිළිබඳව රාජ්‍ය මුලධර්ම ගැන උපදෙස්
    1. ස්තුතිවන්තකම: ලූක් 17:11-19
    2. රජතුමාගේ පැමිණීම :ලූක් 17:20-37
    3. යාච්ඤාව: ලූක් 18:1-14
    4. දික්කසාදය :මතෙව් 19:1-12, මාර්ක් 10:1-12
    5. රාජ්‍යයට ඇතුළුවීම: මතෙව් 19:13-15, මාර්ක් 10:17-31, ලූක් 18:31-34
    6. ඉශ්‍රායෙලය: මතෙව් 20:29-34, මාර්ක් 10:46-53, ලූක් 18:35-43
    7. පෞද්ගලික භක්තිය: ලූක් 19:1-10
    8. කල් දැමූ රාජ්‍යය: ලූක් 19:11-28

VIII. රජතුමාගේ පිළිගැන්වීම
A. රජතුමා බෙතානියට පැමිණේ: යොහන් 11:55-12:1, 9-11
B. යෙරුසලමට ඇතුළුවීම :මතෙව් 21:1-11,14-17, මාර්ක් 11:1-11, ලූක් 19:29-44, යොහන් 12:12-19
C. රජතුමාගේ ආධිපත්‍යය: මතෙව් 21:12-13,18-19, මාර්ක් 11:12-18, ලූක් 19:45-48
D. රජතුමාගේ ආරාධනය: යොහන් 12:20-50
E. අධිකාරී බලය ඔප්පු කිරීම :මතෙව් 21:20-22, මාර්ක් 11:19-25, ලූක් 21:37-38
F. රජතුමාගේ අධිකාරී බලය අභියෝගයකට ලක් කෙරේ
    1. පූජකයන් හා වැඩිහිටියන් විසින් :රජතුමා ප්‍රතික්ෂේප කිරීම: මතෙව් 22:14, මාර්ක් 11:27-12:12, ලූක් 20:1-19
    2. පරිසිවරුන් හා හෙරෝදිවරුන් විසින්: ප්‍රශංසාව පිළිබඳ රාජ්‍යමය මුලධර්ම :මතෙව් 22:15-22, මාර්ක් 12:13-17, ලූක් 20:20-26
    3. සද්දිසිවරුන් විසින් :නැවත නැගිටීම පිළිබඳ රාජ්‍යමය මුලධර්ම: මතෙව් 22:23-33, මාර්ක් 12:18-27, ලූක් 20:27-40
    4. පරිසිවරුන් විසින්: රාජ්‍යයේ ඇති ශ්‍රේෂ්ඨතම ආඥාව :මතෙව් 22:34-40, මාර්ක් 12:28-34
G. රජතුමා විසින් අභියෝග කිරීම: මතෙව් 22:41-46, මාර්ක් 12:35-37, ලූක් 20:41-44
H. විනිශ්චය පිළිබඳ මුලධර්ම: මතෙව් 23:1-39, මාර්ක් 12:38-40, ලූක් 20:45-47
I. දීම පිළිබඳ රාජ්‍යමය මුලධර්ම: මාර්ක් 12:41-44, ලූක් 21:1-4

IX. රජතුමාගේ මරණය සඳහා සූදානම් වීම

A. රජතුමා විසින් අනාවැකි කිම

1. ප්‍රශ්නය: මතෙව් 24:1-3
2. පීඩා සමය :මතෙව් 24:27-30
3. දෙවැනි පැමිණීම :මතෙව් 4:27-30
4. ඉශ්‍රායෙල් සෙනග එක්රැස්කිරීම: මතෙව් 24:31
5. අවසානය පිළිබඳ උපමා
    a. අත්තික්කා ගස: මතෙව් 24:32-44
    b. විශ්වාසවන්ත දාසයෝ :මතෙව් 24:45-51
    c. කන්‍යාවන් දසදෙනා: මතෙව් 25:1-13
    d. තලෙන්ත : මතෙව් 25:14-30
6. අන්‍යජාතීන් විශ්වාසකිරීම: මතෙව් 25:31-46

B. රජතුමාගේ මරණය සඳහා සූදානම් වීම

1. උන්වහන්සේගේ මරණය ගැන අනාවැකි කිම :මතෙව් 26:1-2, මාර්ක් 14:1, ලූක් 22:1
2. පාලකයන්ගේ සැලැස්ම: මතෙව් 26:3-5, මාර්ක් 14:1-2, ලූක් 22:2
3. තෙලින් ආලේප කරනු ලැබීම :මතෙව් 26:6-13, මාර්ක් 14:3-9, යොහන් 12:2-8
4. පාවාදීමට පොරොන්දු වීම: මතෙව් 26:14-16, මාර්ක් 14:10-14, ලූක් 22:3-6
5. පාස්කුව සඳහා සූදානම් වීම: මතෙව් 26:17-19, මාර්ක් 14:12-16, ලූක් 22:7-13
6. පාස්කුව: මතෙව් 26:20, මාර්ක් 14:17, ලූක් 22:14-16, 24-30
7. ආදර්ශයක් සැපයීම :යොහන් 13:1-20
8. ජුදස් විසින් පාවාදෙනු ලබන බවට අනාවැකි: මතෙව් 26:21-25, මාර්ක් 14:18-21, ලූක් 22:21-23, යොහන් 13:21-30
9. පේත්‍රුස් විසින් අඳුනන්නේ නැත යයි කිම පිළිබඳව කලින් කීම :මතෙව් 26:31-35, මාර්ක් 14:27-31, ලූක් 22:31-38, යොහන් 13:37-38
10. සිහිවටනයක් :මතෙව් 26:26-30, මාර්ක් 14:22-26, ලූක් 22:17-20

C. රජතුමාගේ අවසාන පණිවිඩය

1. හැඳින්වීම :යොහන් 13:31-35
2. ගැටලු: යොහන් 13:36-14:24
3. පොරොන්දු :යොහන් 14:25-31
4. මේ දේවල් ගැන දුන් උපදෙස් :
    a. පලදැරීම :යොහන් 15:1-17
    b. ගෝලයන්ගේ සතුරෝ :යොහන් 15:18-16:4
    c. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය: යොහන් 16:5-15
    d. නැවත නැගිටීමේ ප්‍රතිඵල : යොහන් 16:16-28
    e. සමාප්තිය: යොහන් 16:29-33

D. රජතුමාගේ අවසාන යාච්ඥාවන්

1. තමන්වහන්සේ වෙනුවෙන්ම කරන ලද යාච්ඥාව: යොහන් 17:1-5
2. උන්වහන්සේගේ ගෝලයන් වෙනුවෙන් කළ යාච්ඥා :යොහන් 17:6-19
3. සියලු ඇදහිලිවන්තයන් වෙනුවෙන් උන්වහන්සේ කළ යාච්ඥාව: යොහන් 17:20-26

E. උද්‍යානයේ යාච්ඥාව :මතෙව් 26:36-46, මාර්ක් 14:32-42, ලූක් 22:39-46, යොහන් 18:1

X. රජතුමාගේ මරණය

A. අත්අඩංගුවට ගැනිම :මතෙව් 26:47-56, මාර්ක් 14:43-52, ලූක් 22:47-53, යොහන් 18:2-12

B. රජතුමා පිළිබඳ ආගමික නඩු විභාගය

1. අන්නාස් ඉදිරියේ විභාග කිරිම :යොහන් 18:12-14, 19-23
2. කායපස් ඉදිරියේ විභාග කිරිම: මතෙව් 26:57,59-68, මාර්ක් 14:53,55-56, ලූක් 22:54,63-65, යොහන් 18:24
3. පේත්‍රුස්ගේ විසින් අඳුනන්නේ නැත යයි කිම: මතෙව් 26:58, 69-75, මාර්ක් 14:54,66-72, ලූක් 22:54-62, යොහන් 18:15-18,25-27
4. යුදෙව් මන්ත්‍රණ සභාවේ නඩු තීන්දුව: මතෙව් 27:1, මාර්ක් 15:1, ලූක් 22: 66-71
5. ජුදාස්ගේ මරණය: මතෙව් 27:3-10

C. රජතුමාගේ සිවිල් නඩු විභාගය

1. පිලාත් ඉදිරියෙහි නඩු විභාගය: මතෙව් 27:2,11-14, මාර්ක් 15:2-5,ලූක් 3:1-5, යොහන් 18:28-38
2. හෙරොද් ඉදිරියෙහි නඩු විභාගය: ලූක් 23:6-12
3. පිලාත් ඉදිරියෙහි නඩු විභාගය: මතෙව් 27:15-26, මාර්ක් 15:6-15, ලූක් 23:13-25,යොහන් 18:39-19:1,4-16
4. රජතුමාට නිග්‍රහ කිරිම: මතෙව් 27:27-30,මාර්ක් 15:16-19, යොහන් 19:2-3
5.

D. කල්වරියට ගිය ගමන :මතෙව් 27:31-34, මාර්ක් 15:20-23, ලූක් 23:26-33, යොහන් 19:16-17

E. රජතුමා කුරුසියෙහි ඇණ ගැසීම

1. පළමු තුන් පැය: මතෙව් 27:35-44, මාර්ක් 15:24-32, ලූක් 23:33-43, යොහන් 19:18-27
2. දෙවන තුන් පැය: මතෙව් 27:45-50, මාර්ක් 15:33-37, ලූක් 23:44-46, යොහන් 19:28-30
3. රජතුමාගේ මරණයේදී ඇතිවූ ලකුණු: මතෙව් 27:51-56, මාර්ක් 15:38-41, ලූක් 23:45,47-49

F. රජතුමාගේ භූමදානය :මතෙව් 27:57-60, මාර්ක් 15:42-47, ලූක් 23:50-56, යොහන් 19:31-42

G.රජතුමාගේ සොහොන් ගෙයට මුරා තැබීම: මතෙව් 27:62-66

XI. රජතුමා නැවත නැගිටිම

A. ස්ත්‍රීන් විසින් කරන ලද සූදානම: මතෙව් 28:1, මාර්ක් 16:1
B. සොහොන් ගෙය විවෘත කිරිම: මතෙව් 28:2-4
C. ස්ත්‍රීන්ගේ පැමිණිම: මතෙව් 28:5-8 මාර්ක් 16:2-8, ලූක් 24:1-8, යොහන් 20:1
D. ගෝලයන්ගේ වාර්තා කිරිම් :ලූක් 24:9-12, යොහන් 20:2-10
E. රජතුමා මරියාට පෙනිම :මාර්ක් 16:9-11, යොහන් 20:11-18
F. රජතුමා ස්ත්‍රීන්ට පෙනිම: මතෙව් 28:9-10
G. මුරකරුවන්ගේ වාර්තාව :මතෙව් 28:11-15
H. එම්මානුවෙල් මාර්ගයේදි ගෝලයන්ට පෙනිම :මාර්ක් 16:12-13, ලූක් 24:13-32
I. ගෝලයන් දෙදෙනාගේ වාර්තාව: ලූක් 24:33-35
J. ගෝලයන් දසදෙනාට පෙනිම: මාර්ක් 16:14, ලූක් 24:36-43, යොහන් 20:19-25
K. ගෝලයන් එකොළොස් දෙනාට රජතුමා පෙණිම :යොහන් 20:26-31
L. ගෝලයන් සත් දෙනාට රජතුමාට පෙනිම: යොහන් 21:1-25

XII. රජතුමා විසින් දෙන ලද පැවරිම: මතෙව් 28:16-20, මාර්ක් 16:15-18, ලූක් 24:44-49

XIII. රජතුමා නැවත ස්වර්ගයට යෑම: යේසුස්වහන්සේගේ ස්වර්ගාරෝහණය: මාර්ක් 16:19-20, ලූක් 24:50-53

# තුන්වන පරිච්ඡේදය

## රාජ්‍යය: අතීතය, වර්තමානය, අනාගතය

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දේවරාජ්‍යය එය පැවති පැරණි ආකාරයෙන් හඳුනාගත් බව ප්‍රදර්ශනය කිරීමට
- දේවරාජ්‍යය එය වර්තමානයේ පවතින ආකාරයෙන් හඳුනාගත් බව ප්‍රදර්ශනය කිරීමට
- දේවරාජ්‍යය එය අනාගතයේදී පැවතෙන ආකාරය හඳුනාගත් බව ප්‍රදර්ශනය කිරීමට
- දේවරාජ්‍යය පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය

> **එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක්: මාගේ පියාණන්ගෙන් ආශිර්වාදලත්තෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුමකරගන්න. (මතෙව් 25:34)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදවලින් දේවරාජ්‍යයත් මෙම රාජ්‍යයේ පාලකයාණන් වන ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේත් හඳුන්වා දෙනු ලැබීය. මෙම පරිච්ඡේදයෙන් ඔබ වෙත, දේව රාජ්‍යයේ අතීතය, වර්තමානය හා අනාගතය දළ විශ්ලේෂණයක් ලෙස ඉදිරිපත් කෙරේ. එමෙන්ම එම රාජ්‍යය පිළිබඳ මූලික කරුණු ද ඉදිරිපත් කර ඇත.

බයිබලයේ පැරණි හා නව ගිවිසුම් එක්සත් කරන මූලික තේමාවක් ඇත. එම තේමාවන් වන්නේ දේවරාජ්‍යය හා එහි රජතුමා වේ. "දේව රාජ්‍යය" හා "ස්වර්ග රාජ්‍යය" යන පද පැරණි ගිවිසුමේ සඳහන් වන්නේ නැත. ඒවා නව ගිවිසුම් පද වේ. එහෙත් දේවරාජ්‍යයේ අතීත ඉතිහාසය ඔබ අධ්‍යයනය කරන විට, එහි අත්තිවාරම පැරණි ගිවිසුම් සමයේ දැමූ බව ඔබට පෙනෙනු ඇත. දේව රාජ්‍යයේ වර්තමානයේ හා අනාගතයේ පැවතෙන ආකාර ගොඩනැගී ඇත්තේ පැරණි ගිවිසුමේ අත්තිවාරම් මතය.

## අතීත රාජ්‍යය : පැරණි ගිවිසුම

දේවරාජ්‍යය සදාතනිකය. ඉන් අදහස් වන්නේ එය නිරතුරුවම පැවති අතර සදහටම පවතින බවය.

> **ඔබගේ රාජ්‍යය සදාකාලික රාජ්‍යයක්ය, ඔබගේ අධිපතිකමද සියලු පරම්පරාවලටම පවත්නේය. (ගීතාවලිය 145:13)**

දෙවියන්වහන්සේ රාජ්‍යය පළමුව පැවතියේ ස්වර්ගයේ වේ. දෙවියන්වහන්සේ පෘථිවිය මැවූ විට, උන්වහන්සේගේ ආශාව වුයේ උන්වහන්සේගේ ස්වර්ගීය රාජ්‍යය, උන්වහන්සේ මවන ලද ලෝකය දක්වාම පැතිරිය යුතු බවය.

## තෝරාගත් මිනිසෙක්

මේ ආගාව සම්පූර්ණ කිරිම සඳහා, උන්වහන්සේගේ රාජ්‍යයේම කොටසක් ලෙස සර්ව සම්පූර්ණ පරිසරයක් මැවූ සේක. මෙම ඒදන් උයනේ උන්වහන්සේ පළමු මිනිසා සහ ස්ත්‍රිය මැවූ අතර ඔවුන් වැඩි වර්ධනය වී, පොළව පුරා පැතිරිය යුතු විය. මේ ආකාරයේ බෝවීමකින් මෙම දේවරාජ්‍යය ලොව පුරා පැතිරීම ඔවුන් කළ යුතු විය.

මිනිසා විසින් උරුම කරගත යුතු දේවරාජ්‍යය සුදානම් කිරීම ලෝකය මැවීමෙන් ඇරඹුනි.

> **එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක්: මාගේ පියාණන්ගෙන් ආශිර්වාදලත්තෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සුදානම් කර තිබෙන රාජ්‍යය උරුමකරගන්න. (මතෙව් 25:34)**

පළමු මිනිසාට හා ස්ත්‍රියට එනම් ආදම් හා ඒවට පොළොවේ පැතිරුනු දේවරාජ්‍යයේ පාලනය දෙනු ලැබිය.

> **තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදමින: ඔව්හු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළව කෙරෙහිද පොළව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩුකෙරෙත්වයි කීසේක. දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක: දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක: පුරුෂයාද සත්‍රියද කොට ඔවුන් මැවූ සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාදකළසේක: දෙවියන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා බෝවී වැඩිවෙමින් පොළව පූර්ණකොට ඒක යටත්කරගන්න: මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන් කෙරෙහිද පොළොව පිට හැසිරෙන සියලු සතුන් කෙරෙහිද අධිපතිකම් කරන්නැයි කීසේක. (උත්පත්ති 1:26-28)**

දෙවියන්වහන්සේට, උන්වහන්සේගේ භූමික රාජ්‍යයේ වැසියන්ගෙන් බලහත්කාරයෙන් ලබාගත් දාසභාවයක් අවශ්‍ය වූයේ නැත. උන්වහන්සේට අවශ්‍ය වූයේ තමාගේම නිදහස් කැමැත්තෙන් මිනිසා දේවරාජ්‍යයේ කොටස්කරුවකු වීම වේ. එබැවින් උන්වහන්සේ අලුත් රාජ්‍යයේ නීතියක් පැනවූ සේක. ඒ නීතිය නිදහස් තේරීම මත පදනම් වූවකි. දේවරාජ්‍යයේ ජීවත් වන්නේද නැද්ද යන්න මෙම තේරීම මගින් තීරණය කරනු ඇත.

> **ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥාකරමින්: නුඹට උයනේ සියලු ගස්වලින් කැමති ලෙස කන්ට පුළුවන: එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය: මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහියයි කීසේක. (උත්පත්ති 2:16-17)**

ඔබට, උත්පත්ති 3 වන පරිච්ඡේදයෙන් ආදම් හා ඒවගේ වැරදි තෝරා ගැනීමේ කතාව කියවිය හැකිය. ආදම් හා ඒව පව් කළ විට දේවරාජ්‍යයේ උරුමය ඔවුන්ට නැතිවිය. ඔවුන්ට සදාතනික ජීවනයද එම රාජ්‍යයේ අලංකාර පරිසරයද නැති විය.

පාපය නිසා සාතන්, පෘථිවිය හා මිනිසා කෙරෙහි ඇතැම් ශාප පැමිණියේය. මේ ශාප පිළිබඳව ඔබට උත්පත්ති 3 වන පරිච්ඡේදයෙන් කියවිය හැකිය. පොළව තවදුරටත් පරිපූර්ණ පරිසරයක් හෝ ස්වර්ග රාජ්‍යයේම නිර්දෝෂ කොටසක් නොවිය. මිනිසාට තවදුරටත් පෘථිවිය කෙරෙහි ආධිපත්‍යයක් නොමැතිවූ අතර පාපය නිසා මිනිසා රජතුමාගේ අභිමුඛයෙන් වෙන් කෙරුනි.

දෙවියන්වහන්සේට අවශ්‍ය වූයේ මනුෂ්‍යයා තුළින් උන්වහන්සේගේ රාජ්‍යය පැතිරවීමටය. එහෙත් මනුෂ්‍යයා මේ රාජ්‍යය ප්‍රතික්ෂේප කරන ලදි. ලෝකය ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ මිනිසා වෙනුවෙන් සුදානම් කර තිබූ උරුමය ඔහුට නැතිවිය. පොළොවේ පාලනය සාතන් අතට ගත්තේය.

එහෙත් ඒ අඳුරු පැයේදී, දේවරාජ්‍යය නැවතත් මනුෂ්‍යයාට ලබා දීමේ පොරොන්දුව දෙනු ලැබීය. දෙවියන්වහන්සේ සාතන්ට මෙසේ පැවසූ සේක.

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි: ඒ වංශය තාගේ හිස පොඩිකරන්නේය, තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහියයි කීසේක. (උත්පත්ති 3:15)**

මෙය කවදා හෝ දවසක සතුරාගේ, සාතන්ගේ බලය පොඩිකරනු ලබන රජතුමෙකුගේ පළමු පොරොන්දුව වේ. ස්ත්‍රියකගේ ශරීරයෙන් මෙම රජතුමා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙන සේක. උන්වහන්සේගේ මරණය තුළින් මිනිසාව පාපයෙන් පිරිසිදු කළ හැකිය. දේවරාජ්‍යයට නැවත උපත ලැබිය හැකිය, සදාතනික ජිවිතය ලබා ගත හැකිය, එමෙන්ම තමාට හිමි උරුමය නැවත ඉල්ලිය හැකිය.

## තෝරාගත් සෙනගක්

මිනිසා අසාර්ථක වූ පසු දෙවියන්වහන්සේ ලෝකය පුරා උන්වහන්සේගේ රාජ්‍යය පැතිරවීම සඳහා ජාතියක් තෝරාගත් සේක. මේ ජාතිය පැවත එන්නේ දෙවියන්වහන්සේගේ තෝරාගත් මනුෂ්‍යයකු වූ ආබ්‍රහම්ගෙනි. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් සහ ලොව මුළුල්ලේම දේවරාජ්‍යය පැතිරවීමේ කාර්යය වෙනුවෙන් පොරොන්දු බොහෝමයක් දුන්නේය. ඔබට ආබ්‍රහම් පිළිබඳවද ඔහුට දුන් පොරොන්දු පිළිබඳවද "ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳවද කතාව" උත්පත්ති 12 සිට 25 දක්වා කියවිය හැකිය.

ඉශ්‍රායෙල් ජාතිය තෝරාගත්තේ පරමාර්ථයක් උදෙසා මිස වරප්‍රසාදයක් පිණිස නොවේ. ඔවුන් තෝරා ගනු ලැබුවේ" ඔවුන් අනෙක් ජාතින්ට වඩා යහපත් නිසා හෝ දෙවියන්වහන්සේ ඔවුන්ට වැඩි ප්‍රේමයක් දැක් වූ නිසා හෝ නොවේ. මෙය වගකීමේ තෝරා ගැනීමකි. එම වගකීම වූයේ දේවරාජ්‍යය ලොව මුළුල්ලේම පැතිරවීම වේ. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට රාජ්‍යයේ නීති දුන් සේක. මේ බොහෝ නීති නික්මයාම පොතේ වාර්තා කර ඇත.

දේවරාජ්‍යය පාලනය කිරීමට උපකාර කිරීම සඳහා පසුව භූමික රජවරුන් පත්කරන ලදි. එහෙත් දේව රාජ්‍යය පැතිරවීමේ වගකීම ඉටුකිරීමට ඉශ්‍රායෙල් ජාතිය අසමත්විය. වරින් වර මේ ජාතිය පව් කළ අතර ඔවුහු ව්‍යාජ දෙවිවරුන් වෙත යොමු වූහ. ඔවුන්ගේ අසමත්වීම පිළිබඳ නිදර්ශන පැරණි ගිවිසුමේ විනිශ්චකාරයන්ගේ පොතේ කියවිය හැකිය.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ස්වාභාවික ලෝකයේ මිදිවැලක් හා සංසන්ධනය කළ සේක. ඉශ්‍රායෙලය තෝරා ඇත්තේ දේවරාජ්‍යයේ "ඵලය" පලදැරීම පිණිසය. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය ගැන අවසානයේ මෙසේ පැවසූ සේක.

> **ඉශ්‍රායෙල් විහිදියන්නාවූ, ඵලදරන මිදිවැලක්ය. තමාගේ ඵල වැඩිවූ පමණට ඔහු පූජාසන වැඩි කළේය: ඔහුගේ දේශයේ සාරභාවය හැටියට ඔව්හු අලංකාරවූ රූපස්තම්භ සෑදුවෝය. ඔවුන්ගේ සිත බෙදී තිබේ: දැන් ඔවුන් අපිවූවිදිනවා ඇත. උන්වහන්සේම ඔවුන්ගේ පූජාසන පෙරළාදමා, ඔවුන්ගේ රූපස්තම්භ නාස්තිකරනසේක. සැබවින්ම ඔව්හු දැන් කථාකොට: අපට රජෙක් නැත. මක්නිසාද අපි ස්වාමින්වහන්සේ කෙරෙහි භය නැත්තෙමුව: රජු අපට මක්කරනවා ඇද්දැයි කියන්නෝය. (හොෂෙයා 10:1-3)**
>
> **එහෙත් මා විසින් නුඹ හොඳ මිදිවැළක්ද මුළුමනින්ම හරිවූ බීජයක්ද කොට හිටවා තිබුණේය. එසේවී නම් නුඹ වෙනස්වී මට වල් මිදිවැළක නරක්වූ පැළයක් වුණේ කොහොමද? (යෙරමියා 2:21)**

ඔවුන් දේවරාජ්‍යය ප්‍රතික්ෂේප කළ නිසාත් එය පැතිරවීමේ වගකිම ඉටුකිරීමට නොහැකි වු නිසාත් ඉශ්‍රායෙලය බෙදුනු ජාතියක් බවට පත්විය. එය ඉශ්‍රායෙල් දේශය හා යුදා දේශය ලෙස වෙන් කෙරුනි. අවසානයේ මේ දේශයන් දෙකම මිථ්‍යාදෘෂ්ටි ජාතින් විසින් යටත් කරගෙන පාලනය කරන ලදි.

ඉශ්‍රායෙල්හි අසාර්ථක විම් තිබියදී දේව රාජ්‍යය කිසියම් දිනක දෘශ්‍යමාන ආකාරයෙන් නැවත පිහිටුවන බවත් ඉශ්‍රායෙලය එහි කොටසක් වන බවටත් දෙවියන්වහන්සේ පොරොන්දු වු සේක. අනාගතවක්තෘවරු මගින් පැමිණීමට නියමිත රජතුමා හා දේවරාජ්‍යය ගැන දෙවියන්වහන්සේ බොහෝ පොරොන්දු දුන් සේක.

දාවිත්ටද (2සාමුවෙල් 7:16, ගිතාවලිය 22:27-28, 72:7-11, 89:1-4; 96 හා 98), යෙරමියාටද (යෙරමියා 3:17-18, 23:5-6, 31:31-34) පොරොන්දු දෙන ලදි. යෙසායා අනාගතවක්තෘවරයා තුළින්ද පොරොන්දු දුන්නේය. (යෙසායා 2:2-5, 33:20-22,35, 62:1-2, 65:17-25). එමෙන්ම එසකියෙල්ට ද (එසකියෙල් 26:25-30, 37:22-28), යෝවෙල්ටද (යෝවෙල් 2:28) සෙකරියාටද (සෙකරියා 8:20-23, 12:10, 14:9-17) ආමොස්ටද (ආමොස් 9:15) හා මීකාටද (මීකා 4) පොරොන්දු දෙන ලදි. දේවරාජ්‍යය පිළිබඳව මෙහි සඳහන් ඒවාට අමතරව බොහෝ පොරොන්දු දී තිබේ.

මේ ශ්‍රේෂ්ඨ පොරොන්දු ඉටුකිරිම පිණිස මෙසියස්වහන්සේ කෙනෙකු එන තෙක් ඉශ්‍රායෙල්වරු බලා සිටියහ. ඔවුන් බලා සිටියේ අනෙකුත් ජාතින්ගෙන් ඔවුන්ව නිදහස් කරගන්නා රජතුමෙකු පැමිණෙන තෙක්ය. ඔවුන් බලා සිටියේ, ඔවුන්ට නැතිවු රාජ්‍යය නැවතත් ඔවුන්ට දෘශ්‍යකාරයෙන් නැවතත් ලබා දෙන තෙක්ය.

## අතිත රාජ්‍යය : නව ගිවිසුම

දේවරාජ්‍යය පිළිබඳව පැරණි හා නව ගිවිසුම් වාර්තා එකට සම්බන්ධ කෙරෙන ප්‍රධාන පදයක් ඇත.

> **ව්‍යවස්ථාවද අනාගතවකතෘහුද යොහන් දක්වා පැවතුණෝය. එතැන් පටන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරනු ලැබේ, සියල්ලෝද බලෙන් ඊට ඇතුල්වෙති. (ලූක් 16:16)**

පැමිණීමට නියමිත රාජ්‍යයන් හා රජතුමා ගැන පැරණි ගිවිසුම් අනාගතවක්තෘහු අනාවැකි පල කළහ. මෙ අනාවැකි අලුත් ගිවිසුමෙහි සම්පූර්ණ වන ලදි. දේවරාජ්‍යයේ පිවිත පාලනය කෙරෙන අලුත් ගිවිසුම් මුලධර්ම සඳහා පදනම, පැරණි ගිවිසුමේ නීති මගින් සැපයේ. යේසුස්වහන්සේ පැමිණි කල, උන්වහන්සේ මෙම නීති කඩ කළේ නැත. උන්වහන්සේ එය සම්පූර්ණ කර මෙම පදනම මත දේවරාජ්‍යයේ මුලධර්ම ව්‍යජ්ත කළ සේක.

යොහන් බව්තිස්ත යුදයේ පාළුකරයේ "ස්වර්ග රාජ්‍යය අත ළඟය" යි පැවසු විට ඔහු ඒ යුගයේ භාෂාව භාවිතා කළේය. මුළු ඉශ්‍රායෙල් ජාතියටම මේවා තේරුම් ගත හැකි වුයේ පොරොන්දු වු රාජ්‍යය හා රජතුමා පිළිබඳ බලාපොරොත්තුව සැම යුදෙව්වෙකුගේම හදවතෙහි දැවෙමින් තිබු බැවින්ය.

> **ඒ දවස්වලදී යොහන් බව්තිස්ත ඇවිත් යුදයේ වනයෙහි දේශනාකරමින් : පසුතැවිලිවෙයන්න, මක්නිසාද ස්වර්ගරාජ්‍යය ළඟයයි කිවේය. කුමක් හෙයින්ද ස්වාමින්වහන්සේගේ මාර්ගය පිළියෙලකර උන්වහන්සේගේ මාවත් සමතලාකරපල්ලාය කියා වනාන්තරයෙහි හඬගසන්නෙකුගේ ශබ්දයයයි අනාගතවක්තෘවු යෙසායා කරණකොටගෙන කියන ලද්දේ මොහු ගැනය. (මතෙව් 3:1-3)**

### තෝරාගත් මනුෂ්‍යයෙක්

පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේ තම රාජ්‍යය ලොව පුරා පැතිරවීමට මනුෂ්‍යයෙකු තෝරාගත් සේක. ආදම් ඒ වගකිමෙන් අසමත් විය. නව ගිවිසුමේ දෙවියන්වහන්සේ දේවරාජ්‍යය ලොවපුරා පැතිරවීමට උන්වහන්සේගේම පුත්‍රයාවු යේසුස්වහන්සේ එවුසේක. යේසුස්වහන්සේ මේ වගකිම තම පිවිතයේ හා සේවයේ ප්‍රධාන පරමාර්ථය කරගත් බැවින් එය ඉටු කළ සේක.

යොහන් බව්තිස්ත සිරගත කිරීමෙන් හා මිය යෑමෙන් පසු, දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය බෙදා ගැනීම යේසුස්වහන්සේ ඇරඹූ සේක.

**යොහන් පාවාදෙනු ලැබූවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනාකරමින්, කාලය සම්පූර්ණ විය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි කීසේක. (මාර්ක් 1:14-15)**

**එතැන් පටන් යේසුස්වහන්සේ: පසුතැවිලිවෙයන්න, මක්නිසාද ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

යේසුස්වහන්සේ, තම භූමික සේවයේදී, තම ගෝලයන් වශයෙන් ප්‍රධාන මනුෂ්‍යයන් කිහිප දෙනෙකු තෝරාගත් සේක. "ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය " කියා දේශනා කිරීමට යේසුස්වහන්සේ ඔවුන්ට උපදෙස් දුන් සේක. (මතෙව් 10:7) " ළංවී තිබේ" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? යේසුස්වහන්සේ මෙම වචනයම වෙනත් සන්දර්භයක භාවිත කළ අයුරු බලන්න. (එතැන ඇත්තේ "ළඟ" යනුවෙනි)

**නැගිටින්න, අපි යමු. අන්න, මා පාවාදෙන්නා ළඟයයි කීසේක. (මතෙව් 26:46)**

මා පවා දෙන්නා "ළඟ" යයි යේසුස්වහන්සේ පැවසූ විට, උන්වහන්සේ ඉන් අදහස් කළේ ඒ තැනැත්තා (යුදස්) පැමිණ ඇති බවය. පවා දීමේ අවස්ථාව "ළංවී තිබේ". දේවරාජ්‍යය "ළංවී තිබේ" යයි යේසුස්වහන්සේ පැවසූ විට, ඉන් අදහස් කළේ දේවරාජ්‍යය පැමිණ ඇති බවය. යේසුස්වහන්සේ තම මුළු ජීවිත කාලයම ගත කළේ, දේවරාජ්‍යය පැමිණ ඇති බව පැවසීමටත්, දේවරාජ්‍යයේ ජීවත්වීමට අවශ්‍ය මූලධර්ම ඉගැන්වීමටත් හා දේවරාජ්‍යයට ඇතුළුවන ආකාරය මනුෂ්‍යයන්ට පැහැදිලි කිරීමටත් වේ.

දේවරාජ්‍යය ළංවී තිබුණද එය දෘශ්‍යමාන ආකාරයෙන් පැමිණියේ නැත.

**දෙවියන්වහන්සේගේ රාජ්‍යය කොයි කලක ඒන්නේදැයි ඵරිසිවරුන් විසින් ඇසූ බැවින් උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය පෙරහැර සහිතව නොඑන්නේය. බලව, ඒක මෙතැනය! එතැනයයි නොකියන්නෝය: මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා ඇතුළේයයි කීසේක. (ලූක් 17:20-21)**

දේවරාජ්‍යය පිළිබඳ යේසුස්වහන්සේගේ උපමා කතාවලින් පෙන්වූයේ එය වපුරන ලද බීජයක් පොළොවේ සැඟවූ අබ ඇටයක්, සඟවන ලද වස්තුවක් හා සඟවා තැබූ ඉතා වටිනා මුතු ඇටයක් ලෙසය. මේ සියලු අවස්ථාවල රාජ්‍යය පැවතියද දෘශ්‍යමාන නොවීය.

ඉශ්‍රායෙලය බලාපොරොත්තුව වූයේ දේවරාජ්‍යය දෘශමාන ආකාරයෙන් හා මහත් උත්සවශ්‍රීයෙන් බලවත් රජතුමෙකු විසින් පාලනය කිරීම වේ.

**මේ කාරණා ඔවුන් ඇසූකල, උන්වහන්සේ යෙරුසලමට සමීපව සිටි බැවින්ද, දෙවියන්වහන්සේගේ රාජ්‍යය වහාම එළිදරව්වේයයි ඔවුන් සිතූ බැවින්ද, උන්වහන්සේ තවදුරටත් උපමාවක් කීසේක. (ලූක් 19:11)**

යේසුස්වහන්සේ පැවසූ උපමාව වූයේ, ඈත රටකට ගොස් තමාගේ රාජ්‍යය නැවත ලබා ගැනීමට ආපසු පැමිණි වංශවත් මිනිසෙකු පිළිබඳව වේ. යේසුස්වහන්සේ යෙරුසලමට ළඟාවන විට, උන්වහන්සේ උන්වහන්සේගේ ඉදිරි මරණය සඳහා සෙනග සූදානම් කරමින් සිටිසේක. මෙම උපමාව මගින් උන්වහන්සේ එළිදරව් කළේ දෘශ්‍යමාන ආකාරයෙන් රාජ්‍යයේ පැමිණීම උන්වහන්සේ නැවත පැමිණීම තෙක් කල්දමන බවය. උන්වහන්සේ නැවත පැමිණි විට එය පිහිටවනු ඇත.

ඉශ්‍රායෙල් ජනතාව විශ්වාස කළේ සැබෑ රජතුමා, දාවිත් රජු යටතේ දෘශමානව පැවති ඒ මහිමාන්විත රාජ්‍යය ඒ ආකාරයෙන්ම ඉක්මණින්ම පිහිටුවන ඇති බවය.

> **ඔහුම මාගේ නාමයට ගෘහයක් ගොඩනගන්නේය, ඔහුගේ රජකමේ සිංහාසනයද සදාකාලේටම ස්ථිරකරන්නෙමි. (2 සාමුවෙල් 7:13)**

යේසුස්වහන්සේ, යෙරුසලමට කොටළුවෙකු පිට පැමිණෙන විට, මනුෂ්‍යයන් බලාපොරොත්තු වුයේ උන්වහන්සේ පැමිණෙන්නේ පරණ ගිවිසුම් කාලයේ පටන්ම අනාවැකියෙන් පැවසු පරිදි යෙරුසලම අගනුවර බවට පත්කරමින් දෘශ්‍යමාන රාජ්‍යය පිහිටුවන බවය. මේ නිසා උන්වහන්සේ නගරයට ඇතුළු වන විට ඔවුහු උන්වහන්සේට රජකෙනෙකු ලෙස ගෞරව කරමින් ප්‍රීති වුහ. ඔවුහු මෙසේ කෑගැසුහ.

> **පැමිණෙන්නාවු අපේ පියවු දාවිත්ගේ රාජ්‍යය ආශිර්වාද ලද්දේය කියාත්, ඉතා උසස්තැන්හි හෝසන්නාය කියාත් මොරගැසුවෝය. (මාර්ක් 11:10)**

එහෙත් එම රාජ්‍යය දෘශ්‍යමාන ආකාරයෙන් පිහිටුවනු නොලබන්නේය. රාජ්‍යයේ පැතිරීම පැහැදිලි කිරීම සඳහා යේසුස්වහන්සේ දැනටමත්, මුහුන් දැමූ පිටි මිශ්‍රණය පිළිබඳ උපමාවක් පවසා ඇත (මතෙව් 13:33). මුහුන්, පිටි මිශ්‍රණය පුරා පැතිරෙන ආකාරයෙන් මෙම රාජ්‍යය නිශ්ශබ්දව, ක්‍රමවත් ලෙස වර්ධනය විය යුතුය.

යේසුස්වහන්සේ දැනටමත්, ඈත රටකට ගොස් තම රාජ්‍යය ආපසු බාර ගැනීමට නැවත පැමිණි වංශවත් මිනිසාගේ උපමාව පවසා තිබේ. එහෙත් ඉශ්‍රායෙල් ජාතිය දේවරාජ්‍යයේ උපමාවන් තේරුම් ගත්තේ නැත. යේසුස්වහන්සේ දෘශ්‍යමාන රාජ්‍යය එවලෙහිම නොපිහිටුවු බැවින්, උන්වහන්සේව රජකෙනෙකු ලෙස පිළිගත් සෙනගම දැන් උන්වහන්සේව ප්‍රතික්ෂේප කළෝය. ඔවුහු උන්වහන්සේට එරෙහි වී උන්වහන්සේව කුරුසිපත් කිරීමෙන් මරණ ලෙස ඉල්ලුහ.

යේසුස්වහන්සේ මෙලොවට පැමිණි අවස්ථාවේ දේවරාජ්‍යය "ළඟා වී" තිබිණි. එහෙත් ඔවුන් බලාපොරොත්තු වු ආකාරයෙන් එය නොපැමිණි බැවින් යුදෙව් සෙනග රාජ්‍යයත්, රජතුමාත් යන දෙකම ප්‍රතික්ෂේප කළහ.

> **උන්වහන්සේ ස්වකීය ස්ථානවලට ආසේක, ස්වකීයයෝ උන්වහන්සේ පිළි නොගත්තෝය. නමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන්වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක. ඔව්හු ලෙයෙන්වත් මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යයාගේ කැමැත්තෙන්වත් නොව දෙවියන්වහන්සේගෙන් උපන්නෝය. (යොහන් 1:11-13)**

මේ ප්‍රතික්ෂේප කිරීම නිසා, දේවරාජ්‍යය ඉශ්‍රායෙල්වරුන්ගෙන් ඉවත්කර, ධර්මිෂ්ඨකමේ ඵල උපදවන සෙනගකට දී ඇති බව යේසුස්වහන්සේ පැවසු සේක.

> **එබැවින් නුඹලාට මම කියමි - දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලාගෙන් අහක්කොට එහි ඵල උපදවන ජාතියකට දෙනු ලබන්නේය. (මතෙව් 21:43)**

මින් යේසුස්වහන්සේ අදහස් කළේ, දේවරාජ්‍යයේ පණිවිඩය විජාතීන් (ඉශ්‍රායෙල් හැර අනෙකුත් සියලුම ජාතීන්) වෙතටද ගෙනයන බවය. එය පිළිගැනීමට හා ඊට ප්‍රතිචාර දැක්වීමට ඔවුහු සුදානම්ව සිටියහ.

ඉශ්‍රායෙල් ජාතියද ඔවුන්ගේ අගනුවර වු යෙරුසලමද විනිශ්චය යටතට පත්වන බව යේසුස්වහන්සේ පැවසු සේක.

**ඔව්හු කඩුමුවහතින් වැටෙන්නෝය. සියලු ජාතින් අතරට වහලුන් මෙන් ගෙනයනු ලබන්නෝය. අන්‍යජාතින්ගේ කාලවල් සම්පූර්ණවනතෙක් යෙරුසලම අන්‍යජාතින් විසින් මඩිනු ලබන්නීය. (ලූක් 21:24)**

ඉශ්‍රායෙලය, රාජ්‍යයද රජතුමාද ප්‍රතික්ෂේප කළ බැවින් අවසාන ආකාරයෙන් රාජ්‍යය දෘශ්‍යමානව පිහිටුවීම රජතුමාගේ ඊළඟ පැමිණීම තෙක් කල්දමන ලදි. මේ ඊළඟ පැමිණීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවැනි පැමිණීම ලෙස හැඳින්වේ.

## තෝරාගත් සෙනගක්

පැරණි ගිවිසුම අනුව, දේවරාජ්‍යය ලොව පුරා පැතිරවීමේ සාමුහික සෙනග සමුහය ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය තෝරාගත් සේක. ඉශ්රායෙලය මෙම වගකීම ඉටුකිරීමට අසමත්විය. අලුත් ගිවිසුමේදි, දේවරාජ්‍යය පැතිරවීමේ සාමුහික කණ්ඩායම ලෙස දෙවියන්වහන්සේ සභාව, එනම් ශුභාරංචිය පිළිගන්නාවු හා එයට ප්‍රතිචාරය දක්වන්නාවු අය තෝරාගත් සේක.

දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය විජාතින් වෙත ගෙන යෑම සඳහා දෙවියන්වහන්සේ තෝරාගත් ප්‍රේරිතයෙකු වු පාවුලුතුමා මෙසේ ලියා ඇත.

**සියලු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තාවු මට මේ අනුග්‍රහය දෙනලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන අන්‍යජාතින්ට දේශනාකරන්නටත්, සියල්ල මැවුවාවු දෙවියන්වහන්සේ තුළ සියලුකාලවල පටන් සැඟවී තිබුණාවු රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසත්ය. එසේ කළේ අපගේ ස්වාමි වු ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රායකරනලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගිය ස්ථානවල අධිපතින්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්නට ලැබෙන පිණිසය. (එපිස 3:8-11)**

දෙවියන්වහන්සේ , දේවරාජ්‍යය මනුෂ්‍යයා උදෙසා ලෝකයේ අත්තිවාරමේ සිටම සුදානම් කළ බව මතක තබා ගන්න. දෙවියන්වහන්සේ සභාව තෝරාගෙන ඇත්තේ රාජ්‍යය පිළිබඳ මේ අභිරහස ලෝකයේ ජාතින්ට එළිදරව් කිරීම පිණිසය. මෙමගින් දෙවියන්වහන්සේගේ සදාතනික පරමාර්ථය ඉටුවනු ඇත.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස සවර්යෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපිස 1:9-10)**

ලොවපුරා දේව රාජ්‍යය පැතිරවීමේ දෘශ්‍යමාන සාමුහික කණ්ඩායම සභාව වේ. පහත දැක්වෙන රූප සටහන අධ්‍යයනය කරන්න.



යේසුස්වහන්සේ සභාවෙන් ඉවත්වුයේ මේ වගකිම සභාවට පැවරීමෙනි.

> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක් : නුඹලා ලොවමුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න. (මාර්ක් 16:15)**

මේ කාර්යය සාක්ෂාත් කිරිමට උන්වහන්සේ ඇදහිලිවතුන්ව සන්නද්ධ කළ සේක.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

අවසානයේදී, සියලුම දේ රජු වූ, දෘශ්‍යමාන රාජ්‍යය පිහිටුවිමට නැවත පැමිණෙන්නාවූ යේසුස් වහන්සේ යටතට සියල්ල පමුණුවනු ලබන්නේය.

## වර්තමාන රාජ්‍යය

“දේවරාජ්‍යය ඔබ තුළ“ බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. එනම්, රජතුමා සිටින්නේ කොතැනකද හා උන්වහන්සේගේ පාලනය පිළිගන්නේ කොතැනකද වර්තමාන දේවරාජ්‍යය එතැන පවති. දේවරාජ්‍යය යනු දෙවියන්වහන්සේගේ පාලනය පවතින ප්‍රදේශයයි. ලෝකයේ මෙම රාජ්‍යය, වන්නේ ඕනෑම අවස්ථාවකදි උන්වහන්සේගේ පාලනය පිළිගන්නාවූ ඕනෑම ප්‍රදේශයක් වේ.

ස්වර්ගයේදි සාතන්ගේ කැරැල්ල සිදු වූ දින සිටම, දේවරාජ්‍යය හා සාතන්ගේ රාජ්‍යය අතර සටනක් පැවතිණි. දෙවියන්වහන්සේට එරෙහි මේ විශ්විය කැරැල්ල සිදුවන ස්ථානය පෘථිවිය වේ. මනුෂ්‍යයාගේ පාපය නිසා පෘථිවිය වෙත ශාපයක් පැමිණි අතර සාතන්, ඔහුගේ දුෂ්ඨ රාජ්‍යය මෙහි පිහිටු විමට මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේය. සාතන් යේසුස්වහන්සේ පරික්ෂා කළ අවස්ථාවේ ඔහු පෘථිවි රාජ්‍යයන් පාලනය කරන බව පැහැදිලිව පෙනුණි.

> **නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලූ රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයද උන්වහන්සේට පෙන්වා : ඔබ බිම වැටි මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කිවේය. එවිට යේසුස්වහන්සේ : සාතන් අහක්ව යව. මක්නිසාද-නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේට නමස්කාර කරව, උන්වහන්සේට පමණක් සේවය කරවයි ලියා තිබේ යැයි ඔහුට කීසේක. (මතෙව් 4:8-10)**

එහෙත් මනුෂ්‍යයාගේ කැරැලි ගැසිම මධ්‍යයේ දෙවියන්වහන්සේ, රජතුමෙකු ලෙස වන උන්වහන්සේගේ සර්වබලධාරිත්වය අත්හැර නැත. එය පිහිටවීම සඳහා වන උන්වහන්සේගේ අභිප්‍රාය උන්වහන්සේ ප්‍රකාශ කර ඇත.

> **ඒ රජුන්ගේ දවස්වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසි කලක නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටුවන සේක. ඒකේ ආණ්ඩුව අන් සෙනගකට අත්හරිනු නොලබන්නේය, (දානියෙල් 2:44)**

දේවරාජ්‍යය දැන් මෙහි ඇත. එය ලෝකාන්තිමයේදී දෘශ්‍යමානව පිහිටවන තෙක් අප කිසිවක් නොදන්නා අනාගතයේදි ඇති වන දෙයක් නොවේ. රජතුමාගේ පාලනය, අද ඇදහිලිවන්තයන්ගේ හදවත් තුළින් පිළිගෙන ඇත. රජතුමාගේ පාලනය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ සභාව අද පිළිගෙන ඇත. දෙවියන්වහන්සේට ප්‍රේම කරන දේවරාජ්‍යයට ඉපදුනු තම ජිවිත රටාවන් සඳහා දේවරාජ්‍යයේ මුලධර්ම පිළිගත්, හා රජතුමා ලෙස ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පාලනය පිළිගත් සෙනග සිටින්නේ නම් දේවරාජ්‍යය එතැන වේ.

දැන් දේවරාජ්‍යය "රහසක්" ලෙස පැවසේ (මාර්ක් 4:11). ඊට හේතුව එය නිරීක්ෂණය කළ හැකි ස්වභාවික බල සීමාවක් තුළ නොපවතින බැවිනි.

> **දෙවියන්වහන්සේගේ රාජ්‍යය කොයිකලක එන්නේදැයි ඵරිසිවරු විසින් ඇසූ බැවින් උන්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : දෙවියන්වහන්සේගේ රාජ්‍යය පෙරහැර සහිතව නොඑන්නේය. (ලූක් 17:20)**

වර්තමානයේ දේවරාජ්‍යය පෘථිවිය මත නිර්ණය කළ හැක්කේ ආත්මිකව පමණි. එය ආත්මිකව මිස තවමත් දෘශ්‍යමානව පිහිටුවා නැත. දැන් දේවරාජ්‍යය දැක ගත හැකිවන්නේ ස්වර්ගයේදී පමණි. මෙම ස්වර්ගය ඉහළ ආකාශය ගැන කථා කරන විට ඇති ස්වර්ගය නොවේ. යේසුස්වහන්සේ පෘථිවියට පැමිණීමට පෙර පිවත් වූ ස්වර්ගයයි (යොහන් 17:5). එනම් උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටිනු පසු ඔසවාගනු ලැබූ ස්වර්ගයයි (ක්‍රියා 1:9-11).

ස්වර්ගය යනු දෙවියන්වහන්සේත් යේසුස්වහන්සේත් දේවදූතයනුත් දෘශ්‍යාකාරයෙන් දැන් වාසය කරන ස්ථානය වේ. ස්වර්ගය යනු දේවරාජ්‍යය ස්ථිර, දෘශ්‍යකාරයෙන් පිහිටු වීම පිණිස යේසුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණෙන තෙක් දැන් සිටින ස්ථානය වේ. යේසුස්වහන්සේ ස්වර්ගයේ සිටින අතරතුර මැදහත්කාරයෙකු ලෙස සේවය කරන සේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු භාගයෙහි වැඩ සිටිමින් තවමත් පොළවේ සිටින ඇදහිලිවතුන් වෙනුවෙන් මැදහත්කාරකම් කරන සේක (හෙබ්‍රෙව් 7:25).

## අනාගත රාජ්‍යයය

දේවරාජ්‍යය ළංවී ඇති බව හා එය ඔවුන් මධ්‍යයේ පවතින බව යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසුවත් දේවරාජ්‍යයේ අනාගත ආකාරය ගැනද උන්වහන්සේ පැවසූ සේක. "ඔබගේ රාජ්‍යය ඒවා" ලෙස යාච්ඤා කිරීමට උන්වහන්සේ තම ගෝලයන්ට පැවසූ සේක (මතෙව් 6:10).

යේසුස්වහන්සේ කල්වරියට යෑමට පෙර මෙම "පැමිණෙන" හෝ අනාගත දේව රාජ්‍යය උන්වහන්සේ විසින් පිහිටුවන ලබනු ඇතැයි ගෝලයෝ බලාපොරොත්තු වූහ. යේසුස්වහන්සේ මිය ගිය විට මේ බලාපොරොත්තුව සුන් විය. උන්වහන්සේ නැවත නැගිටුනු පසු ඔවුන්ගේ බලාපොරොත්තුව නැවත පණ ගැන්විනි. නැවත නැගිටීමේ හා උන්වහන්සේ ස්වර්ගයට යෑමේ කාලය අතරතුර දේවරාජ්‍යය පිළිබඳ බොහෝ දේ යේසුස්වහන්සේ ගෝලයන්ට කතා කළ සේක. මේ නිසා "ස්වාමීනි, මේ කාලයේදී ඔබ ඉශ්‍රායෙල් රාජ්‍යය නැවත පිහිටුවා දෙනසේක්ද" යි ඇසීමට ගෝලයෝ පෙළඹුනාහ (ක්‍රියා 1:6). යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක් : පියාණන් වහන්සේ තමන්ගේම බලය යටතේ තබාගත් කාලයන්ද ප්‍රස්තාවන්ද දැනගැනීම නුඹලාට අයිති නැත. (ක්‍රියා 1:7)**

දේවරාජ්‍යය පැමිණීම ස්ථිරය, එහෙත් දෘශ්‍යමාන ලෙස එය පිහිටුවන වේලාව පියාණන්වහන්සේ මත රඳා පවතී. අවසාන ආකාරයෙන් රාජ්‍යය පිහිටුවීමට පෙර මෙලොව සිදු විය යුතු බොහෝ දේ යේසුස්වහන්සේ පැවසූ සේක. මෙම ලකුණු දෙන ලද්දේ එම කාලය ළංවන විට අපට දැනගැනීමටය. ඔබට මේ ලකුණු මතෙව් 24 හා 25 පරිච්ඡේදවලත්, මාර්ක් 13 පරිච්ඡේදයේ හා ලූක් 17:20-37, 21:8-36 ත් කියවිය හැකිය. මේ දේවල් සිදුවීම ආරම්භ වන විට, දේවරාජ්‍යය දෘශ්‍යමාන ලෙස පිහිටු වීම ළංවී ඇති බවට ලකුණු යයි යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූ සේක.

> **එලෙසම මේ දේ සිදුවෙනවා දකින කල, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟ බවත් දැනගනිල්ලා. (ලූක් 21:31)**

## සියලු ජාතීන් වෙත ශුභාරංචිය ප්‍රකාශවීම අවසාන කාලය ආරම්භවීමේ ලකුණකි

රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොවමුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය, එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)

## යේසුස්වහන්සේ මෙලොවට නැවත පැමිණෙනු ඇත

ගලීලයේ මනුෂ්‍යයෙනි, නුඹලා ස්වර්ගය දෙස බල බලා සිටින්නේ මක්නිසාද? නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුන්ට කීවෝය. (ක්‍රියා 1:11)

## යේසුස්වහන්සේ ලෝකයේ ඇති සියලුම රාජ්‍යයන් පරාජය කරනු ඇත

උන්වහන්සේ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැතිකළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාරදෙන සේක. මක්නිසාද උන්වහන්සේ සියලු සතුරන් තමන්වහන්සේගේ පාද යට දමන තුරු රජකම් කරන්ට ඕනෑය. (1 කොරින්ති 15:24-25)

සත්වෙනි දේවදූතයාද පිම්බේය, එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම්කරනසේකැයි කියන මහත් ශබ්ද ස්වර්ගයෙහි විය. (එළිදරව් 11:15)

## සාතන් හා ඔහුගේ රාජ්‍යයේ සියලුදෙනා පරාජය කරනු ඇත

ඔවුන් මුළා කළ යක්ෂයා වනාහි, මෘගයාද බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද ගෙන්දගම්න්ද යුත් විලට හෙළනු ලැබුවේය, ඔහු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:10)

## සියලු ජාතීන් දේවරාජ්‍යයට පැමිණෙනු ඇත

නැගෙනහිරින්ද බස්නාහිරින්ද බොහෝ දෙනෙක් ඇවිත්, ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සමඟ ස්වර්ග රාජ්‍යයෙහි හිඳගන්නෝය. (මතෙව් 8:11)

## සියලු සෙනඟ යේසුස්වහන්සේ රජතුමා ලෙස පිළිගනු ඇත

එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන් සේක. එසේකළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් එත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:9-11)

එවිට මහත් සමූහයකුගේ හඬ මෙන්ද බෝහෝ ජලඝෝෂාවක් මෙන්ද බලවත් ගර්ජනාවල ශබ්දය මෙන්ද හඬක් මට ඇසුණේය. එනම්: සර්වපරාක්‍රම වූ අපගේ දෙවි වූ ස්වාමින්වහන්සේ රජකම් කරන බැවින්, හාලෙලූයා! අපි අතිශයෙන් ප්‍රීති සන්තෝෂවෙමු. (එළිදරව් 19:6,7)

## සියලු මනුෂ්‍යන් ජීවත්වන හා මළාවූ අය දෙවියන්වහන්සේ විසින් විනිශ්වය කරනු ඇත

> **දෙවියන්වහන්සේ ඉදිරියෙහිද, ජීවත්ව සිටින්නන් හා මළවුන්ද විනිශ්වය කරන්ට සිටින ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඉදිරියෙහිද, උන්වහන්සේගේ ප්‍රකාශ වීම සහ උන්වහන්සේගේ රාජ්‍යයේ නාමයෙන් මා විසින් නුඹට අණ කරන්නේ නම්: (2 තිමෝති 4:1)**

> **මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියේ සිටිනවා දුටිමි, පොත්ද දිගහරිනු ලැබුවේය. ජීවන-පොතවන තවත් පොතක් දිග හරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියනලද දේවලින් විනිශ්වය කරනු ලැබුවෝය. සමුද්‍රය එහි උන් මළවුන් පාවා දුන්නේය. මරණයත් පාතාලයත් එහි උන් මළවුන් පාවාදුන්නෝය. ඔව්හු එකිනෙකා තම තමාගේ ක්‍රියා ලෙස විනිශ්වයකරනු ලැබුවෝය. (එළිදරව් 20:12-13)**

> **යමෙකුගේ නම ජීවන-පොතෙහි ලියා නැතිබව සම්බවිද, ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය .(එළිදරව් 20:15)**

යේසුස්වහන්සේ උපමාවක් පවසමින් දේවරාජ්‍යය මුහුදට හෙලූ විශාල දැළකට සමාන කළසේක. ඊට විවිධ වර්ගවල මසුන් අසුවුනද, දැල ගොඩට ගත් පසු හොඳ හා නරක මසුන් වෙන් කෙරුනි (මතෙව් 13:47-48).

උන්වහන්සේ දේවරාජ්‍යය, කිරිඳ හා තිරිඟු වැඩෙන කෙතකටද සමාන කළේය. එහෙත් අවසානයේ හොඳ තිරිඟු, කිරිඳි වලින් වෙන් කරන ලදි (මතෙව් 13:24-30,36-42). තිරිඟු හා කිරිඳි පිළිබඳ උපමාවෙන් යේසුස්වහන්සේ පෙන්වා දුන්නේ දේවරාජ්‍යය පැමිණුනද දුෂ්ඨ මිනිසුන් තවමත් සිටින බවය. ටික කලකට මේ දෙකොටසම එකට ජීවත් වනු ඇත. විනිශ්වයේදි ඔවුන්ව වෙන් කරනු ඇත.

මේ උපමා දෙකෙන්ම පෙන්නුම් කළේ වෙන්කිරීම සිදුවන්නේ විනිශ්වයේදි බවය. අලුත් ඉපදීමකින් දේවරාජ්‍යයට ඇතුලුව සිටින අය දේවරාජ්‍යයට පිළිගනු ඇත. අනෙකුත් සියලු දෙනාම දේවරාජ්‍යයෙන් පලවා හරිනු ලැබේ.

> **ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සියලු අනාගතවක්තෘවරුන්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි සිටිනවාත් නුඹලාම පිටත දමනු ලබනවාත් නුඹලා දකිනල කල, එහි හැඬීමද දත්මිටිකෑමද වන්නේය. (ලූක් 13:28)**

## දේවරාජ්‍යය දෘශ්‍ය ආකාරයෙන් පිහිටවනු ලබන්නේය

> **සියලු ජනයන්ද ජාතින්ද භාෂාවන්ද උන්වහන්සේට සේවය කරන පිණිස ආණ්ඩුබලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්වහන්සේට දෙනලද්දේය. උන්වහන්සේගේ ආණ්ඩුව පහ නොවන සදාකාල ආණ්ඩුවක්ය, උන්වහන්සේගේ රාජ්‍යයද නැති නොවන්නේය. (දානියෙල් 7:14)**

## ඇදහිලිවතුන් යේසුස්වහන්සේ සමඟ එම රාජ්‍යයේ රජ කරනු ඇත

> **මම ජය ගෙන මාගේ පියාණන්වහන්සේ සමඟ උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත් සේම, ජය ගන්නාටත් මාගේ සිංහාසනයෙහි මා සමඟ ඉඳගන්ට දෙන්නෙමි. (එළිදරව් 3:21)**

## අලුත් අහසක් සහ අලුත් පොළවක් පැමිණෙනු ඇත

අලුත් අහස සහ පොළව ගැන එළිදරව් 21 හා 22 පරිච්ඡේදවලින් කියවිය හැක. යෙරුසලම ස්වාමින්වහන්සේගේ සිංහාසනය වන අතර සියලු ජාතිහු ඒ ළඟට රැස්වන්නෝය.

**ඒ කාලයේ යෙරුසමට : ස්වාමින්වහන්සේගේ සිංහාසනයයි කියනවා ඇත, සියලු ජාතිහුද ඒක ළඟට ස්වාමින්වහන්සේගේ නාමය නිසා යෙරුසලමට රැස්වන්නෝය. ඔවුහු නපුරු සිත්වල මුරණ්ඩුකමේ හැටියට නොහැසිරෙන්නෝය. (යෙරෙමියා 3:17)**

## සාරාංශය

දැන් අපි දේවරාජ්‍යයේ අතීතයේ, වර්තමානය හා අනාගතය සාරාංශ ගත කරමු.

පහත දැක්වෙන සටහනද ඉන්පසු ඊළඟට ඇති සාරාංශය ද අධ්‍යයනය කරන්න.

←------------------- **ස්වර්ගයේ ඇති දේවරාජ්‍යය** ------------------------→



පෘථිවිය මත දේවරාජ්‍යය



රජතුමාගේ නැවත පැමිණීම හා අවසාන කාලය



දේවරාජ්‍යය, එහි අවසාන දෘශ්‍යමාන ආකාරයෙන් පිහිටුවීම

පතුරවන්නේ -----------→මිනිසා ------------→ ඉශ්‍රායෙලය-------------→සභාව-----------→

රූප සටහනකට ඉහළින් ඇති තිත් ඉරි දෙස බලන්න. ඉන් පෙන්නුම් කෙරෙන්නේ පොළොව මැවීමටත් පෙර දේවරාජ්‍යය, ස්වර්ගයේ පැවති අතර සදාතනිකවම එය පවතින බවය.

රූප සටහනට පහළින් ඇති ඊතල බලන්න. දෙවියන්වහන්සේ පෘථිවිය මැව්වේ උන්වහන්සේගේ දේවරාජ්‍යයේ ව්‍යාප්තියක් ලෙසය. උන්වහන්සේගේ රාජ්‍යය ව්‍යාප්ත කිරීමේ උපකරණය ලෙස මනුෂ්‍යයා තෝරාගත් සේක. එහෙත් මනුෂ්‍යයා ඔහුගේ වගකීමෙහි අසමත් විය.

ඉන්පසු උන්වහන්සේගේ රාජ්‍යය ව්‍යාප්ත කිරීමට උන්වහන්සේ ජාතියක් තෝරාගත් සේක. එහෙත් ඉශ්‍රායෙලය තම වගකීම ඉටුකිරීමට අපොහොසත් විය. ඔවුහු දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති වෙනුවට මිථ්‍යාදෘෂ්ටි දෙවිවරුන් සොයන්ටත් ලෞකික ප්‍රමිතින් පිළිගන්නටත් පටන් ගත්හ.

ඉන්පසු දෙවියන්වහන්සේ තම පුත්‍ර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එවූ සේක. පළමු මිනිසා වූ ආදම් අසමත් වූ දෙය කිරීමට දෙවැනි මනුෂ්‍යයා වූ යේසුස්වහන්සේ සමත්වූ සේක. උන්වහන්සේ දේවරාජ්‍යය පෘථිවියට ගෙන ආසේක. මේ නිසා ස්වාභාවික ලෝකයේ තවම ජීවත් වුවද නැවත ආත්මික ඉපදීම තුළින් මිනිසාට දේවරාජ්‍යයේ ජීවත්වීමට හා දේවරාජ්‍යය ඔහු තුළ පැවතිමට මාර්ගයක් යේසුස්වහන්සේ සැළසූ සේක. රජතුමාත් උන්වහන්සේගේ රාජ්‍යයත් ප්‍රතික්ෂේප කිරීම නිසා දේවරාජ්‍යයේ දෘශ්‍ය පිහිටුවීම යේසුස්වහන්සේගේ දෙවනි පැමිණීම තෙක් කල්දමන ලදි.

පණිවිඩය හෙවත් දේවරාජ්‍යයේ "ශුභාරංචිය" ව්‍යාප්ත කිරීම සඳහා දෙවියන්වහන්සේ දැන් සභාව තෝරාගෙන ඇත. ලෝකයේ ජාතීන් සමග දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය බෙදා ගැනීම සඳහා උපකරණයක් ලෙස සභාව කටයුතු කරයි. පළමුවෙන් තෝරාගත් සෙනග වන ඉශ්‍රායෙල්වරුන් අසමත් වුවත්, සභාව සමත් වනු ඇත. දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලොවපුරා දේශනා කළ විට රජතුමාගේ දෙවැනි පැමිණීම සිදුවනු ඇත. දේවරාජ්‍යය එහි අවසාන දෘශ්‍යමාන ආකාරයෙන් පිහිටුවනු ඇත අනෙකුත් සියලුම ලෞකික රාජ්‍යයන් පරාජය කෙරෙනු ඇත.

# දේවරාජ්‍යය පිළිබඳ කරුණු

ඔබ දේවරාජ්‍යයේ අතීතය, වර්තමානය හා අනාගතනය ගැන උගත්තෙහිය. මෙම රාජ්‍යය පිළිබඳ තවත් කරුණු කිහිපයක් පහත දැක්වේ.

## එය පාලනය කරනු ලබන්නේ ස්වර්ගයේ ඇති තම සිංහාසනයේ සිට දෙවියන්වහන්සේ වේ.

**ස්වාමින්වහන්සේ තමන් සිංහාසනය ස්වර්ගයෙහි පිහිටවූ සේක, උන්වහන්සේගේ රාජ්‍යයද සියල්ල කෙරෙහි බලපවත්වයි. (ගීතාවලිය 103:19)**

## එය පාලනය කරනු ලබන්නේ වෙනස් නොවන රජකෙනෙකු විසිනි

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයටත් එකාකාරමය. (හෙබ්‍රෙව් 13:8)**

## දේවරාජ්‍යය සදාතනිකය

**ඔබගේ රාජ්‍යය සදාකාලික රාජ්‍යයක්ය, ඔබගේ අධිපතිකමද සියලු පරම්පරාවලම පවත්නේය. (ගීතාවලිය 145:13)**

**උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම් කරනසේක, උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේයයි කීයේය. (ලූක් 1:33)**

**නුමුත් පුත්‍රයා ගැන කථාකොට : දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය සදාකාලේටම පවත්නේය, ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය යුක්තියේ ජයකොන්තයක්ය. (හෙබ්‍රෙව් 1:8)**

**උන්වහන්සේගේ ලකුණු කොපමණ මහත්ද! උන්වහන්සේගේ ආශ්චර්යයෝ කොපමණ බලවත්ද! උන්වහන්සේගේ රාජ්‍යය සදාකාල රාජ්‍යයක්ය, උන්වහන්සේගේ ආණ්ඩුව පරම්පරාවෙන් පරම්පරාවට පවත්නේය. (දානියෙල් 4:3)**

## දේවරාජ්‍යය වෙනස් කිරීම හෝ සෙලවීම හෝ විනාශකිරීම හෝ කළ නොහැකිය

**එහෙයින් සොලවන්ට බැරි රාජ්‍යයක් ලබන්නාවූ අපි, ගෞරවයෙන්ද දේවභයින්ද දෙවියන්වහන්සේට ප්‍රසන්නවන ලෙස සේවයකරන පිණිස, අනුග්‍රහය ඇතුව සිටිමු. (හෙබ්‍රෙව් 12:28)**

## මෙම රාජ්‍යය පටන් ගැන්මේ සිටම සූදානම් කෙරිනි

එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක් : මාගේ පියාණන්ගෙන් ආශිර්වාදලත්තෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම්කර තිබෙන රාජ්‍යය උරුම කරගන්න. (මතෙව් 25:34)

## උන්වහන්සේගේ රාජ්‍යය අප උරුමකර ගැනිම දෙවියන්වහන්සේට අවශ්‍යය

කුඩා රැළ, භය නොවෙල්ලා, මක්නිසාද නුඹලාට රාජ්‍යය දෙන්ට නුඹලාගේ පියාණන්වහන්සේ ප්‍රසන්නව සිටිනසේක. (ලූක් 12:32)

එබැවින් මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක් නියම කළාක්මෙන්ම, මාගේ රාජ්‍යයෙහිද මාගේ මේසයේ කන්ටද බොන්ටද නුඹලාට රාජ්‍යයක් නියමකරමි. (ලූක් 22:29,30)

## මෙම රාජ්‍යය ස්වාමින්වහන්සේය

මක්නිසාද රාජ්‍යය ස්වාමින්වහන්සේගේය. උන්වහන්සේ ජාතීන් කෙරෙහි ආණ්ඩුකාරයාණෝය. (ගීතාවලිය 22:28)

ඔබගේ නාමයට ගෞරවවේවා, ඔබගේ රාජ්‍යය ඒවා. (ලූක් 11:2)

ස්වාමින්වහන්සේ මුළු පොළව කෙරෙහි රජව සිටිනවා ඇත. ඒ කාලයෙහි ස්වාමින්වහන්සේ පමණක්ම දෙවිව සිටිනවා ඇත, උන්වහන්සේ පමණක්ම දෙවිව සිටිනවා ඇත. උන්වහන්සේගේ නාමය පමණක්ම ඇතිවන්නේය. (සෙකරියා 14:9)

## දෙවියන්වහන්සේගේ රාජ්‍යය අනෙකුත් සියලුම රාජ්‍යයන්ට වඩා ශ්‍රේෂ්ඨය

ස්වාමින්වහන්සේ තමන් සිංහාසනය ස්වර්ගයෙහි පිහිටෙවුසේක, උන්වහන්සේගේ රාජ්‍යයද සියල්ල කෙරෙහි බලපවත්වයි. (ගීතාවලිය 103:19)

## දේවරාජ්‍යය සියලුම ජාතීන්ට අයත් සෙනගගෙන් සමන්විත වේ

තවද මනුෂ්‍යයෝ නැගෙනහිරෙන්ද බස්නාහිරින්ද උතුරෙන්ද දකුණෙන්ද ඇවිත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි හිඳගන්නෝය. (ලූක් 13:29)

## දේවරාජ්‍යය මේ ලෝකයේ රාජ්‍යයක් නොවේ

යේසුස්වහන්සේ උත්තරදෙමින් මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ. මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධවී නම්, යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන පිණිස මාගේ සේවකයන් සටන්කරනවා ඇත. (යොහන් 18:36)

## දේවරාජ්‍යය පදනම් වන්නේ ආත්මික මූලධර්ම මත වේ

මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද ශුද්ධාත්මාණන් තුළ ප්‍රීතියද වේ. (රෝම 14:17)

මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශ වන්නේ) කථාවෙන් නොව බලයෙන්ය.
(1 කොරින්ති 4:20)

## දේවරාජ්‍යය මාංශයෙන් හා රුධිරයෙන් උරුම කරගත නොහැකිය

ඉතින්, සහෝදරයෙනි, මාංසයට හා රුධිරයට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්ට බැරි බවත් දිරන ස්වභාවට නොදිරන ස්වභාව උරුමකරගන්ට බැරිබවත් කියමි. (1කොරින්ති 15:50)

යේසුස්වහන්සේ උත්තරදෙමින් : සැබැවක් සැබැවක් නුඹට කියමි - යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක. (යොහන් 3:3)

යේසුස් වහන්සේ උත්තරදෙමින් : සැබැවක් සැබැවක් නුඹට කියමි - යමෙක් වතුරෙන්ද ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහනසේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය. (යොහන් 3:5)

## දේවරාජ්‍යයට ආත්මික යතුරු ඇත

ස්වර්ග රාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. ( මතෙව් 16:19)

මෙම ”ස්වර්ග යතුරු” ගැන මීළඟ පරිච්ඡේදයෙන් පැහැදලි කෙරේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. වෙනත් කොලයක දේවරාජ්‍යයේ අතීත ඉතිහාසය ගැන සංක්ෂිප්ත සාරාංශයක් ලියන්න.

3. වෙනත් කොලයක වර්තමාන දේවරාජ්‍යය ගැන සාරාංශයක් ලියන්න.

4. වෙනත් කොලයක අනාගත දේවරාජ්‍යය විස්තර කෙරෙන සංක්ෂිප්ත සාරාංශයක් ලියන්න.

5. මෙම පාඩමෙන් ඉදිරිපත් කර ඇති දේවරාජ්‍යය පිළිබඳ කරුණු නැවත අධ්‍යයනය කරන්න. ඔබට ඉන් කොපමණ ප්‍රමාණයක් මතකයෙන් ලිවිය හැකිදැයි බලන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඔබ මේ පාඨමාලාවෙන් උගත් පරිදි ආත්මික රාජ්‍යයන් දෙකක් ඇති අතර මෙලොව ජීවත්වන සෑම කෙනෙක්ම මේ දෙකෙන් එකක ජීවත් වේ. ඔබ සාතන්ගේ රාජ්‍යයේ හෝ දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ හෝ වැසියෙකි. ඔබ මෙම පොළොවේ ජීවත් වන තෙක් ඔබ ලෝකයේ රාජ්‍යයකද ජීවත්වන්නෙහිය. මින් අදහස් වන්නේ ඔබ මනුෂ්‍ය රජයක් මගින් පාලනය කරනු රාජ්‍යයක ජීවත්වන බවය.

මනුෂ්‍ය රජයක් දෙවියන්වහන්සේ විසින් මුලින්ම පිහිටුවන ලද්දේ පෘථිවියේ උන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පවත්වාගෙන යාමටත් මනා සංවිධානයක් ඇති කිරීමටත් වේ. මනුෂ්‍ය රජයේ සර්වබලධාරි පාලකයා දෙවියන්වහන්සේ වීම හා එය ක්‍රියා කළ යුත්තේ උන්වහන්සේගේ වචනය, සැලැස්ම හා අභිප්‍රාය අනුව වීම උන්වහන්සේගේ සැලැස්ම විය. එහෙත් දෙවියන්වහන්සේගේ මේ මුල් සැලැස්ම අද ලෝකයේ රජයන් අනුගමනය නොකරන බව පැහැදිලිය. ඒවා දුෂ්ඨ හා පීඩා ගෙන දෙන ඒවා බවට පත්ව ඇත. ඒවා දෙවියන්වහන්සේගේ මූලධර්ම මත ක්‍රියා නොකරයි. මේ බොහෝ රජයන් හා ඒවායේ පාලකයන් දෙවියන්වහන්සේ සිටින බවක්වත් පිළිගන්නේ නැත. ඒවා සාතන් විසින් පාලනය කරන "ලෝකයේ රාජ්‍යයන්" බවට පත්ව ඇත.

ඔබ මනුෂ්‍ය රජයන් යටතේ ජීවත්විය යුතු බැවින් මේ පිළිබඳ බයිබලය පවසන දෙය දැනගැනීම වැදගත්වේ.

## මේ ලෝකයේ රාජ්‍යයන්

I. දෙවියන්වහන්සේගේ රජයන් ආරම්භ කරයි.

A. රජයන් පත්කරන්නේ දෙවියන්වහන්සේය. රෝම 13:1

B. පාලකයෝ දෙවියන්වහන්සේගේ සේවකයෝ වෙති. රෝම 13:4,6

C. දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ කැමැත්ත පරිදි රජයන් පිහිටුවන්නේය, බිඳ දමන්නේය. දානියෙල් 4:32, 5:21, ගීතාවලිය 75:7

II. රජයන් සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම

A. රජයන් සඳහා දෙවියන්වහන්සේගේ මුල් සැලැස්ම වූයේ

1. සෙනගගේ යහපත පවත්වාගෙන යාමට හා අනුබල දීමට රෝම 13:3,4

2. ධර්මිෂ්ඨකමින් යුතුව කටයුතු කිරීමට හා නපුර විනිශ්චය කිරීමට. රෝම 13:3,4

B. උන්වහන්සේගේ සැලැස්මට රජයන් විරුද්ධ විය.

1. ආත්මාර්ථකාමී ආශාවන් ඉටුකර ගැනීමට ආධිපත්‍යය අනිසි ලෙස යොදවයි. 1 රාජාවලිය 21:7-14

2. එවැනි අවස්ථාවල දෙවියන්වහන්සේ පාලකයා හෝ පාලකයන් හෝ කෙරෙහි විනිශ්චය පමුණුවන සේක. 1 රාජාවලිය 21:19

III. රජයෙන් සෙනග වෙත ඇති වගකීම්

A. පාපය කරා සෙනග ගෙන ගිය යුතු නැත. 1 රාජාවලිය 12:28-30

B. යහපත කිරීම සඳහා මනුෂ්‍යයන්ට අනුබල දිය යුතුය. රෝම 13:1-5

C. නපුර විනිශ්චය කළ යුතුය. රෝම 13:3-4

D. අභ්‍යන්තර සාමය පවත්වාගෙන යායුතුය. 1 සාමුවෙල් 30:21-24

E. එහි පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය. ක්‍රියා 22:25-30

IV. පාලකයින් හසුරුවන මූලධර්ම

A. පාලකයා ප්‍රඥාවන්ත විය යුතුය. උත්පත්ති 41:33, ද්වි.නි 1:13

B. පාලකයා දුප්පතුන් හා අවශ්‍යතා ඇත්තන් රැක ගනිමින් උපකාර කළ යුතුය. රෝම 12:4, ගිතාවලිය 82:3-4

C. පාලකයා, දෙවියන්වහන්සේ, දෙවියන්වහන්සේ ලෙස පිළිගත යුතුය. ගිතාවලිය 2:10,11

D. දෙවියන්වහන්සේ නොපිළිගන්නා පාලකයන් පහත් කරනු ඇත.

1. නෙබුකද්නේසර් : දානියෙල් 4

2. බෙල්ෂගර් : දානියෙල් 5

3. හෙරොද් : ක්‍රියා 12:21-23

E. දෙවියන්වහන්සේ තමාට අවනත නොවන පාලකයෙකු වෙනුවට අවනත වන පාලකයෙකු පත් කරනු ඇත. 1 රාජාවලිය 11:11

F. දෙවියන්වහන්සේ, පාපය හේතු කොටගෙන යම් පවුලක් අධිකාරි බලය ඇති තැනකින් ඉවත් කරනු ඇත. 1 රාජාවලිය 14:7-11

G. එක් මනුෂ්‍යයෙකුගේ ධර්මිෂ්ඨකම නිසා, දෙවියන්වහන්සේ ඔහුට උරුමක්කාරයෙකු හෝ පැවත එන්නෙකු සිංහාසනයේ තැබීමට ඉඩ දෙනු ඇත. 1 රාජාවලිය 11:13, ලූක් 1:32

V. රජය හා මනුෂ්‍යයන් අතර ඇති සබඳතාව

A. පාලකයන්ට හා ව්‍යවස්ථාවට විරුද්ධ නොවිය යුතුය. රෝම 13:2

1. ස්වාමින්වහන්සේ වෙනුවෙන් යටත්වන්න. 1 පේත්‍රුස් 2:13-14

2. රජයට අවමන් කිරීම මාංශයේ පාපයකි. 2 පේත්‍රුස් 2:10

3. සෙනග නිති වලට කිකරු විය යුතුය. මාර්ක් 12: 17

B. එවැනි අවනත වීමකට විකල්පයන් තිබේ. දෙවියන්වහන්සේගේ ආඥාවලට හා අභිප්‍රායන්ට විරුද්ධවූ පාලකයන්ගේ ආඥාවලට අවනත නොවිය යුතුය.

1. නික්මයාම 1:17

2. දානියෙල් 3:18

3. ක්‍රියා 5:29

C. මිනිසුන් රජයට දිය යුතුදේ දිය යුතුය. රෝම 13:6-7, මතෙව් 17:25-27

D. සමහර අවස්ථාවල රජය තෝරා ගැනීමේ නිදහස දෙවියන්වහන්සේ දෙන සේක. 1 සාමු 8:4-9

E. පාලකයන් වෙනුවෙන් සෙනග යාච්ඤා කළ යුතුය. 1 තිමෝති 2:1-2

VI. මනුෂ්‍යයන්ගේ රජයන් තාවකාලිකය. සියලුම රජයන් යම්කිසි දිනක පහව යනු ඇත. 1 කොරින්ති 15:24

# සතරවන පරිච්ඡේදය

## දේවරාජ්‍යයට ඇතුළුවීමට යතුරු

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- රාජ්‍යයට ප්‍රවේශ වන යතුරු හඳුනාගැනීමට
- මේ යතුරු දෙන ලද්දේ කවුරුන්ටදැයි හඳුනාගැනීමට
- රාජ්‍යයට ප්‍රවේශ වීම සඳහා පාපයෙන් පසුතැවිලිවීම අවශ්‍ය බව පිළිගැනීමට
- රාජ්‍යයට ඇතුළුවීම සහතික කිරීම සඳහා අඛණ්ඩ ආත්මික වර්ධනය අවශ්‍ය බව අවබෝධ කරගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළෙවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. (මතෙව් 16:19)**

### හැඳින්වීම

සදාතන දේව රාජ්‍යයෙත් එහි රජතුමා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙත් පැවැත්ම ඔබ අධ්‍යයනය කර ඇත. මෙම පරිච්ඡේදයෙන් "රාජ්‍යයට යතුරු" පිළිබඳව ඔබ අධ්‍යයනය කරන විට දේව රාජ්‍යයට ප්‍රවේශය ලබාගන්නා ආකාරය ඔබ සොයාගනු ඇත.

### නියම කරන ලද රාජ්‍යයක්

යේසුස්වහන්සේ ස්වර්ගයට යෑමට පෙර උන්වහන්සේගේ ගෝලයන්ට උන්වහන්සේ මෙසේ කීසේක:

> **එබැවින් මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක් නියම කළාක් මෙන්ම, මාගේ රාජ්‍යයෙහිදී මාගේ මේසයේ කන්ටද බොන්ටද නුඹලාට රාජ්‍යයක් නියමකරමි:... (ලූක් 22:29)**

ලෝකය මුළුල්ලේම රාජ්‍යය පිළිබඳ පණිවිඩය පතුරුවන උන්වහන්සේගේ සභාව ගැනද යේසුස්වහන්සේ කතාකළසේක:

> **මම නුඹට කියමි. නුඹ පේත්‍රුස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි: පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළෙවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. (මතෙව් 16:18-19)**

පේත්‍රුස්, පළමු සභාවේ අත්තිවාරම් ගලක් වන බව යේසුස්වහන්සේ මෙම කොටසින් එළිදරව් කළසේක. ඔහු සභාවේ වැඩීමේ හා සංවර්ධනයේ වැදගත් පංගුකාරයෙකු වන බව මින් අදහස් කෙරේ. පේත්‍රුස්ගේ නමෙහි අර්ථය "පර්වතය" හෝ "ගල" හෝ යන්නය.

ඉන්පසු යේසුස්වහන්සේ තමන්වහන්සේ ගැනම මෙසේ පැවසූසේක. "... *මේ* පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි". මින් පෙන්නුම් කෙරෙන්නේ සභාවේ පැවැත්ම උන්වහන්සේගෙන් ආරම්භ වන බවය. සභාව ගොඩනංවන පර්වතය උන්වහන්සේ වනු ඇත. තවත් කුඩා ගල් තිබිය හැකිය (පේත්‍රුස් වැනි අය). මේ ගල් සභාවේ වැදගත් කොටස් වන්නේය. එහෙත් සභාව ගොඩනගන ව්‍යුහයේ ප්‍රධාන ගල යේසුස්වහන්සේම වන සේක.

යේසුස්වහන්සේ ඉන්පසු මෙම සභාව ගැන ප්‍රකාශ දෙකක් කළසේක:

*පළමුවැන්න,* "නිරයේ දොරටු ඊට එරෙහිව නොපවතිනු ඇතැ"යි උන්වහන්සේ පැවසූසේක. මින් අදහස් වන්නේ සභාව හා සටන් කරන සතුරන් සිටින නුමුත් ඔවුන් පරාජය කරන බවට සහතික කරන බවය.

*දෙවැන්න,* එය අපගේ අධ්‍යයනයට බොහොසේ වැදගත් වේ. උන්වහන්සේගේ රාජ්‍යයේ යතුරු සභාවට දෙන බවට යේසුස්වහන්සේ පොරොන්දු වූසේක.

ස්වභාවික ලෝකයේ යම් ගොඩනැගිල්ලක යතුරු ඔබ ළඟ තිබේ නම් ඔබට එහි ආධිපත්‍යය අයත් වේ.

යේසුස්වහන්සේ මෙම කොටසින් කතා කරන ආධිපත්‍යය, ආත්මික ආධිපත්‍යය වේ. උන්වහන්සේගේ රාජ්‍යයේ ආත්මික යතුරු උන්වහන්සේ සභාවට දුන්සේක. යේසුස්වහන්සේ පැවසුවේ "මම" එය දෙමි යනුවෙනි. සභාවේ බලය හා ආධිපත්‍යය යේසුස්වහන්සේ වෙතින් ගලා එනු ඇත. "දෙන්නෙමි" (අනාගත කාලය) යන වචනය භාවිත කිරීමෙන් අදහස් වන්නේ යේසුස්වහන්සේ ඒ කතා කරන අවස්ථාවේ යතුරු දී නොතිබුණු බවය. බලය නිදහස් කරනු ලැබුවේ ක්‍රියා 2 සඳහන් පරිදි ඇදහිලිවතුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ දුන් පසුවය.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

රාජ්‍යයට යතුරු දීම යනු නිදහස් කිරීමට හා බැඳීමට ඇති බලය වේ. යම් දෙයක් බැඳීම යන්නෙන් අදහස් වන්නේ ඊට විලංගු දැමීමක් හෝ බන්ධනයක් ඇති කිරීමක් හෝ වේ. එය කාමරයක දොරක් වසා යතුරු දැමීමක් වැනිය. යමක් නිදහස් කිරීම යනු, එහි බන්ධනය ඉවත් කිරීමක් වේ. එය කාමරයකට ඇතුළු වීමට දොර විවෘත කිරීමක් වැනිය.

සභාවට ආධිපත්‍යයේ ස්ථානයක් තිබේ. එය තුළ දේව රාජ්‍යයේ යතුරු ඇත. ලෝකයේ ජාතීන් සඳහා දේව රාජ්‍යයට ආත්මික දොරටු විවෘත කරනු ලබන උපකරණය එය වේ. රාජ්‍යයට යතුරු භාවිත කරන පළමු තැනැත්තා පේත්‍රුස් වනු ඇත. ඔහු සේවයේ දොරටු ලෝකයේ අන්‍යජාතීන්ට විවෘත කරනු ඇත.
යහපත් ආත්මික බලවේග නිදහස් කිරීමටත් නපුරු බලවේග බැඳ තැබීමටත් සභාවට බලය ලැබෙනු ඇත. ඇදහිලිවතුන් මුහුණ දෙන සෑම අසීරු අවස්ථාවකදීම ජයග්‍රහණය සඳහා යතුර වන්නේ බැඳ තැබීම හා නිදහස් කිරීම වේ.

## රාජ්‍යයට ඇතුළු වන්නේ කෙසේද?

යේසුස්වහන්සේ රාජ්‍යයේ යතුරු සභාවට දුන්සේක. එහෙත් සුවිශේෂීව, දේවරාජ්‍යයට ඇතුළුවීම ලබාගන්නේ කෙසේද?

ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව සේවා කාලයේ ආගමික නායකයෙකු වූ නිකදේමුස්ගේ කතාව යොහන් 3:1-21හි වාර්තා කර ඇත. ඔහු යේසුස්වහන්සේ වෙතට පැමිණියේ දේවරාජ්‍යයට ප්‍රවේශ වීමේ ආශාව ඇතිව හා එමගින් සදාතන ජීවනය උරුම කරගැනීමටය. යේසුස්වහන්සේ ඔහුට මෙසේ පැවසූසේක.

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි-යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක. (යොහන් 3:3)**

නිකදේමුස් ව්‍යාකුල විය. ඔහු යේසුස්වහන්සේගේ මෙසේ ඇසුවේය.

**නිකොදේමුස් උන්වහන්සේට කථාකොට: මනුෂ්‍යයෙක් මහලුව සිටියදී උපදින්ට පුළුවන් කොහොමද? දෙවෙනි වර මවුකුසට ඇතුල්ව උපදින්ට පුළුවන්දැයි උන්වහන්සේට කීවේය. (යොහන් 3:4)**

යේසුස්වහන්සේ කතා කළ "අලුතෙන් ඉපදීම" ශාරීරික උපතක් නොවන බව උන්වහන්සේ නිකදේමුස්ට පැහැදිලි කළසේක. ශාරීරික උපතින් ඔබ මෙලොව රාජ්‍යයක යම් ජාතියක පුරවැසියෙකු සේ ඉපදෙයි.

ස්වභාවික උපතේදී ඔබ ස්වභාවධර්මයේ මූලික පාපය උරුම කරගන්නේය.

**බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි; මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ්ගත්තාය. (ගීතාවලිය 51:5)**

දේවරාජ්‍යය ආත්මික රාජ්‍යයක් බැවින් ඔබ ඊට ඉපදිය යුත්තේ ආත්මික උපතකිනි. ඔබගේ වාසභූමිය සාතන්ගේ රාජ්‍යයේ සිට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට මාරු කළ යුතුය. යේසුස්වහන්සේ මෙසේ පැවසුසේක:

**මාංසයෙන් උපදින දේ මාංසයය; ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මයය. නුඹලා අලුතෙන් උපදින්ට ඕනෑයයි මා කීවාට පුදුම නොවන්න. (යොහන් 3:6-7)**

මාංශය හා රුධිරය සහිත ශරීරයකින් දේවරාජ්‍යයට ඇතුළු විය නොහැකි බව පාවුලුතුමා පැහැදිලි කළේය.

**ඉතින් සහෝදරයෙනි, මාංසයට හා රුධිරයට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්ට බැරි බවත් දිරන ස්වභාවට නොදිරන ස්වභාව උරුමකරගන්ට බැරි බවත් කියමි. (1 කොරින්ති 15:50)**

ඔබ දේවරාජ්‍යයට ඇතුළු වී එම රාජ්‍යයේ උරුමක්කාරයන් වන්නේ ආත්මිකව නැවත උපතකිනි. නැවත ඉපදීමේ ක්‍රමය වන්නේ යේසුස්වහන්සේ ඔබගේ පාපය සඳහා දඬුවමක් වශයෙන් මැරුණු බව විශ්වාස කිරීම වේ. ඔබ, ඔබගේ පාප සඳහා පසුතැවිලි වී, කමාව ඉල්ලා, උන්වහන්සේ කෙරෙහි විශ්වාස තැබිය යුතුය.

**මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවුවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහන් 3:16-17)**

(පාපය වෙනුවෙන් පසුතැවිලි වීම හා දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම ගැන හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ඇදහිල්ලේ පදනම"* නමැති පාඨමාලාවෙන් ඉගැන්වේ. ඔබ නැවත ඉපදීමේ අත්දැකීම ලබා නොමැති නම් මේ ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීමට එම පාඨමාලාව ලබාගන්න).

සාතන්ගේ රාජ්‍යයෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට මාරු විය හැක්කේ යේසුස්වහන්සේ තුළිනි.

**පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත්සේක. (කොලොස්සි 1:13)**

# පසුතැවිලිවීමද? විප්ලවයද?

දේවරාජ්‍යය පැතිරීම සඳහා යේසුස්වහන්සේ මෙලොවට පැමිණි විට උන්වහන්සේ රජතුමා වශයෙන් පිළිගත් සමහරුන් සිතුවේ එම රාජ්‍යය විප්ලවයකින් පැමිණෙන බවය. ඔවුන් සිතුවේ, ලෝකයේ දැනට පැවති පාලනය කරන බලවේග වලට එරෙහිව සැබෑ විප්ලවයක් පැමිණෙන බවය. එහෙත් උන්වහන්සේගේ රාජ්‍යයට ඇති යතුර විප්ලවය නොව පසුතැවිලිවීම බව යේසුස්වහන්සේ ඉගැන්වූසේක.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින් මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ. මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධවී නම්, යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන පිණිස මාගේ සේවකයන් සටන් කරනවා ඇත. නුමුත් දැන් මාගේ රාජ්‍යය මෙලොවින් නොවේයයි කීසේක. (යොහන් 18:36)**

> **යොහන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනාකරමින්: කාලය සම්පූර්ණවිය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලිවී ශුභාරංචිය අදහාගන්නැයි කීසේක. (මාර්ක් 1:14-15)**

> **එතැන් පටන් යේසුස්වහන්සේ: පසුතැවිලිවෙන්න; මක්නිසාද ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

යේසුස්වහන්සේ කුරුසිය මත මැරුණු විට උන්වහන්සේ දෙපස කුරුසි දෙකක සොරුන් දෙදෙනෙකුද කුරුසිපත් කෙරිණි. ඉන් එක් කෙනෙක් පසුතැවිලිවී මෙසේ ඇසුවේය:

> **තවද ඔහු: යේසුස්වහන්ස, ඔබගේ රාජ්‍යයෙන් යුක්තව ඔබ එන කල මා සිහිකළ මැනවයි කීවේය. උන්වහන්සේද: සැබවක් නුඹලාට කියමි-අදම නුඹ මා සමග පරාදීසයෙහි සිටින්නෙහි යයි කීසේක. (ලූක් 23:42-43)**

දේවරාජ්‍යයට ප්‍රවේශ වීමේ එකම මාර්ගය පසුතැවිලි වීම වේ.

රාජ්‍යය සඳහා මාර්ගය තමන් බව ව්‍යාජ දිවැසිවරුන් හා ව්‍යාජ ධර්මයන් පවසන බවට යේසුස්වහන්සේ අනතුරු ඇඟවූසේක.

> **පටු දොරටුවෙන් ඇතුල්වෙන්න. මක්නිසාද විනාශයට යන දොරටුව විශාලය, පාරත් පළලය, එයින් ඇතුල්වන්නෝද බොහෝය. මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය, පාර අවහිරය, ඒක සම්බවන්නේ ස්වල්ප දෙනෙකුටය. (මතෙව් 7:13-14)**

දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා ඇත්තේ එකම මාර්ගයකි. ඒ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි.

සදාතන ජීවනයට දැන් දොරටුවෙන් ඇතුළු විය යුතු බවට යේසුස්වහන්සේ අනතුරු ඇඟවූසේක. මක්නිසාද යම් දිනෙක එම ප්‍රවේශයන් වසා දමන බැවිනි.

> **පටු දොරකඩින් ඇතුල්වෙන්ට වීර්යකරන්න. මක්නිසාද බොහෝ දෙනෙක් ඇතුල්වෙන්ට සොයන නුමුත් බැරිවන්නේයයි නුඹලාට කියමි. ගෙයි ස්වාමියා නැගිට දොර වැසුවායින් පසු නුඹලා පිටත සිට දොරට තට්ටුකරන්ට පටන්ගෙන: ස්වාමිනි, අපට දොර ඇරිය මැනවයි කියන කල, උන්වහන්සේ උත්තරදෙමින්: නුඹලා කොතැනින් ආවාද කියා නොදනිමියි නුඹලාට කියන්නේය. (ලූක් 13:24-25)**

දැන් දේව රාජ්‍යයට දොර විවෘතය. පාපය ගැන පසුතැවිලිවීමෙන් දැන් ඔබට ඇතුළු විය හැකිය. දෙවියන්වහන්සේ ලෝකය විනිශ්චය කරන අවධියේ ඊට පරක්කු වැඩිය. එවිට දොරටු වසා තැබෙනු ඇත.

## ඇතුළුවීම පිළිබඳ උපමා කතාවන් තුනක්

ලූක් 15:1-32හි යේසුස්වහන්සේ උපමා ගණනාවක් පවසා ඇත. ඔබ උපමා කතා පිළිබඳව මෙම පාඩමාලාවෙන් පසුව ඉගෙන ගන්නවා ඇත. උපමා කතා යනු ආත්මික සත්‍යයන් පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ යොදාගත් ස්වභාවික නිදර්ශන වේ. නැතිවූ බැටළුවා, නැතිවූ කාසිය හා නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමා කතා ලූක් 15හි කියවන්න. මේ සියල්ල දේවරාජ්‍යයට ඇතුළු වීම පිළිබඳව වේ.

- නැතිවූ බැටළුවා සොයා යන එඬේරා පිළිබඳ උපමා කතාවෙන් පෙන්නුම් කෙරෙන්නේ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ රාජ්‍යයට ආත්මිකව නැතිවූ අය ආපසු ගෙන ඒමට ගන්නා උත්සාහය වේ.

- නැතිවූ කාසිය සොයා යන ස්ත්‍රිය පිළිබඳ උපමා කතාවෙන් පෙන්නුම් කෙරෙන්නේ පාපය තුළින් නැතිවූවන්ට දේවරාජ්‍යයට මගපෙන්වීම සඳහා ඔබ කෙතරම් උද්යෝගයකින් කටයුතු කළ යුතුද යන්න ගැනය.

- නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමා කතාවෙන් පෙන්නුම් කෙරෙන්නේ දේවරාජ්‍යයේ උරුමක්කාරයකු වශයෙන් ඔබට අයත් තැන නැවත ලබාගැනීමට පසුතැවිලි වීමේ මූලධර්මය යොදාගත හැකි ආකාරය වේ.

## ඇදහිල්ල එක්කිරීම

ඔබ දේවරාජ්‍යයට ඇතුළු වන්නේ දෙවියන්වහන්සේත් උන්වහන්සේගේ පුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේත් කෙරෙහි ඇති ඇදහිල්ල තුළිනි.

> **මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, අසන්නඃ ඇදහිල්ලෙහි ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරා නොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට අගෞරවකළහුය. (යාකොබ් 2:5)**

කෙසේවුවද ප්‍රේරිත වූ පේත්‍රුස්තුමා කතාකරන්නේ අලුත් උත්පත්තියේ අත්දැකීම් ඔබගේ ජීවිතය තුළ වර්ධනය කරගැනීමට ඔබ සොයා යා යුතු ආත්මික ගුණාංග පිළිබඳව වේ.

> **එසේය, මේ කාරණය නිසාම මුළු උත්සාහයෙන් නුඹලාගේ ඇදහිල්ල සමග ගුණයද, ගුණය සමග දැනගැන්මද, දැනගැන්ම සමග පමණ දැන ක්‍රියාකිරීමද, පමණ දැන ක්‍රියාකිරීම සමග ඉවසිල්ලද, ඉවසිල්ල සමග දේවභක්තියද, දේවභක්තිය සමග සහෝදර ස්නේහයද, සහෝදර ස්නේහය සමග ප්‍රේමයද සපයාගන්න. මක්නිසාද මේවා නුඹලාට තිබේ නම්, වැඩිවේ නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමෙහි කම්මැලි බවටවත් අඵල බවටවත් පැමිණෙන්ට ඒවා නුඹලාට ඉඩ නොදෙයි. නුමුත් මේවා නැති තැනැත්තේ තමාගේ පරණ පව්වලින් පවිත්‍ර කරනු ලැබූ බව මතකනැතිකොට, ළඟ තිබෙන දේ පමණක් බලමින්, අන්ධව සිටියි. එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීමද තෝරාගැනීමද ස්ථිර කරගන්න පිණිස වඩා කඩිසරව ක්‍රියාකරන්න. මක්නිසාද නුඹලා මේ දේ කරනවා නම්, කිසි කලකත් පැකිලෙන්නේ නැත. මක්නිසාද මෙසේ අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාල රාජ්‍යයට ඇතුල්වීම නුඹලාට බොහෝසේ දෙනු ලැබේ. (2 පේත්‍රුස් 1:5-11)**

ඔබ ඇදහිල්ල තුළින් එම රාජ්‍යයට ඇතුළු වූ පසු දේවරාජ්‍යය පාලනය කෙරෙන මූලධර්ම හා සමග ජීවිත ශෛලියක් ඔබ වර්ධනය කරගත යුතුය. ඔබ මෙය නොකළහොත් දෙවියන්වහන්සේ ඔබ පාපයෙන් පිරිසිදු කළ බව අමතක වී ඔබගේ පැරණි පාපී ජීවිත ශෛලියටම ආපසු යනු ඇත.

ඔබ ආත්මික පරිණතභාවය ලැබුවහොත් දේවරාජ්‍යයට ඇතුළුවීම සහතික කෙරෙන බව පේත්‍රුස්තුමා පවසයි. මෙම පාඨමාලාවේදී ඔබ දේවරාජ්‍යයේ ජීවත්වීම සඳහා අවශ්‍ය මූලධර්ම ඉගෙන ගන්නා අතර එමගින් ආත්ම පරිණතභාවය ලබාගන්නවා ඇත.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දේවරාජ්‍යයේ යතුරු දෙන ලද්දේ කවරෙකුටද?

3. දේවරාජ්‍යයට යතුරු කවරේද?

4. සාතන්ගේ රාජ්‍යයෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට මාරුවීමට ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද?

5. දේවරාජ්‍යයට ඇතුළුවීමට නිකදේමුස් කළ යුත්තේ කුමක්දැයි යේසුස්වහන්සේ ඔහුට පැවසුසේක්ද?

6. 2 පේත්‍රුස් 1:5-11 කොටසින් උගන්වන්නේ කවරක්ද? (මෙම පද නැවත කියවීමට ඔබට බයිබලය භාවිත කළ හැකිය)

7. යම් දෙයක් බැඳ තැබීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

8. යම් දෙයක් නිදහස් කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

රජතුමා, රාජ්‍යය හා රාජ්‍යයේ මූලධර්ම මත පදනම් වූ යේසුස්වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳ සංක්ෂිප්තයක් ඔබ ඉහත පරිච්ඡේදයකින් උගත්තෙහිය. එම සංක්ෂිප්තය මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් යන ශුභාරංචි සතර සම්බන්ධ කරන ලදි.

දැන් ඔබ එක් ශුභාරංචියක් විස්තරාත්මකව ඉගෙන ගන්නවා ඇත. මතෙව් පොත සියලුම ඇදහිලිවන්තයන් වෙනුවෙන් ලියන ලද්දක් වුවද මුලින්ම ලියන ලද්දේ යුදෙව්වන් උදෙසා වේ. යේසුස්වහන්සේ පොරොන්දු වූ මෙසියස්වහන්සේ ලෙස මතෙව් ඉදිරිපත් කර ඇති අතරම යේසුස්වහන්සේ යුදෙව්වරුන්ගේ රජ බව අවධාරණය කර ඇත. යේසුස්වහන්සේ ඉගැන්වූ දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචියක්ද මතෙව් අවධාරණය කර ඇත. මෙම අවධාරණය නිසා බයිබලයේ ඇති දේවරාජ්‍යය වෙත බොහෝ සේ යොමු වූ පොත් අතුරින් එක් පොතක් මතෙව් වේ. "රාජ්‍යය" යන වචනය මතෙව් 50 වරකට වඩා භාවිත කර ඇති අතර "ස්වර්ගීය රාජ්‍යය" යන්න මුළු පොත පුරාම භාවිත කර ඇත.

රජතුමා, උන්වහන්සේගේ රාජ්‍යය හා රාජ්‍ය මූලධර්ම පදනම් කරගෙන මතෙව් පොත අධ්‍යයනය කිරීමට පහත දැක්වෙන සංක්ෂිප්තය භාවිත කරන්න.

## පළමුවන කොටස: රජතුමාගේ පෙළපත
**1:1-17**

1. හැඳින්වීම: 1:1

2. පෙළපතට අයත් පුද්ගලයන්: 1:2-16

3. පෙළපතෙහි සැලැස්ම: 1:17

## දෙවන කොටස: රජතුමාගේ උපත හා ළදරු කාලය
**1:18-2:23**

1. පිළිසිඳගැනීම: 1:18-23

2. උපත: 1:24-25

3. උපත හා සම්බන්ධ සිද්ධීන්: 2:1-23

   අ. ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම හා හෙරොද්ගේ කුමන්ත්‍රණය: 2:1-12
   ආ. මිසරයට පලායෑම: 2:13-15
   ඇ. හෙරොද්ගේ පළිගැනීම: 2:16-18
   ඈ. නාසරෙත්හි නිවසට නැවත පැමිණීම: 2:19-23

## තෙවන කොටස: සූදානම්වීම
**3:1-4:11**

1. රජතුමාගේ පැමිණීම සඳහා පිළියෙලවීම : 3:1-17

අ. යොහන් බව්තිස්තගේ සේවය හා පණිවිඩය 3:1-12
ආ. රජතුමාගේ බව්තිස්ම වීම 3:13-17

2. රජතුමා පිළියෙල වීම: 4:1-11

අ. සාතන් විසින් උන්වහන්සේගේ මාංසයට පහරදීම 4:1-4
ආ. සාතන් විසින් උන්වහන්සේගේ දේවත්වයට පහරදීම 4:5-7
ඇ. සාතන් විසින් අන්වහන්සේගේ මෙසියස්භාවයට පහරදීම 4:8-11

## හතරවන කොටස : ගලිලයේ රජතුමාගේ සේවය 4:12-13:58

1. පසුතැවිලිවීම සඳහා කැඳවීම: 4:12-17

2. ගෝලයන් වීම සඳහා මසුන් අල්ලන්නන් සතරදෙනෙකු කැඳවීම: 4:18-22

3. මුල් ජයග්‍රහණ හා ප්‍රසිද්ධිය: 4:23-25

4. දේවරාජ්‍යයේ පුරවැසියන්ට තිබිය යුතු ක්‍රියාකිරීමේ මූලධර්ම: 5:1-7:28

අ. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ ක්‍රියාකිරීම් සකස් කෙරෙන ආකල්ප: 5:1-12
ආ. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ සාක්ෂිය: ආලෝකය හා ලුණු: 5:13-16
ඇ. ව්‍යවස්ථාව හා දිවැසිවරුන් සම්බන්ධ රාජ්‍ය මූලධර්ම: 5:17-48

1. පොදු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව: 5:17-20

2. නව ව්‍යවස්ථාව: 5:21-48
අ. මිනී මැරීම: 5:21-26
ආ. කාමමිථ්‍යාචාරය: 5:27-30
ඇ. දික්කසාදය: 5:31-32
ඈ. දිවුරුම්දීම: 5:33-37
ඉ. අන්අයට දක්වන සැලකිල්ල: 5:38-48

ඈ. දේවරාජ්‍යයේ නමස්කාරයේදී තිබිය යුතු ආකල්ප තුනක්: 6:1-18
1. දන්දීම: බාහිර බැල්ම : 6:1-4
2. යාච්ඤාව: ඉහළ බැල්ම: 6:5-15
3. නිරාහාරව සිටීම: අභ්‍යන්තර බැල්ම : 6:16-18

ඉ. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ ප්‍රමුඛතා: 6:19-23
1. වටිනාකම් හා සම්බන්ධව: 6:19-21
2. සේවය හා සම්බන්ධව: 6:22-24
3. ද්‍රව්‍යමය අවශ්‍යතා හා සම්බන්ධව: 6:25-34
4. නිවැරදි ප්‍රමුඛතාව: රාජ්‍යය: 6:33

ඊ. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ නිවැරදි හැසිරීම: 7: 1-29
1. විනිශ්චයේදී: 7:1-5

2. ශුද්ධ දේ ගැන සැලකිලිමත් වීමේදී: 7:6
3. යාච්ඤා කිරීමේදී: 7:7-12
   අ. යාච්ඤා වර්ග තුන: ඉල්ලීම, සෙවීම, තට්ටු කිරීම: 7:7-8
   ආ. ස්වර්ගීය පියා හා ස්වභාවික පියවරුන් සැසඳීම: 7:9-11

උ. දේවරාජ්‍යයේ පුරවැසියන් සඳහා දෙනු ලබන විශේෂ අනතුරු හැඟවීම්: 7:13-29
1. දොරටු දෙක: 7:13-14
2. ව්‍යාජ දිවැසිවරුන්: 7:15-20
3. දෙවියන්වහන්සේගේ මිනසෙකු බවට සහතිකය: උන්වහන්සේගේ කැමැත්ත කිරීම: 7:21-23
4. ඥානවන්ත හා මෝඩ මිනිසුන් සැසඳීම: 7:24-27

ඌ. යේසුස්වහන්සේගේ ධර්මය ගැන විශ්මපත් වීම: 7:28-29

5. රජතුමාගේ ආධිපත්‍යය: 8:1-9:38

අ. රෝග කෙරෙහි ඇති ආධිපත්‍යය: 8:1-17
1. කුෂ්ඨ රෝගියෙකු සුවකිරීම: 8:1-4
2. ශතාධිපතිගේ සේවකයා සුවකිරීම: 8:5-13
3. පේත්‍රුස්ගේ භාර්යාවගේ මව සුවකිරීම: 8:14-15
4. සියලු ආකාර රෝග සුවකිරීම: 8:16-17

ආ. තම ගෝලයින් කෙරෙහි ඇති ආධිපත්‍යය :8:18-22

ඇ. ස්වභාවික දේ කෙරෙහි ඇති ආධිපත්‍යය: 8:23-27

ඈ. යක්ෂයන් කෙරෙහි ඇති ආධිපත්‍යය: 8:28-34

ඉ. පාපය කෙරෙහි ඇති ආධිපත්‍යය: 9:1-8

ඊ. මනුෂ්‍යයන් කෙරෙහි ඇති ආධිපත්‍යය: 9:9-17
1. මතෙව් කැඳවීම: 9:9
2. පව්කරුවන් සමග ආහාර ගැනීම: 9:10-13
3. අභියෝගයකට පිළිතුරු දීම: 9:14-17

උ. මරණය කෙරෙහි ඇති ආධිපත්‍යය: මුලාදෑණියාගේ දුව: 9:18-19; 23-26

ඌ. ශාරීරික තත්ව කෙරෙහි ඇති ආධිපත්‍යය :9:20-38
1. මහලේ රෝගයෙන් පෙළුණාවූ ස්ත්‍රිය: 9:20-22
2. අන්ධ බව: 9:27-31
3. බිහිරිකම හා යක්ෂාවේශවීම: 9:32-34
4. යේසුස්වහන්සේ දැක්වූ අනුකම්පාව: 9:35-38

6. රජතුමා විසින් බලය පැවරීම: 10:1-42

අ. ධර්මදූතයන් දොළොස්දෙනා හා ඔවුන්ගේ ආධිපත්‍යය: 10:1-4

ආ. ගමන යෑම සඳහා උපදෙස්: 10:5-42
1. යා යුත්තේ කොතැනකටද? 10:5-6

2. සේවාව: 10:7-8
3. ද්‍රව්‍යමය දේ පිළිබඳ උපදෙස්: 10:9-15
4. ආත්මික උපදෙස්: 10:16-42

7. රාජ්‍යය කෙරෙහි දක්වන ආකල්ප: 11:1-30

අ. වරදවා අවබෝධ කරගත් දේවරාජ්‍යය: 11:1-11
ආ. විකෘති කරන ලද දේවරාජ්‍යය: 11:12-19
ඇ. ප්‍රතික්ෂේප කරන ලද දේවරාජ්‍යය: 11:20-24
ඈ. පිළිගත් දේවරාජ්‍යය: 11:25-30

8. පරිසිවරුන් සමග ඇති මතභේද: 12:1-14
අ. සබත් දින අස්වන්න නෙළීම: 12:1-8
ආ. සබත් දින සුවකිරීම: 12:9-13
ඇ. ප්‍රතිඵල: 12:14-21

9. කමාව දිය නොහැකි පාපය: 12:22-37

10. පරිසිවරුන්ගේ ඉල්ලීම්වලට ක්‍රිස්තුස්වහන්සේ දුන් පිළිතුර: 12:38-45

11. දේවරාජ්‍යයේ ශාරීරික නෑ සබඳතා වලට වඩා ආත්මික සබඳතා වලට දෙනු ලබන ප්‍රමුඛතාව: 12:46-50

12. දේවරාජ්‍යය පිළිබඳ උපමාවන්: 13:1-53

අ. වපුරන්නාගේ උපමාව: 13:1-9
ආ. උපමාවලින් කතා කිරීමට හේතු: 13:10-17
ඇ. වපුරන්නාගේ උපමාව තෝරාදීම: 13:18-23
ඈ. කිරිඳි ගැන උපමාව: 13:24-30
ඉ. අබ ඇටයේ උපමාව: 13:31-32
ඊ. මුහුන් පිළිබඳ උපමාව: 13:33
උ. උපමා පිළිබඳ සාරාංශය: 13:34-35
ඌ. කිරිඳි උපමාව තෝරාදීම: 13:36-43
එ. කෙතෙහි සඟවා තිබූ නිධානය පිළිබඳ උපමාව: 13:44
ඒ. වැඩි වටිනාකමක් ඇති මුතු ඇටය ගැන උපමාව: 13:45-46
ඔ. දැල පිළිබඳ උපමාව: 13:47-50
ඕ. උපමා පිළිබඳ සමාප්තික සටහන්: 13:51-52

13. රජතුමා තමාගේම නගරයේදී පිළිගනු ලැබූ ආකාරය: 13:53-58

## පස්වන කොටස: ගලීලය ප්‍රදේශය අසල රජතුමාගේ සේවය 14:1-18:35

1. යොහන් බව්තීස්තගේ මරණය: 14:1-12

2. මුහුදින් එපිට තැනකට යේසුස්වහන්සේ පිටත්ව යෑම: 14:13-15:20

අ. පන්දහසකට කන්ට දීම: 14:13-21
ආ. රොටී හා මසුන් අනුව යෑම 14:22-23

ඇ. මුහුද පිට පයින් යෑම: 14:24-33
ඈ. ගෙනසෙරත්හි කළ සේවය: 14:34-36
ඉ. පරිසිවරුන් හා ලියන්නන් සමග ඇතිවූ මතභේදය: 15:1-20

3. තිර් හා සීදොන් පෙදෙසට යේසුස්වහන්සේ පිටත්ව යෑම: 15:21-28

4. දෙකපොලිස පෙදෙසට යේසුස්වහන්සේ පිටත්ව යෑම: 15:29-38

අ. ගලීලය මුහුද අසල සුවකිරීමේ මෙහෙය: 15:29-31
ආ. හාරදහසකට කන්ට දීම: 15:32-38

5. මගදන් පෙදෙසේ සේවය: 15:39-16:4

6. පරිසිවරුන් හා සද්දුසිවරුන් ගැන ගෝලයන්ට අනතුරු ඇඟවීම් කිරීම: 16:5-12

7. පිලිප්පි කායිසාරියේ පළාත් වලට පිටත්ව යෑම: 16:13-17:21

අ. ගෝලයන් පරීක්ෂා කිරීම: 16:13-20
ආ. උන්වහන්සේගේ මරණය, නැවත නැගිටීම හා නැවත පැමිණීම ගැන දැනුම් දීම: 16:21-28
ඇ. ක්‍රිස්තුස්වහන්සේ අන්වෙසක්වීම: 17:1-13
ඈ. අපස්මාර රෝගියා සුවකිරීම: 17:14-21

8. ගලීලයට ගිය කෙටි ගමන: 17:22-18:35

අ. උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම මතක් කිරීම: 17:22-23
ආ. මාළිගා බද්ද ගෙවීම: 17:24-27
ඇ. ශ්‍රේෂ්ඨත්වය ගැන පාඩම: 18:1-6
ඈ. අනුන්ට බාධා කිරීම ගැන අවවාදය: 18:7-9
ඉ. නැතිවූ බැටළුවා ගැන උපමාව: 18:10-14
ඊ. දේවරාජ්‍යයේ පුරවැසියන් අතර මතභේද විසඳීම: 18:15-35
1. මතභේද විසඳන්නේ කෙසේද?: 18:15-17
2. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ වගකීම් හා වරප්‍රසාද: 18:18-20
3. කමාවීම ගැන ප්‍රශ්නය: 18:21-22
4. රජතුමා හා ඔහුගේ ණයකාරයෝ: 18:23-35

## සයවන කොටස: පෙරියාහිදී රජතුමාගේ සේවය
## 19:1-20:34

1. ජුදා දේශයේදී බොහෝ දෙනෙකු සුව කිරීම: 19:1-2

2. දික්කසාදය පිළිබඳ ප්‍රශ්නය: 19:3-12

3. යේසුස්වහන්සේගේ ආශිර්වාද ලත් ළමයින්: 19:13-15

4. පොහොසත් යෞවනයා සමග කළ සම්මුඛ සාකච්ඡාව: 19:16-22

5. වස්තුව අන්තරා සහිත බව: 19:23-30

6. ගෙදර ස්වාමියා පිළිබඳ උපමාව: 20:1-16

7. යේසුස්වහන්සේ බලාපොරොත්තුවෙන් සිටින මරණය හා නැවත නැගිටීම: 20:17-19

8. මවකගේ ආත්මාර්ථකාමී ඉල්ලීම: 20:20-28

9. යෙරිකෝව අසල අන්ධයන් දෙදෙනෙකු සුව කිරීම: 20:29-34

## සත්වන කොටස: රජතුමාගේ අවසාන සතිය
**21:1-27:31**

1. යේසුස්වහන්සේ රජෙකු සේ යෙරුසලමට ඇතුළුවීම: 21:1-11

2. දේවමාළිගාව පවිත්‍ර කිරීම: 21:12-17

3. සාප කරනු ලැබූ අත්තික්කා ගස: 21:18-22

4. යේසුස්වහන්සේගේ ආධිපත්‍යය අභියෝග කිරීම: 21:23-32

5. නපුරු සේවකයෝ: 21:33-46
6. සරණ මංගල්‍යය පිළිබඳ උපමාව: 22:1-14

7. යේසුස්වහන්සේට අවමන් කිරීමට ගත් උත්සාහයන්: 22:15-45

    අ. කායිසර්ට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය: 22:15-22
    ආ. නැවත නැගිටීම පිළිබඳ ප්‍රශ්නය: 22:23-33
    ඇ. ශ්‍රේෂ්ඨතම ආඥාව ගැන ප්‍රශ්නය: 22:34-40
    ඈ. යේසුස්වහන්සේ ඇසූ ප්‍රශ්න: 22:41-46

8. ලියන්නන් හා පරිසිවරුන් පිළිබඳ සාකච්ජාව : 23: 1-39

    අ. ආගමික ආධිපත්‍යයක් ඇති බව ඔවුන් පෙන්වීම: 23:1-3
    ආ. ඔවුහු බර පටවති: 23:4
    ඇ. ඔවුහු ප්‍රශංසා ලැබීමට ආශා කරති: 23:5-7
    ඈ. උන්වහන්සේගේ ගෝලයන්ට දුන් උපදෙස්: 23:8-12
    ඉ. ලියන්නන්ට හා පරිසිවරුන්ට සාප කිරීම: 23:13-36
    ඊ. යෙරුසලම සඳහා දුක්වීම: 23:37-39

9. දේවරාජ්‍යයේ අනාගතය: 24:1-25:46

    අ. දේවමාළිගාවේ විනාශය: 24:1-2
    ආ. ලෝකාන්තිමයේ ලකුණු: 24:3-14
    ඇ. පීඩා සමය: 24:15-22
    ඈ. යේසුස්වහන්සේගේ නැවත පැමිණීම: 24:23-31
    ඉ. අත්තික්කා ගස පිළිබඳ උපමාව: 24:32-35
    ඊ. ස්වාමීන්වහන්සේගේ දවස: 24:36-41
    උ. අවදිව සිටීමට කරන ලද ආඥාව: 24:42-51
    ඌ. අවසාන කාලය පිළිබඳ උපමාවන්: 25:1-46
        1. කන්‍යාවන් දසදෙනා: 25:1-13

2. තලෙන්ත: 25:14-30
3. බැටළුවන් සහ එළුවන්: 25:31-46

10. කුරුසිපත් කිරීමට පෙර වූ සිද්ධීන්: 26:1-27:31

අ. පැමිණීමට නියමිත මරණය ගැන දැන්වීම: 26:1-2
ආ. යේසුස්වහන්සේ මරන්නට කුමන්ත්‍රණය: 26:3-5
ඇ. භූමදානය සඳහා ආලේප කිරීම: 26:6-13
ඈ. යේසුස්වහන්සේ පාවාදීමට ජුදස් එකඟවීම: 26:14-16
ඉ. අන්තිම රාත්‍රි භෝජනය: 26:17-29
1. පාස්කුව සඳහා සූදානම්වීම: 26:17-19
2. අන්තිම රාත්‍රි භෝජනය: 26:20-29
3. යේසුස්වහන්සේගේ අවවාද කිරීම හා පේත්‍රුස්ගේ පුරසාරම්: 26: 30-35
ඊ. ගෙත්සෙමන: 26:36-46
උ. පාවාදීම හා අල්ලා ගැනීම: 26:47-56
ඌ. යේසුස්වහන්සේ විනිශ්චය කරනු ලැබීම: 26:57-27:26

## අටවන කොටස: රජතුමාගේ මරණය හා ජයග්‍රහණය
## 27:27-28:20

1. කුරුසිපත් කිරීම හා භූමදානය: 27:27-66

අ. භේවායන්ගේ කවටකම්: 27:27-31
ආ. කල්වරියට යන මාර්ගය : 27:32
ඇ. කල්වරියේදී සිදුවූ මරණය: 27:33-50
ඈ. අධිස්වභාවික සිද්ධීන්: 27:51-54
ඉ. භක්තිමත් ස්ත්‍රීහු: 27:55-56
ඊ. භූමදානය: 27:57-61
උ. සොහොන මුරකිරීම: 27:62-66

2. නැවත නැගිටීම: 28:1-15

3. ශ්‍රේෂ්ඨ පැවරීම: 28:16-20

# පස් වන පරිච්ඡේදය

## දේවරාජ්‍යයෙන් පිටමංකිරීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන පාප සඳහන් බයිබල් කොටස් හඳුනාගැනීමට
- දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන පාප අර්ථ විග්‍රහ කිරීමට
- දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන පාප ඉවත් කළ හැකි ආකාරය පැහැදිලි කෙරෙන බයිබලීය යොමු කිරීම් සැපයීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21)**

## හැඳින්වීම

දේවරාජ්‍යයට ප්‍රවේශවීමට ඉඩ දෙන ආත්මික යතුරු පිළිබඳව ඔබ පසුගිය පරිච්ඡේදයෙන් උගත්තෙහිය. මෙම පරිච්ඡේදය සොයා බලන්නේ දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන දේ පිළිබඳව වේ. ඇතැම් අය දේවරාජ්‍යයෙන් පිටමං කරන බව දැක්වෙන දුක්ඛිත සත්‍යතාව මෙහිදී අධ්‍යයනය කෙරේ.

## දේවරාජ්‍යයෙන් පිටමං කිරීම

දේවරාජ්‍යයේ කොටස්කරුවන් බව ප්‍රකාශ කරන එහෙත් සැබවින්ම දේවරාජ්‍යයේ වැසියන් නොවන බොහෝ අය සිටිති. දේවරාජ්‍යය හොඳ බීජ වලින් හා නරක බීජ වලින් පැලවෙන කිරිඳි වලින් සමන්විත බව බයිබලය පවසයි.

> **කෙත නම් ලෝකයය; හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයෝය; කිරිඳි නම් නපුරාගේ පුත්‍රයෝය; ඒවා වපුළ සතුරා නම් යක්ෂයාය. කපන කාලය නම් ලෝකාන්තිමයය; කපන්නෝ නම් දේවදූතයෝය. එබැවින් කිරිඳි එක්කොට ගින්නෙන් දවන්නාක් මෙන් ලෝකාන්තිමයේදී වන්නේය. මනුෂ්‍ය පුත්‍රයා තමන් දූතයන් එවනසේක, ඔව්හු බාධා උපදවන සියල්ලද අයුතුකම් කරන්නන්ද උන්වහන්සේගේ රාජ්‍යයෙන් එක්කොට, ගිනි උදුනෙහි හෙළන්නෝය. එහිදී හැඬීමද දත්මිටිකෑමද වන්නේය. එකල ධර්මිෂ්ඨයෝ තමුන්ගේ පියාණන්ගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන් බබළන්නෝය. ඇසීමට කන් ඇත්තේ අසාවා. (මතෙව් 13:38-43)**

වර්තමානයේ තමන් දේවරාජ්‍යයේ වැසියන් බව ප්‍රකාශ කරමින් තවමත් පාපයේ ජීවත්වන අය සිටිති. දෙවියන්වහන්සේ මේ අය දේවරාජ්‍යයේ සැබෑ වැසියන්ගෙන් වෙන් කරන විනිශ්වය කිරීමේ දවස අනාගතයේදී පැමිණෙනු ඇත. නපුරු අය දේවරාජ්‍යයෙන් පිටමං කරනු ඇත.

බයිබලය වර්තමාන රාජ්‍යය විවිධ මසුන් විශාල ප්‍රමාණයක් අල්ලා ගන්නා මුහුදට හෙලනු ලබන විශාල දැලකට සමාන කර ඇත.

**තවද මුහුදේ හෙළුවාවූද සියලු වර්ග වල මසුන් අසුවුණාවූද දැලකට ස්වර්ගරාජ්‍යය සමානය. ඒ දැල පිරුණු කල ඔව්හු එය වෙරළට ඇද හිඳගෙන, හොඳවුන් භාජන වල එකතුකොට, නරකවුන් අහකදැමුවෝය. ලෝකාන්තිමයේදී එසේම වන්නේය. දේවදූතයෝ නික්ම ඇවිත්, ධර්මිෂ්ඨයන් කෙරෙන් දුෂ්ටයන් වෙන්කොට, ගිනි උදුනෙහි හෙළන්නෝය. එහි හැඬීමද දත්මිටිකෑමද වන්නේය. (මතෙව් 13:47-50)**

බයිබලය අනාගත දිනයක් ගැනද පවසයි. එදින:

**තවද නුඹලාට කියමි: නැගෙනහිරින්ද බස්නාහිරින්ද බොහෝ දෙනෙක් ඇවිත්, ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සමග ස්වර්ගරාජ්‍යයෙහි හිඳගන්නෝය. (මතෙව් 8:11)**

එහෙත් යේසුස්වහන්සේ මෙසේ අවවාද කරනසේක:

**ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සියලු අනාගතවක්තෘවරුන්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි සිටිනවාත් නුඹලාම පිටත දමනු ලබනවාත් නුඹලා දකින කල, එහි හැඬීමද දත්මිටිකෑමද වන්නේය. (ලූක් 13:28)**

දේවරාජ්‍යය පිහිටුවීමට පෙර දෙවියන්වහන්සේ සියලු මනුෂ්‍යයන් විනිශ්චය කරනු ඇත. එනම් යේසුස්වහන්සේ පැමිණෙන විට ජීවත්ව සිටින්නන් හා ඊට පෙර මැරුණු අය වේ.

**දෙවියන්වහන්සේ ඉදිරියෙහිද ජීවත්ව සිටින්නන් සහ මළවුන්ද විනිශ්චයකරන්ට සිටින ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඉදිරියෙහිද උන්වහන්සේගේ ප්‍රකාශවීම හා උන්වහන්සේගේ රාජ්‍යයේ නාමයෙන් මා විසින් නුඹට අණ කරන්නේනම්: ...... (2 තිමෝති 4:1)**

අවසාන විනිශ්චයේදී සියලු මනුෂ්‍යයන් බෙදනු ලබන්නෝය. සමහරු දේවරාජ්‍යයට ඇතුළුවෙති. සමහරු පිටමං කෙරෙති.

**මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග තමන්ගේ තේජසින් එන කල, ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳිනසේක. එවිට සියලු ජාතිහු උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලබන්නෝය. උන්වහන්සේ එඬේරෙකු විසින් එළුවන් කෙරෙන් බැටළුවන් වෙන් කරන්නාක්මෙන් ඔවුන් වෙන්කොට, බැටළුවන් තමන්ගේ දකුණු පැත්තේද එළුවන් වම් පැත්තේද සිටුවනසේක. එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක්: මාගේ පියාණන්ගෙන් ආශිර්වාදලත්තෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම්කර තිබෙන රාජ්‍යය උරුමකරගන්න. (මතෙව් 25:31-34)**

## ස්ථිර පදිංචිය ලබාගැනීම

ඇතැමුන් දේවරාජ්‍යයෙන් පිටමං කරන බව බයිබලය එළිදරව් කරන බැවින් දේවරාජ්‍යයේ ස්ථිර පදිංචිය ලබාගන්නා ආකාරය දැනගැනීම වැදගත්ය. යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක:

**ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21)**

යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පිළිගත් පමණින් දේවරාජ්‍යයේ ස්ථිර පදිංචිය සහතික නොකෙරේ. වචනයෙන් කැපවීම පමණක් ප්‍රමාණවත් නොවන බව යේසුස්වහන්සේ පැවසූසේක. ඔබ පියාණන්වහන්සේගේ කැමැත්ත කළ යුතු වේ. ඔබ ඔබගේ පාප ගැන පසුතැවිලි වී යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වේ.

**ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමීන්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසනසේක. (2 පේත්‍රුස් 3:9)**

යේසුස්වහන්සේ ගැළවුම්කරු වශයෙන් පිළිගත් පසු ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට නිරන්තරයෙන් අවනත විය යුතුය. ඔබ ඇතුළු වූ නව රාජ්‍යයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ඔබ ජීවත්විය යුතුය. මෙම ප්‍රතිපත්ති මෙම පාඨමාලාවේදී පසුව ඔබට පැහැදිලි කරනු ඇත.

දේවරාජ්‍යයේ වැසියෙකු වීම සඳහා වචනයෙන් කැපවීමට වඩා වැඩිමනත් දෙයක් අවශ්‍ය වේ. සිතුවිලි හා කාර්ය රටාවන්වල වෙනසක් ඊට ඇතුළත් වේ. දේවරාජ්‍යයේ රටාවන් හා ප්‍රතිපත්ති වලට නිරතුරුවම ගැළපෙන ජීවන රටාවක් ඔබ වර්ධනය කරගත යුතුය.

දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමේ වැදගත්කම මතෙව් 21:28-32හි සඳහන් යේසුස්වහන්සේ කී කතාවකින් අවධාරණය කෙරේ. මේ කතාව ඔබ බයිබලයෙන් කියවන්න. ශුභාරංචියට පෞද්ගලිකවම ප්‍රතිචාර දැක්විය යුතු බව එය එළිදරව් කරයි. වචනයෙන් කැපවීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ ක්‍රියා කළ යුතුය.

## ඇතුළුවීම වළක්වාලන පාප

දේවරාජ්‍යයට ඇතුළුවීම පාපය වළක්වාලයි. පාපය, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩ කරයි.

**පව්කරන සැමදෙනම නොපනත්කමද කරති. පාපය නම් නොපනත්කමය. (1 යොහන් 3:4)**

නව ගිවිසුමේ පාප බොහොමයක් හඳුන්වා දී ඇත. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ඇඳහිල්ලේ පදනම"* නම් වූ තවත් පාඨමාලාවක මේ පාප සම්පූර්ණයෙන් ලයිස්තුගත කර ඇත.

දේවරාජ්‍යයට ඇතුළුවීම වළකාලන පාප හඳුන්වා දෙන සුවිශේෂී පාඨ දෙකක් ඇත:

**නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා. වේශ්‍යාකම්කරන්නෝවත් රූපවඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමග අනාචාරකරන්නෝවත්, සොරුවත් ලෝභයෝවත් බේබද්දෝවත් නින්දා කරන්නෝවත් කොල්ලකන්නෝවත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය.**
**(1 කොරින්ති 6:9-10)**

**ඉඳින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ: එනම් වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම: රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද, වෛර, බීමත්කම, මංගල්‍යඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි.** (ගලාති 5:19-21)

ඇතැම් පාප මේ පාඨ දෙකෙහිම සඳහන් වේ. එක පාඨයක සඳහන් නොමැති පාප අනෙක් පාඨයේ සඳහන්ව ඇත.

### පහත දැක්වෙන පාප කොරින්තිවල මෙන්ම ගලාති වලද ඇත:

## අධර්මිෂ්ඨකම:

කොරින්ති පාඨයේ ඇති ප්‍රකාශයේ සඳහන් වන්නේ අධර්මිෂ්ඨයන් දේවරාජ්‍යය උරුමකර ගන්නේ නැති බවය. ගලාති පාඨයේද අධර්මිෂ්ඨයන් දේවරාජ්‍යයේ උරුමක්කාරයන් නොවන බව සඳහන් වේ. ගලාති පාඨය එය "අපවිත්‍රකම" ලෙස හඳුන්වයි. එහි අදහස ආත්මික හෝ සාරධාර්මික අධර්මිෂ්ඨකමය.

ලෝකයේ බොහෝ රටවල යම් පුද්ගලයෙක් මිය ගිය පසු ඔහුට අයත් දේපළ අන් අයට හිමිකර දෙන ක්‍රමයක් ඇත. එය හිමිකරගන්නා අය උරුමක්කාරයන් ලෙස හඳුන්වනු ලැබේ. ඔබ යම් දෙයකට උරුමක්කාරයෙකු නම් ඔබට එය හිමිවන්නේය. ඔබ යම් දෙයක් වෙනත් කෙනෙකුගෙන් ලබාගන්නේය. එහෙත් එය ලබාගැනීමට නම් ඔබ අවශ්‍යතාවන් සමහරක් සපුරාලිය යුතුය. එනම් රටේ නීතිය අනුව ඔබ එයට නීත්‍යනුකූල හිමිකරු විය යුතුය.

ඔබ දේව රාජ්‍යයේ උරුමක්කාරයෙකි. යේසුස්වහන්සේ, උන්වහන්සේගේ මරණයේදී ඔබ උරුමක්කාරයෙකු කළසේක. ඔබගේ පාප වෙනුවෙන් උන්වහන්සේ වූ මරණය තුළින් ඔබට දේවරාජ්‍යයට ඇතුළුවිය හැකිය. එහෙත් ඔබ නීත්‍යනුකූල උරුමක්කාරයෙකු වීමට නම් ඔබගේ අතීතයේ පාප වලට කමාව ලබාගෙන ඔබගේ ජීවන රටාව සිතිවිලි හා ක්‍රියාවන් වෙනස් කිරීම සඳහා යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ධර්මිෂ්ඨ ජීවිතයක් ගෙන යාම ආරම්භ කළ යුතුය. මේවා ශුද්ධ ලියවිල්ල මගින් දී ඇති අවශ්‍යතාවන් වේ.

"ධර්මිෂ්ඨ" යන වචනයේ තේරුම සාධාරණව, නිවැරදිව හා ශුද්ධව සිටීම වේ. ඉන් අදහස් වන්නේ උන්වහන්සේගේ ලිඛිත වචනයේ සඳහන් පරිදි සිතින්, වචනයෙන් හා ක්‍රියාවෙන් ශුද්ධව දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුකූල විය යුතු බවය.

යම් ව්‍යවස්ථාවකට අවනත වීමෙන් ධර්මිෂ්ඨ විය නොහැකිය. එය ලබාගත හැක්කේ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් පමණය. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන තැනැත්තා "උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම" වේ. ඔහු දෙවියන්වහන්සේට අවශ්‍ය ආකාරයේ මනුෂ්‍යයෙකු වන අතර, ඔහුගේම ශක්තියෙන් ඔහු තුළ ඇතිකරගත නොහැකි දේ ඇතිවනු ඇත.

> **අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට (දෙවියන්වහන්සේ) සැලැස්සූසේක. (2 කොරින්ති 5:21)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොව සේවය කරන අවදියේ ආගමික නායකයන් වූ ලියන්නන් හා පරිසිවරුන් ආගමික සම්ප්‍රදායන්ට අනුකූල වීමෙන් ධර්මිෂ්ඨ වීමට උත්සාහ කළ නුමුත් යේසුස්වහන්සේ ඔවුන්ට අනතුරු ඇඟවූසේක:

> **මක්නිසාද නුඹලාගේ ධර්මිෂ්ඨකම ලියන්නන්ගේද ඵරිසිවරුන්ගේද ධර්මිෂ්ඨකමට වැඩි නොවීනම්, නුඹලා කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුයයි නුඹලාට කියමි. (මතෙව් 5:20)**

ආගමික නායකයන්ට යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක:

> **ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට එන්ට නොදී ස්වර්ගරාජ්‍යය වසා, නුඹලාම ඇතුල්වෙන්නේවත් ඇතුල්වෙමින් සිටින්නන්ට ඇතුල්වෙන්ට ඉඩදෙන්නේවත් නැත. (මතෙව් 23:13)**

ධර්මිෂ්ඨකම ලබාගැනීම සඳහා ආගමික ඇදහිලි ක්‍රම, සම්ප්‍රදායන්, නීති හා ව්‍යවස්ථාවන් අනුගමනය කරන සියලුම දෙනා ලියන්නන් හා පරිසිවරුන් මෙන් වෙති. මේවා ව්‍යාජ ධර්මිෂ්ඨකම වේ. ඒවා අභ්‍යන්තරව හදවත වෙනස්කර ගැනීමකට වඩා බාහිරව ව්‍යවස්ථාවන්ට අනුකූල වීමක් කෙරෙහි යොමු වේ. ධර්මිෂ්ඨකම ලබා ගැනීමේ ක්‍රමය මෙවැනි සම්ප්‍රදායන් බව කවුරුන් හෝ උගන්වන්නේ නම් ඔවුහු අන් අය දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වති.

“අධර්මිෂ්ඨකම” හා “අපවිත්‍රකම” යන පද වල සියල්ල ඇතුළත්ය. දේව වචනයේ සඳහන් සියලු පාප ගලාති හා කොරින්ති පාඨ වල ඇතුළත් නුවුවද මේ පද දෙකේ සියලු පාප අන්තර්ගතය. යම් කෙනෙක් අධර්මිෂ්ඨව ජිවත් වෙමින් ඕනෑම පාපයක නියැලී සිටිත් නම් ඔහුට දේවරාජ්‍යයට ඇතුළුවිය නොහැකිය. කොරින්ති පාඨයේ “නොරුවටෙල්ලා” යනුවෙන් අනතුරු ඇඟවීමක් කර තිබේ. ඔබට අවශ්‍ය ආකාරයට ජිවත් වෙමින් දේවරාජ්‍යයට ඇතුළු විය හැකි බව විශ්වාස කිරීම සාතන්නේ රැවටිලිකාර බොරුවකි.

## වේශ්‍යාකම්කරන්නෝ:

වේශ්‍යාකම යනු එකිනෙකාට විවාහ නුවූ දෙදෙනෙක් අතර සිදුවන ලිංගික සංසර්ගය වේ. මේ පාපයට කාමමිථ්‍යාචාරය ඇතුළත්ය. එනම්, විවාහ වූ පුද්ගලයෙක් තම සහකාරිය සමග නොව වෙනත් කෙනෙකු සමග ලිංගික සංසර්ගයේ යෙදීම වේ. විවාහ නුවූ අය අතර ලිංගික සංසර්ගයද වේශ්‍යාකමට ඇතුළත්ය. මීට සමලිංගිකතාව, (එකම ලිංගයේ අය සමග ලිංගික සබඳතා ඇතිකර ගැනීම), ව්‍යාභිචාරය (ලේ නෑදෑයෙකු සමග ලිංගික සබඳතාව) වැනි පාපද ඇතුළත්ය.

## රූප වඳින්නෝ:

රූප වඳින්නෝ යනු පිළිම නමස්කාර කරන්නෝ වෙති. මින් අදහස් වන්නේ ගලින්, ලීයෙන්, ලෝහයෙන් කළ පිළිම පමණක් නොවේ. දෙවියන්වහන්සේට වඩා වැදගත් ඕනෑම දෙයක් “පිළිමයක්” වේ.

සැබෑ දෙවියන්වහන්සේට හැර වෙනත් ඕනෑම දෙයකට නමස්කාර කරන්නෝ හෝ පිළිම පූජාවේ යෙදෙන්නෝ හෝ රූප වඳින්නෝ වෙති. ඔබගේ ජිවිතය තුළ දෙවියන්වහන්සේට නියමිත තැන නොදෙන ඕනෑම කෙනෙක් රූප වඳින්නෙකි.

## කාමමිථ්‍යාචාරිකයෝ:

තම සහකාරිය / සහකාරයා සමග නොව වෙනත් කෙනෙකු සමග ලිංගික සංසර්ගයේ යෙදීම කාමමිථ්‍යාචාරය වේ.

## බේබද්දෝ:

ගලාති පාඨයේ මෙම පාපය බීමත්කම ලෙස හැඳින්වේ. මෙය සැර බීමක් මගින් සාමාන්‍යයෙන් මද්‍යසාර අඩංගු බීම මගින් මානසික හා ශාරීරික ක්‍රියාවන් කෙරෙහි බලපෑමක් ඇති කෙරෙන තත්වය වේ.

## මෙම පාප සඳහන්ව ඇත්තේ කොරින්ති පාඨයේ පමණකි :

## ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝ:

මෙය සල්ලාකමේ යෙදෙන පිරිමින්ට පමණක් නොව මාංශයේ ලිංගික පාප වල යෙදෙන ඕනෑම කෙනෙකුට යෙදෙන්නකි.

## මිනිසුන් සමග අනිසි ලෙස හැසිරෙන්නෝ:

අනාචාරකම් කිරීම යනු අසාධාරණ ලෙස වාසියක් ලබාගැනීම හෝ වැරදි ලෙස සැලකීම හෝ වේ. “මිනිසුන් සමග අනිසි ලෙස හැසිරෙන්නෝ” අන් අය සමගද වැරදි ලිංගික සබඳතා ඇතිකර ගනිති. එසේ කිරීමෙන් ඔවුහු තමන්ගේම ශරීර අයුතු ලෙස භාවිත කරති.

**සොරු:**

සොරු යනු සොරකම් කරන අය වෙති. ඔවුහු අන් අයට අයත් දේ ඔවුන්ට නොදන්වා හෝ ඔවුන්ගේ අවසරය නොගෙන හෝ ගනිති.

**ලෝභයෝ:**

ඔබ යම් දෙයක් කෙරෙහි ලෝභ වන්නේ නම් ඔබ එය ලබාගැනීමට මහත් ආශාවක් දක්වන අතර එය දැනට ඇති අයට නොව ඔබට තිබුණේ නම් වඩාත් හොඳ බව සිතයි. ඔබ යම් කෙනෙකුගේ මුදල්, දේපළ, තත්වය හෝ බලය කෙරෙහි ලෝභ විය හැකිය. එමෙන්ම යම් කෙනෙකුගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව කෙරෙහිද ලෝභ විය හැකිය.

**කොල්ලකාරයෝ:**

කොල්ලකෑම යනු යම් දෙයක් බලයෙන් ලබාගැනීම වේ. යම් කෙනෙකුට බලය පෙන්වා යම් දෙයක් ඔහුගෙන් ලබාගැන්ම වේ.

**නින්දාකරන්නෝ:**

නින්දා කිරීම යනු යම් කෙනෙක් කෙළෙසන අයුරින් කතාකිරීම, ඔහුට විරුද්ධව කතාකිරීම හෝ අපවිත්‍ර භාෂාවෙන් බැන වැදීම හෝ වේ.

**පහත දැක්වෙන පාප සඳහන් වන්නේ ගලාති වල පමණි :**

**සල්ලාලකම:**

සල්ලාලකම යනු කාමයේ පාපය, පාපි හැඟීම්, අපවිත්‍රකම, පාපි හැසිරීම් ආදිය වේ.

**මායාව:**

මායාව යනු හූනියම් කිරීම, මන්ත්‍ර ගුරුකම්, නක්ෂත්‍රය, බන්ධන හා මත්ද්‍රව්‍ය ආදිය වේ. සියලුම සාතන්ගේ කටයුතු හා නමස්කාරය මීට ඇතුළත්ය.

**සතුරුකම්:**

සතුරුකම්, ප්‍රේමයට පටහැනි දේ වේ. එය වෙනත් කෙනෙකුට බොහෝ සේ අකමැති වන්නාවූ හැගීමක් වේ.

**විවාදය:**

විවාදය යනු එකඟ නොවීමකි. අසමගියක් ඇත. විරුද්ධකම් ඇතිවේ. ආරවුල් වලට සමානය.

**තරගය:**

අන් අයව අනුකරනය කිරීමට හෝ සමාන වීමට හෝ අන් අයට වඩා ඉහළින් සිටීමට දක්වන කැමැත්ත වේ. එය තරගකාරී ආත්මයකි.

### කෝධය:

කෝධය යනු තදබල කේන්තිය, තද ක්‍රියාවක් වේ.

### පක්ෂවාදිකම්:

පක්ෂවාදිකම් යනු රන්ඩු දබර කිරීම, ගැටීම් හා මතභේද ඇති කර ගැනීම වේ.

### භේද:

භේද යනු අසමගිය ඇති කිරීම හා එකමුතුකම නැතිකිරීම වේ.

### වැරදි ඉගැන්වීම්:

වැරදි ඉගැන්වීම් යනු දේව වචනයට විරුද්ධ විශ්වාසයන් වේ. ඒවා තම කැමැත්තෙන් ඇති කර ගත් අදහස් වන අතර ඒවා වැරදි මාර්ගයේ ගෙනයන අතර සභාවේ බෙදීම් ඇති කරයි.

### ඊර්ෂ්‍යාව:

ඊර්ෂ්‍යාව යනු අන් අයගේ සාර්ථකත්වයට අකමැති වීම, ඔවුන්ගේ මුල්‍යමය, ද්‍රව්‍යමය හා ආත්මික ආශිර්වාදවලට අකමැති වීම.

### මිනිමැරීම:

මිනිමැරීම යනු හිතාමතා අන් අයෙකුගේ ජිවිතය බලෙන් නැති කිරීම වේ. මිනිමැරීම යනු වැරදීමකින් මැරීම හෝ තමාව ආරක්ෂා කිරීමට කරන්නක් නොවේ.

### මංගල්‍ය ඝෝෂා:

මින් අදහස් වන්නේ ලෞකික දේ සමග ජිවත්වීමට දක්වන ආශාව ඇතිව ඝෝෂා කරමින් කලහකාරී ලෙස හැසිරීම.

## ඇතුල්වීම ප්‍රතික්ෂේප කිරීම

මෙම සුවිශේෂී පාප වලට අමතරව දේවරාජ්‍යයට ඇතුළු වීම ප්‍රතික්ෂේප කෙරෙන තවත් දේ බයිබලයේ සඳහන් වේ.

### මාංශය හා රුධිරය:

පාවුලුතුමා මෙසේ අනතුරු අඟවයි:

> **ඉතින් සහෝදරයෙනි, මාංසයට හා රුධිරයට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්ට බැරි බවත් දිරන ස්වභාවට නොදිරන ස්වභාව උරුමකරගන්ට බැරි බවත් කියමි.**
> (1 කොරින්ති 15:50)

මෙය පසුගිය පරිච්ජේදයෙන් සාකච්ජා කළ රාජ්‍යයට ඇතුළු වීමේ යතුරු හා සම්බන්ධය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ආත්මික රාජ්‍යයකි. ඔබට ඔබගේ මාංශයෙන් හා රුධිරයෙන් ඊට ඇතුළු

විය නොහැකිය. පසුගිය පරිච්ඡේදයෙන් සාකච්ඡා කළ පරිදි නැවත ඉපදීම මගින් දේවරාජ්‍යයට ඇතුළු වීමට ඔබ ආත්මික තීරණයක් ගත යුතුය.

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි-යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක.**

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි-යමෙක් වතුරෙන්ද ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය. (යොහන් 3:3 සහ 5)**

**මක්නිසාද මෙසේ අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාල රාජ්‍යයට ඇතුල්වීම නුඹලාට බොහෝසේ දෙනුලැබේ. (2 පේත්‍රුස් 1:11)**

## දරුවෙකු වැනි ඇදහිල්ලක් නොමැතිකම:

**සැබවක් නුඹලාට කියමි-නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නුණොත්, කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුය. (මතෙව් 18:3)**

**සැබවක් නුඹලාට කියමි-යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවෙකු මෙන් පිළි නොගත්තොත් ඔහු කිසිසේත් එහි ඇතුල් නොවන්නේයයි ඔවුන්ට කීසේක. (මාර්ක් 10:15)**

දේවරාජ්‍යයට ඇතුළු වීමට දරුවෙකු මෙන් වීම අවශ්‍ය වේ. ඔබ ශාරීරිකව හා හැඟීම් වලින් දරුවෙකු වීම මින් අදහස් නොකෙරේ. මෙයද නැවත ඉපදීම යනු මවගේ කුසයට නැවත ඇතුළුවී ඉපදීම නොවන්නාක් මෙනි. මින් අදහස් කෙරෙන්නේ ඔබ දේවරාජ්‍යයට දරුවෙකු මෙන් විශ්වාසයක් ඇතිව ඇතුළු විය යුතු බවය. ඔබ එසේ නොකළහොත් ඔබට දේවරාජ්‍යයට ඇතුළු විය නොහැකිය.

## වස්තුව:

යේසුස්වහන්සේ මෙලොව සේවයේ යෙදී සිටියදී එක් අවස්ථාවක එක් මුළාදෑනියෙක් උන්වහන්සේගේ ගෝලයෙකු මෙන් උන්වහන්සේ අනුගමනය කිරීමට අවශ්‍ය බව කිය (ලූක් 18:18-25හි මේ කතාව කියවන්න). මේ මුළාදෑනියා යහපත් කෙනෙකි.

එහෙත් යේසුස්වහන්සේ මෙසේ පැවසුසේක:

**යේසුස්වහන්සේ ඒ අසා: නුඹට තව එක දෙයක් අඩුය. නුඹ සන්තක සියල්ල විකුණා, දිළිඳුන්ට බෙදාදෙන්න, එවිට ස්වර්ගයෙහි නුඹට වස්තුව ලැබෙන්නේය. මා අනුව යන්ට එන්නැයි ඔහුට කීසේක. නුමුත් ඔහු ඒ අසා, බොහෝ ධනවත්ව සිටි බැවින් අතිශයින් ශෝකවූයේය. (ලූක් 18:22-23)**

මේ පොහොසත් මුළාදෑනියා යේසුස්වහන්සේ අනුව යෑමට අකමැති විය. ඊට හේතුව යේසුස්වහන්සේට වඩා ඔහුගේ වස්තුව ඔහුට වැදගත් වූ බැවිනි.

**යේසුස්වහන්සේ ඔහු දෙස බලා කියනසේක්: වස්තු ඇති අය දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්නේ කොපමණ අමාරුවෙන්ද? (ලූක් 18:24)**

**එවිට යේසුස්වහන්සේ අවට බලා: ධනවන්තයන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම කොපමණ අමාරුදැයි ගෝලයන්ට කීසේක. ගෝලයෝ උන්වහන්සේගේ වචනවලට විස්මපත් වූවෝය. නුමුත් යේසුස්වහන්සේ නැවතත් උත්තරදෙමින්: දරුවෙනි, වස්තුව කෙරෙහි විශ්වාසකරන්නන්ට**

**දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම කොපමණ අමාරුද! ධනවන්තයෙකු ස්වර්ගරාජ්‍යයට ඇතුල්වීමට වඩා ඉඳිකටු සිදුරෙන් ඔටුවෙකුට යන්ට පහසුයයි කීසේක.** (මාර්ක් 10:23-25)

වස්තුව ඇති අය දේවරාජ්‍යයට ඇතුළු කර නොගන්නා බව යේසුස්වහන්සේ මින් අදහස් කළේ නැත. මනුෂ්‍යයන් දේවරාජ්‍යයෙන් පිටත තබන්නේ වස්තුවට ඇති ආශාව නිසා වේ.

**මක්නිසාද වස්තු තෘෂ්ණාව සියලු ආකාර නපුරේ මුලක්ය. සමහරු ඊට ආලයවී ඇදහිල්ලෙන් මුළාව ගොස්, බොහෝ වේදනාවලින් තුමුම ඇනගත්තෝය.** (1 තිමෝති 6:10)

වස්තුව යේසුස්වහන්සේ අනුගමනය කිරීමට වඩා වැදගත් වූ විට එමගින් දේවරාජ්‍යයට ඇතුළුවීම වළකාලයි.

## පාපය සඳහා පිළියම

ඔබ යම් පාපයක් සඳහා වරදකරු නම් ඊට ඇත්තේ එකම පිළියමකි. ඒ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් කමාව ගැනීම පමණි. පාවුලුතුමා මෙසේ පැවසිය:

**නුඹලාගෙන් සමහරු එබන්දෝව සිටියෝය. නුමුත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්ද අපගේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් තුළද නුඹලා සෝදනු ලැබුවහුය, ශුද්ධකරනු ලැබුවහුය, ධර්මිෂ්ඨකරනු ලැබුවහුය.** (1 කොරින්ති 6:11)

ඔබ අතිතයේ කුමන දෙයක් කර තිබුණද ඔබ දැන් කුමන දෙයක් කරමින් සිටිද ඔබට කමාව ලබාගත හැකිය:

**අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක.** (1 යොහන් 1:8-9)

ඔබ සියලු අධර්මිෂ්ඨකම් වලින් පවිත්‍ර කරනු ලැබූ විට දේවරාජ්‍යයට ඔබ ඇතුළු වීම වළක්වන සියලු පාප ඔබට කමා කෙරෙනු ඇත.

## උගුලා දමන්න

ඔබ බයිබලය මාක් 9:43-48ට පෙරළා ගන්න. මෙම පාඨයෙන් යේසුස්වහන්සේ උගන්වන්නේ ඔබේ අත හෝ පය හෝ ඔබට බාධා කරන්නේ නම් එය කපා දමන ලෙසය. ඔබේ ඇස ඔබට බාධා කරන්නේ නම් එය උගුලා දමන ලෙස උන්වහන්සේ පවසන සේක.

**නුඹේ ඇස නුඹට බාධාකෙරේ නම්, ඒක උගුලාදමන්න. ඇස් දෙක ඇතුව නිරයේ හෙළනු ලැබීමට වඩා එක ඇසක් ඇතුව දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම නුඹට හොඳය.** (මාර්ක් 9:47)

පව් කිරීමට පොළඹවන යම් දෙයක් ඔබගේ ජීවිතය තුළ තිබේ නම් එය ඉවත් කරන ලෙස මින් යේසුස්වහන්සේ අදහස් කරනසේක. ඔබට එය ඉතා වටිනා දෙයක් හෝ අත්‍යවශ්‍ය දෙයක් හෝ වුවද එය ඉවත් කළ යුතුය. උන්වහන්සේ අත්, පා හා ඇස් නිදර්ශන ලෙස ගෙන ඇත. සාමාන්‍යයෙන් ස්වභාවික ලෝකයේ මේ ඉතා වටිනා අත්‍යවශ්‍ය අංගෝපාංග වේ. එහෙත් යේසුස්වහන්සේ පවසන්නේ ඒවා ඔබ පව්කිරීමට හේතුවක් වේ නම් ඒවා ඉවත් කිරීම ඔබ ස්වර්ග රාජ්‍යයට ඇතුළුවීම වළක්වනවාට වඩා යහපත් බවය.

ස්වර්ග රාජ්‍යයෙන් පිටමන් කිරීම තරම් වැදගත්... පාපය, දේපළ හා සැප සම්පත් නැත.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________________________________

________________________________________________________________

2. දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන සුවිශේෂී පාප දැක්වෙන යොමුවීම් දෙකක් සඳහන් කරන්න.

______________________________ සහ __________________________________

3. පහත දැක්වෙන සෑම ප්‍රකාශයක්ම කියවන්න. ප්‍රකාශය සත්‍යය නම් “ස” යන්නද අසත්‍යය නම් “අ” යන්නද හිස් තැනේ ලියන්න.

   අ. ______ ඔබ ධනවත් නම්, ඔබට දේවරාජ්‍යයට ඇතුළු විය නොහැකිය.

   ආ. ______ මාංශයට හා රුධිරයට දේවරාජ්‍යය උරුම කරගත නොහැකිය.

   ඇ. ______ දේවරාජ්‍යයට ඇතුළුවීම වළකාලන ඔබේ ජීවිතයේ ඇති ඕනෑම දෙයක් ඉවත් කරන ලෙස යේසුස්වහන්සේ පැවසූසේක.

   ඈ. ______ දේවරාජ්‍යයට ඇතුළුවීමට ඔබ දරුවෙකු මෙන් විය යුතු යයි යේසුස්වහන්සේ පැවසූසේක.

   ඉ. ______ දේවරාජ්‍යයට ඇතුළුවීමට ඔබ යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගත යුතු වේ.

   ඊ. ______ ඔබ කළ යුතු එකම දෙය “යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේය” යනුවෙන් පැවසීම පමණකි. එවිට, ඔබට දේවරාජ්‍යයට ඇතුළුවීම ස්ථිරය.

   උ. ______ විනිශ්චය කිරීමේ අවසාන අවස්ථාවක් ඇති අතර එවිට ඇතැම් අය දේවරාජ්‍යයෙන් පිටමං කෙරේ.

4. දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන පාප ඉවත් කෙරෙන ආකාරය පැහැදිලි කරන බයිබලීය යොමුකිරීමක් දෙන්න.

________________________________________________________________

5. දේවරාජ්‍යයට ඇතුළුවීම වළක්වන පාප පළමු තීරුවෙන් කියවන්න. ඉන්පසු දෙවැනි තීරුවේ ඇති අර්ථ විග්‍රහයන් කියවන්න. එක් එක් පාපයට අදාළ අර්ථ විග්‍රහයේ අංකය පාපයට ඉදිරියෙන් ඇති හිස් තැනේ ලියන්න. නිදර්ශකයක් ලෙස පළමුවැන්න ඔබ වෙනුවෙන් කර ඇත.

| පළමු තීරුව | | දෙවැනි තීරුව |
|---|---|---|
| ___2__ | a. අධර්මිෂ්ඨකම | 1. ලෞකික ජීවිතයක් ගත කිරීම හා කලහකාරී ලෙස හැසිරීම |
| ______ | b. වේශ්‍යාකම් කරන්නෝ | 2. සියලු පාප මීට ඇතුළත් වේ |

______ c. රූප වඳින්නෝ | 3. අනෙක් අයගේ සාර්ථකවීම ගැන ඊර්ෂ්‍යාව
______ d. කාමමිථ්‍යාචාරිකයෝ | 4. තවත් කෙනෙකුගේ ජීවිතය නැති කිරීම
______ e. බේබද්දෝ | 5. විවාහ නුවුනු අය අතර ලිංගික සබඳතා
______ f. ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝ | 6. සැර බීමක් මගින් ඇති වූ බලපෑම
______ g. තමන්වම අනිසි ලෙස භාවිත කරන්නෝ | 7. සොරකම් කරන අය
______ h. සොරු | 8. යම් කෙනෙකුට එරෙහිව අශුද්ධ ලෙස කතා කිරීම
______ i. ලෝභයෝ | 9. පිළිම නමස්කාරය
______ j. කොල්ලකාරයෝ | 10. අශිෂ්ඨ ලෙස ලිංගික පාපයේ යෙදෙන පිරිමි
______ k. නින්දා කරන්නෝ | 11. ඔබගේම සහකාරිය නොවන කෙනෙකු සමග ලිංගික කටයුතු වල යෙදීම
______ l. සල්ලාලකම් කරන්නෝ | 12. තමාගේම ශරීර අනිසි ලෙස භාවිතා කිරීම
______ m. මායම්කාරයෝ | 13. අනෙක් කෙනෙකුට අයත් දෙයක් කෙරෙහි ආශා කිරීම
______ n. සතුරුකම් | 14. යම් දෙයක් බලෙන් ගැනීම
______ o. විවාදය | 15. පාපී හැඟීම්, අපවිත්‍ර හැසිරීම
______ p. තරගය | 16. හිංසාකාරී තරහ
______ q. ක්‍රෝධය | 17. දේවවචනයට පටහැනි විශ්වාසයන්
______ r. පක්ෂවාදිකම් | 18. ප්‍රබල ලෙස එපා කිරීම
______ s. භේද | 19. එකඟ නොවීම, අසමගිය
______ t. වැරදි ඉගැන්වීම් | 20. අනෙක් අය අනුකරනය කිරීමට ඇති ආශාව, සමාන හෝ උසස් වීම
______ u. ඊර්ෂයාව | 21. රණ්ඩු කිරීම
______ v. මිනී මැරීම | 22. භේද ඇති කිරීම
______ w. මංගල්‍ය ඝෝෂා | 23. මන්ත්‍ර ගුරුකම් කිරීම

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

දේව රාජ්‍යය සඳහා යොමු වීම් අධ්‍යයනය කර මාක් පොතේ උගන්වා ඇති දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති සාරාංශගත කරන්න.

**<u>මාක්</u>**

1:14-15

---

3:24

---

4:11, 26, 30

---

9:1, 47

---

10:14-15, 23-25

---

11:9-10

---

13:8

---

14:25

---

15:43

# සයවන පරිච්ඡේදය

## රටා හා මුලධර්ම පිළිබඳ හැඳින්වීමක්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "රටාව" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- "මුලධර්මය" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- "බයිබලිය රටාව" යන්නෙන් අදහස් වන දෙය පැහැදිලි කිරීමට
- "බයිබලිය මුලධර්මය" යන්නෙන් අදහස්වන දෙය පැහැදිලි කිරීමට
- "රාජ්‍යයේ රටා හා මුලධර්ම" යන්නෙන් අදහස් වන දෙය පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

**මේ සටහනේ සියලු වැඩ තේරුම් කර දුන්නාවූ ස්වාමින්වහන්සේගේ අතින් මා ලවා සියල්ලම ලියවා තිබේයයි දාවිත් කීවේය.** (1 ලේකම් 28:19)

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයකින් ඔබ දේවරාජ්‍යයට ඇතුළුවන ආත්මික යතුරු ගැන උගත්තෙහිය. ඔබ දේවරාජ්‍යයේ පදිංචි වු විට දේවරාජ්‍යයේ ජිවත්වන රටා හා මුලධර්ම ඉගෙන ගත යුතුය. එය ඔබ සංක්‍රමණය වු අලුත් රටක ජිවත් වන ආකාරය ඉගෙන ගන්නාක් මෙනි.

දේවරාජ්‍යය පාලනය කෙරෙන රටා හා මුලධර්ම ඇතුළත් ලිඛිත වාර්තාව බයිබලය වේ. ඉදිරි පරිච්ඡේදවලින් ඔබ මුලධර්ම ඉගෙනිමට පෙර ඔබ ඒවායේ වැදගත්කම අවබෝධ කරගත යුතුය.

### රටා හා මුලධර්ම

රටාවක් යනු අනුකරණය කිරීම සඳහා නිර්මාණය කර ඇති යම් දෙයක් හෝ එහි ආකෘතියක් හෝ වේ. එය පිටපත් කිරීමට හෝ අනුකරණය කිරීමට හෝ සැලසුම් කළ දෙයකි. නිදසුන් වශයෙන් බටහිර ලෝකයේ ඇඳුම්, රටාවන් මගින් නිර්මාණය කරන ලද ඒවා වේ. ඇඳුමේ මෝස්තරයට ගත් හැඩය රෙද්දක් මත තබා එම මෝස්තරය අනුව රෙද්ද කපනු ලැබේ. එකම රටාවෙන් හෙවත් මෝස්තරයෙන් ඇඳුම් බොහොමයක් නිර්මාණය කළ හැකිය. ඒවා එකම මෝස්තරය භාවිතයෙන් සැදු බැවින් එකිනෙකට සමාන වේ.

මුලධර්මයක් යනු ක්‍රියාමාර්ගයක් ගැනිම හෝ හැසිරීම හෝ සඳහා යොදාගත් නිතියක් හෝ ක්‍රමයක් සත්‍යයක් හෝ වේ. පොදු සත්‍යයක් උප සත්‍යයන්ගෙන් සමන්විත වේ. "උප සත්‍යයන්" පොදු සත්‍යයට සම්බන්ධය. නිදසුනක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාවේ මුලික මුලධර්මයක් වනුයේ ප්‍රකාශ කිරීමේ නිදහස තිබීමය. මෙහි උප සත්‍යයන් වලට ඇතුළත් වන්නේ, නිදහස් ලිවීම හා කතාකිරීම, නිත්‍යානුකුල රැස්වීම් පැවැත්වීම, විශ්වාසයන් ප්‍රකාශ කිරීම ආදිය වේ.

# බයිබලීය රටා හා මූලධර්ම

බයිබලීය රටාවක් යනු අනුකරණය කිරීම සඳහා ශුද්ධලියවිල්ලෙහි සඳහන්ව ඇති ආත්මික ආකෘතියක් හෝ නිදර්ශනයක් හෝ වේ. නිදර්ශනයක් ලෙස, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය ගැන සඳහන් වන්නේ, ඇදහිලිවතුන් අනුගමනය කළ යුතු රටාවක් හෝ ආකෘතියක් හෝ වශයෙනි.

බයිබලීය මූලධර්මයක් යනු ශුද්ධ ලියවිල්ලේ උගන්වා ඇති ආත්මික සත්‍යයකි. එවැනි මූලධර්මයක් බොහෝ විට විවිධ අවස්ථාවනට යෙදිය හැකි අතිරේක උපප්‍රධාන මූලධර්ම සම්බන්ධ කරයි. නිදසුනක් වශයෙන් යේසුස්වහන්සේ උගන්වා ඇති එක් බයිබලීය මූලධර්මයක් නම් "දෙන්න එවිට නුඹලාට දෙනු ලැබේ". එහි උප සත්‍යයන් මුදල්දීම, ද්‍රව්‍යමය දේ දීම, මිත්‍රත්වය දීම ආදිය හා සම්බන්ධය. මේ සෑම අවස්ථාවකම, දීමේ ක්‍රියාවලිය නිසා ආත්මික වාසි ලැබේ.

# රටා හා මූලධර්මවල වැදගත්කම

එසකියෙල් 43:7-12 කියවන්න. මෙම කොටස රටා හා මූලධර්මවල වැදගත්කම අවධාරණය කරයි. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට අනුගමනය කිරීම සඳහා සුවිශේෂී රටා පිහිටවූ අතර ඒවායේ ඔවුන්ගේ හැසිරීමේ ආත්මික රටා මෙන්ම නමස්කාර කිරීමේ ස්ථාන සඳහා ද්‍රව්‍යමය රටාද අන්තර්ගත විය.

එහෙත් ඉශ්‍රායෙල්වරුන් ඔවුන්ගේම රටා පිහිටුවා ගත්හ. "ඔවුන්ගේ එළිපත්ත මගේ එළිපත්ත ළඟද"හා "ඔවුන්ගේ කණුව මාගේ කණුව ළඟද පිහිටුවන්න" යයි පැවසූ විට දෙවියන්වහන්සේ අදහස් කළේ ඒ දෙය වේ. ඉශ්‍රායෙල්වරුන් ඔවුන්ගේම රටා නිර්මාණය කළ බැවින් ඔවුන් දෙවියන්වහන්සේගෙන් වෙන් කෙරෙන බිත්තියක් ගොඩනැගූ අතර එමගින් දෙවියන්වහන්සේගේ බලය ගලා ඒම නැවතිණි. එමගින් උන්වහන්සේ ඔවුන්ගේ නමස්කාරය හා සේවය පිළිගැනීම වැළකිණි.

එසකියෙල් දිවැසිවරයා සෙනගට පැවසුවේ දෙවියන්වහන්සේගේ රටාව දෙස බලා ඊට අනුකලව ඔවුන්ගේ ජීවිතවල රටාව මනින ලෙසය.

> **මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල් වංශය තමන්ගේ අපරාධ ගැන ලජ්ජාවෙන පිණිසත් ගෘහයේ ආදර්ශ සිතුයම මනින පිණිසත් ගෘහය ඔවුන්ට පෙන්වන්න. (එසකියෙල් 43:10)**

මිනිසුන් තමන්ගේම හැසිරීම් රටාවන් පිහිටුවාගත් විට, එනම් ඔවුන්ගේම නිකායන්, ආගමික හෝ සංස්කෘතිකයන් අයත් නීති ආදිය, එවිට ඔවුහු ව්‍යාජ ප්‍රමිතියන් පිහිටුවා ගනිති. ඔවුහු බයිබලීය ධර්මයන් ලෙස මනුෂ්‍යයන්ගේ ආඥා උගන්වන්නට පටන් ගනිති. එවැනි අය ගැන යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මනුෂ්‍යන්ගේ ශික්ෂාවන් ගුරුකම්කොට උගන්වමින්, ඔවුන් මට නමස්කාරකරන්නේ නිරර්ථකයේයයි අනාගත වචන මනාකොට කියේයයි කීසේක. (මතෙව් 15:9)**

බයිබලීය රටා හා මූලධර්ම අවබෝධ කරගැනීම වැදගත් වේ. නැතහොත් ඔබගේ දේවනමස්කාරය අපතේ යා හැකිය.

බොහෝ ලෞකික ප්‍රමිතීන් ඇත. ලෞකික හැසිරීම්වලට හා සාර්ථකත්වයට විවිධ රටාවන් ඇත. මිනිසුන් ඒ අනුව රටාවන් සකස් කරගනු ලැබේ. මනුෂ්‍යයන් තමාවම මැනගනු ලබන්නේ අනෙක් මනුෂ්‍යයන්ගේ ප්‍රමිතීන් මත මිස දෙවියන්වහන්සේගේ ප්‍රමිතීන් මත නොවේ. ප්‍රේරිත වූ පාවුල් මෙසේ ලියා තිබේ.

**මක්නිසාද තමුන් ගැනම සාක්ෂිදෙන්නාවූ සමහරුන් සමඟ අප ගණන්ගන්ට නොහොත් ඔවුන්ට අපම සමානකරගන්ට අපට ධෛර්‍යය නැත. නුමුත් තමුන්ගේම මිම්මෙන් තමුන්ම මැනගන්නාවූ, තමුන්ටම තමුන් සමානකර බලන්නාවූ ඔවුහු තේරුම් නැතිව සිටිති. (2 කොරින්ති 10:12)**

මණ්ඩපය සෑදීම සඳහා මෝසෙස්ට උපදෙස් දෙනවිට දෙවියන්වහන්සේ දෙන සැලැස්ම අනුව සියල්ල කරන ලෙස ඔහුට අනතුරු ඇඟවීය.

**මා විසින් නුඹට පෙන්වන සියල්ල ලෙස එනම් මණ්ඩපයේ ආදර්ශයද, එහි සියලු බඩුවල ආදර්ශයද ලෙස එය සාදන්න. (නික්මයාම 25:9)**

**කන්දේදී නුඹට පෙන්වනලද ආදර්ශය ලෙස ඒවා සාදන්ට බලාගනින්න. (නික්මයාම 25:40)**

**මෝසෙස් මණ්ඩපය සාදන්ට යන කළ : කන්දේදී නුඹට පෙන්වන ලද ආදෘශය ලෙස සියල්ල සාදන්ට බලාගන්නැයි දෙවියන්වහන්සේ ආඥා කළ හැටියට, ඒ පූජකයෝ ස්වර්ගියවූ දේවල සටහනක්ව ජායාවක්ව තිබෙන දෙයට සේවය කරති. (හෙබ්‍රෙව් 8:5)**

දේවමාලිගාව සාදන්ට දාවිත් රජතුමා සැලසුම් කරනවිට, දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුගමනය කිරිමට පරිස්සම් විය.

**මේ සටහනේ සියලු වැඩ තේරුම්කර දුන්නාවූ ස්වාමින්වහන්සේගේ අතින් මා ලවා සියල්ලම ලියවා තිබේයයි දාවිත් කීවේය. (1 ලේකම් 28:19)**

භෞතික ලෝකයේ දෙවියන්වහන්සේගේ රටා අනුගමනය කිරිමට මෙම මනුෂ්‍යයෝ බොහෝ සේ පරිස්සම් වූහ. එසේ නම් බයිබලයේ සඳහන් රටා හා මුලධර්ම අනුගමනය කිරිමට අප කෙතරම් පරිස්සම් විය යුතුද?

## බයිබලිය රටා සඳහා නිදර්ශන

ඇදහිලිවතුන් තම පිවිතය සැලසුම් කරගත යුතු හොඳම නිදර්ශනය යේසුස්වහන්සේ වේ.

**මක්නිසාද මා නුඹලාට කළ ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි. (යොහන් 13:15)**

අප අනුගමනය කළ යුතු රටාවන් ලෙස, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ගේ හා ස්ත්‍රින්ගේ පිවිත බයිබලයේ සඳහන්ව ඇත.

**ඉදින් ඔවුන් නපුරු දේවලට ආශාවුණාක්මෙන් අප විසිනුත් ආශා නොවන පිණිස මේ කාරණා අපට ආදර්ශ විය. (1 කොරින්ති 10:6)**

**ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධවුණේය, ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙලවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

බයිබලයේ වාර්තා කර ඇති ජාතින් මගින්, අනෙකුත් ජාතින්ට අනුගමනය කිරිම සඳහා ධනාත්මක නිදර්ශනද, අනුගමනය නොකිරිම සඳහා සෘණාත්මක නිදර්ශනද සපයා තිබේ.

**සොදොම හා ගොමොරාව යන නුවරවල් අළුකරමින් ඒවා පෙරළා දමා විනාශයට නියමකොට මතු අභක්තික ලෙස හැසිරෙන්නන්ට ඒවා ආදර්ශයක් කළසේක් නම්, (2 පේත්‍රැස් 2:6)**

කිතුනු නායකයන් ඔවුන්ගේ අනුගාමිකයන්ට ආදර්ශයක් විය යුතුය.

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලහත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙනලද්දවුන් කෙරෙහි අධිපතිකම් කරන්නාක් මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලාගන්න. (1 පේතෘස් 5:2-3)**

ප්‍රේරිත වූ පාවුල්තුමා මෙසේ ලියා ඇත :

**සහෝදරයෙනි, එක්ව මා අනුව යන්නෝ වෙන්න. අප නුඹලාට ආදර්ශයක්ව සිටින්නේ යම් සේද, එසේ හැසිරෙන්නන් බලාගන්න. (පිලිප්පි 3:17)**

**එසේ කළේ බරක් වෙන්ට අපට අයිතිවාසිකම නැති නිසා නොව, අපම නුඹලාට ආදර්ශයක් වන පිණිසත් නුඹලා අප අනුවයන්නන් වන පිණිසත්ය. (2 තෙසලෝනික 3:9)**

ඇදහිලිවන්තයන්ම ආත්මික ආදර්ශ විය යුතුය. ඔවුන් අන් අයට අනුගමනය කිරීමට ධනාත්මක නිදර්ශන සැපයිය යුතුය.

**නුඹේ යෞවනකම සුළුකරන්ට කිසිවෙකුට ඉඩ නැර, කථාවෙනුත් හැසිරීමෙනුත් ප්‍රේමයෙනුත් ඇදහිල්ලෙනුත් පිරිසිදුකමෙනුත් අදහන්නන්ට නුඹම ආදර්ශයක් වෙන්න. (1 තිමෝති 4:12)**

**මෙසේ නුඹලාම මකිදෝනියෙහි සහ අකායෙහි සිටින සියලු ඇදහිලිවන්තයන්ට ආදර්ශවුණහුය. (1 තෙසලෝනික 1:7)**

**සියල්ලෙහිදී නුඹම යහපත් ක්‍රියාවල ආදර්ශයක් වෙයන්න, විරුද්ධකාරයාට අප ගැන කිසි නපුරක් කියන්ට නැතුව,... (තීතස් 2:7)**

ඔබ අන් අය වෙනුවෙන් ධනාත්මක ආත්මික රටාවන් සැපයීමට නම්, එය ඔබගේ ජීවිතයට බයිබලීය මුලධර්ම අන්තර්ගත කළ යුතු අතර ඔබ ඒවා අවබෝධ කරගත යුතුය.

## බයිබලීය මුලධර්ම සඳහා නිදර්ශන

හෙබ්‍රෙව් 5:12 හි පාවුලු තුමා "දෙවියන්වහන්සේගේ වාක්‍යවල මුල් ගුරුකම්" ගැන සඳහන් කරයි. හෙබ්‍රෙව් 6:1-3 හි ඔහු ඒවා ලයිස්තුගත කරයි. මේවායේ ඇති වැදගත්කම නිසා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය *"ඇහිල්ලේ පදනම"* නමැති සම්පූර්ණ පාඨමාලාව මේ මුලධර්ම සඳහා කැපකර ඇත.

මේ පාඨමාලාව හා සමග එකට අධ්‍යයනය කිරීම සඳහා *"ඇහිල්ලේ පදනම"* නමැති පාඨමාලාව ලබාගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු. මූලික මුලධර්මවල වැදගත්කම එය විස්තර සහිතව පැහැදිලි කරයි. මෙම මූලික මුලධර්ම, දේවරාජ්‍යයේ රටා හා මුලධර්ම ඔබගේ ජීවිතයට අන්තර්ගත කර ගැනීමට අවශ්‍ය ආත්මික පදනම සපයයි.

## දේවරාජ්‍යයේ රටා හා මුලධර්ම

ඉදිරි පරිච්ඡේදවලදී ඔබ *"දේවරාජ්‍යයේ සංස්කෘතිය"* ගැන අධ්‍යයනය කරන විට, දේවරාජ්‍යයේ ජීවිතය පාලනය කරන රටා හා මුලධර්ම ඉගෙන ගන්නවා ඇත.

මේ රටා හා මුලධර්ම ලෝක ප්‍රමිතින්ට හා මෙලොව රාජ්‍යයන්ගේ මුලධර්මවලට වඩා වෙනස්ය.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "රටාව" යන වචනය අර්ථ විග්‍රහ කරන්න.

3. මූලධර්ම" යන වචනය අර්ථ විග්‍රහ කරන්න.

4. "බයිබලීය රටා" යන්නෙන් අදහස්වන්නේ කුමක්ද?

5. "බයිබලීය මූලධර්ම" යන්නෙන් අදහස්වන්නේ කුමක්ද?

6. "දේවරාජ්‍යයේ ජිවත්වීමේ රටා හා මූලධර්ම" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඊළඟ පරිච්ඡේද කිපයේදී ඔබ දේවරාජය පාලනය කෙරෙන මුලික මුලධර්ම අධ්‍යයනය කරන්නෙහිය. මෙම මුලධර්ම, යේසුස්වහන්සේ විසින් දෙන ලද ආඥා මත පදනම් වේ. මේ ආඥා ඉගෙන ගැනිම සඳහා පහත දැක්වෙන කටුසටහන භාවිත කරන්න.

## රජතුමාගේ ආඥා

### පසුතැවිලිවීම:

| | |
|---|---|
| -පසුතැවිලිවන්න | මතෙව් 4:17, එළිදරව් 2:5 |
| -මා වෙතට එන්න | මතෙව් 11:28 |
| -පළමුකොට දෙවියන්වහන්සේද උන්වහන්සේගේ රාජ්‍යයද සොයන්න | මතෙව් 6:33 |
| -යමෙකුට විරුද්ධව යමක් නුඹලාට ඇත්නම් නුඹලාත් කමාවෙයල්ලා | මාර්ක් 11:25 |
| -තමාම නොසලකා හරින්න | මතෙව් 16:24 |
| -ඉල්ලන්න ---සොයන්න ---- තට්ටුකරන්න | මතෙව් 7:7 |
| -පටු දොරකඩින් ඇතුල්වන්ට වීර්ය කරපල්ලා | ලූක් 13:24 |

### විශ්වාසය:

| | |
|---|---|
| -ශුභාරංචිය විශ්වාස කරන්න | මාර්ක් 1:15 |
| -දෙවියන්වහන්සේ කෙරේ විශ්වාස කරපල්ලා, මා කෙරේත් විශ්වාස කරපල්ලා | යොහන් 14:1 |
| -දෙවියන්වහන්සේ විසින් එවු තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගන්න | යොහන් 6:28-29 |
| -මම පියාණන්වහන්සේ තුළත් පියාණන්වහන්සේ මා තුළත් සිටිනසේක යන මාගේ කීම විශ්වාස කරපල්ලා | යොහන් 14:11 |
| -මා කරන ක්‍රියා විශ්වාස කරපල්ලා | යොහන් 10:37-38 |
| -ආලෝකය නුඹලාට තිබෙද්දී ආලෝකය කෙරෙහි අදහාගනිල්ලා | යොහන් 12:36 |
| -නුඹලාට ලැබුණේයයි අදහාපල්ලා | මාර්ක් 11:24 |

### අලුතින් ඉපදීම

| | |
|---|---|
| -නුඹලා අලුතින් උපදින්ට ඕනෑය | යොහන් 3:7 |
| -පළමුකොට ඒවායේ ඇතුළ පවිත්‍ර කරපන්න | මතෙව් 23:26 |
| -ගහත් එකේ එලත් යහපත්යයි පිළිගනිල්ලා | මතෙව් 12:33 |
| -මා තුළ පැවතියල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි | යොහන් 15:4 |
| -නුඹලා තුළ ලුණු ඇතිව සිටපල්ලා | මාර්ක් 9:50 |
| -සදාකාල ජිවනයට පවතින්නාවු කෑම පිණිස වැඩකරපල්ලා | යොහන් 6:27 |
| -නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීතිවෙයල්ලා | ලූක් 10:20 |

## ශුද්ධාත්මාණන්වහන්සේ ලැබීම

| | |
|---|---|
| -ශුද්ධාත්මයාණන් පිළිගනිල්ලා | යොහන් 20:22 |
| -පළමුකොට දරුවෝ තෘප්තියට පැමිණෙත්වා | මාර්ක් 7:27 |
| -යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ | යොහන් 7:37-39 |
| -මාගේ ආඥා රක්ෂා කරන්නෙහුය. සැනසිලිකාරයෙකු නුඹලාට දෙන සේක | යොහන් 14:15-17 |
| -ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලාපල්ලා | යොහන් 16:24, ලූක් 11:5-13 |
| -නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නැවති සිටපල්ලා | ලූක් 24:49 |
| -සැනසිලිකාරයාණන්වහන්සේ මා ගැන සාක්ෂි දෙන සේක. | යොහන් 15:26-27 |
| -නුඹලාත් සාක්ෂි දෙන්නහුය. | |

## යේසුස්වහන්සේ අනුව යෑම

| | |
|---|---|
| -මා අනුව ඒවා | යොහන් 12:26 |
| -බව්තිස්ම ලැබීම | මතෙව් 3:13-15,28:19 |
| -මා සිහිකිරීම පිණිස මේක කරපල්ලා | ලූක් 22:17-19 |
| -නුඹලා විසින් එකිනෙකාගේ පාද සේදිය යුතුය | යොහන් 13:14-15 |
| -යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, තමාගේම කුරුසිය රැගෙන මා අනුව ඒවා | ලූක් 9:23 |
| -මාගෙන් ඉගෙනගනිල්ලා | මතෙව් 11:29 |
| -මාගේ ප්‍රේමයෙහි පැවතියල්ලා | යොහන් 15:9 |

## යාච්ඤාව

| | |
|---|---|
| -සැමවිටම යාච්ඤා කරපල්ලා | ලූක් 21:36 |
| -පරීක්ෂාවට නොපැමිණෙන ලෙස යාච්ඤා කරපල්ලා | ලූක් 22:40-46 |
| -ගොයමේ ස්වාමින්වහන්සේට යාච්ඤා කරපල්ලා | ලූක් 10:2 |
| -නුඹලාට නින්දාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා | ලූක් 6:28 |
| -නුඹේ පියාණන්වහන්සේට යාච්ඤා කරපල්ලා | මතෙව් 6:6, යොහන් 16:24-26 |
| -එහෙින් නුඹලා මෙසේ යාච්ඤා කරපල්ලා | මතෙව් 6: 9-13 |
| -යාච්ඤා කිරීමේදී නිරර්ථකවූ වචන කියාගන කියාගන නොයල්ලා | මතෙව් 6: 7-8 |

## ඇදහිල්ල

| | |
|---|---|
| දෙවියන් කෙරෙහි ඇදහිල්ල ඇතුව සිටපල්ලා | මාර්ක් 11:22 |
| අවිශ්වාස නොකොට විශ්වාස කරපන්න | යොහන් 20:27 |
| සැක නොසිතල්ලා | ලූක් 12:29 |
| නුඹලාගේ ජීවිත ගැන කනස්සලු නොවෙල්ලා | මතෙව් 6:25-34 |
| ඔබගේ සිත කරදර නොවේවා | යොහන් 14:1-27 |
| ධෛර්යවත් වෙයල්ලා | මතෙව් 14:27 |
| බිය නොවන්න | මාර්ක් 5:36, ලූක් 12:4-7 |

## මරණය දක්වා විශ්වාසව සිටින්න

| | |
|---|---|
| මරණය දක්වා විශ්වාසව සිටින්න | එළදරව් 2:10 |
| නුඹලාට තිබෙන දේ තදින් අල්ලා ගනිල්ලා | එළිදරව් 3:11 |
| මනුෂ්‍යයන් නුඹලාට නින්දා, පීඩා කරන කල ප්‍රීතිවෙයල්ලා | මතෙව් 5:11-12, ලූක් 6:23 |
| ඔවුන් එක් නුවරකදී පීඩා කරන කළ ඊළඟ නුවරට දුවපල්ලා | මතෙව් 10:23 |
| නුඹලා කතා කරන්නේ කුමක්දැයි කියා කනගාටු නොවෙල්ලා | මතෙව් 10:19 |
| නුඹලා අතරෙහි නොකොඳුරල්ලා | යොහන් 6:41-43 |
| ඉහළ බලා හිස් ඔසවාපල්ලා | ලූක් 21:28 |

## ශුභාරංචිය දේශනා කිරීම

| | |
|---|---|
| සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා | මතෙව් 10:7, මාර්ක් 16:15 |
| ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් පසුතැවිල්ල ප්‍රකාශ කළ යුතුය | ලූක් 24:46-47 |
| ත්‍රිත්වයේ නාමයෙන් බව්තිස්ම කරපල්ලා | මතෙව් 28:19 |
| මා විසින් අණ කළ සියල්ල ...... උගන්වාපල්ලා | මතෙව් 28:20 |
| මා විසින් නුඹලා කියන දේ කියාපල්ලා | මතෙව් 10:27, මාර්ක් 4:22 |
| මාගේ බැටළුවන් පෝෂණය කරපල්ලා | යොහන් 21:15-17 |
| රෝගීන් සුවකරපල්ලා | මතෙව් 10:8 |

## ලෝභකම

| | |
|---|---|
| සියලු ආකාරයේ ලෝභකමෙන් ප්‍රවේසම් වෙන්ට බලාගනිල්ලා | ලූක් 12:15 |
| පොළොවේ වස්තුව රැස්කර නොගනිල්ලා | මතෙව් 6:19-20 |
| දසයෙන් කොටසක් දෙන්නහුය. එහෙත් වැදගත් කාරණා අත්හැර තිබේ | මතෙව් 23:23 |
| නුඹෙන් ඉල්ලන්නාට දීපල්ලා | මතෙව් 5:42 |
| තිබෙන දෙයින් දන් දීපල්ලා | ලූක් 11:41 |
| නුඹ කෑමක් පිළියෙළ කරන කළ දිළිඳුන් කැඳවාපල්ලා | ලූක් 14:12-13 |

## කෛරාටිකකම

| | |
|---|---|
| පරිසිවරුන්ගේ වංචා නමැති මුහුන්වලින් ප්‍රවේසම් වෙයල්ලා | ලූක් 12:1 |
| ලියන්නන්ගෙන් ප්‍රවේසම් වෙයල්ලා | ලූක් 20:46-47 |
| ඔවුන්ගේ ක්‍රියා ලෙස නොකරල්ලා | මතෙව් 23:2-3 |
| මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳාම් ගෙයක් නොකරල්ලා | යොහන් 2:16 |
| මනුෂ්‍යයන් ඉදිරියේ දන් නොදේවා | මතෙව් 6:1-4 |
| ඇතුල් ගෙට වැදී රහසිගතව යාච්ඤා කරපන්න | මතෙව් 6:5-6 |
| නිරාහාරව ඉන්න කල්හි මනුෂ්‍යයන්ට ඒ බව නොපෙන්වාපන්න | මතෙව් 6:16-18 |

## නිහතමානිකම

| | |
|---|---|
| මාගේ වියගහ නුඹ පිටට ගනින්න | මතෙව් 11:29 |
| අන්‍යජාතීන් මෙන් අධිපතිකම් නොකරල්ලා | මතෙව් 20:25-26 |
| ප්‍රධානියා වෙන්ට කැමති කවරෙකු නුමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය | මාර්ක් 10:43-44 |
| නුඹලා රබ්බියයි කියවා නොගනිල්ලා | මතෙව් 23:8 |
| ප්‍රධානාසනයෙහි ඉඳ නෙගනිල්ලා | ලූක් 14:8-11 |
| ආත්මයන් නුඹලාට යටත්වන නිසා ප්‍රීති නොවෙල්ලා | ලූක් 10:20 |

| | |
|---|---|
| “අපි නිෂ්ප්‍රයෝජන දාසයෝය“ යයි කියාපල්ලා | ලූක් 17:10 |

## අප සහෝදරයන්ට දක්වන ප්‍රේමය

| | |
|---|---|
| මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරපල්ලා | යොහන් 15:12 |
| මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් හෙළා නොදක්නා ලෙස බලාගනිල්ලා | මතෙව් 18:10-14 |
| එකිනෙකා සමග සමගි වෙයල්ලා | මතෙව් 5:23:24, මාර්ක් 9:50 |
| සහෝදරයා සමග ඇති අමනාප විසදා ගනින්න | මතෙව් 18:15-17 |
| නුඹේ සහෝදරයාට දිනකට සත්වරක් කමාවන්න | මතෙව් 18:21-22, ලූක් 17:3-4 |
| පෙනිමේ හැටියට විනිශ්චය නොකරල්ලා | මතෙව් 7:1-5, යොහන් 7:24 |
| වරදට පත් නොකරල්ලා | ලූක් 6:37 |

## පරිපූර්ණ ප්‍රේමය

| | |
|---|---|
| නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා | මතෙව් 5:48 |
| නුඹ සන්තක දේ විකුණා දිළිඳුන්ට දිපල්ලා | මතෙව් 19:21, ලූක් 12:32-33 |
| නුඹේ සතුරන්ට ප්‍රේම කරපන්න | මතෙව් 5:44, 26:52 |
| නුඹට වෛරකරන්නන්ට යහපත කරපල්ලා | ලූක් 6:27-28 |
| සැක නොසිතා ණයට දීපල්ලා | ලූක් 6:35 |
| නපුරු අය සමග පොරට නොසිටිල්ලා | මතෙව් 5:39-41 |
| නුඹලා ක්ෂාන්ති ගුණයෙන් සිටිමෙන් ආත්ම දිනාගන්නහුය | ලූක් 21:19 |

## දෙවියන්වහන්සේ දක්වන උතුම් ප්‍රේමය

| | |
|---|---|
| නුඹේ මුළු හෘදයෙන්ද--- ආත්මයෙන්ද--- බුද්ධියෙන්ද-- ශක්තියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරපන්න | මාර්ක් 12:30 |
| දෙවිවූ ස්වාමින්වහන්සේට පමණක් සේවය කරව | මතෙව් 4:10 |
| පියාණන්වහන්සේට ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුය | යොහන් 4:23-24 |
| පොළොවෙහි කාටවත් පියාණෝයයි නොකියල්ලා | මතෙව් 23:9 |
| තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ පරීක්ෂා නොකරව | මතෙව් 4:7 |
| උන්වහන්සේටම භය වෙයල්ලා | ලූක් 12:5 |
| සියල්ලන් විසින් පුත්‍රයාට ගෞරව කළ යුතුය | යොහන් 5:22-2 |

## දෙවියන්වහන්සේට හා මනුෂ්‍යයාට අපගේ යුතුකම

| | |
|---|---|
| කායිසර්ගේ දේ කායිසර්ට දිපල්ලා | මාර්ක් 12:17 |
| කිසිසෙත් නොදිවුරල්ලා | මතෙව් 5:34-37, මාර්ක් 4:22 |
| දෙවියන්වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා | මතෙව් 19:5-6 |
| නුඹේ විරුද්ධකාරයා සමග ඉක්මනින් සමගිවන්න | මතෙව් 5:25 |
| අනෙක් අය යක්ෂයන් දුරු කිරීම තහනම් නොකෙරේවා | මාර්ක් 9:38-40 |
| නුඹලා ඉදිරියෙහි තබන දේ කාපල්ලා | ලූක් 10:8 |
| කිසිවක් නැති නොවන පිණිස ඉතිරිවූ කෑබලි එකතු කරපල්ලා | යොහන් 6:12 |

## අසල්වැසියාට ඇති යුතුකම

| | |
|---|---|
| තමාට මෙන්ම තමාගේ අසල්වැසියාට ප්‍රේම කරව | මතෙව් 19:17-19 |
| මිනී නොමරව | මතෙව් 19:18 |

| | |
|---|---|
| කාමමිථ්‍යාචාර නොකරව | මතෙව් 19:18 |
| සොරකම් නොකරව | මතෙව් 19:18 |
| බොරු සාක්ෂි නොකියව | මතෙව් 19:18 |
| තාගේ පියාටත් මවටත් ගෞරව කරව | මතෙව් 19:19 |
| මනුෂ්‍යයන් විසින් නුඹලාට යම්සේ ක්‍රියා කරනවාට නුඹලා කැමතිද නුඹලාත් ඔවුන්ට එසේම කරපල්ලා | ලූක් 6:31 |

## ප්‍රඥාව

| | |
|---|---|
| සර්පයන් මෙන් නුවණ ඇතිව, පරවියන්මෙන් අහිංසකව සිටපල්ලා | මතෙව් 10:16 |
| මනුෂ්‍යයන්ගෙන් ප්‍රවේසම් වෙයල්ලා | මතෙව් 10:17 |
| (මගපෙන්වන අන්ධයෝ) නිකම් සිටින්වා | මතෙව් 15:12-14 |
| ශුද්ධ දේ බල්ලන්ට හෝ ඌරන්ට නොදෙල්ලා | මතෙව් 7:6 |
| පසුම්බියක් ඇත්තෙක් ඒක ගනීවා | ලූක් 22:35-36 |
| සුදුස්සා කව්දැයි විභාගකොට එහි නැවති සිටපල්ලා | මතෙව් 10:11-13, ලූක් 10:5-7 |
| නුඹලා පිළි නොගන්නේ නම් නුඹලාගේ පාදවල දූලි ගසාදමාපල්ලා | ලූක් 9:5,10:10-11 |

## ශුද්ධලියවිල්ල සෙවීම

| | |
|---|---|
| ශුද්ධලියවිල්ල සොයන්න | යොහන් 5:39 |
| නඹලාට මා කී වචනය සිහිකරපල්ලා | යොහන් 15:20 |
| මේ වචනය නුඹලාගේ කන්වල බහා ගනිල්ලා | ලූක් 9:44 |
| නුඹලා අසන්නේ කෙසේදැයි කියා බලාගනිල්ලා | ලූක් 8:18 |
| නුඹලා අසන කාරණා ගැන බලාගනිල්ලා | මාර්ක් 4:24 |
| පරිසිවරුන්ගේ මුහුන්වලින් ප්‍රවේසම් වෙයල්ලා | මතෙව් 16:6-12 |
| බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේසම් වෙයල්ලා | මතෙව් 7:15-17 |

## ඔබගේ ආලෝකය බැබළීමට ඉඩහැරීම

| | |
|---|---|
| නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා | මතෙව් 5:16 |
| නුඹ තුළ තිබෙන එළිය අඳුරු නොවන ලෙස බලාගනින්න | ලූක් 11:35 |
| නුඹලා ගොස් ඵල දරන්න | යොහන් 15:16 |
| නුඹලාත් දයාවන්තව සිටපල්ලා | ලූක් 6:36 |
| නුඹට කොපමණ මහත් දේවල් කළසේක්දැයි කියාපන්න | මාර්ක් 5:19 |
| නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමන්න | යොහන් 4:35 |
| ආලෝකය තිබෙන කළ ඇවිදපල්ලා | යොහන් 12:35 |

## ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි පැමිණීම

| | |
|---|---|
| නුඹලාට ඇති දේ මා එනතුරු තදින් අල්ලාගෙන සිටපල්ලා | එළිදරව් 2:25, 3: 2-3 |
| සුදානම්ව සිටින්න, මනුෂ්‍ය පුත්‍රයා එන්නේය | ලූක් 12:40 |
| නුඹලාගේ ඉඟටි බැඳ නුඹලාගේ පහන්ද දල්වා තිබේවා | ලූක් 12:35-36 |
| නුඹලාගේ සිත් බර නොවන හැටියට බලාගනිල්ලා | ලූක් 21:34 |
| ලොත්ගේ භාර්යාව සිහිකරපල්ලා | ලූක් 17:31-32 |
| මුළා නොවෙන්ට බලාගනිල්ලා | මාර්ක් 13:5-6, ලූක් 21:8 |
| අවදිව සිටින්න | මාර්ක් 13: 34-37 |

# සත්වන පරිච්ඡේදය

## දේවරාජ්‍යයේ සංස්කෘතිය

## දේවරාජ්‍යයේ මුලධර්මය - 1 කොටස

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දේවරාජ්‍යයේ මුලධර්ම දැනගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීම
- දේවරාජ්‍යයේ ජිවිතය පාලනය කෙරෙන මුලික මුලධර්ම හැඳින ගැනීමට
- දේවරාජ්‍යයේ මුලධර්ම ගොඩනගා ඇති පදනම හැඳින ගැනීමට
- අනෙකුකත් සියලු මුලධර්ම පදනම් වන දේවරාජ්‍යයේ නිති දෙක සඳහන් කිරීමට
- හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **එබැවින් මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක් නියම කළාක්මෙන්ම... නුඹලාට රාජ්‍යයක් නියම කරමි. (ලූක් 22:29)**

## හැඳින්වීම

දේවරාජ්‍යයේ ශුභාරංචිය වන්නේ, දෙවියන්වහන්සේගේ මුල් සැලැස්මෙන් බලාපොරොත්තු වු ජිවිතයට නැවත පැමිණෙන ලෙස මිනිසාට කෙරෙන ආරාධනාවයි. එහෙත් දෙවියන්වහන්සේ යම්කිසි සාරධාර්මික ප්‍රමිතියක් දක්වා, ඔබ එය සාක්ෂත් කර ගතහොත් ඔබට දේව රාජ්‍යයට ඇතුළුවිය හැකියයි පවසන්නේ නැත. ඇතුල්වීම සඳහා එක් අවශ්‍යතාවයක් ඇත. එය නම් පාපය ගැන පසුතැවිලිවීම තුළින් ආත්මිකව නැවත ඉපදිම වේ. පසුතැවිලිවීමෙන් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් ඔබ දේවරාජ්‍යයට උපත ලබන අතර ඔබ දේවරාජ්‍යයේ වාසය කරන්නෙකු වේ.

දේවරාජ්‍යයේ පදිංචිකරුවකු විමට, දේවරාජ්‍යයේ නිති මගින් පාලනය කෙරෙන අලුත් ජිවන රටාවක් අවශ්‍යය. ආත්මික රාජ්‍යයේ ජිවන රටාව ලෝක රාජ්‍යවල ජිවන රටාවලට වඩා හාත්පසින්ම වෙනස්ය. එය ව්‍යුහයෙන් මෙන්ම ප්‍රතිපත්ති වලින්ද වෙනස්ය. ඔබ දේවරාජ්‍යයට ඇතුළු වු විට එය අලුත් රටකට සංක්‍රමණය වුවාක් මෙනි. ඔබ වෙනස් සංස්කෘතියක් උගත යුතුය.

ස්වාභාවික ලෝකයේ "සංස්කෘතිය" යනු එම සමාජයේ ජිවන ශෛලය්‍ය පාලනය කෙරෙන හැසිරීම් රටාව වේ. මෙම පරිච්ඡේදයෙන් හා ඊළඟ පරිච්ඡේදයෙන් ඔබ දේව රාජ්‍යයේ සංස්කෘතිය ගැන ඉගෙනගන්නෙහිය. පසුව එන පරිච්ඡේදයකින්, උපමා මගින් එළිදරව් කෙරෙන දේවරාජ්‍යයේ අතිරේක සත්‍යයන් ඉදිරිපත් කෙරෙනු ඇත.

## දේවරාජ්‍යයේ මුලධර්මවල වැදගත්කම[1]

දේවරාජ්‍යයේ ජිවිතය පාලනය කෙරෙන මුලධර්ම දැනගැනිම, පහත දැක්වෙන කරුණු නිසා, වැදගත්වේ.

### ඔබගේ පදිංචිය තබාගැනිම සඳහා දේවරාජයේ මුලධර්මවලට අනුකූලව ජිවත්විය යුතුය:

දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා එකම අවශ්‍යතාවය පසුතැවිලිවිම වුවද, පදිංචිය පවත්වාගෙන යෑමට විවිධ අවශ්‍යතා ඇත. යේසුස්වහන්සේ මෙසේ පැවසු සේක.

> **ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට : ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් එළිදරව් කළ පරිදි, පියාණන්වහන්සේගේ කැමැත්ත වන්නේ ඇදහිලිවතුන් දේවරාජ්‍යයේ නිති මගින් පාලනය විය යුතු බවය.

### දේවරාජ්‍යයේ මුලධර්ම වැදගත් බව යේසුස්වහන්සේ පැවසු සේක:

ජිවිතයේ මුලිකම අවශ්‍යතාවය විය යුත්තේ දේවරාජ්‍යය බව ලුක් 12:22-31 න් යේසුස්වහන්සේ පැවසු සේක. උන්වහන්සේ එම ප්‍රකාශය සමාප්ත කර ඇත්තේ මෙසේය.

> **එහෙත් උන්වහන්සේගේ රාජ්‍යයම සොයායන්න, එවිට මේ දේවලුත් නුඹලාට දෙනු ලබන්නේය. (ලූක් 12:31)**

ඔබ දේවරාජ්‍යය, එනම් එහි මුලධර්ම, එහි ජිවන රටාව, එහි ශුභාරංචිය සොයන්නේ නම් ජිවිතයට අවශ්‍ය අනෙකුත් සියල්ල සැපයෙනු ඇත.

### දේවරාජ්‍යයේ ඵල වන්නේ එය අයත්දැයි බැලිමට කෙරෙන පරීක්ෂාවය:

දේවරාජ්‍යය අයත්දැයි බැලිමට කෙරෙන පරික්ෂාව වන්නේ එහි ඇති ඵල ගෙන ඒම බව යේසුස්වහන්සේ යුදෙව්වන්ට පැවසු සේක (මතෙව් 21:43). දේවරාජ්‍යයේ ඵලය නම් අභ්‍යන්තරයේ ඇති ජිවය නිසා බාහිරව නිපදවන දෙය වේ. එයද ස්වාභාවික ගසක ඵලය මෙනි. එහිද බාහිර නිපැයුම ඇතුළත ජිවය නිසා සිදුවන්නෙකි. ඔබ දේවරාජයේ පදිංචි කරුවෙකු නම් ඔබගේ ජිවිත රටාවෙන් එය පෙන්වනු ඇත.

### අනාගත රාජ්‍යයේ රජකම් කිරිමට නම් අපි එහි මුලධර්ම දැනගත යුතු වෙමු:

2 තිමෝති 2:12 න් දැක්වෙන්නේ අනාගත දේවරාජ්‍යයේ යේසුස්වහන්සේ සමග ඇදහිලිවතුන්ද රජකම් කරන බවය. “රජකම්කිරිම“ යනු “බලය හා ආධිපත්‍යය ඇතිව පාලනය කිරිම“ වේ. ඔබ උන්වහන්සේ සමග රජකම් කිරිමට නම්, ඔබ එම රාජ්‍යයේ පාලනය කෙරෙන නිති දැනගත යුතුය.

---

[1] හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් ඉදිරිපත්කර ඇති *“ඇහිල්ලේ පදනම“* නැමැති පාඩමාලාව යේසුස්වහන්සේගේ සම්පූර්ණ ඉගැන්විම් විෂයන් අනුව සංවිධානය කර ඉදිරිපත් කර ඇත. මේ පාඩමාලාව හා සමග එකට අධ්‍යයනය කිරිම සඳහා *“ඇහිල්ලේ පදනම“* නමැති පාඩමාලාව ලබාගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු. එයට හේතුව එම ලයිස්තුව මෙහි සඳහන් කොට නොමැති බැවිනි.

## දේවරාජ්‍යයේ මුලධර්මවල අත්තිවාරම

ස්වාභාවික ලෝකයේ අත්තිවාරමක් යනු යමක් ගොඩනගා ඇති දෙයක යටින් ඇති ව්‍යුහය වේ. ගොඩනැගිල්ලක් සාදන සෑම අවස්ථාවකම හොඳ අත්තිවාරමක් පළමුව දැමිය යුතුය. මෙම අත්තිවාරම සාදන ගොඩනැගිල්ල දරා ගෙන සිටී.

දේවරාජ්‍යයේ හා එය පාලනය කරන මුලධර්මවල අත්තිවාරම ධර්මිෂ්ඨකම වේ.

> **නුමුත් පුත්‍රයා ගැන කථාකොට : දෙවියන්වහන්සේ, ඔබගේ සිංහාසනය සදාකාලේටම පවත්නේය. ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය යුක්තියේ ජයකොන්තයක්ය. (හෙබ්‍රෙව් 1:8)**

ජයකොන්තය යනු බලයේ හෝ ආධිපත්‍යයේ හෝ සලකුණක් ලෙස අතින් අල්ලා ගෙන සිටින යෂ්ටියක් හෝ දණ්ඩක් හෝ වේ. දේවරාජ්‍යයේ බලය හෝ ආධිපත්‍යය, ධර්මිෂ්ඨකමය. එය ස්වයං- දියුණුවේ හෝ ආගමේ හෝ ධර්මිෂ්ඨකම නොවේ. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මක්නිසාද නුඹලාගේ ධර්මිෂ්ඨකම ලියන්නන්ගේද ඵරිසිවරුන්ගේද ධර්මිෂ්ඨකමට වැඩි නොවීනම්, නුඹලා කිසිසේත් ස්වර්ගයට ඇතුල් නොවන්නුයයි නුඹලාට කියමි. (මතෙව් 5:20)**

ලියන්නෝ හෝ පරිසිවරු ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව සේවා කාලයේ සිටි ආගමික නායකයෝ වෙති. ඔවුන්ගේ ආත්මික අත්දැකිමේ පදනම වූයේ, ධර්මිෂ්ඨවීම සඳහා ඔවුන් විසින්ම දරණ ලද උත්සහය වේ. ඔවුන්ගේ ජිවිතයේ සෑම අංගයක්ම පාලනය කෙරෙන නිති, ව්‍යවස්ථා හා සම්ප්‍රදායන් තිබිණි.

> **නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න, මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)**

දේවරාජ්‍යයේ අත්තිවාරම පවතින්නේ ධර්මිෂ්ඨ මිනිසුන් ගතකරන ධර්මිෂ්ඨ ජිවිත මතය.

> **එසේද වුවත් : ස්වාමින්වහන්සේ තමන්ගේ අය දන්නාසේකැයිද ස්වාමින්වහන්සේගේ නාමය සඳහන්කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්වායිද යන මුද්‍රාව ඇතුව දෙවියන්වහන්සේගේ ස්ථිර අත්තිවාරම පවත්නේය. (2 තිමෝති 2:19)**

මෙය පහත දැක්වෙන රූප සටහනින් පැහැදිලි වේ.

ධර්මිෂ්ඨ මිනිසුන් ---------→ ස්වාමින්වහන්සේ තමන්වහන්සේගේ අය දන්නා සේක.

ධර්මිෂ්ඨ ජිවිත ගත කිරිම--------------→ ස්වාමින්වහන්සේගේ නාමයෙන්, තමන්වද නම්කරගන්නා සෑම කෙනෙක්ම අපරාධ සියල්ල අත්හැර, ඒවායින් ඈත්ව සිටීවා.

## දේවරාජ්‍යයේ අත්තිවාරම

මෙම ධර්මිෂ්ඨකම සඳහා කැපවෙන මට්ටම් දෙකක් තිබේ. පහත දැක්වෙන පාඨවලින් එය පැහැදිලි වේ.

**බලව, එක්තරා කෙනෙක් උන්වහන්සේ ළඟට ඇවිත් : ආචාරීන්වහන්ස, සදාකාල ජීවනය ලබාගන්න පිණිස මොන යහපත් දෙයක් කරම්දැයි උන්වහන්සේගෙන් ඇසුවේය. උන්වහන්සේද, නුඹ යහපත ගැන මාගෙන් විචාරන්නේ මක්නිසාද? යහපත්ව සිටින්නේ එක්කෙනෙක්මය. නුමුත් නුඹ ජීවනයට ඇතුල්වෙන්ට කැමැත්තෙහි නම් ආඥාවන් පවත්වාපන්නැයි ඔහුට කීසේක. (මතෙව් 19:16-17)**

**යෞවනයාද : මේ සියල්ල රක්‍ෂාකළෙමි. තව මට අඩු කිමෙක්දැයි උන්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්වහන්සේද : නුඹ සම්පූර්ණවෙන්ට කැමති නම් ගොස් නුඹ සන්තක දේ විකුණා දිළිඳුන්ට දෙන්න, එවිට ස්වර්ගයෙහිදී නුඹට වස්තු ලැබෙන්නේය. නුඹ මා අනුව යන්ට එන්නැයි ඔහුට කීසේක. නුමුත් යෞවනයා ඒ කීම අසා, තමා බොහෝ සම්පත් ඇති කෙනෙක්ව සිටි බැවින්, ශෝකයෙන් යන්ට ගියේය. (මතෙව් 19:20-22)**

“ජීවිතයට ඇතුළුවීමට“ අවශ්‍ය ධර්මිෂ්ඨකමේ එක් මට්ටමක් තිබේ. මෙය, මනුෂ්‍යයන් පාපයෙන් පවිත්‍රවී දෙවියන්වහන්සේගේ ආඥාවන් අනුව ජීවත්වීම ආරම්භ කරන විට අත්දකින අලුත් ඉපදීමක් තුළින් පැමිණෙන්නකි. එහෙත් පරිපූර්ණත්වය (ආත්මික පරිණතවීම) ලෙස හැඳින්වෙන තවත් ධර්මිෂ්ඨකමේ මට්ටමක් ඇත. පරිපූර්ණත්වය අත්කර ගැනීම සඳහා ලෞකික අගයයන්, ප්‍රමිතීන් හෝ තමන්ට මහත්සේ වටිනාකමක් ඇති තමාට අයත් දේවල් සම්පූර්ණයෙන්ම කැපකිරීම අවශ්‍යය.

අපට අයත් සියල්ල විකුණා දිළිඳුන්ට දියයුතුයයි මින් අදහස් නොකෙරේ. යේසුස්වහන්සේට මේ දෙය අවශ්‍ය වූයේ මේ මිනිසාගෙන් පමණි. ඊට හේතුව ඔහුට වස්තුව දෙවියන්වහන්සේට වඩා වැදගත්වූ බැවිනි. රජතුමාට වඩා වැදගත් දෙයක් අපට මෙලොව තිබිය නොහැකිය. පරිපූර්ණත්වය ලබාගැනීමට සඳහා අපි ලෞකික ප්‍රතිපත්ති අතහැර දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති අල්ලා ගත යුතු වෙමු.

## දේවරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම ප්‍රතිපත්ති දෙක:

අනෙකුත් සියලුම ප්‍රතිපත්ති පදනම්වන ශ්‍රේෂ්ඨ දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති දෙකක් ඇත. ශ්‍රේෂ්ඨතම ආඥා කවරෙක්දැයි ඇසූ විට යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

**උන්වහන්සේ ඔහුට කථාකොට, තාගේ මුළු හෘදයෙන්ද තාගේ මුළු ආත්මයෙන්ද තාගේ මුළු බුද්ධියෙන්ද තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරව. මේක උතුම්වූ පළමුවෙනි ආඥාවය. මෙය හා සමාන දෙවනි එකක් තිබේ, එනම් තට මෙන් තාගේ අසල්වැසියාටද ප්‍රේම කරව යනුය. මේ ආඥා දෙක පිට මුළු ව්‍යවස්ථාවත් අනාගතවාකයයත් පිහිටා තිබේයයි කීසේක. (මතෙව් 22:37-40)**

මාර්ක් මෙම ප්‍රකාශයම මෙසේ සඳහන් කර ඇත.

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: ප්‍රධාන එක නම් අහෝ ඉශ්‍රායෙල්, අසන්න, අපේ දෙවියන්වහන්සේ ස්වාමින්වහන්සේය උන්වහන්සේ එකම (දෙවියන්වහන්සේ)ය. නුඹේ මුළු හෘදයෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ මුළු ශක්තියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරන්න යන එකය. දෙවනි එක නම් නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේම කරන්න යන එකය. මේවාට වඩා උතුම්වූ අන්කිසි ආඥාවක් නැතැයි කීසේක. (මාර්ක් 12:29-31)**

දෙවනි ආඥාව යේසුස්වහන්සේ තවත් ආකාරයකට සඳහන් කළ සේක.

**එබැවින් මනුෂ්‍යයන් විසින් නුඹලාට යමක් යමක් කරනවාට නුඹලා කැමතිද නුඹලාත් එසේම ඔවුන්ට කරපන්න. ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් මේය. (මතෙව් 7:12)**

**මනුෂ්‍යයන් විසින් නුඹලාට යම්සේ ක්‍රියා කරනවාට නුඹලා කැමතිද, නුඹලාත් ඔවුන්ට එසේම කරන්න. (ලූක් 6:31)**

දේවරාජයයේ ශ්‍රේෂ්ඨතම ප්‍රතිපත්ති දෙක මෙසේ සාරාංශ කළ හැකිය.

1. නුඹේ මුළු හෘදයෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, සිතින් හා ශක්තියෙන් දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම.
2. ඔබ ඔබටම ප්‍රේම කරන තරමටම අන් අයට ප්‍රේම කිරීම හා අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද ඒ දේම ඔවුන්ටත් කිරීම.

අනෙකුත් සියලුම රාජ්‍යය ප්‍රතිපත්ති මෙම ප්‍රධාන ප්‍රතිපත්ති දෙක මත පිහිටන්නේය. සෑම රාජ්‍යය ප්‍රතිපත්තියක්ම ඔබ දෙවියන්වහන්සේ සමග හෝ අන් අය දෙවියන්වහන්සේ සමග හෝ සම්බන්ධතාව හා බැඳේ.

## දේවරාජ්‍යය හඳුන්වාදීම

දේවරාජ්‍යය හඳුන්වාදුන් මොහොතේ සිටම, එහි ව්‍යුහය ලෝකයේ රාජ්‍යයවල ව්‍යුහයනට වඩා සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ බව පෙනුණි. කන්‍ය වූ මරියතුමියට දේවදූතයා දර්ශනය වී පැමිණෙන්නාවූ රජතුමාගේ මව ඇය බව පැවසූ විට, මරියතුමිය දෙවියන්වහන්සේට ප්‍රශංසා කළාය. ඇගේ නමස්කාරයේ වචන අනාගත වාක්‍යයන් වන අතර දේවරාජ්‍යයේ නව ලෝක පිළිවෙළ ඉන් එළිදරව් විය.

**මක්නිසාද බලවත්වූ තැනැන්වහන්සේ මට මහත් දේ කළසේක, උන්වහන්සේගේ නාමය ශුද්ධය. උන්වහන්සේගේ කරුණාව උන්වහන්සේට භයවන්නන් කෙරෙහි පරම්පරාවෙන් පරම්පරාවට පවතියි. උන්වහන්සේ ස්වකිය බාහුවෙන් බලය පෑසේක. තමුන්ගේ සිත්වල කල්පනාවෙන් අහංකාරිවූ අය විසිරෙවූසේක. උන්වහන්සේ අධිපතින් සිංහාසනවලින් හෙළා පහත් අය උසස් කළසේක. බඩගිනිවූවන් යහපත් දෙයින් තෘප්තියට පමුණුවා වස්තුකාරයන් හිස් අතින් හැරිය සේක. (ලූක් 1:49-53)**

අහංකාරිවූ අය හා බලවත් අය පහතට ගෙන එනු ලැබේ. පහත් අය උසස් කරනු ලැබේ. බඩගිනිවූවන් යහපත් දෙයින් තෘප්තියට පමුණුවා වස්තුකාරයන් හිස් අතින් හරිනවා ඇත.

යොහන් දේවරාජ්‍යය හඳුන්වාදුන් විටද ඉහත පිළිවෙළටම එළිදරව් කරන ලදි.

**සියලු මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේගේ ගැළවීම දකින්නෝයයි වනයෙහි හඬගසන්නෙකුගේ ශබ්දයය කියා අනාගතවක්තෘවූ යෙසායාගේ වචන, සඳහන්වූ පොතෙහි ලියා තිබෙන ලෙස, යොහන් පව්කමාව පිණිස පසුතැවිල්ලේ බව්තිස්මය දේශනාකරමින්, යොර්දාන් වටකර මුළු පළාතට ආවේය. (ලූක් 3:5-6)**

යේසුස්වහන්සේ කළ පළමු හාස්කම වතුර, වයින් බවට හැරවීම වේ. මින් පෙන්වන්නේ දේවරාජ්‍යය පාලනය කරන නීති, ස්වාභාවික ලෝකයේ ඒවාට වඩා පටහැනි බවය.

## පොදු මූලධර්ම : දේවරාජ්‍යයේ සංස්කෘතිය

දේවරාජ්‍යය ක්‍රියාත්මක වන මූලික මූලධර්ම, මනුෂ්‍යාගේ සාමාන්‍ය සිතිවිල වලට හා මෙලොව රාජ්‍යයන් වල පිළිගත් ව්‍යුහවලට ප්‍රතිවිරුද්ධය. මේවාට පහත දැක්වෙන මූලධර්ම අයත් වේ.

## පොදු මූලධර්මයක්:

"නුඹලා අතරේ එසේ නොවන්නේය" යන මූලික දේවරාජ්‍යය මූලධර්මය යේසුස්වහන්සේ පිහිටුවන ලදි.

**නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා: අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයින් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් නුඹලා දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය. එසේම මනුෂ්‍යය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේයයි කීසේක. (මතෙව් 20:25-28)**

**නුමුත් නුඹලා එසේ නොව, නුඹලා අතරෙන් වඩා උත්තමයා බාලයා මෙන් වේවා, ප්‍රධානයා උපස්ථාන කරන්නා මෙන් වේවා. (ලූක් 22:26)**

**නුමුත් නුඹලා අතරේ එසේ නොවේය. නුඹලා අතරේ උතුම්වෙන්ට කැමති කවරෙක් නුමුත් නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙක් නුමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය. (මාර්ක් 10:43-44)**

යේසුස්වහන්සේ මෙහිදී නායකත්වය පිළිබඳ සුවිශේෂ කරුණු ගැන කටයුතු කළද, උන්වහන්සේ දේවරාජ්‍යය පිළිබඳ පොදු මූලධර්මයක් ද පිහිටවූ සේක. "නුඹලා අතරේ එසේ නොවන්නේය". ලෞකික ප්‍රමිතීන් හා භූමික රාජ්‍යයන් ඇතැම් මූලධර්ම පිළිගත්තද, දේවරාජ්‍යයේ මූලධර්ම වෙනස් වේ" .නුඹලා අතරේ එසේ නොවන්නේය".

## එකමුතුකම පිළිබඳ මූලධර්ම:

එකිනෙකාගෙන් බෙදී වෙන් වූ භූමික රාජ්‍යයන් බොහෝ තිබේ. එමෙන්ම භූමික රාජ්‍යයයන් තුළද බෙදීමක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස කුමන්ත්‍රණ හා විප්ලවයන් ඇතිවේ. දේවරාජ්‍යය එක්සත් රාජ්‍යයකි. එය කොටස් බොහෝමයක් සහිත එක් ආත්මික ශරීරයක් ලෙස විස්තර කර ඇත.

**මක්නිසාද ශරීරිය එකක්ව බොහෝ අවයව ඇතුවාක්මෙන්ද, ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එය ශරීරයක්ව තිබෙන්නාක්මෙන්ද ක්‍රිස්තුස්වහන්සේත් එසේව සිටිනසේක. මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වෙත්වා දාසයෝ නොහොත් නිර්දාසයෝ වෙත්වා, අපි සියල්ලෝ එකම ආත්මාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තිස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මාණන්ගෙන් පොවනු ලැබීමුව. මක්නිසාද ශරීරය එක අවයවක් නොව බොහෝ අවයවයෝය. (1කොරින්ති 12:12-14)**

දේවරාජ්‍යයේ වාසයෝ කරන්නෝ දෙවියන්වහන්සේ තුළ හා යේසුස්වහන්සේ තුළ එකමුතුව සිටිති.

**ඔවුන් සියල්ලන් එකත්වයක් වන පිණිස, පියවු ඔබ මා තුළෙහිද මා ඔබ තුළෙහිද සිටින්නාක් මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාසකරන පිණිසත්, අප තුළ ඔවුන් එකත්වයක් වන පිණිසත් යාච්ඤාකරමි. අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් එකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි. මෙසේ කලේ මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත් ඔබ මා එවූ බවද මට ප්‍රේමකළාක්මෙන් ඔවුන්ටත් ප්‍රේමකළ බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය. (යොහන් 17:21-23)**

සාතන්ගේ රාජ්‍යය සමග දෙවියන්වහන්සේගේ රාජ්‍යයට කිසිදු සම්බන්ධකමක් නැත.

**උන්වහන්සේ ඔවුනගේ සිතිවිලි දැන ඔවුන්ට කථාකොට : තමාටම විරුද්ධව භේදවුණාවූ හැම රාජ්‍යයම පාළුවන්නේය: තමාටම විරුද්ධව භේදවුණාවූ හැම නුවර හෝ ගෙය නොපවතින්නේය. සාතන් විසින්ම සාතන් දුරුකරයි නම් ඔහු තමාටම විරුද්ධව භේදව සිටියි: එසේවී නම් ඔහුගේ රාජ්‍යය පවතින්නේ කොහොමද? තවද මම බෙල්සෙබුබ් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, නුඹලාගේ පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන උන් දුරුකරද්ද? එබැවින් ඔව්හු නුඹලාගේ විනිශ්චයකාරයෝ වන්නෝය. නුමුත් මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා කරා පැමිණ තිබේ. (මතෙව් 12:25-28)**

**එවිට උන්වහන්සේ ඔවුන් තමන් වෙතට කැඳවා උපමාවලින් කථාකරමින් : සාතන් දුරුකරන්ට සාතන්ට පුළුවන් කොහොමද? යම් රාජ්‍යයක් ඒකටම විරුද්ධව භේද වුණොත් ඒ රාජ්‍යය පවතින්ට නොහැකිය. යම් ගෙයක් ඒකටම විරුද්ධව භේද වුනොත් එය පවතින්ට නොහැකිවන්නේය. සාතන් තමාටම විරුද්ධව නැගිට භේදවේ නම් ඔහු පවතින්ට නොහැකිව කෙළවරවෙයි. (මාර්ක් 3:23-26)**

**නුමුත් උන්වහන්සේ ඔවුන්ගේ සිතිවිලි දැන ඔවුන්ට කියනසේක් : තමාටම විරුද්ධව භේද වූ යම් රාජ්‍යයක් ඇත්ද ඒක පාළුවන්නේය: ගෙදරකට භේද වූ ගෙදරක් වැටී යන්නේය. ඉදින් සාතන් තමාටම විරුද්ධව භේදව සිටිනම් ඔහුගේ රාජ්‍යය පවතින්නේ කෙසේද? මක්නිසාද මා යක්ෂයන් දුරු කරන්නේ බෙල්සෙබුබ් කරණකොටගෙනයයි නුඹලා කියන්නහුය. නුමුත් මම බෙල්සෙබුබ් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම් නුඹලාගේ පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන ඔවුන් දුරු කරද්ද? එහෙයින් ඔවුහු නුඹලාගේ විනිශ්චයකාරයෝවන්නෝය. නුමුත් මම දෙවියන්වහන්සේගේ ඇඟිල්ලෙන් යක්ෂයන් දුරුකරම් නම්, සැබවින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය නුඹලා කෙරෙහි පැමිණ තිබේ. (ලූක් 11:17-20)**

දේවරාජ්‍යයේ ඇති එක්සත්කමේ එක් ප්‍රධාන පරමාර්ථයක් වන්නේ ඉන් ඇතිවන අසීමිත බලයවේ. යේසුස්වහන්සේ මෙසේ පොරොන්දු වූ සේක.

**නැවතත් නුඹලාට කියම් : පොළවේදී නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන යමක් ගැන එක්සිත්වන්නෝ නම් ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට ලැබෙන්නේය. මක්නිසාද දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන ඔවුන් මැද සිටිමියි කීසේක. (මතෙව් 18:19-20)**

දේවරාජ්‍යයේ වාසය කරන්නවුන් තවම මාංශික ශරීරයන් ඇතිව සිටින බැවින් වරින් වර භේද ඇතිවිය හැකිය. මෙවැනි භේද හා කටයුතු කරන ආකාරය ගැන උපදෙස් යේසුස්වහන්සේ මතෙව් 18:15-35 දී ඇත.

## කාවැද්දීමේ මූලධර්ම:

දේවරාජ්‍යය, දෙයාකාරයකින් ලෝකයට කාවැද්දිය යුතුය. ආලෝකය සහ ලුණු මෙන් වේ.

**නුඹලා පොළොවේ ලුණුය. නුමුත් ලුණුවල රස නැතිවුනොත් ඒවා, කුමකින් රස කරනු ලබන්නේද? එතැන් පටන් ඒවා පිටත දමනු ලබන්ටද මනුෂ්‍යයින්ගේ පයින් පාගනු ලබන්ටද මිස අන්කිසිවකට නොවටනේය. නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනේ තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය. මනුෂ්‍යයෝ පහනක් දල්වා කුරුණිය යට නොව පහන්රුක උඩ තබති, එවිට එයින් ගෙයි සිටින සියල්ලන් කෙරෙහි ආලෝකය බබළයි. එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයේ සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරවකරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. (මතෙව් 5:13-16)**

**කිසිවෙක් පහනක් දල්වා, ඇතුල් වන්නන්ට එළිය ලැබෙන පිණිස පහන් රුක උඩ තබනවා මිස යට ගබඩාවකවත් කුරුණියක් යටවත් නොතබයි. ශරීරයේ පහන නම් නුඹේ ඇසය. නුඹේ ඇස පැහැදිලිව තිබෙන විට නුඹේ මුළු ශරීරියත් එළිය වන්නේය, නුමුත් එය නරකව තිබෙන විට නුඹේ ශරීරියත් අඳුරු වන්නේය. එබැවින් නුඹ තුළ තිබෙන එළිය අඳුරු නොවන ලෙස බලාගන්න. ඒ නිසා නුඹේ මුළු ශරීරය එහි අඳුරු තැනක් නැතිව එළියෙන් පිරී තිබේ නම් පහන දීප්තිමත්ව බැබළීමෙන් නුඹට එළිය දෙන ලෙසම, ඒක සම්පූර්ණයෙන්ම එළිය වන්නේයයි කී සේක. (ලූක් 11:33-36)**

**ඉඳින් ලුණු හොඳය. නුමුත් ලුණෙහි පවා ලුණු ගතිය නැතිවුනොත්, ඒවා රසකරන්නේ කුමකින්ද? පොළොවටවත් කසල ගොඩටවත් ඒවා සුදුසු නැත. ඒවා අහක දමති. අසන්ට කන් ඇත්තේ අසාවයි කී සේක. (ලූක් 14:34-35)**

**තවද උන්වහන්සේ ඔවුන්ට කියන සේක්: පහන ගෙනෙන්නේ කුරුණිය යට හෝ ඇඳයට හෝ තබන පිණිසද පහන් රුක උඩ තැබීමට නොවේද? (මාර්ක් 4:21)**

**ලුණු හොඳය. නුමුත් ඒවායේ ලුණු ගතිය නැතිවුනොත් ඒවා රස කරන්නේ කුමකින්ද? නුඹලා තුළ ලුණු ඇතුව සිටින්න. එකිනෙකා සමග සමාදානෙන් සිටින්නැයි කීසේක. (මාර්ක් 9:50)**

ස්වාභාවික ලෝකයේ ලුණු නිශ්ශබ්දව ක්‍රියා කරයි. එය ආහාර සංරක්ෂණය කිරීමට, තුවාල සුවකිරීමට, රසයක් එක් කිරීමට භාවිතා කෙරේ. ලුණු ඉතා ස්වල්පයක් විශාල ආහාර ප්‍රමාණයකට බලපෑම් ඇති කරයි.

ආත්මික ලෝකයේ, දේවරාජ්‍යයේ වැසියෝ, ලෝකයා තුළට (ලුණු මෙන්) යා යුතු වෙති. ඔවුන් දේවරාජ්‍යයේ ගුණාත්මක බව හා අගයයන් සුරක්ෂිත කළ යුතුය. අන් අයට සුවකිරීමේ ආලේපයක් විය යුතුය. ජිවිතයට රසයක් එක් කළ යුතුය. එමෙන්ම ඔවුන් දේවරාජ්‍යය ව්‍යාප්ත කළ යුතුය. ලුණු මෙන් ඔවුන් විශාල සංඛ්‍යාවක් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. යේසුස්වහන්සේ, තවත් අවස්ථාවක දේවරාජ්‍යය තුළට කාවැද්දීම මුහුන් වලට සමාන කළ සේක. (මතෙව් 13:33). ලුණු මෙන්ම මුහුන් ස්වල්පයක්ම නිශ්ශබ්දව විශාල පාන් ගුලියක් තුළට කාවදී.

ස්වාභාවික ලෝකයේ, ආලෝකය අඳුර අනාවරණය කරයි. අඳුරෙන් එළියට එන අයුරු පෙන්නුම් කරයි. අඳුරේ ඇති ආලෝකයක් නොදැක සිටිය නොහැකිය. දේවරාජ්‍යයේ වැසියෝ ලෝකයට ආලෝකයක් විය යුත්තාහ. ඔවුහු අඳුරෙන් එළියට එන මාර්ගය පෙන්විය යුතුය. ඔවුහු ජිවිතයේ ඇති කිසිදෙයකින් (කුරුණිය) දේවරාජ්‍යයේ ඇති ආලෝකය වැසී යාමට ඉඩ නොදිය යුතුය. ඇදහිලිවන්තයෝ දෘශ්‍ය ආකාරයකින් දේවරාජ්‍යයේ ජිවිතය ගත කළ යුතු අතර දේවරාජ්‍යයේ ශුභාරංචියෙන් මේ ලෝකයේ රාජ්‍යයන් තුළට කාවැදිය යුතුය.

## යාච්ඥාවේ මුලධර්ම:

දේවරාජ්‍යයේදී, යාච්ඥාව මුලධර්ම 03 ක් මත පදනම වේ. ඉල්ලීම, සෙවීම හා තට්ටු කිරීම.

**ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ, සොයන්න, එවිට නුඹලාට සම්බවේ, තට්ටු කරන්න, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. (මතෙව් 7:7-8)**

සෑම යාච්ඥා මට්ටමකින්ම කතා කරන්නේ වඩාත් ඕනෑකමකින් දෙවියන්වහන්සේ සෙවීම පිළිබඳවය.

දේවරාජ්‍යයේ පදිංචිකරුවන්ට යේසුස්වහන්සේ යාච්ඥා කිරීමේ ආකෘතියක් දුන්සේක. ඔබට එය මතෙව් 6:9-15 න් හා ලූක් 11:2-4න් කියවිය හැකිය.

## නමස්කාර කිරීමේ මූලධර්ම:

දේවරාජ්‍යයේ නමස්කාර කිරීමේ මූලික මූලධර්මය ඔබට මතෙව් 6:1-18න් කියවිය හැකිය. ඔබගේ බයිබලයෙන් මෙම කොටස කියවන්න. නමස්කාර කිරීමේ මූලික මූලධර්වල මේවා අන්තර්ගත වේ.

| | | |
|---|---|---|
| දීම | බාහිරව බැලීම | මතෙව් 6:1-4 |
| යාච්ඤා කිරීම | ඉහළට බැලීම | මතෙව් 6:5-15 |
| නිරාහාරව සිටීම | අභ්‍යන්තරව බැලීම | මතෙව් 6: 16-18 |

මේ සියලූ නමස්කාර ක්‍රම, දේවාශිර්වාද ලැබීමට නම්, රහසින් අනුගමනය කළ යුතු වේ.

## දර්ශනයේ එකම දැක්ම පිළිබඳ මූලධර්මය:

දේවරාජ්‍යයේ පදිංචිකරුවන්ගේ දර්ශනයේ එකම දැක්ම විය යුත්තේ පළමුව දේවරාජ්‍යය සෙවීම වේ. මතෙව් 6:19-34 කියවා එය ලූක් 12:22-34 හා සසඳන්න.

- o යේසුස්වහන්සේ මතෙව් 6:19-21 හි එකම සිතක් ගැන කතා කරන සේක.
- o උන්වහන්සේ මතෙව් 6:22-23 හි දර්ශනයේ එකම දැක්මක් ගැන කතා කරන සේක.
- o උන්වහන්සේ ලූක් 16:13 හි එකම භක්තියක් ගැන කතාකරන සේක.
- o උන්වහන්හන්සේ මතෙව් 6:24 හා ලූක් 9:60 හා 62 හි එකම සේවයක් ගැන කතා කරන සේක.
- o උන්වහනසේ මතෙව් 6:25-32 හා 34 හි එකම සිතිවිල්ලක් ගැන කතා කරන සේක.

දර්ශනයේ එකම දැක්ම පිළිබඳ මූලධර්මය පහත දැක්වෙන පදයෙන් සාරාංශගත කෙරේ.

> **නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න, මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. අනෙකුත් සියලුම දේවරාජ්‍ය මූලධර්ම පවතින අත්තිවාරම කවරේද?

______________________________________________

3. අනෙකුත් සියලුම මූලධර්ම පදනම් වන දේවරාජ්‍ය නීති දෙක ලියන්න.

පළමුවැන්න - ______________________________

දෙවැන්න - ______________________________

4. දේවරාජ්‍යයේ මූලධර්ම දැනගැනීම වැදගත්වන හේතු හතරක් දෙන්න.

____________________ ____________________

____________________ ____________________

5. සෑම පදයක්ම එය උගන්වන මූලධර්ම හා සැසඳීමට ඔබට බයිබලය භාවිත කළ හැකිය. පළමු තීරුවේ පදයක් දෙස බලන්න. එම පදයෙන් උගන්වනු ලබන පොදු මූලධර්මය දෙවනි තීරුවෙන් තෝරාගන්න. එහි අංකය පළමු තීරුවේ යොමුව ඉදිරියෙන් ලියන්න. පළමු එක නිදර්ශනයක් ලෙස කර ඇත.

| පළමු තීරුව | දෙවනි තීරුව |
|---|---|
| a. -------2---------මතෙව් 5:13-16 | 1. එක්සත්කම පිළිබඳමූලධර්ම |
| b. ---------------1 කොරින්ති 12:12-14 | 2. කා වැදීම පිළිබඳ මූලධර්මය |
| c. ---------------මතෙව් 20:26 | 3. යාච්ඤා මූලධර්ම |
| d. ----------------මතෙව් 7:7-12 | 4. පොදු මූලධර්මයකි. දේවරාජ්‍යයේ මූලධර්ම ලෝකයේ ඒවායින් වෙනස් වේ. |
| e. -----------------මතෙව් 6:1-18 | 5. දර්ශනය පිළිබද එකම දැක්ම |
| f. -----------------මතෙව් 6:19-34 | 6. නමස්කාරය පිළිබඳ මූලධර්මය |

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ලූක් පොතේ උගන්වා ඇති දේවරාජ්‍ය මුලධර්ම සාරාංශ ගත කරන්න:

ලූක් 1:33

4:43

6:20

7:28

8:1, 10

9:2, 11, 72, 60

10: 9-11

11:2, 17-20

12:31-32

13:18-29

14:15

16:16

17:20-21

18:16-29

19:11-15

21:10, 31

22:16-30

23:42, 50-51

# අටවන පරිච්ඡේදය

## දේව රාජ්‍යයේ සංස්කෘතිය

## දේවරාජ්‍ය මූලධර්ම - 2 කොටස

### අරමුණු:

මෙම පාඩමාලාව අධ්‍යනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දේව රාජ්‍යයේ හා මොලොව රාජ්‍යයන් අතර ව්‍යුහයේ වෙනස්කම් හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, අසාපල්ලා: ඇදහිල්ලෙහි ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරානොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට අගෞරවකළහුය. (යාකොබ් 2:5)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන්, ඔබට දේව රාජ්‍යයේ මූලධර්ම තවදුරටත් අධ්‍යයනය කරන අතරතුර දේව රාජ්‍යයේ සංස්කෘතිය පිළිබඳව ද ඉගෙනගනු ඇත. සත්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කළ පොදු මූලධර්ම මත පදනම් වන මෙම ආත්මික රාජ්‍යයේ සුවිශේෂි මූලධර්ම ඔබ මෙහි ඉගෙන ගන්නෙහිය.

## සුවිශේෂි වෙනස්කම්: දේව රාජ්‍යයේ සංස්කෘතිය

දැනටමත් සාකච්ජා කර ඇති පොදු මූලධර්ම මත පදනම් වන දේව රාජ්‍යයේ සුවිශේෂි මූලධර්ම දැන් අපි අධ්‍යයනය කරමු. මේ බොහෝ වෙනස්කම් මතෙව් 5-7 හි සහ ලූක් 6 හි සඳහන් වේ. ඔබ තවදුරටත් අධ්‍යයනයෙහි යෙදීමට පෙර මෙම පරිච්ඡේද කියවන්න.

මෙම පාඩ යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලින් කොටසක් වන අතර ඒවා උන්වහන්සේ පළමුව ඉශ්‍රායෙල්හි කන්දක් අසල ඉගැන්වූ බැවින් “කන්ද උඩ දේශනාව” ලෙස හැඳින්වේ. මෙම දේශනාවේ සුවිශේෂි දේවරාජ්‍ය මූලධර්ම අඩංගු වේ. මෙම දේශනාවෙන් සියලු ජීවිත අවස්ථා ආවරණය නොවේ. එහෙත් මූලධර්ම නියෝජනය කෙරේ. මේවා සාරධර්ම සඳහා සහ සියලු අවස්ථාවන්ට යෙදිය හැකි හැසිරීම් සඳහා රටාවක් පිහිටුවයි.

මතෙව් 5:1-12 හි සඳහන් මෙම දේශනාවේ පළමු කොටස “ආශිර්වාද වාක්‍ය” ලෙස හැඳින්වෙන අතර ඒවා දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලත් මූලික දේවරාජ්‍ය ආකල්ප ගැන වේ. ආශිර්වාද ලද අය සමාජයේ සම්ප්‍රදායික අගයයන් අල්ලාගන්නේ නැත. මෙම පාඩයේ සඳහන් “ආශිර්වාද ලද්දෝය” යන වචනවලින් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ අනුමැතිය ලබා ඇත්තන්ය. ආශිර්වාද ලබා සිටීම හා ප්‍රීතියෙන් සිටීම අතර වෙනසක් තිබේ. ආශිර්වාද ලැබීම දෙවියන්වහන්සේ මත රඳා පවතින අතර එය අවට තත්වයන් මත රදා පවතින්නේ නැත. ප්‍රීතියෙන් සිටීම ජීවිතයේ අවස්ථාවන් මත රඳා පවතී.

දේවරාජ්‍යයේ සංස්කෘතියේ සුවිශේෂී වෙනස්කම් සමහරක් මෙසේය.

## දේව රාජ්‍යය අයත් වන්නේ සිතින් දිළින්දන්ට වේ.

**සිතින් දිළින්දෝ ආශිර්වාදලද්දෝය: මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය. (මතෙව් 5:3)**

ද්‍රව්‍යමය වස්තුව ඇති අයට ලෝකයා ගරු කරති. දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරාගෙන ඔවුන් ඇදහිල්ලෙන් පොහොසත් අය කරන සේක.

**මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, අසාපල්ලා: ඇදහිල්ලෙහි ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරානොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට අගෞරවකළහුය. (යාකොබ් 2:5)**

**එවිට උන්වහන්සේ තමන් ගෝලයන් දෙසට ඇස් ඔසවා කියනසේක්, දිළිඳුවූ නුඹලා ආශිර්වාදලද්දෝය. මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලාගේය. (ලූක් 6:20)**

## දුප්පත් අය පොහොසත්ය, පොහොසත් අය දුප්පත්ය:

ලෝකයා ආත්ම විශ්වාසයෙන් ස්වයං ප්‍රකාශනයේ හා ස්වයං-දියුණුව් ආත්මය අවධාරණය කරති. එහෙත් දෙවියන්වහන්සේ අනුමත කරන්නේ සිතින් දිළිඳු, තමාවම ගළවා ගැනීමට හෝ තම ආත්මික අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීමට හෝ තම ප්‍රශ්න විසඳා ගැනීමට හෝ හැකියාවක් නැති බව දන්නා අය වේ.

**නුමුත් ධනවන්තවූ නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලාගේ සැනසීම නුඹලාට ලැබී තිබේ. (ලූක් 6:24)**

## ශෝකය ප්‍රීතිය ගෙනදෙයි:

ශෝකය වර්ග දෙකකි. ලෝකයේ ශෝකය පාපය නිසා ඇතිවූ ශෝකයකි. එය පාපයේ දඬුවම අත්විඳීම තුළින් පැමිණෙන ශෝකයකි. එහෙත් මෙම ශෝකය මගින් ජීවිත රටාව වෙනස් නොවේ. දේවකැමැත්තට එකඟ වූ ශෝකය පාපය සඳහා වූ ශෝකයකි. දේව කැමැත්තට එකඟවූ ශෝකයේ ප්‍රතිඵලය පසුතැවිලි වීම වේ.

**මක්නිසාද දේව කැමැත්තට එකඟවූ ශෝකයෙන්, තැවෙන්ට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය. නුමුත් ලෞකික ශෝකය මරණය උපදවන්නේය. (2 කොරින්ති 7:10)**

දෙවියන්වහන්සේ මෙවැනි ශෝකයක් අනුමත කරන සේක. එය අත්දකින අය සනසනු ලබන බව උන්වහන්සේ ප්‍රකාශ කරන සේක.

**ශෝකවන්නෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාදා ඔව්හු සනසනු ලබන්නෝය. (මතෙව් 5:4)**

**දැන් හඬන්නාවූ නුඹලා ආශිර්වාදලද්දෝය. මක්නිසාද නුඹලා සිනාසෙන්නහුය. (ලූක් 6:21)**

**සැබවක් සැබවක් නුඹලාට කියමි නුඹලා හඬා වැලපෙන්නහුය. නුමුත් ලෝකයා ප්‍රීතිවන්නෝය. නුඹලා ශෝකවන්නහුය. නුමුත් නුඹලාගේ ශෝකය ප්‍රීතියට හැරෙන්නෝය. (යොහන් 16:20)**

දේවරාජ්‍යයේ ශෝකවන අය සනසනු ලබන අතර කණගාටු වන අයට ප්‍රීතිය ලැබෙන්නේය. මොලොව රාජ්‍යයන්හි සිටින්නවුන්ට ප්‍රීතිය දුකට හැරෙනු ඇත.

> **දැන් තෘප්තියට පැමිණ සිටින නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා බඩගිනිවීමට පැමිණෙන්නහුය. දැන් සිනාසෙන්නාවූ නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා ශෝකව අඬන්නහුය. (ලූක් 6:25)**

## මොළොක්ගුණ ඇත්තෝ ජයග්‍රාහකයෝ වෙති:

මොළොක් ගුණය දුර්වල කමක් හෝ නිෂ්ක්‍රිය බවක් හෝ නොවේ. මොළොක් ගුණයෙන් සිටීම යනු නිහතමානීව, පහසුවෙන් කෝප නොවී, සෞම්‍ය සිතක් ඇතිව සිටීම වේ. එය “තදින් සිටින්න, ඔබගේ අයිතිවාසිකම සඳහා නැගිටින්න” යන ලෞකික මූලධර්මවලට පටහැනිය.

මෘදු ගුණය මාංශික මිනිසුන්ගේ ස්වභාවික ගුණාංගයක් නොවේ. එය දේවරාජ්‍යයේ එක් ආත්මික ඵලයකි.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම්, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. (ගලාති 5:22-23)**

මේ සෑම එකක්ම දේවරාජ්‍යයේ පදිංචිකරුවන්ගේ ගුණාංගයන් විය යුතුය. මේවා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වීම නිසා ලැබෙන ආත්මික ඵල වේ (මේවා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *“ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය”* නමැති පාඩමාලාවේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත).

> **මොළොක් ගුණ ඇත්තෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු පොළොව උරුමකරගන්නෝය. (මතෙව් 5:5)**

## සාපිපාසා ඇත්තෝ තෘප්තියට පත්වෙති:

මෙලොව රාජ්‍යවල මනුෂ්‍යයෝ බොහෝ දේ නිසා සාපිපාසාවට පත්වෙති. ඔවුහු බලය, වස්තුව, සාර්ථකත්වය හා ප්‍රීතියට සාපිපාසා ඇත්තෝ වෙති. දේවරාජ්‍යයේ වැසියන් මෙවැනි ද්‍රව්‍යමය දේ ගැන සාපිපාසා විය යුතු නැත. ඔවුන් දේවරාජ්‍යයේ මූලික මූලධර්මයක් වන ධර්මිෂ්ඨකම සෙවිය යුතුය.

> **ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු තෘප්තියට පැමිණෙන්නෝය. (මතෙව් 5:6)**

> **දැන් බඩගිනි ඇති නුඹලා ආශිර්වාදලද්දෝය. මක්නිසදා නුඹලා තෘප්තියට පැමිණෙන්නහුය. (ලූක් 6:21)**

ඇතැම් ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගෙන් “ආශිර්වාද” සොයමින් බොහෝ ආගමික රැස්වීම්වලට යති. ඔව්හු කිසිදිනක ආත්මිකව තෘප්තියට පත් නොවෙති. මෙම දේවරාජ්‍ය මූලධර්මයේ යේසුස්වහන්සේ පෙන්නුම් කරන්නේ ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තන් පමණක් ආත්මිකව පූර්ණවන බවය.

ඔබට ස්වභාවික ලෝකයේ සාපිපාසාවක් දැණුනු විට ආහාර ලැබෙන තෙක් අක්‍රියව සිටින්නේ නැත. ඔබ ඔබගේ සාපිපාසාව සංසිඳවා ගැනීමට ආහාර ලබාගෙන කෑමවේලක් පිළියෙල කරගන්නෙහිය. ආත්මික ලෝකයේ ද දෙවියන්වහන්සේ ඔබගේ ආත්මික සාපිපාසාව සංසිඳවන තෙක් අක්‍රියව බලා සිටිය නොහැකිය. ඔබ දෙවියන්වහන්සේ සමග යාච්ඤාවෙන්ද, උන්වහන්සේගේ ලිඛිත වචනය අධ්‍යයනය කිරීමෙන්ද සන්නිවේදනයේ යෙදෙමින් ක්‍රියාකාරීව ආත්මික ආහාර සෙවිය යුතුය.

දේවරාජ්‍යයේ සාපිපාසා ඇත්තන් තෘප්තියට පත්කරනු ලැබේ. ලෝකයේ රාජ්‍යවල සාපිපාසායෙන් සිටින්නෝ එසේම තබනු ඇත.

**දැන් තෘප්තියට පැමිණ සිටින නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා බඩගිනිවීමට පැමිණෙන්නහුය. (ලූක් 6:25)**

## දයාවන්තයන්ට දයාව ලැබෙන්නේය:

ඔබ දයාවන්තයෙකු නම් ලෝකයා ඔබගෙන් අයුතු ප්‍රයෝජන ගන්නා බවට ලෞකික මූලධර්මවලින් අනතුරු අඟවයි. ඔබ මහත් සේ කරුණාව දැක්වුවහොත් ඔව්හු ඉන් අනිසි වාසි ලබන බව ලෝකයා උගන්වයි. එහෙත් දේවරාජ්‍යයේ මූලධර්ම ඊට ප්‍රතිවිරුද්ධ දෙයක් උගන්වයි. ඔබ දයාව දැක්වුවහොත් ඔබට අනිසි ලෙස ප්‍රයෝජන නොව ඔබට දයාව ලැබෙනු ඇත.

**දයාවන්තයෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු දයාව ලබන්නෝය. (මතෙව් 5:7)**

## බාහිර දේ නොව අභ්‍යන්තරය අවධාරණය කෙරේ.

යේසුස්වහන්සේගේ කාලයේ ආගමික නායකයෝ හදවත් අභ්‍යන්තරයේ ආකල්පවලට වඩා නීතියට අනුකූල වීම හා සම්ප්‍රදාය රැකීම වැනි බාහිර දේ අවධාරණය කළහ. ඔව්හු ඉතා තදින් සබත පිළිපැද්දෝය, නිරන්තරයෙන්ම නිරාහාරව සිටියහ. එළිමහනේ යාච්ඤා කළහ, සහ දුප්පතුන්ට දානය දුන්නෝය.

එහෙත් යේසුස්වහන්සේ බාහිර කැපකිරීම්වලට වඩා හදවතේ අභ්‍යන්තර ආකල්ප ගැන අවධාරණය කළ සේක.

**සිතින් පවිත්‍රව සිටින්නෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේ දකින්නෝය. (මතෙව් 5:8)**

දෙවියන්වහන්සේ දකින්නේ ආගම පිළිබඳ බාහිර සලකුණු ඇති අය නොව සිතින් පවිත්‍රව සිටින්නන් වේ.

## විප්ලවය වෙනුවට සාමය:

ලෝකයේ රාජ්‍යයන් වෙනස් කිරීමේ ක්‍රමයක් වන්නේ විප්ලවය වේ. සමාදානය කරන්නෝ යනු දේවරාජ්‍යයේ වෙනසක් ගෙන එන අය වේ. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**සමාදානයකරන්නෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝය. (මතෙව් 5:9)**

සමාදානය යනු ගැටලුවලින් පැන දිවීම හෝ යුද්ධය හා ගැටුම් නැතිව සිටීම හෝ නොවේ. යේසුස්වහන්සේ කතා කළ සමාදානය ලෞකික සමාදානයට වඩා වෙනස්ය.

**නුඹලා වෙත සමාදානය තබා යමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැලඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙල්ලා. (යොහන් 14:27)**

ලෝකයේ ඇති සාමයේ බිය අඩංගුය. ඔව්හු සාම ගිවිසුම අරක්ෂා කරයිද? පොරොන්දු වූ පරිදි කටයුතු කරයිද? යනුවෙන් ප්‍රශ්න ඇත් වේ. දෙවියන්වහන්සේගේ සාමයේ බියක් නැත. ඇදහිලිවන්තයන් සමාදානයෙන් තැබීමට උන්වහන්සේ පොරොන්දු වී ඇත. මේ ලෝකයේ රාජ්‍යවල වියවුල් තත්වයන් වල ඔවුන් ජීවත්වුවත් ඔවුන්ට දෙවියන්වහන්සේගේ සමාදානය ඇතිව ජීවත්විය හැකිය.

## පීඩා විඳින්නන්ට ප්‍රතිලාභ ලැබේ.

විශේෂ හේතුවක් වෙනුවෙන් දුක්විඳින්නන්ට, මෙම දේවරාජ්‍යයේ අනුව මූලධර්ම ආශිර්වාද ලබා දෙන බව ප්‍රකාශ කරයි. ධර්මිෂ්ඨකම වෙනුවෙන්.

> **ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය. (මතෙව් 5:10)**

> **මනුෂ්‍ය පුත්‍රයා නිසා මනුෂ්‍යයන් නුඹලාට වෛරකරන කලද තමුන්ගේ සමාගමෙන් නුඹලා වෙන්කර, නුඹලාට නින්දාකර, නුඹලාගේ නාමය නපුරුයයි පහකරන කලද නුඹලා ආශිර්වාදලද්දෝය. ඒ දවසේදී ප්‍රීතියෙන් නටාපල්ලා, මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය, ඔවුන්ගේ පියවරු අනාගතවක්තෘවරුන්ටත් එසේම කළෝය. (ලූක් 6:22-23)**

> **සියලු මනුෂ්‍යයන්ට නුඹලා ගැන හොඳ කියන කල නුඹලාට දුක්වේ! මක්නිසාද ඔවුන්ගේ පියවරු බොරු අනාගතවක්තෘන්ටත් එසේම කළෝය. (ලූක් 6:26)**

මෙය දුක්විඳින සියලු දෙනා වෙනුවෙන් ඇති පොදු ආශිර්වාදයක් නොවේ. මක්නිසාද ඇතැම් අය දුක්විඳින්නේ තමන්ගේම වරදිනි.

> **මක්නිසාද නුඹලා වරදකොට ඒ ගැන පහර ලබන කල්හි ඉවසන්නහු නම්, එය මොන උතුම්කමක්ද? නුමුත් යහපත්කම් කොට ඒ ගැන දුක්විඳින කල්හි ඉවසන්නහු නම්, ඒක දෙවියන්වහන්සේ ඉදිරියෙහි ප්‍රශංසනිය දෙයක්ය. (1 පේතෘස් 2:20)**

ඇතැම් දුක්විඳීම් පිටුපස පාපය ඇත.

> **නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා, ඔව්හු ස්වාමින්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤාකරත්වා, එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමින්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත. ඔහු පාපයන්කර තිබේ නම්, ඒවා ඔහුට කමාකරනු ලැබේ. එබැවින් නුඹලාගේ වරද එකිනෙකාට කියාදී, සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤාකරපල්ලා. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් සේ ඉෂ්ටවෙයි. (යාකොබ් 5:14-16)**

## සුළු අය ශ්‍රේෂ්ඨයන් වේ:

පොළොවේදී ශ්‍රේෂ්ඨත්වය උසස් කෙරේ. මනුෂ්‍යයන් සාර්ථකනම්, කීර්තියක් ඇත්නම්, බලය හෝ වස්තුව තිබේ නම් ඔවුන් ශ්‍රේෂ්ඨයන් ලෙස සලකනු ලැබේ. දේව රාජ්‍යයේ ශ්‍රේෂ්ඨයෝ දේව රාජ්‍යයේ මූලධර්ම උගන්වති. ඒ අනුව ජීවත් වෙති. ඔවුන් මේ ලෝකයේ සුළු අය ලෙස සැලකිය හැකිය. එහෙත් ඔව්හු දේව රාජ්‍යයේ ශ්‍රේෂ්ඨයෝ වෙති.

> **එබැවින් මේ ආඥාවලින් ඉතා සුළු එකක්වත් කඩකරන්නාවූ කඩකරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නුමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා සුළුයයි කියනු ලබන්නේය. නුමුත් ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නුමුත් ස්වර්ගරාජ්‍යයෙහි උතුම්යයි කියනු ලබන්නේය. (මතෙව් 5:19)**

## නිහතමානී අය උසස් කරනු ලැබේ:

**මක්නිසාද තමුන්ම උසස්කරගන්න හැමදෙනම පහත්කරනු ලබන්නෝය. තමාම යටහත්කරගන්නා උසස්කරනු ලබන්නේයයි කීසේක. (ලූක් 14:11)**

**තමාම උසස්කරගන්න කවරෙක් නුමුත් පහත්කරනු ලබන්නේය. තමාම පහත්කරගන්න කවරෙක් නුමුත් උසස්කරනු ලබන්නේය. (මතෙව් 23:12)**

## සේවකයෝ නායකයෝය:

මෙලොව රාජ්‍යයන් නායකයන්ට සලකනු ලබන්නේ බොහෝ උසස් අය ලෙසය. ඔව්හු ගෞරව ලබති. බුහුමන් ලබති. සේවකයන් ඔවුන්ට සේවය කරන අතර සමාජයේ ඔව්හු අන් අයට වඩා උසස් අය ලෙස සැලකිලි ලබති.

දේව රාජ්‍යයේ නායකයෙකුවීමට සේවකයෙකු විය යුතුය.

**නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා, අන්‍යජාතීන්ගේ ආන්ඩුකාරයන් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම්වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය. එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවයකරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේයයි කීසේක. (මතෙව් 20:25-28)**

**නුමුත් නුඹලා එසේ නොව, නුඹලා අතරෙන් වඩා උත්තමයා බාලයා මෙන් වේවා, ප්‍රධානියා උපස්ථානකරන්නා මෙන් වේවා. (ලූක් 22:26)**

**නුමුත් නුඹලා අතරේ එසේ නොවේය. නුඹලා අතරේ උතුම්වෙන්ට කැමති කවරෙක් නමුත් නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙක් නුමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය. (මාක් 10:43-44)**

**නුමුත් නුඹලා අතරෙන් ඉතා උත්තමයා නුඹලාගේ සේවකයා වන්නේය. (මතෙව් 23:11)**

## අන්තිමයෝ ප්‍රථමයෝ වෙති

මෙලොව රාජ්‍යයන්ගේ ප්‍රථමයෝ දේව රාජ්‍යයේ අන්තිමයෝ වෙති.

**නුමුත් ප්‍රථමයෝ බොහෝ දෙනෙක් අන්තිමයෝද අන්තිමයෝ ප්‍රථමයෝද වන්නෝයයි කීසේක. (මතෙව් 19:30)**

**මෙසේ අන්තිමයෝ ප්‍රථමයෝද ප්‍රථමයෝ අන්තිමයෝද වන්නෝයයි කීසේක. (මතෙව් 20:16)**

**බලව, දැන් අන්තිමයෝව සිටින්නාවූ සමහරෙක් ප්‍රථමයෝද දැන් ප්‍රථමයෝව සිටින්නාවූ සමහරෙක් අන්තිමයෝද වන්නෝයයි කීසේක. (ලූක් 13:30)**

## කුඩා දෙය විශාල වන්නේය:

යේසුස්වහන්සේ මෙම මුලධර්මය, අබ ඇටය, මුහුන් හා වැන්දඹුවකගේ කුඩාමිල යන ස්වභාවික නිදර්ශන මගින් පැහැදිලි කළේය.

උන්වහන්සේ තවත් උපමාවක් ඔවුන් ඉදිරියේ දක්වමින්: මනුෂ්‍යයෙකු විසින් අරගෙන තමාගේ කෙතෙහි වපුළ අබ ඇටයකට ස්වර්ගරාජ්‍යය සමානය. ඒක සියලුම බීජවලට වඩා කුඩා නුමුත් වැඩුණු කල පළාගස්වලට වඩා මහත්ව, ආකාශ පක්ෂීන් ඇවිත් එහි අතුවල ලගින තරම් ගසක් වන්නේයයි කීසේක. උන්වහන්සේ තවත් උපමාවක් කියනසේක්: ස්ත්‍රියකු විසින් පිටි නැළි තුනක් සහමුලින්ම පිපෙන තුරු එහි දමා තිබූ මුහුන්වලට ස්වර්ගරාජ්‍යය සමානයයි කීසේක. (මතෙව් 13:31-33)

තවද උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානකරමුද? නොහොත් කවර උපමාවකින් එය දක්වාදෙමුද? එය අබ ඇටයකට සමානය. එය පොළොවෙහි වපුරන කල පොළොවෙහි තිබෙන සියලු බීජවලට වඩා කුඩා නුමුත්, වපුළායින් පසු එය වැඩී, සියලුම පලා ගස් වලට වඩා ලොකුවී, ඒකේ සෙවණෙහි ආකාශයේ පක්ෂීන්ට ලගින්ට පුළුවන් තරමට මහත් අතු විහිදන්නේයයි කීසේක. (මාක් 4:30-32 ද බලන්න)

උන්වහන්සේ ඇස් ඔසවා ධනවතුන් තමුන්ගේ පඬුරු ගබඩාවට දමනවා දුටුසේක. එක්තරා දිළිඳු වැන්දඹුවක් කුඩා මිල දෙකක් එහි දමනවාත් උන්වහන්සේ දැක, සැබවක් නුඹලාට කියමි මේ දිළිඳු වැන්දඹුව සියල්ලන්ට වඩාදැමුවාය. මක්නිසාද මොවුන් සියල්ලෝම තමුන්ගේ වැඩිමනත් දෙයින් ගබඩාවට පඬුරු දැමුවෝය. නුමුත් මෑ තමාගේ හිඟකමින්, තමාට ජීවිකාවට තිබුණු සියල්ලම දැමුවායයි කීසේක. (ලූක් 21:1-4)

## උතුම්කොට සලකන්නන්ට පහත් අගයක් දෙනු ලැබේ:

උන්වහන්සේ ඔවුන්ට කියනසේක්, නුඹලා නම් මනුෂ්‍යයන් ඉදිරියෙහි තමුන් ධර්මිෂ්ඨකරගන්න අයය. නුමුත් දෙවියන්වහන්සේ නුඹලාගේ සිත් දන්නාසේක. මක්නිසාද මනුෂ්‍යයන් අතරේ උතුම්කොට සලකන දෙය දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිළිකුලක්ය. (ලූක් 16:15)

## වැඩිහිටි අය දරුවන් මෙන් විය යුතුය:

දේව රාජ්‍යයේ වැඩිහිටි අය දරුවන් මෙන් විය යුතුය. මින් අදහස් වන්නේ ඔවුන් දේව රාජ්‍යයේ ශුභාරංචිය දරුවෙකු මෙන් පිළිගත යුතු බවය. එනම් සරල ඇදහිල්ලකිනි.

ඒ පැයේදී ගෝලයෝ යේසුස්වහන්සේ ළඟට ඇවිත්: ඉදින් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම් වන්නේ කවුදැයි ඇසුවෝය. උන්වහන්සේ කුඩා දරුවෙකු තමන් ළඟට කැඳවා ඔවුන් මැද සිටුවා: සැබවක් නුඹලාට කියමි- නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නුණොත්, කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුය. එබැවින් මේ කුඩා දරුවා මෙන් යටත්වන කවුරු නුමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම් තැනැත්තාය. තවද යමෙක් මාගේ නමින් මෙබඳු කුඩා දරුවෙකු පිළිගන්නේද ඔහු මා පිළිගන්නේය. (මතෙව් 18:1-4)

නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා: ළදරුවන් නොවලක්වා මා ළඟට එන්ට ඉඩහැරපල්ලා; මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය. සැබවක් නුඹලාට කියමි- යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවෙකු මෙන් පිළි නොගන්නේද, ඔහු කිසිසේත් එහි ඇතුල් නොවන්නේයයි කීසේක. (ලූක් 18:16-17)

## ජීවිතය ගලවාගැනීමට තැත්කරන්නා එය නැතිකරගන්නේය:

සැබවක් සැබවක් නුඹලාට කියමි- ගෝධුම බීජය පොළොවෙහි වැටී නොමළොත් තනිව තිබෙයි. නුමුත් මළොත් බොහෝ ඵල දෙයි, (යොහන් 12:24)

මක්නිසාද තමාගේ ජීවිතය ගලවාගන්ට කැමති කවරෙකුට නුමුත් ඒක නැතිවන්නේය. මා නිසාද ශුභාරංචිය නිසාද තමාගේ ජීවිතය නැතිකරගන්න කවරෙක් නුමුත් ඒක ගලවාගන්නේය. (මාක් 8:35)

තමාගේ ජීවිතය ආරක්ෂා කරගන්නාට ඒක නැතිවේ; මා නිසා තමාගේ ජීවිතය නැතිකරගන්නාට ඒක සම්බවේ. (මතෙව් 10:39)

ඔබ ජීවිතයට නැතිකර ගන්නේ රජතුමා අනුව යෑම සඳහා ලෞකික සැප සම්පත් ප්‍රතික්ෂේප කිරීමෙනි.

**එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. මක්නිසාද යමෙක් තමාගේ ජීවිතය ගළවාගන්ට කැමතිවේද, ඒක ඔහුට නැතිවන්නේය. මා නිසා තමාගේ ජීවිතය නැතිවෙන අයට ඒක සම්බවන්නේය. (මතෙව් 16:24-25)**

## ජීවිතයට ප්‍රේම නොකර වෛර කරන්න:

**තමාගේ ජීවිතයට ප්‍රියවන්නාට ඒක නැතිවන්නේය. මේ ලෝකයෙහි තමාගේ ජීවිතයට වෛරකරන්නා සදාකාල ජීවනයට ඒක ආරක්ෂා කරගන්නේය. (යොහන් 12:25)**

## දෙන්න එවිට ලැබෙනු ඇත:

**දීපල්ලා, එවිට නුඹලාටත් දෙනු ලබන්නේය, ඔව්හු ඔබමින් සොලවමින් උතුරුවමින් නුඹලාගේ ඔඩොක්කුවලට හොඳකාර මැනදෙන්නෝය. මක්නිසාද නුඹලා යම් මිම්මකින් මැනදෙන්නහුද එයින්ම නැවත නුඹලාටත් මැනදෙනු ලැබෙන්නේයයි කීසේක. (ලූක් 6:38)**

## නුපුළුවන් දේ පුළුවන් වේ.

**උන්වහන්සේද: මනුෂ්‍යයන්ට නුපුළුවන් දේ දෙවියන්වහන්සේට පුළුවනැයි කීසේක. (ලූක් 18:27)**

**යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින්, ඒක මනුෂ්‍යයන්ට නම් නුපුළුවන. නුමුත් දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක. (මතෙව් 19:26)**

**යේසුස්වහන්සේ ඔවුන් දෙස බලා, මනුෂ්‍යයන්ට නම් නුපුළුවන. නුමුත් දෙවියන්වහන්සේට එසේ නොවේය. මක්නිසාද දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක. (මාක් 10:27)**

## ඇස් නොපෙනෙනවුන්ට පෙනේ ඇස් පෙනෙනවුන් අන්ධ වේ:

**යේසුස්වහන්සේ කථාකොට: ඇස් නොපෙනෙනවුන්ට පෙනෙන පිණිසද ඇස් පෙනෙනවුන් අන්ධවන පිණිසද විනිශ්චය සඳහා මේ ලෝකයට ආවෙමියි කීසේක. (යොහන් 9:39)**

යේසුස්වහන්සේ පැමිණියේ ආත්මික අන්ධකාරයේ නැතිවී සිටින අයට ආත්මික පෙනුම දීමට වේ. ආගමික සම්ප්‍රදායන් තුළින් ආත්මික පෙනුම ඇති බව සිතූ අය සැබවින්ම අන්ධයෝ වෙති.

## සහනය ලැබීම සඳහා වියගහක් හා බරක් ගන්න

වියගහක් යනු නගුලක් ඇදීම සඳහා සතුන් දෙදෙනෙකු එක්කොට බඳින උපකරණයකි. ඉන් වෙහෙස ගැන කතා කරයි. සිතේ බරක් යනු උසුලාගෙන යන දෙයක් වේ. එය බරක්ය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**වෙහෙසවෙන්නාවූ බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙන ගනිල්ලා. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය, මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

යේසුස්වහන්සේගේ බර උසුලාගෙන යෑම සඳහා උන්වහන්සේ සමග එකම වියගහකට බැඳ සිටීමෙන් ඔබට සැබෑ සහනය ලැබේ. උන්වහන්සේගේ බර වන්නේ දේව රාජ්‍යයේ ශුභාරංචිය ලොව මුළුල්ලේ සියලු ජාතීන් අතර පැතිරීම වේ.

## පොළොවෙහි නොව ස්වර්ගයෙහි වස්තු රැස්කිරීම අවධාරණය කෙරේ:

**පොළොවෙහි නුඹලාට වස්තු රැස්කර නොතබල්ලා, එහිදී කාවෝද මළකඩද ඒවා නාස්තිකරති. සොරුද උමංකැන සොරාගනිති. නුමුත් ස්වර්ගයෙහි නුඹලාට වස්තු රැස්කර තබා ගනිල්ලා. එහිදී**

**කාවෝවත් මලකඩවත් ඒවා නාස්ති නොකරති. සොරු උමංකැන සොරා නොගනිති. මක්නිසාද නුඹේ වස්තුව යම් තැනෙක්හිද නුඹේ සිතත් එතැන්හිම වන්නේය. (මතෙව් 6:19-21)**

යේසුස්වහන්සේ පොළොවෙහි වස්තු ගැන අවධාරණය කරන්නන් මෝඩයන්ට සංසන්දනය කළ සේක.

**දෙවියන්වහන්සේ කෙරෙහි පොහොසත් නොවී තමාටම වස්තු රැස්කරගන්න අය එයාකාරයයි කීසේක. (ලූක් 12:21)**

## භූමික නොව ස්වර්ගීය ගෞරවය සෙවිය යුතුය:

**තමාම උපදවන දේ කියන්නා තමාගේම ගෞරවය සොයයි. නමුත් තමා එවූ තැනැන්වහන්සේගේ ගෞරවය සොයන්නා සැබෑවූ කෙනෙක්ය. ඔහු තුළ අධර්මිෂ්ඨකමක් නැත. (යොහන් 7:18)**

**එකම දෙවියන්වහන්සේ කෙරෙන් පැමිණෙන ගෞරවය නොසොයා, එකිනෙකාගෙන් ගෞරවය ලබන්නාවූ නුඹලාට විශ්වාසකරන්ට පුළුවන් කොහොමද? (යොහන් 5:44)**

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: මම මටම ගෞරව කරමිනම් මාගේ ගෞරවය හිස්ය. මට ගෞරවකරන්නේ මාගේ පියාණන්වහන්සේය. උන්වහන්සේ නුඹලාගේ දෙවියන්වහන්සේයයි නුඹලා කියහුය. නුඹලා උන්වහන්සේ ඇඳිනගත්තේ නැත. (යොහන් 8:54)**

## සමාදානය වෙනුවට භේදය:

යේසුස්වහන්සේ සමාදානය වේ. උන්වහන්සේ මාංශාකාරයෙන් ලොවට වැඩම කළ අවස්ථාවේ ලෝකයේ සමාදානය තිබුණි. එහෙත් යේසුස්වහන්සේ පොළොවේ රාජ්‍යයන් වෙතට සමාදානය වෙනුවට බෙදීම් ගෙන ආ සේක. උන්වහන්සේ නිසා පවුල්, නගර හා රාජ්‍යයන් බෙදිනි. සමහරු උන්වහන්සේ රජ කෙනෙකු බව විශ්වාස කරමින් පිළිගත්හ. ඔව්හු ආත්මික නැවත ඉපදීම තුළින් රාජ්‍යයේ වැසියෝ බවට පත්වූහ. අනෙක් අය යේසුස්වහන්සේ රජ කෙනෙකු ලෙස පිළිනොගත් අතර දේව රාජ්‍යයේ වැසියන් බවට පත්වූයේ නැත. එහි ප්‍රතිඵලය වූයේ භේද ඇතිවීමය.

**පොළොවට සමාදානය දෙන පිණිස මම ආවෙමියි නුඹලා සිතවුද? එසේ නොව, භේද උපදවන පිණිසයයි නුඹලාට කියමි. මක්නිසාද මෙවක් පටන් එක ගෙයක සිටින පස්දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධව තුන්දෙනෙක්ද තුන්දෙනෙකුට විරුද්ධව දෙදෙනෙක්ද භේදව සිටින්නෝය. පියා පුත්‍රයාටත් පුත්‍රයා පියාටත් මවු දුවටත් දුව මවුටත් නැන්දා යෙහෙළිටත් යෙහෙළි නැන්දාටත් විරුද්ධව භේද වන්නෝයයි කීසේක. (ලූක් 21:51-53)**

**මනුෂ්‍යයෙකුගේ සතුරෝ නම් ඔහුගේම ගෙයි වැසියෝය. (මතෙව් 10:36)**

## වැසී තිබෙන දේ එළිදරව් වන්නේය:

**මක්නිසාද ප්‍රකාශ නොවන්නාවූ වැසී තිබෙන දෙයක්වත් දැනගනු නොලබන්නාවූ සැඟවී තිබෙන දෙයක්වත් නැත. (මතෙව් 10:26-27)**

## දේව රාජ්‍යය ධර්මිෂ්ඨයන්ට නොව පව්කරුවන්ට පතුරුවනු ලැබේ:

**නුමුත්-මම පූජාවට නොව දයාවට කැමැත්තෙමියි යන කීමේ අර්ථය නුඹලා ගොස් ඉගෙනගනිල්ලා. මක්නිසාද මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමියි කීසේක. (මතෙව් 9:13)**

## ස්වභාවික දේ නොව ආත්මික දේ අවධාරණය කෙරේ:

**මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ. (රෝම 14:17)**

**මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව බලයෙන්ය. (1 කොරින්ති 4:20)**

# අතිරේක වෙනස්කම්

ලෝකයේ රාජ්‍යයන් හා දේව රාජ්‍ය අතර අතිරේක වෙනස්කම් අධ්‍යයනය කිරීමට පහත දැක්වෙන සටහන භාවිත කරන්න.

| | |
|---|---|
| මාර්ග හා දොරටු දෙක: | මතෙව් 7:13-14 |
| දිවැසිවරුන් දෙදෙනා: | මතෙව් 7:15 |
| ගස්දෙක: | මතෙව් 7:17-20; ලූක් 6:43-44 |
| ඉල්ලීම් දෙක: | මතෙව් 7:21-23 |
| ගෙවල් දෙක: | මතෙව් 7:24-27; ලූක් 6:46-49 |

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

______________________________________________

2. සෑම වගන්තියක්ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය වචනය හිස්තැනේ ලියන්න

### සුවිශේෂී දේව රාජ්‍ය මූලධර්ම

a. දිළින්දන්ට ______________________ අයත් වේ.

b. ශෝකය ______________________ ගෙන එයි.

c. මොළාක් ගුණ ඇත්තෝ ______________________ ______________________

d. සාපිපාසා ඇත්තෝ ______________________ පැමිණෙන්නේය.

e. දයාවන්තයෝ ______________________ ලබන්නෝය.

f. ______________________ වඩා අභ්‍යන්තරය අවධාරණය කෙරේ.

g. ______________________ වෙනුවට භේදය.

h. පීඩා විඳින්නන්ට ______________________ ලැබේ.

i. සුළු අය ______________________ වේ.

j. නිහතමානී අය ______________________ වේ.

k. සේවකයන් ______________________ වෙති.

l. අන්තිමයෝ ______________________ වෙති.

m. කුඩා දෙය ______________________ වෙති.

n. උතුම් කොට සලකනු ලැබූ දේව ________________ ____________________ ලැබේ.

o. වැඩිහිටි අය ______________________ මෙන් විය යුතුය.

p. ජීවිතය නැතිකර ගන්නේ ______________________ ගැනීමටය.

q. නුඹ මළොත් ______________________ දරයි.

r. ජීවිතයට ______________________ නොකර වෛර කරන්න.

s. දෙන්න එවිට ______________________ ඇත.

t. නුපුළුවන් දේ ______________________

u. නොපෙනෙනවුන්ට ______________________ ඇත.

v. ______________________ ලැබීම සඳහා විය ගහක් හා බරක් ගන්න.

w. ______________________ නොව ස්වර්ගයෙහි වස්තු රැස්කිරීම අවධාරණය කෙරේ.

x. වැසී තිබෙන දේ ______________________ වන්නේය.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

දේව රාජ්‍යයේ අසමානත්වය පිළිබඳ තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා 2 කොරින්ති 6:8-10 හි සඳහන් ඒවා නැවත බලන්න. ඒවා පහත ලයිස්තුගත කරන්න.

___

___

___

___

# නවවන පරිච්ඡේදය

## දේව රාජ්‍යයේ සංස්කෘතිය

## දේවරාජ්‍යයේ මූලධර්ම - 3 කොටස

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව හා අලුත් ගිවිසුමේ දේවරාජ්‍ය මූලධර්ම අතර සබඳතාව පැහැදිලි කිරීමට
- පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාවන් වල විස්තරකිරීමක් ලෙස නව ගිවිසුමේ මූලධර්ම මගින් හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එහෙත් සමූහයෝ එය දැනගෙන උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට කථාකොට, සුවය ඕනෑ අයට සුවකළසේක. (ලූක් 9:11)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය, පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව හා අලුත් ගිවිසුමේ මූලධර්ම අතර සබඳතාව විමසා බැලීමෙන් දේව රාජ්‍යයේ සංස්කෘතිය ගැන අධ්‍යයනය තවදුරටත් ඉදිරියට ගෙන යයි.

### පැරණි හා අලුත් වස්තු

දේව රාජ්‍යය පිළිබඳව යේසුස්වහන්සේ විසින් දෙන ලද උදාහරණයකින් පැරණි හා අලුත් දේව රාජ්‍ය මූලධර්ම ඒකාබද්ධ කිරීම අවධාරණය කෙරේ.

**එවිට උන්වහන්සේ ඔවුන්ට කථාකොට, එහෙයින් ස්වර්ග රාජ්‍යය සඳහා ගෝලයෙක්වී සිටින යම් ලියන්නෙක් ඇද්ද, ඔහු තමාගේ ගබඩාවෙන් අලුත් දේත් පරණ දේත් පිටතට ගෙනෙන්නාවූ ගෙදර ස්වාමියෙකුට සමානයයි කීසේක. (මතෙව් 13:52)**

යේසුස්වහන්සේ ඉගැන්වූ දේව රාජ්‍ය මූලධර්ම අතර පැරණි ඒවා මෙන්ම අලුත් ඒවාද විය. යේසුස්වහන්සේ ඒවා හැඳින්වූයේ “පරණ හා අලුත් වස්තු” ලෙසය. නික්මයාම, ලෙවී කථාව හා ද්විතිය කථාවේ සඳහන් දෙවියන්වහන්සේ විසින් මෝසෙස්ට දෙන ලද ව්‍යවස්ථාව දේව රාජ්‍ය ජීවිතයේ අලුත් මූලධර්මවල පදනම විය. පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව සුවිශේෂී වූ අතර ඒවා බාහිර ක්‍රියාවන් හා සම්බන්ධ වූ ඒවාය. යේසුස්වහන්සේ ඉගැන්වූ අලුත් දේවරාජ්‍ය මූලධර්ම ඒවා අභ්‍යන්තර ආකල්ප හා සම්බන්ධ ඒවා විය.

යේසුස්වහන්සේගේ ඉගැන්වීමේ ව්‍යවස්ථාව නොසලකා හැරියේ නැත. ඒවා සම්පූර්ණ විය.

**ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගුකරන පිණිස මම ආවෙමියි නොසිතල්ලා. සම්පූර්ණකරන්ට මිස අවලංගුකරන්ට නාවෙමි. සැබවක් නුඹලාට කියමි: අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. (මතෙව් 5:17-18)**

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්, මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ විය යුතුයයි මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේ යයි කීසේක. (ලූක් 24:44)**

යේසුස්වහන්සේ දේව රාජ්‍යය පිළිබඳ මුලධර්ම පැරණි ගිවිසුමේ අත්තිවාරම මත වර්ධනය කළ සේක. උන්වහන්සේ පැරණි මුලධර්ම අත්හැරියේ නැත. උන්වහන්සේ ඒවායේ ඇති දේව රාජ්‍යය පිළිබඳ අභ්‍යන්තර සත්‍යතාවන් අත් හැරෙන ප්‍රවණතාවක් ගෙන දුන් ආගමේ බාහිර බැඳීම් පමණක් ඉවත් කළ සේක.

යේසුස්වහන්සේගේ ඉගැන්වීම් පැරණි ගිවිසුම හා එකඟ විය. එහෙත් ඒවා එකල සිටි ආගමික නායකයන් හා එකඟවූයේ නැත. ලියන්නන් හා පරිසිවරු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට ඔවුන්ගේම සම්ප්‍රදායන් හා අර්ථනිරූපණ එක් කළහ. ඔවුන් සලකන ලද්දේ“ “ව්‍යවස්ථාවේ නීතියේ ” එනම් ව්‍යවස්ථාවේ සෑම සුළු කොටසක්ම හා ඔවුන්ගේම සම්ප්‍රදායන් හා අර්ථනිරූපණ පිළිපැදීම ගැන වේ. යේසුස්වහන්සේ “ව්‍යවස්ථාවේ ආත්මය” එනම් ව්‍යවස්ථාව තුළ ඇති පොදු මුලධර්ම අවධාරණය කළ සේක.

## පැරණි දෙයට අලුත් දෙය තබා ගත නොහැකිය

යේසුස්වහන්සේ ඉගැන්වූ මෙම දේවරාජ්‍ය මුලධර්ම පැරණි ආගමික ව්‍යුහය තුළ තැබිය නොහැකි විය. මෙය පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ කතාන්දර දෙකක් පැවසූ සේක. උන්වහන්සේ පැරණි හා අලුත් වස්ත්‍ර ගැන කතා කළ සේක.

**කිසිවෙක් තාන් රෙදිකැල්ලක් පරණ වස්ත්‍රයකට මහන්නේ නැත. මක්නිසාද එසේ කළොත් අණ්ඩයට ගත් රෙදි කැබෙල්ල වස්ත්‍රයෙන් ඇදී, වඩා ලොකු ඉරුමක් වේ. (මතෙව් 9:16)**

**කිසිවෙක් තාන් රෙදි කැබෙල්ලක් පරණ වස්ත්‍රයකට මහන්නේ නැත. මැහුවොත් අලුත් රෙදි කැල්ලට පරණ රෙද්ද ඇදී, වඩා ලොකු ඉරුමක් වේ. (මාක් 2:21)**

**උන්වහන්සේ ඔවුන්ට උපමාවක්ද කියමින්, කිසිවෙක් අලුත් වස්ත්‍රයකින් කැබෙල්ලක් ඉරාගෙන පරණ වස්ත්‍රයකට මහන්නේ නැත. මැහුවොත් අලුත් එක ඉරෙනවාත් ඇර අලුත් එකෙන් ගත් කැබෙල්ල පරණ එකට සම නොවන්නේය. (ලූක් 5:36)**

උන්වහන්සේ පැරණි හා අලුත් මිදියුස ගැනද කතා කළ සේක.

**අලුත් මුද්‍රිකපානය පරණ සම්භාජනවල වත් නොකරති. වත්කළොත් භාජන පැළී, මුද්‍රිකපානය වැගිරී ගොස්, භාජනත් නාස්තිවන්නේය. නුමුත් අලුත් මුද්‍රිකපානය අලුත් සම්භාජනවල වත්කරති. එවිට දෙවගේම ආරක්ෂාවේයයි කීසේක. (මතෙව් 9:17)**

**තවද කිසිවෙක් අලුත් මුද්‍රිකපානය පරණ සම්භාජනවල වත් නොකරයි. වත්කළොත් මුද්‍රිකපානයෙන් සම්භාජන පැළී, මුද්‍රිකපානයත් භාජනත් නාස්තිවන්නේය. නුමුත් අලුත් මුද්‍රිකපානය අලුත් සම්භාජනවල වත්කරතියි කීසේක. (මාක් 2:22)**

**කිසිවෙක් අලුත් මුද්‍රිකපානය පරණ සම්භාජනවල වත් නොකරයි, වත්කළොත් අලුත් මුද්‍රිකපානයෙන් සම්භාජන පැළී, මුද්‍රිකපානය වැගිරී ගොස්, සම්භාජනත් නාස්තිවන්නේය. නුමුත් අලුත් මුද්‍රිකපානය අලුත් සම්භාජනවල වත්කළ යුතුය. තවද පරණ මුද්‍රිකපානය බීවාවූ කිසිවෙක් අලුත් ඒවාට කැමති නොවෙයි. මක්නිසාද: පරණ ඒවා හොඳය කියා ඔහු කියන්නේයයි කීසේක. (ලූක් 5:37-39)**

පැරණි ආගමික ව්‍යුහය තුළ දේව රාජ්‍යයේ මූලධර්මවල "අලුත් මිදියුස" තැබිය නොහැකිය. අලුත් මිදියුස අලුත් භාජනවලට වත්කළ යුතුය. දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා ආත්මික නැවත ඉපදීමක් අවශ්‍යවන්නේ එබැවිනි. මේ පැරණි ආගමික ව්‍යුහයන් වෙනස් කිරීම සඳහා කාලයක් දිය යුතු විය. මක්නිසාද ඒවා අත්දුටු අය "පැරණි ඒවා වඩාත් හොඳය" යි කියන බැවිනි.

යේසුස්වහන්සේ පැරණි ආගමික ව්‍යුහය විනාශ කළේ නැත. ඒවා ආරක්ෂා කිරීමට උන්වහන්සේ ඉඩහැරිය අතරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ නැවත ඉපදුනු පිරිමින්ගේ හා ස්ත්‍රීන්ගේ අලුත් ආත්මික භාජනවලට "අලුත් මිදියුස" වත්කළ සේක. පැරණි දේ සිට අලුත් දෙයට මාරු වීමට යේසුස්වහන්සේ කාලය දුන්සේක.

පැරණි ආගම් සහිත සමාජවලට දේව රාජ්‍ය ශුභාරංචිය හඳුන්වාදීමේ දී මෙය වැදගත් වේ. අලුත් භාජනවලට "අලුත් මිදියුස" වත්කිරීම ගැන අවධාරණය යොමු කළ යුතුය. පැරණි ආගමික ව්‍යුහය සම්ප්‍රදායන් විනාශ කිරීමට මෙහෙය විය යුතු නැත. "අලුත් මිදියුස" වඩාත් හොඳ බව දැනගත් විට පැරණි ඒවා අත්හරිනු ඇත.

## හඳුනාගැනීම සඳහා රටාවක්

පහත දැක්වෙන රටාව ගැන විමසිලිමත් වීමෙන් ඔබට ශුභාරංචිය මුළුල්ලේම "පැරණි හා අලුත් වස්තු" හැඳිනගත හැකිය.

1. යේසුස්වහන්සේ මේ ඉගැන්වීම් හඳුන්වා දෙන්නේ "නුඹලා අසා තිබේ", "මෙසේ ලියා තිබේ" නුඹ "මෙසේ කියවා නැද්ද" වැනි වාක්‍ය ඛණ්ඩ සමගය.

2. පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව සඳහන් කර තිබේ.

3. "නමුත් මම නුඹලාට කියමි" යනුවෙන් යේසුස්වහන්සේ පවසන සේක.

4. පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව මත වර්ධනය කළ අලුත් ගිවිසුමේ දේවරාජ්‍ය මූලධර්මය සඳහන් කර ඇත.

# දේව රාජ්‍යයේ වස්තු

යේසුස්වහන්සේ පැවසූ දේව රාජ්‍යයේ "පැරණි හා අලුත් වස්තු" සමහරක් පහත දැක්වෙන සටහනින් සාරාංශ කර තිබේ. මේ දේවරාජ්‍ය මූලධර්ම අධ්‍යයනය කිරීම සඳහා සෑම යොමුවක්ම බලන්න.

| | පැරණි වස්තුව "නුඹලා අසා තිබේ" | අලුත් වස්තුව "නුමුත් මම නුඹලාට කියමි" |
|---|---|---|
| මතෙව් 5:21-26 | මිනී නොමරව | කෝපවන කවරෙක් නුමුත් එසේ වේ |
| මතෙව් 5:23-44; 6:1-8; 23:14, 23-27<br>මාක් 7:6-8; 11:25-26<br>ලූක් 18:10-14 | නමස්කාරය බාහිර ක්‍රියාමත රඳා පවතී. | නමස්කාරය අභ්‍යන්තර ආකල්ප මත රඳා පවතී. |
| මතෙව් 5:27-32 | කාමමිථ්‍යාචාරය නොකරව | සිතිවිල්ල ක්‍රියාව හා සමාන වේ. |
| මතෙව් 5:33-37; 23:16-22 | බොරුවට නොදිවුරව | කිසිසේත් නොදිවුරව |
| මතෙව් 5:38-42 | නපුරට නපුර කරන්න | නපුරට යහපත කරන්න |
| මතෙව් 5:43-47, ලූක් 6:27-35 | අසල්වාසියට ප්‍රේම කරව | සතුරන්ට ප්‍රේම කරපල්ලා |
| මතෙව් 15:3-9, මාක් 7:7-13 | ශුද්ධකම ලැබෙන්නේ මනුෂ්‍යයාගේ සම්ප්‍රදායන් අනුගමනය කිරීමෙනි. | ශුද්ධකම යනු දෙවියන්වහන්සේගේ ආඥා අනුව ක්‍රියා කිරීමය |
| මතෙව් 12:3-14, මාක් 2:23-28; 3:1-6; ලූක් 6:1-11; යොහන් 5:1-47; | මනුෂ්‍යා සබත උදෙසා මවා තිබේ. එමනිසා සබතට අදාළ සෑම නීතියක්ම පැවැත්විය යුතුය. | සබත ඇත්තේ මනුෂ්‍යා උදෙසාය |
| මතෙව් 15:10-20; මාක් 7:14-23; | අවධාරණය බාහිර ශුද්ධවන්තකම ගැන වේ. | අවධාරණය අභ්‍යන්තර ශුද්ධවන්තකම ගැන වේ. |
| මතෙව් 5:31-32; 19:1-9; මාක් 10:2-12 | ඕනෑම දෙයකට දික්කසාදවන්න | දික්කසාදය දෙවියන්වහන්සේගේ මුල් සැලැස්ම නොවේ. එහෙත් සීමිත හේතු කිහිපයකට ඉඩ දී ඇත. |

ඔබ ඉහත අධ්‍යයනය කළ සටහනේ සියලුම "පැරණි හා අලුත් වස්තු" නැත. ඉන් අවධාරණය කෙරෙන්නේ ඔබගේ අධ්‍යයනය පහසුවීම සඳහා රටාවක් ගොඩනගා ගැනීමට භාවිත කළ හැකි වැදගත් නිදසුන් කිපයක් පමණි.

ශුභාරංචි පොත් (මතෙව්, මාක්, ලූක්, යොහන්) කියවා මෙම රටාව ගැන සොයන්න. මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටස භාවිත කර දේවරාජ්‍යයේ පැරණි හා අලුත් වස්තු, සටහනට තවත් ඒවා එක් කරන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

2. පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව විස්තර කෙරෙන සෑම ප්‍රදේශයක් ඉදිරියේම හිස්තැන් "පැරණි" යන්නත් අලුත් ගිවිසුම් දේව රාජ්‍ය මූලධර්ම විස්තර කෙරෙන සෑම ප්‍රකාශයක් ඉදිරියේම හිස් තැනේ "අලුත්" යන්නත් ලියන්න.

a. _____________ අභ්‍යන්තර ආකල්ප පිළිබඳ වඩාත් සැලකිලිමත් වේ.

b. _____________ බාහිර ක්‍රියා ගැන වඩාත් සැලකිලිමත් වේ.

c. _____________ වඩාත් සුවිශේෂිය

d. _____________ ඇතුලාන්තයේ දේ අන්තර්ගතය

e. _____________ ව්‍යවස්ථාවේ නිතිය ගැනය

f. _____________ ව්‍යවස්ථාවේ ආත්මය ගැනය

g. _____________ මිනී නොමරව

h. _____________ හේතුවක් නොමැතිව කෝපවීමද එසේමය

i. ____________ යම් දෙයක් කරනකොටගෙන නොදිවුරව

j. _____________ තමා කරනකොටගෙන නොදිවුරව

k. _____________ නපුරට යහපත කරන්න

l. _____________ නපුරට නපුර කරන්න

m. _____________ අසල්වාසියාට ප්‍රේම කරන්න

n. _____________ සතුරාට ප්‍රේම කරන්න

o. _____________ නමස්කාරය අභ්‍යන්තර ආකල්ප මත රඳා පවතී.

p. _____________ නමස්කාරය බාහිර ක්‍රියා මත රඳා පවතී.

q. _____________ සබත මනුෂ්‍යයා උදෙසා සාදා තිබේ.

r. _____________ මනුෂ්‍යයා සබත උදෙසා මවා තිබේ.

s. _____________ ශුද්ධවන්තකම යනු මිනිසාගේ සම්ප්‍රදායන් පැවැත්වීම වේ.

t. _____________ ශුද්ධවන්තකම යනු දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂා කිරීම වේ.

u. _____________ බාහිර ශුද්ධවන්තකම ගැන අවධාරණය කෙරේ.

v. _____________ අභ්‍යන්තර ශුද්ධවන්තකම ගැන අවධාරණය කෙරේ.

w. _____________ දික්කසාදය සීමිත හේතුවලට පමණි.

x. _____________ දික්කසාදය ඕනෑම හේතුවකටමය.

3. මෙම වාක්‍ය සම්පූර්ණ කිරීමට නිවැරදි පිළිතුර වටා රවුමක් අඳින්න.

යේසුස්වහන්සේ පැමිණියේ ______________________________

a. පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව විනාශ කිරීමටය.
b. පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීමටය

4. පැරණි ගිවිසුම ව්‍යවස්ථාව හා අලුත් ගිවිසුම් දේව රාජ්‍ය මූලධර්ම අතර ඇති සබඳතාව කුමක්ද?

___________________________________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. යොහන්ගේ ශුභාරංචියේ දේව රාජ්‍යය පිළිබඳව එතරම්ම සඳහන් කොට නැත. එහෙත් එහි සඳහන් ස්වල්පය. ඉතා වැදගත් වේ.

   යොහන් 1:45-49: යේසුස්වහන්සේ රජ කෙනෙකු හා පැරණි ගිවිසුම් අනාවැකි සම්පූර්ණ කරන්නාවූ තැනැන්වහන්සේ බව නතානියෙල් පිළිගත්තේය.

   යොහන් තෙවෙනි පරිච්ඡේදය: මෙය දේව රාජ්‍යයට ඇතුළුවන ආකාරය පැහැදිලි කෙරෙන ඉතා වැදගත් පරිච්ඡේදයකි.

   යොහන් 18:36: දේව රාජ්‍යය පිළිබඳ වැදගත් සඳහනකි. දේව රාජ්‍යය මේ ලෝකයේ රාජ්‍යයක් නොවන බව මෙමගින් ස්ථිර කරයි.

2. "පැරණි හා අලුත් වස්තු" පිළිබඳව මතෙව්, මාක්, ලූක් හා යොහන් ශුභාරංචිවල සඳහන් දේ තවදුරටත් අධ්‍යයනය කරන්න. පහත දැක්වෙන සටහනේ ඔබේ සොයා ගැනීම් සඳහන් කරන්න.

**පැරණි වස්තු "නුඹලා අසා තිබේ"** **අලුත් වස්තු "නුමුත් මම නුඹලාට කියමි"**

# දසවන පරිච්ඡේදය

## දේවරාජ්‍යය පිළිබඳ උපමා

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලියන්න
- "උපමා" යන වචනය අර්ථ විග්‍රහ කිරීමට
- යේසුස්වහන්සේ, දේවරාජ්‍යය මූලධර්ම ඉගැන්වීමට උපමා භාවිතා කිරීමට හේතුව පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේගේ උපමා කතාවල ප්‍රධාන විෂය හැඳින ගැනීමට
- දේවරාජ්‍යයේ මූලධර්ම ඉගැන්වීම සඳහා යේසුස්වහන්සේගේ උපමා අධ්‍යයනය කිරීමට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය

**උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින් : ස්වර්ගරාජ්‍යයේ රහස් දැනගැනීම නුඹලාට දී තිබේ, නුමුත් ඔවුන්ට දීලා නැත. (මතෙව් 13:11)**

## හැඳින්වීම

මීට පෙර පරිච්ඡේදවලින් දේවරාජ්‍යයේ ජීවිත පාලනය කරන මූලික මූලධර්ම ඔබ උගත්තෙහිය. යේසුස්වහන්සේ, උන්වහන්සේගේ මෙලොව සේවයේදී දේවරාජ්‍යය පිළිබඳ ආත්මික සත්‍යයන් එළිදරව් කිරීමට "උපමා" ලෙස හැඳින්වෙන සුවිශේෂී ඉගැන්වීම් ක්‍රමයක් භාවිත කළ සේක.

මෙම පරිච්ඡේදයෙන්, උපමා යනු මොනවාද යන්නත් දේවරාජ්‍යයේ මූලධර්ම ඉගැන්වීමට යේසුස්වහන්සේ උපමා භාවිතා කිරීමට හේතුවත් ඔබ ඉගෙන ගන්නෙහිය. එමෙන්ම දේවරාජ්‍යයේ මූලධර්ම ඉගෙනීමට තෝරාගත් උපමා කතා කිපයක්ද ඔබ අධ්‍යයනය කරනු ඇත.

## උපමාවක් යනු කුමක්ද?

උපමාවක් යනු ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීමට ස්වාභාවික ලෝකයෙන් නිදර්ශනයක් ගෙන භාවිතා කරන කතාවකි. "උපමාව" යන වචනයෙහි සැබෑ තේරුම "සැසඳීම සඳහා කිට්ටුවෙන් තැබීම" වැන්නකි. උපමා කතාවලදී යේසුස්වහන්සේ ස්වාභාවික නිදර්ශනයක් භාවිතා කර එය ආත්මික සත්‍යයක් හා සැසඳූ සේක. උපමාවක් යනු ස්වර්ගික තේරුමක් ඇති මෙලොව කතාවකි. ස්වාභාවික දෙයක් යනු ඔබගේ ඉන්ද්‍රියයන්ගෙන් ඔබට නිරීක්ෂණය කළ හැකි දෙයක් වේ. ඔබට එය ඇසීමට, දැකීමට හා ස්පර්ශ කිරීමට හැකිය. ආත්මික දෙයක් නිරීක්ෂණය කළ හැක්කේ ආත්මික ඉන්ද්‍රියයන්ගෙන් පමණි.

## උපමාවල විෂයයන්

යේසුස්වහන්සේගේ උපමාවල ප්‍රධාන විෂය වුයේ දේවරාජ්‍යයයි. මේ උපමා සමහරක් ප්‍රකාශ කිරීමට පෙර යේසුස්වහන්සේ පැහැදිලිවම තමන්වහන්සේගේ විෂය ලෙස එය සඳහන් කළේය.

**තවද උන්වහන්සේ කියනසේක් : දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන කරමුද? නොහොත් කවර උපමාවකින් එය දක්වා දෙමුද? (මාර්ක් 4:30)**

**එබැවින් උන්වන්සේ කියනසේක් : දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානද? ඒක කුමකට සමානකරම්ද? (ලූක් 13:18)**

**නැවතත් උන්වහන්සේ කියනසේක් : දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන කරම්ද? (ලූක් 13:20)**

එවැනි ඍජු ප්‍රකාශයකින් උපමාව හඳුන්වා නුදුන් අවස්ථාවලද, විෂය දේව රාජ්‍යයම විය. යේසුස්වහන්සේ පැවසු සෑම උපමාවකින්ම යම්කිසි අයුරකින් දේවරාජ්‍යයට හා සම්බන්ධකමක් තිබිණි.

## උපමා අවශ්‍ය මන්ද?

දේවරාජ්‍යය පිළිබඳ ආත්මික සත්‍යයන් එළිදරව් කිරීමට යේසුස්වහන්සේ මේ සුවිශේෂී ක්‍රමය භාවිතා කරන ලද්දේ මන්ද? ගෝලයෝද මෙම ප්‍රශ්නයම ඇසුවෝය.

**එවිට ගෝලයෝ ඇවිත් : ඔබවහන්සේ ඔවුන්ට උපමාවලින් කථා කරන්නේ මක්නිසාදැයි ඇසුවෝය. (මතෙව් 13:10)**

යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

**උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින් : ස්වර්ගරාජ්‍යයේ රහස් දැනගැනීම නුඹලාට දී තිබේ, නුමුත් ඔවුන්ට දීලා නැත. (මතෙව් 13:11)**

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක් : දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ රහස් දැනගැනීම නුඹලාට දී තිබේ. නුමුත් දකිමින්ම නොදක්නා පිණිසත් අසමින්ම තේරුම් නොගන්නා පිණිසත් සෙස්සන්ට උපමාවලින් කියනු ලැබේ. (ලූක් 8:10)**

දේවරාජ්‍යය පිළිබඳ ආත්මික සත්‍යයන් ගැන දැනුම ගෝලයන්ට දෙන ලද්දේ ඔවුන්ට ආත්මික සිත් තිබුණු නිසාය. මේ උපමාවලට සවන් දුන් ආත්මික සිත් නොමැති අයට මේවා අවබෝධ කරගත නොහැකි විය. මක්නිසාද ආත්මික සත්‍යයන් අවබෝධ කරගත හැක්කේ ආත්මික සිත්වලට පමණක් බැවිනි.

**නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය, ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

ආත්මික සිත් ඇති අයට උපමා මගින් එළිදරව් කළ දේවරාජ්‍යය මූලධර්ම අවබෝධ කරගත හැකි විය. මාංශික, පාපී සිත් ඇති අයට ඒවා අවබෝධ කරගත නොහැකිය. යේසුස්වහන්සේ උපමා භාවිතා කළේ මේ උතුම් ආත්මික මූලධර්ම නොඇදහිලිවතුන්ගෙන් සඟවා තැබීමටය.

**මක්නිසාදයත් : යම් හෙයකින් ඔවුන් හැරී කමාව නොලබන ලෙස දැක දැකත් නොදක්නා පිණිසය, අස අසාත් තේරුම් නොගන්නා පිණිසයයි කීසේක. (මාර්ක් 4:12)**

("ආත්මික සිතක්" ඇති මනුෂ්‍යයකු යනු මෙම අත්පොතේ සතරවන පරිච්ඡේදයෙන් පැහැදිලි කළ ආත්මිකව නැවත උත්පාදනය ලැබූ කෙනෙකි ).

## දේවරාජ්‍යය පිළිබඳ උපමා

යේසුස්වහන්සේ පැවසූ සියලුම උපමාවලින් දේවරාජ්‍යය පිළිබඳ විවිධ කරුණු එළිදරව් විය. මේ සෑම එකකින්ම උගැන්වූ විෂය, යොමුව හා දේවරාජ්‍යයේ සත්‍යයන් පහත ලයිස්තු ගතකර ඇත. සෑම යොමුවක්ම බයිබලයෙන් බලා එම උපමාව කියවන්න.

### දේවරාජ්‍යයේ පිරිනැමීම පිළිබඳ උපමා:

පහත සඳහන් උපමාවලින් දැක්වෙන්නේ දේවරාජ්‍යය ගැන යේසුස්වහන්සේ විසින් කරන ලද පිරිනැමීම් වේ.

**අණ්ඩ දැමූ වස්ත්‍ර:** මතෙව් 9:16, මාර්ක් 2:21, ලූක් 5:36
**මුද්‍රික භාජනය:** මතෙව් 9:17, මාර්ක් 2:22, ලූක් 5:37

මෙම උපමා දෙකින් උගන්වන්නේ යේසුස්වහන්සේ අලුත් හා අද්විතීය රාජ්‍යයක් පිරිනැමූ බවය. එය ආගමික සම්ප්‍රදායින් හි පැරණි රටාවන් වලට සීමා කළ නොහැකිය. පැරණි සිතුවිලි රටා හා ජීවිත ශෛලයවලට දේවරාජ්‍යය අනුරූප කිරීමට උත්සාහ කිරීමෙන් එය අවබෝධ කර ගත නොහැකිය.

**යහපත් එඬේරා:** යොහන් 10:1-16

යේසුස් රජතුමා එඬේරෙකුට සසඳා ඇත. උන්වහන්සේ උන්වහන්සේගේ බැටළුවන් ආගමික බැඳීම් වලින් මුදා උන්වහන්සේගේ රාජ්‍යයේ නිදහසට ගෙන එන සේක. උන්වහන්සේගේ බැටළුවන් උන්වහන්සේගේ හඬ දන්නා අතර උන්වහන්සේ පිරිනමනු ලබන දේවරාජ්‍යයට ප්‍රතිචාර දක්වනු ඇත.

**නැතිවූ බැටළුවා:** මතෙව් 18:12-14, ලූක් 15:4-7
**නැතිවූ කාසිය:** ලූක් 15:8-10
**නැතිවූ පුත්‍රයා:** ලූක් 15:11-32

මෙම උපමාවලින් පෙන්වනු ලබන්නේ පියාණන්වහන්සේ දේවරාජ්‍යය උදෙසා නැති වූ බැටළුවා සොයන ආකාරයත්, උන්වහන්සේගේ අනුගාමිකයන් නැතිවූ අය සෙවිය යුතු ආකාරයත් සහ දේවරාජ්‍යයේ උරුමක්කාරයන් විමත් යතුර පසුතැවිලිවීම වන ආකාරයත් වේ.

**සරණ මංගලයය:** මතෙව් 22:1-14
**මහත් රාත්‍රි කෑම:** ලූක් 14:16-24

මෙම උපමාවලින් යේසුස්වහන්සේ වර්තමාන පරම්පරාවට දේවරාජ්‍යයට ඇතුල්වන ලෙස ඉල්ලා සිටි සේක. මුල් දැන්වීම එවන ලද්දේ විශේෂ සෙනඟ කණ්ඩායමකටය. එය ඉශ්‍රායෙල් ජාතියට වේ. තෝරාගත් සියලු දෙනා ප්‍රතිචාර දැක්වූයේ නැත. එබැවින් අන්‍ය ජාතීන්ටද ආරාධනා කරන ලදි.

**අත්තිවාරම් දෙක:** මතෙව් 7:24-27

මෙම උපමාවෙන් යේසුස්වහන්සේ ඉගැන්වූයේ දේවරාජ්‍යය උන්වහන්සේ මත ගොඩනගන ලද බවය. යේසුස්වහන්සේ තමා පර්වතයක් ලෙසත් එම පර්වතය මත මනුෂ්‍යයාට තම ජීවිතය ගොඩනගා ගත හැකි බවත් පෙන්නුම් කළ සේක. එවැනි ආරක්ෂා සහිත අත්තිවාරමක ගොඩනගා ඇති නිවසක් ඕනෑම

කුණාටුවකට මුහුණ දෙනු ඇත. දේවරාජ්‍යයේ සදාතනික අත්තිවාරම මත තම ජීවිත ගොඩනගා ගැනීමේ අවස්ථාව යේසුස්වහන්සේ සියලුම පිරිමින්ට හා ස්ත්‍රීන්ට දුන් සේක.

**දොරටු දෙක:** මතෙව් 7:13-14, ලූක් 13:24-28

දේවරාජ්‍යය වෙත ගෙන යනු ලබන්නේ එක් දොරටුවකින් පමණි. එම දොරටුව ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වේ.

## රජතුමා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ උපමාව:

**මිනිමරු ගොවීහු:** මතෙව් 21:33-44, මාර්ක් 12:1-11, ලූක් 20:9-18

තමන්වහන්සේ මෙසියස්වහන්සේ හා රජතුමා ලෙස ඉශ්රායෙල්වරුන් ප්‍රතික්ෂේප කරන බව දැක්වීමට යේසුස්වහන්සේ උපමා භාවිතා කළ සේක. මේ මිනිමරු ගොවීන් පිළිබඳ උපමාවෙන් පැහැදිලි වේ. දේවරාජ්‍යය පිරිනමමින් දෙවියන්වහන්සේ අනාගතවක්තෘවරුන් මෙලොවට එවූ සේක. එහෙත් ඉශ්‍රායෙල්වරු ඔවුන්ව මරා දැම්මෝය. ඉන්පසු දෙවියන්වහන්සේ තමාගේම පුත්‍රයාණන්වහන්සේ වුසේක. උන්වහන්සේවද ප්‍රතික්ෂේප කර මරා දමන ලදි.

**ඵල නැති අත්තික්කා ගස:** ලූක් 13:6-9

ඵල නැති අත්තික්කා ගහක් පිළිබඳ උපමාවක් යේසුස්වහන්සේ පැවසූ සේක. අත්තික්කා ගහ ඉශ්‍රායෙල් ජාතියේ ස්වාභාවික සංකේතයකි. දේවරාජ්‍යය ලෝකයාට එළිදරව් කළ හැකි ජාතිය ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ගොඩනැඟූ සේක. වරින් වර ඉශ්‍රායෙලය නැමැති "ගස" සැබෑ දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යය මිථ්‍යාදෘෂ්ටි ජාතීන් සමග බෙදා ගැනීමෙන් "ඵල" දැරීමට සැලැස්වීමට උන්වහන්සේ උත්සාහ කළ සේක. එහෙත් ඉශ්‍රායෙලය ඵල රහිතව වඳව තිබුණි.

**සරණ මංගල්‍යය:** මතෙව් 22: 2-14

උන්වහන්සේව ප්‍රතික්ෂේප කරන බව පෙන්වීම යේසුස්වහන්සේ සරණ මංගල්‍යයක් පිළිබඳ උපමාවක් පැවසූ සේක. සරණ මංගල්‍යයට මිනිසුන් කැඳවීම සඳහා සේවකයන් යවන ලදි. එහෙත් ඔවුහු සේවකයන් ප්‍රතික්ෂේප කරන ඔවුන්ව මරා දැමූහ. මින් පෙන්නුම් කළේ දේවරාජ්‍යය පිරිනැමීම ප්‍රතික්ෂේප කරන ආකාරය වේ.

## දේවරාජ්‍යයේ පැමිණීම කල්දැමීම පිළිබඳ උපමා:

**තලෙන්ත:** මතෙව් 25:14-30, ලූක් 19:11-27
**දිගු ගමනක් ගිය මිනිසා:** මාර්ක් 13:34-37
**දාසයෝ:** මතෙව් 24:43-51, ලූක් 12:39-46
**අවදිව සිටින දාසයෝ:** ලූක් 12:36-38

අනාගතයේදි දේවරාජ්‍යය අවසාන ආකාරයෙන් පිහිටුවන බව එළිදරව් කිරීමට යේසුස්වහන්සේ උපමා බොහෝමයක් පැවසූ සේක. ඉශ්‍රායෙලය යේසුස්වහන්සේව රජතුමා ලෙස ප්‍රතික්ෂේප කළ නිසා දේවරාජ්‍යය වර්තමානයේ පැමිණෙන්නේ නැත. එමෙන්ම මෙම උපමා එළිදරව් කළ තවත් කරුණක් වන්නේ දේවරාජ්‍යය අවසාන වශයෙන් පිහිටුවන ක්ෂේත්‍රයෙන් යේසුස්වහන්සේ ස්වල්ප කලකට ඉවත්ව සිටින බවද වේ. උන්වහන්සේගේ අනුගාමිකයන් විශ්වාසවන්තව ඔවුන්ට පවරන ලද කාර්යය ඉටු කළ යුතු බවද, ඔවුන්ට දෙන ලද තලෙන්ත හා හැකියාවන් දේවරාජ්‍යය පැතිරවීමට භාවිතා කළ යුතු බවද ඒවායින් අවධාරණය කෙරේ.

**අත්තික්කා ගස:** මතෙව් 24:32-34, මාර්ක් 13:28-30, ලූක් 21:29-32

අවසාන වශයෙන් දේවරාජ්‍යය පිහිටුවන කාලය දළ වශයෙන් එළිදරව් කිරීමට යේසුස්වහන්සේ අත්තික්කා ගසක් පිළිබඳ උපමාවක් පැවසූ සේක. එහි අතු මෘදුව කොළ හටගන්නා කල ග්‍රීෂ්ම ඍතුව ළඟ බව කෙනෙකුට කිව හැකිය. කලින් සඳහන් කළ පරිදි අත්තික්කා ගස ඉශ්‍රායෙල් ජාතියේ ස්වාභාවික උදාහරණයකි. යේසුස්වහන්සේ පැවසුවේ ඉශ්‍රායෙලය නැවතත් ඇගේම භූමියේ නැවත පිහිටුවූ විට හා ජාතියක් වශයෙන් නැවත "මල් හට ගන්නා" විට රජතුමාගේ නැවත පැමිණීමේ කාලය ආසන්න බවය. (මෙය දැනටමත් සිදු වී ඇත...... ඉශ්‍රායෙලය ජාතියක් ලෙස නැවතත් ඔවුන්ගේම භූමියේ පිහිටුවා ඇත)

## දේවරාජ්‍යයේ වර්ධනය පිළිබඳ උපමාව:

ලෝකය මුළුල්ලේම දේවරාජ්‍යය පැතිරෙන ආකාරය පිළිබඳ උපමා කිහිපයක්ම යේසුස්වහන්සේ පැවසූ සේක.

**තලෙන්ත:** මතෙව් 25:14-30, ලූක් 19:11-27

මෙම උපමාවෙන් එළිදරව් වන්නේ දේවරාජ්‍යය, දෙවියන්වහන්සේ විසින් ඇදහිලිවතුන්ට දෙන ලද තලෙන්ත හා හැකියාවන් උපයෝගී කර ගනිමින් ඥාණවන්තව පතුරවන බවය.

**වපුරන්නා:** මතෙව් 13:3-8, මාර්ක් 4:3-8, ලූක් 8:5-8

දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පතුරුවනු ලබන්නේ දේවවචනය නැමැති බීජය වැපිරීමෙනි. මෙම වැපිරීමට සවන් දෙන්නන්ගේ ආකල්ප මත විවිධ ප්‍රතිචාර ලැබෙනු ඇත. මෙහි ඵලය රඳා පවතින්නේ වපුරන්නා මත නොව බීජයේ ඇති ජීවය හා පසෙහි තත්වය අනුවය (මනුෂ්‍යයාගේ හදවත)

**කිරිඳි සහ තිරිඟු:** මතෙව් 13:24-30

දේවරාජ්‍යයේ හොඳ බීජ සමග "වල් පැළෑටි" ලෙස හැඳින්වෙන මිනිසුන් වැපිරීම මගින් දේවරාජ්‍යය පැතිරවීම පරාජය කිරීමට සාතන් උත්සාහ ගනු ඇත. සාතන් වපුරන බීජද හොඳ බීජ හා සමානය. එහෙත් අස්වැන්න නෙළා ගන්නා කාලයේ පැළෑටි නිපදවන ධාන්‍යය මගින් තිරිඟු හඳුනා ගත හැකිය. කෙසේ වුවද වල් පැළෑටිවලින් ප්‍රයෝජනවත් ධාන්‍යය නොනිපදවේ.

**දැල:** මතෙව් 13:47-50

දේවරාජ්‍යය මුහුදට හෙලන ලද විශාල දැලකට සමාන කර ඇත. විවිධාකාර මසුන් හසු වේ. එහෙත් දැල වෙරළට ඇද ගත් කළ හොඳවුන් නරක උන්ගෙන් වෙන් කෙරේ. සියලු ජාතීන්වල පිරිමි හා ගැහැණු දේවරාජ්‍යය වෙත ඇද ගනු ලබති. අවසානයේ දේවරාජ්‍යය පිහිටවීමට පෙර ඉවත් කර යුත්තේ කවුරුන්දැයි තීරණය කිරීමට විනිශ්චයක් කරනු ඇත.

**අබ ඇටය:** මතෙව් 13:31-32, මාර්ක් 4:31-32 ලූක් 13:19

දේවරාජ්‍යය අබ ඇටයක් මෙන් වැඩෙනු ඇත. බීජය ඉතා කුඩාවන අතර ආරම්භයේදී වැදගත් බවක් නොපෙනේ. එහෙත් පරිනත වීමේදී විශාල ගසක් බවට පත්වේ.

**මුහුන්:** මතෙව් 13:33, ලූක් 13:21

පිටි ගුලියක ඇති මුහුන් මෙන් දේවරාජ්‍යය මුළු ලොවපුරාම පැතිරෙනු ඇත. දේවරාජ්‍යයේ බලය බාහිර දෙයක් නොවේ අභ්‍යන්තර දෙයකි.

## දේවරාජ්‍යයේ විනිශ්චය පිළිබඳ උපමා:

**කන්‍යාවන් දසදෙනා:** මතෙව් 25:1-12
**බැටළුවන් හා එළුවන්:** මතෙව් 25:31-46

දේවරාජ්‍යයේ අවසාන විනිශ්චය පිළිබඳ උපමා කථා කිහිපයක් යේසුස්වහන්සේ පවසා ඇත. විනිශ්චය දවසේදී සැබෑ එඬේරාවූ යේසුස්වහන්සේගේ බැටළුවන් පිළිගනු ඇති අතර අනෙකුත් සියල්ලන්ට දේවරාජ්‍යයට ඇතුළු විමට ඉඩ දෙනු නොලැබේ.

## දේවරාජ්‍යයේ අගයන් පිළිබඳ උපමා:

දේවරාජ්‍යයේ අගයයන් පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ උපමා කිහිපයක් භාවිතා කළ සේක.

**මහත් වටිනාකමක් ඇති මුතු ඇටය** මතෙව් 13:45-46
**සැඟවුනු නිධානය** මතෙව් 13:44

මෙම උපමාවලින් පෙන්වන්නේ දේවරාජ්‍යය කෙතරම් වටින්නේද යත් වෙන කිසිවක් ඊට සමාන කල නොහැකි බවය. මනුෂ්‍යයාට අයත් සෑම වස්තුවකටම වඩා දේවරාජ්‍යය වටිනවා ඇත. දේවරාජ්‍යය ලබා ගැනිම සඳහා ඔබට අයත් සියල්ල පූජා කිරීමට සිදුවුවත් එම කැපකිරීම වටිනා බවය.

**ගෙදර ස්වාමියා:** මතෙව් 13:52

මෙම උපමාවෙන් යේසුස්වහන්සේ තමන්වහන්සේව, ගෙදරට අවශ්‍යය දේ ගබඩාවෙන් ගෙනෙන භාරකාරයෙකුට සමාන කළ සේක. භාරකරු යමක් භාරව සිටින තැනැත්තෙකි. භාරකරු අලුත් ධාන්‍යය හෝ පරණ ධාන්‍ය නැතහොත් අලුත් මුද්‍රකපානය හෝ පැරණි මුද්‍රිකපානය ගෙනෙනු ඇත. ඔහු ගෙනෙන දෙයින් ගෙයි අවශ්‍යතාවයන් සම්පූර්ණයෙන්ම සපිරේ. යේසුස්වහන්සේ ගෙනා රාජ්‍යය සමහර දේ අතින් පැරණි දේවරාජ්‍යයට සමානය. සමහර දේ අතින් එය සම්පූර්ණයෙන්ම අලුත්ය. එහෙත් මේ පැරණි හා අලුත් දේවල් සියල්ලෙන් දේවරාජ්‍යයේ පදිංචි කරුවන්ගේ අවශ්‍යතාවන් සැපිරුණේය.

## දේවරාජ්‍යයේ ජිවිතය පිළිබඳ උපමා:

දේවරාජ්‍යය ජිවත් විමේ මුලධර්ම පැහැදිලි කෙරෙන උපමා කිහිපයක් යේසුස්වහන්සේ පැවසූ සේක.

**පුත්‍රයන් දෙදෙනා:** මතෙව් 21:28-32

දේවරාජ්‍යය පවුල තුළ පුත්‍රත්වය පිළිබඳ පරික්ෂණය කිකරුකම බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක.

**යහපත් සමාරිතයා** ලූක් 10:30-37

සියල්ලන්ටම ප්‍රේම කරන්න යන දේවරාජ්‍යය මුලධර්මය මෙම උපමාවෙන් ඉගැන්වේ. අපගේ අසල්වැසියා යනු අවශ්‍යතාවයක් ඇති කෙනෙකු වන අතර ඒ අවශ්‍යතාවය අප දන්නා හා අපට ඒ අවශ්‍යතාව ඉටු කිරීමට හැකි ඕනෑම කෙනෙක් ය.

**ණයකාරයන් දෙදෙනා** ලූක් 7:41-43

මෙම උපමාවෙන් අපට උගන්වනු ලබන්නේ දේවරාජ්‍යයේ ප්‍රේමය අත්දුටු අය ප්‍රේමය පෙන්වන බවය.

**ඵරිසියා සහ ආදායම් අයකරන්නා:** ලූක් 18:10-14

ඵරිසියා දෙවියන්වහන්සේ වෙතට පැමිණුනේ තමාගේම ධර්මිෂ්ඨකම පදනම් කරගෙනය. ස්වාමින් වහන්සේ ඉදිරියේ සිටිමට තරම් වටිනාකමක් තමාට නොමැති බව ආදායම් අය කරන්නා තේරුම් ගත්තේය. මෙම උපමාවෙන් යේසුස්වහන්සේ අපට ඉගැන්වුයේ නමස්කාර කිරිමට, ප්‍රශංසා කිරිමට, ස්තුති දීමට, ඉල්ලීමට හා දේවරාජ්‍යයේ මැදිහත්වීමට දෙවියන්වහන්සේ වෙතට ළගා විය යුතු ආකාරය වේ. එමෙන්ම ඉන් යාච්ඤාවේ නිහතමානිකම ඉගැන්වූ අතර ස්වයං ධර්මිෂ්ඨකමේ පාපය ගැනද අවවාද කළේය.

**නොනවත්වා උත්සාහ කළ වැන්දඹුව:** ලූක් 18:1-8
**නොනවත්වා උත්සාහ කළ මිතුරා:** ලූක් 11:5-10

මෙම උපමා වලින් අවධාරණය කරන්නේ නොනවත්වා උත්සාහයෙන් කරන්නාවු යාච්ඤාවන්ගේ වැදගත්කමය.

**විශ්වාසවන්ත කළමනාකරු:** මතෙව් 25: 14-30

දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ට විශ්වාසයෙන් යුතුව බාරදෙන දේවරාජ්‍යයේ වස්තූන් ඥාණාන්විතව හා යුක්ති සහගතව රැකබලා ගැනිමේ වැදගත්කම මෙම උපමාවෙන් අවධාරණය කෙරේ.

**සරණ මංගලයයේ ආසන:** ලූක් 14:7-11

මෙම උපමාවෙන් නිහතමානිකමේ වැදගත්කම පෙන්වන අතර දේවරාජ්‍යයේ උසස් විම පැමිණෙන්නේ ස්වාමින්වහන්සේගෙන් බව අවධාරණය කෙරේ.

**මිදිවැල හා අතු:** යොහන් 15:1-6

මෙම උපමාවෙන් යේසුස්වහන්සේ හා සභාව සමග ඇති සබඳතාවය විස්තර කෙරේ.

**මිදිවත්තේ වැඩකාරයෝ:** මතෙව් 20:1-16

මෙම උපමාවෙන් උගන්වනු ලබන්නේ සදාතනික ප්‍රතිලාභ, ලෞකික ප්‍රමිතින් පදනම් කර ගෙන නොසාදන බවය.

**දාසයාගේ ස්ථානය:** ලූක් 17:7-10

මෙම උපමාවෙන් උගන්වනු ලබන්නේ අපගේ වගකිම නම් සේවය කිරිම හා රජතුමා විසින් අණකරන ලද දෙය කිරිම බවය.

**රජතුමා යුද්ධයට යෑම:** ලූක් 14:31-33
**කොතක් ගොඩනගන මිනිසා:** ලූක් 14:28-30

මෙම උපමාවලින් අවධාරණය කෙරෙන්නේ දේවරාජ්‍යයට කැපවීම පිළිබඳව නිවැරදි අවබෝධයේ වැදගත්කමය.

**මංගල්‍ය වස්ත්‍රය:** මතෙව් 22: 10-14

මෙම උපමාවෙන් අවධාරණය කෙරෙන්නේ දේවරාජ්‍යයේ පැවති  සිටිම සඳහා ධර්මිෂ්ඨකමේ වස්ත්‍ර පැළඳ සිටිමේ අවශ්‍යතාවය වේ. මෙය ලබා ගත හැක්කේ ස්වයං-ධර්මිෂ්ඨකමෙන් නොව යේසුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමෙනි.

**පොහොසත් මනුෂ්‍යයාගේ කල්පනාව:** ලූක් 12:16-21

මෙම කතාවෙන් පෙන්නුම් කරන්නේ තාවකාලික ද්‍රව්‍යමය වස්තුව මත රඳා පැවතිමේ මෝඩකම පිළිබඳව වේ. ජිවිතයේ ප්‍රමුඛතාව සදාතනික දේවරාජ්‍යයය.

**දූවිය හා රොඩ්ඩ** මතෙව් 7:1-5, ලූක් 6:41-42

මෙම උපමාවෙන් උගන්වනු ලබන්නේ අප අනුන්ව නොව අපවම විනිශ්චය කළ යුතු බවය.

**අස්වැන්න** මතෙව් 9:37-38, ලූක් 10:2

මෙය පැසි කැපිමට ආසන්නව ඇති ගොයමක් පිළිබඳ කතාවකි. මෙය දේවරාජ්‍යයේ පැතිරිම ගෝලයන්ට අවධාරණය කිරිම සඳහා යේසුස්වහන්සේ යොදාගත් සේක. මෙම උපමාවෙන් දෙනු ලැබූ දර්ශනයෙන් “ මාලු අල්ලන්නෝ “ “ මිනිසුන් අල්ලන්නන් “ බවට පත්වූහ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

___

___

___

2. උපමාවක් යනු කුමක්ද?

___

___

___

3. දේවරාජ්‍යය පිළිබඳ සත්‍යයන් ඉගැන්වීමට යේසුස්වහන්සේ උපමා භාවිතා කළේ මන්ද?

___

___

___

4. යේසුස්වහන්සේගේ උපමාවල ප්‍රධාන විෂය කුමක්ද?

___

___

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

එළිදරව් පොත, ඒනමටම ගැලපෙන්නෙකි.  මීට කලින් නොදැන සිටි දේ එළිදරව් කරයි. අනාගතයේදී සිදුවන දේ දෙවියන්වහන්සේ ප්‍රේරිත වු යොහන්ට එළිදරව් කළ සේක. මේවා ස්වාභාවික ප්‍රඥාවෙන් යොහන්ට දැනගත නොහැකි කරුණුය. දෙවියන්වහන්සේ මේවා යොහන්ට එළිදරව් කළ ආකාරයට, යොහන් ඒවා "එළිදරව් " පොතේ ලිවේය.

මේ එළිදරව්වීම් වලින් පෙන්නුම් කෙරෙන්නේ අප දැන් දන්නා පරිදි ලෝකාන්තයට පෙර සිදුවන සිද්ධීන් වේ. උපමාවන් මෙන්ම ස්වාභාවික මනසින් එළිදරව් පොත අවබෝධ කරගැනිම අසීරුය. එය ආත්මික මනසකින් නිර්ණය කළ යුතුය.

දේවරාජ්‍යයේ අනාගතය පිළිබඳ බොහෝ දේ එළිදරව් පොතෙන් එළිදරව් වේ.

1. දේවරාජ්‍යය පිළිබඳව පහත දැක්වෙන යොමු කිරිම අධ්‍යයනය කරන්න. එළිදරව් 1:9, 11:15, 12:10

2. පහත දැක්වෙන යොමු කිරිම් වල ඇත්තේ ලෝකයේ හා සාතන්ගේ රාජ්‍යයන් පිළිබඳවය. එළිදරව් 16:10,17:17.

3. එළිදරව් 20:10-15 න් සාතන්ගේ හා ඔහුගේ රාජ්‍යයේ වැසියන්ගේ ඉරණම එළිදරව් කරයි.

4. එළිදරව් 21-22 පරිච්ඡේදවලින් දේවරාජ්‍යයේ වැසියන්ගේ ඉරණම එළිදරව් කරයි.

දේවරාජ්‍යය පිළිබඳව මෙම පාඨවලින් ඔබ උගත් දේ සාරාංශ කරන්න.

# එකළොස්වන පරිච්ඡේදය

## දේවරාජ්‍යයේ තනාපතිවරු

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "තානාපති" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- "සාක්ෂිකාරයා" යන වචනය අර්ථවිග්‍රහ කරීමට
- ලෝකය මුළුල්ලේම දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පැතිරවීමේ වැදගත්කම පැහැදිලි කිරීම හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**නුඹලා යමින් - ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරපල්ලා. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)**

## හැඳින්වීම

ඔබ මෙම පාඨමාලාවෙන් දේවරාජ්‍යය පිළිබඳ බොහෝ දේ උගත්තෙහිය. සාතන්ගේ හා දෙවියන්වහන්සේගේ ආත්මික රාජ්‍යයන්වල පැවතීම පිළිබඳවද උගත්තෙහිය. දේවරාජ්‍යයේ අතීතය, වර්තමානය හා අනාගතය ගැන සලකා බැලුවේය. යේසුස් රජතුමාගේ ජීවිතය හා ඉගැන්වීම ගැන අධ්‍යයනය කළෙහිය. දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා යතුර ඔබට දුන් අතර දේවරාජ්‍යයෙන් පිටුවහල් කිරීමට හේතු වන කරුණු පිළිබඳව ඔබට අනතුරු ඇඟවීය. ඔබ දේවරාජ්‍යයේ උපමා අධ්‍යයනය කළ අතර දේවරාජ්‍යයේ ජීවත්වීම පිළිබඳ වැදගත් මූලධර්මයක් උගත්තෙහිය.

මෙම අවසාන පරිච්ඡේදයෙන් ඔබට විශේෂ පැවරුමක් ලැබෙනු ඇත. මෙය සම්පූර්ණ කිරීම සඳහා ඔබට ජීවිත කාලයක් ගත කිරීම සිදුවේ. ඔබ දේවරාජ්‍යයේ තානාපතිවරයෙකු ලෙස පත් කරනු ලැබේ.

### යේසුස්වහන්සේගේ ධර්ම දූත මෙහෙවරය

යේසුස්වහන්සේ මෙලොව පැමිණියේ දේවරාජ්‍යය පිහිටුවීම පිළිබඳ විශේෂිත මෙහෙවර ඇතිවය.

**යොහාන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරමින් : කාලය සම්පූර්ණවිය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි කීසේක. (මාර්ක් 1:14-15)**

**එතැන් පටන් යේසුස්වහන්සේ : පසුතැවිලි වෙයල්ලා, මක්නිසාද ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

දේවරාජ්‍යය වෙනුවෙන් යේසුස්වහන්සේගේ කැපවීම, උන්වහන්සේගේ මුළු සේවයෙන්ම පෙන්නුම් කෙරේ.

**නුමුත් උන්වහන්සේ : මා විසින් අනික් නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනෑය. මක්නිසාද, ඒ පිණිස එවනලද්දෙමියි ඔවුන්ට කීසේක. (ලූක් 4:43)**

උන්වහන්සේ මරණයෙන් හා නැවත නැගටිමෙන් පසු යේසුස්වහන්සේ ස්වල්ප කාලයක් මෙලොව සිටි අතර බොහෝ දෙනෙකුට දර්ශනය වු සේක. උන්වහන්සේගේ පණිවිඩය වෙනස් වුයේ නැත. එය දේවරාජ්‍යය කෙරෙහි අවධාරණය විය.

**උන්වහන්සේ වධ වින්ද පසු සතළිස් දවසක් අතරතුරේ ඔවුන්ට පෙනෙමින්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන කාරණා කියමින්ද බොහෝ ඔප්පු සාක්ෂිවලින් තමන්ම ජීවමානව ඔවුන්ට ප්‍රකාශවුසේක. (ක්‍රියා 1:3)**

යේසුස්වහන්සේ ස්වකීය සේවය ආරම්භ කළේ දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය ප්‍රකාශ කිරීමෙනි (මතෙව් 4:17). උන්වහන්සේ මෙලොව මෙහෙය අවසන් කළේ දේවරාජ්‍යයට අදාළ දේ ගැන ප්‍රකාශ කිරීමෙනි (ක්‍රියා 1:3). උන්වහන්සේගේ සේවයේ ආරම්භය හා අවසානය අතර කාලයේදි උන්වහන්සේගේ ප්‍රධාන අවධානය යොමු වුයේ දේවරාජ්‍යයේ පැතිරීම පිළිබඳවය.

## මහා පැවරුම

තම මරණයටත් පෙර, යේසුස්වහන්සේ, දේවරාජ්‍යය පැතිරවීම අඛණ්ඩව කරගෙන යාම සඳහා උන්වහන්සේගේ ගෝලයන් සුදානම් කළ සේක. පළමුව, දේවරාජ්‍යයේ පණිවිඩය ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව ගෝලයෝ නිරික්ෂකයෝ වුහ.

**ඉන්පසු උන්වහන්සේ දේශනාකරමින්, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය ප්‍රකාශකරමින්, නුවරවලත් ගම්වලත් සංචාරණයකළසේක. උන්වහන්සේ සමග ගෝලයෝ දොළොස්දෙනාද, (ලූක් 8:1)**

ඉන්පසු ගෝලයන්ව සහභාගි කරගැනිමෙන් ඔවුන්ව පුහුණු කළ සේක. උන්වහන්සේ ඔවුන්ව ඉශ්‍රායෙල් දේශය පුරා යවමින්...

**දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත් ඔවුන් යැවුසේක. (ලූක් 9:2)**

අවසානයේදි උන්වහන්සේ, දේවරාජ්‍යයේ ශුභාරංචිය ලොවේ සියලු ජාතින් අතර පැතිරවීමට බලය පැවරූ සේක.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කතාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්මකරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා, මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්, නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාර්ක් 16:15)**

## දේවරාජ්‍යයේ තානාපතියෝ

යේසුස්වහන්සේ ස්වර්ග රාජ්‍යයට නැවත යෑමට පෙර උන්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට මෙසේ පැවසු සේක.

**එබැවින් මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක් නියම කළාක්මෙන්ම... නුඹලාට රාජ්‍යයක් නියම කරමි. (ලූක් 22:29,30)**

දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේට දුන් රාජ්‍යය, යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට ලබා දුන් අතර මේ සදාතන අධිරාජ්‍යයේ කොටස්කරුවන් වීමේ වාසනාව අපට ඇත. එහෙත් දෙවියන්වහන්සේ තෝරගන්නේ පරමාර්ථයක් ඇතිව මිස වරප්‍රසාදයක් ලෙස නොවේ. ඔවුන් දේවරාජ්‍යය ලොවපුරා පැතිරවීමේ තානාපතිවරු විය යුතුය.

තානාපතිවරයෙකු යන එක් රාජ්‍යයක් නියෝජනය කිරීමට හා විවිධාකාර ගනු දෙනු සඳහා තවත් රාජ්‍යයකට යවනු ලබන නියෝජිතයෙකි. ඔහු තමා නියෝජනය කරන රාජ්‍යයේ, පණිවිඩ කරුවෙකු මෙන්ම බලය ලත් නියෝජිතයෙක් වේ. පාවුල් තුමා මෙසේ පවසා ඇත.

**එබැවින් දෙවියන්වහන්සේ අප ලවා ඉල්වන්නාක්මෙන් අපි ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් තානාපතියෝව සිට... (2 කොරින්ති 5:20)**

අපි ලෝකයේ රාජ්‍යයවල දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ කටයුතු නියෝජනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජතුමා විසින් එවන ලද තානාපතිවරු වෙමු.

දේවරාජ්‍යයේ තානාපතිවරුන් ලෙස අපට පවරා ඇත්තේ ජීවිතකාලය මුළුල්ලේම කළ යුතු කැපවීමකි. අප මේ පැවරුම වරක් පිළිගතහොත් ආපසු හැරී බැලිය නොහැකිය.

**එහෙත් යේසුස්වහන්සේ : නගුලේ අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැයි ඔහුට කීසේක. (ලූක් 9:62)**

## අපි සාක්ෂිකාරයෝ වෙමු

තානාපතිවරුන් ලෙස, අප දේවරාජය පිළිබඳ සාක්ෂිකරුවන් විය යුතුය. සාක්ෂිකාරයෙකු යනු තමාම අත්දුටු දෙයක් පිළිබඳව සාක්ෂි දීමට හා සහතික කිරීමට හැකි කෙනෙකි. ඔහු එය පෞද්ගලිකවම දකින, නිරීක්ෂණය කරන, අත්දකින හා ඔහු අත්දුටු දෙය ඔප්පු කිරීමට හැකි කෙනෙක් වේ.
යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට පැවසු වේ,

**පටන්ගැන්මේ සිට නුඹලා මා සමග සිටි බැවින් නුඹලාත් සාක්ෂිදෙන්නහුය. (යොහාන් 15:27)**

දේවරාජ්‍යයේ තනාපතිවරුන්ගේ සාක්ෂි ලොව පුරා පැතිරිය යුතුය.

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

සාක්ෂිකරුවෙකුගේ පණිවිඩය මෙසේ විය යුතුය.

**මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතින්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය. (ලූක් 24:46-48)**

ගෝලයන් සාක්ෂිකරුවන් වශයෙන් පිටත්ව ගිය විට දෙවියන්වහන්සේද ඔවුන් තුළින් සාක්ෂි දැරූ සේක.

**දෙවියන්වහන්සෙත් ලකුණුවලින්ද පුදුමවලින්ද අනේකාකාර ආශ්චර්යවලින්ද ස්වකිය කැමැත්ත ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලින්ද ඊට සාක්ෂිදුන්සේක. (හෙබ්‍රෙව් 2:4)**

අපි දේවරාජ්‍යයේ පණිවිඩය පිළිබඳ සාක්ෂි දෙමින් එහි තනාපතිවරු වන්නෙමු. දෙවියන්වහන්සේ අපගේ සාක්ෂිය, උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරමින් සහතික කරන සේක.

## වැදගත් වගකීමකි

දේවරාජ්‍යයේ පැතිරීම පිළිබඳ මෙම වගකීම එතරම්ම වැදගත් වන්නේ මන්ද? ඊට හේතුව යේසුස්වහන්සේ මෙසේ කී සේක.

**රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය, එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

දේවරාජ්‍යය අවසාන ලෙස පිහිටුවීම, ලොව මුළුල්ලේ දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කරන තෙක් සිදු නොවනු ඇත. එය ශුභාරංචියම නොවේ..... දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය වේ. පහත දැක්වෙන පදවලින් පාවුල් තුමා ශුභාරංචිය පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරයි.

**තවද, සහෝදරයෙනි, මම නුඹලාට දේශනාකළාවූ, නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි. මා නුඹලාට ප්‍රකාශකළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහු නම්, කුමන වචනවලින් එය නුඹලාට දේශනාකෙළෙම්දැයි දන්වමි. නැත්නම් නුඹලා නිෂ්ඵල ලෙස ඇදහුවහුය. ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්, (1 කොරින්ති 15:1-4)**

මූලික ශුභාරංචි පණිවුඩය නම්, ශුද්ධ ලියවිලි ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත්, ශුද්ධ ලියවිලි ප්‍රකාරයට තුන්වෙනි දින උන්වහන්සේ නැවත නැගිටුවන ලැබූ බවත් වේ.

ශුභාරංචිය දේශනා කළ යුතුය. එහෙත් එහි දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය අන්තර්ගත විය යුතුය. එය පවතින බව මිනිසුන්ට දන්වා දේවරාජ්‍යයට ඇතුළුවන අන්දම හා එහි පිවත්වන අන්දම ඔවුන්ට ඉගැන්විය යුතුය.

## දේවරාජ්‍යය බෙදා ගැනීම

දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය බෙදා ගන්නා අන්දම ගැන යේසුස්වහන්සේ සුවිශේෂී උපදෙස් දුන් සේක. දේවරාජ්‍යය පණිවිඩයේ, පාපයට පසුතැවිලි වන අයුරුද ඇතුළත් විය යුතුය.

**යොහන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනාකරමින් : කාලය සම්පූර්ණ විය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි කීසේක. (මාර්ක් 1:14-15)**

**එතැන් පටන් යේසුස්වහන්සේ : පසුතැවිලිවෙයල්ලා, මක්නිසාද ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය දේශනා කිරීමෙන් හා ඉගැන්වීමෙන් පැතිරවිය යුතුය.

**යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරමින්ද සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක. (මතෙව් 9:35)**

යේසුස්වහන්සේ උන්වහන්සේ අනුගාමිකයන්ට මෙසේ පැවසු සේක.

**නුඹලා යමින්-ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. (මතෙව් 10:7)**

දේවරාජ්‍යය පිළිබඳ පණිවිඩය දෙනු ලබන්නේ වචනවලින් පමණක්ම නොවේ. දේවරාජ්‍යය ගැන වචනයෙන් කෙරෙන ඉදිරිපත්කිරිම සමගම දෙවියන්වහන්සේගේ බලයද ප්‍රදර්ශනය කෙරෙනු ඇත. යේසුස්වහන්සේ විසින් දෙන ලද නිදර්ශනවලින් මෙය පැහැදිලි වේ.

**යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරමින්ද සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක. (මතෙව් 9:35)**

**එහෙත් සමූහයෝ එය දැනගෙන උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට කථාකොට, සුවය ඕනෑ අයට සුවකළසේක. (ලූක් 9:11)**

යේසුස්වහන්සේ තම ගෝලයන්ට උපදෙස් දුන්නේ දේවරාජ්‍යය ගැන ඉගැන්වීමට හා දේශනා කිරීමට පමණක් නොවේ. සැම නගරයකම :

**එහි ඉන්න රෝගීන් සුවකරපල්ලා, දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා ළඟට පැමුණුණේයයි ඔවුන්ට කියාපල්ලා. (ලූක් 10:9)**

**දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත් ඔවුන් යැවුසේක. (ලූක් 9:2)**

භාස්කම් හා සුවකිරීම් මගින් බලය ප්‍රදර්ශනය කිරිම දේවරාජ්‍යය ක්‍රියාවෙන් පෙන්වීමක් වේ. පාවුල් තුමා මෙසේ පැවසිය.

**මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව බලයෙන්ය. (1 කොරින්ති 4:20)**

## පැවරීම සම්පූර්ණ කිරීම

සභාවේ මුල් කාලයේ දේවරාජ්‍යයේ ප්‍රබල තානාපතිවරයෙකු වු ප්‍රේරිතවූ පාවුල් තුමා මෙසේ පැවසිය.

**මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරි 2:4-5)**

මුල් සභාව දේවරාජ්‍යයේ පැතිරවිමේ පැවරීම සම්පූර්ණ කළේ ඉගැන්වීමෙන් හා දේශනා කිරීමෙන් පමණක්ම නොවේ. එය උගත් දේවධාර්මිකයන්, කණ්ඩායම්, වැඩසටහන් මගින් හෝ විශාල ගොඩනැගිලි සෑදීමෙන් ද පැතිරවූයේ නැත. පැවරීම සම්පූර්ණ කළේ දේවරාජ්‍ය පිළිබඳ පණිවුඩය, රජතුමාගේ බලය ප්‍රදර්ශනය කිරීම හා එකට සම්බන්ධ කිරීමෙනි.

දේවරාජ්‍යය පැතිරවීම මුල් සභාවේ ප්‍රධාන පරමාර්ථයක් විය. පීඩාවන් මැද්දේ, ඇදහිලිවත්තු දේවරාජ්‍යයේ තානාපතිවරුන් ලෙස ඔවුන්ගේ පැවරීම නොනවත්වාම සම්පූර්ණ කිරීමේ කාර්යයෙහි යෙදුනේය.

**ඔහු මරාදැමීම ගැන සාවුල්ද එකඟව සිටියේය. ඒ දවසේදී යෙරුසලමෙහි වූ සභාවට විරුද්ධව මහත් පීඩාවක් අටගත්තේය. එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ යුදයේද සමාරියේද පළාත්වල විසිරුවනු ලැබුවෝය... එබැවින් විසිරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශකළෝය. (ක්‍රියා 8:1,4)**

සභා පිහිටුවීමේ සැලැස්මේ කොටසක් වූයේ දේවරාජ්‍යය පිළිබඳ උපදෙස් දීම වේ.

**ඔව්හු ඒ නුවර ශුභාරංචිය දේශනාකොට, බොහෝ දෙනෙක් ගෝලයන් කර, ලුස්ත්‍රාවටද, ඉකෝනියටද අන්තියෝකියටද හැරී ඇවිත් : අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:21-22)**

සභාවේ ගිහියන්ගේද පණිවිඩය වුයේද දේවරාජ්‍යය වේ.

**නුමුත් ඔව්හු දෙවියන්වහන්සේගේ රාජ්‍යයද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද ගැන ශුභාරංචිය දේශනාකළාවූ පිලිප් විශ්වාසකොට, පුරුෂයෝද ස්ත්‍රීහුද බව්තිස්මකරනු ලැබුවෝය. (ක්‍රියා 8:12)**

සභාවේ ශ්‍රේෂ්ඨ නායකයන්ගේ අවධාරණය වුයේ දේවරාජ්‍යය වේ.

**ඔහු සිනගෝගයට ඇතුල් වී දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සම්බන්ධ කාරණා ගැන තර්කකරමින්ද උගන්වමින්ද තුන්මසක් අතරතුරේ භය නැතුව කථා කළේය. (ක්‍රියා 19:8)**

පාවුල් තුමාගේ සේවයේ කේන්ද්‍රිය පණිවිඩය වුයේද දේවරාජ්‍යය වේ. ඔහුගේ සේවයේ අවසාන භාගයේ පාවුල් තුමා ඇදහිලිවතුන්ට මෙසේ පැවසිය.

**ඉතින් රාජ්‍යය ගැන දේශනාකරමින් නුඹලා අතරෙහි ඇවිද්දාවූ මාගේ මුහුණ නුඹලා සියල්ලන් තවත් නොදකින බව දනිමි. (ක්‍රියා 20:25)**

පාවුල් තුමා පිළිබඳව බයිබලයේ සඳහන් වන අවසාන අවස්ථාවේත් ඔහු රෝමයේ සිරකාරයෙකුව සිටියදීත් දේවරාජ්‍යය පැතිරවීමේ යෙදී සිටියේය.

**කිසිම භයක්වත් තහනමක්වත් නැතුව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනාකරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය. (ක්‍රියා 28:31)**

## දේවරාජ්‍යය ගොඩනැගීම

බොහෝ අවස්ථාවල, වර්තමානයේ සභාව දේවරාජ්‍යය ගොඩනැගීම පිළිබඳව අවධාරණය කිරීම නැතිවී තිබේ. අපි විශාල සභාවන්ද, අලංකාර ගොඩනැගිලිද, මහත් නිකාය ප්‍රමාණයක්ද ගොඩනගන්නෙමු. අනාථ නිවාස, පාසල් හා ආරෝග්‍යශාලා තැනීම ගැන අවධාරණය කරන්නෙමු.

මේවා ඉතා යහපත් සභා සේවයේ කොටසක් වන අතර, ප්‍රධාන අවධානය යොමු විය යුත්තේ ඒවාට නොවේ. අරමුදල් රැස්කිරීම හා ගොඩනැගිලි සෑදීම අපට පවරා ඇති දෙයක් නොවේ. මේවායේ ප්‍රතිඵලය ඇතැම් විට දේවරාජ්‍යය ලෝකය මුළුල්ලේ පැතිරවීම නොව පෞද්ගලික රාජ්‍යයන් ගොඩනැගීම විය හැකිය.

පාවුල්තුමා මේ ගැන අවවාද කර ඇත.

> **මක්නිසාද සියල්ලෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාරණා නොව තම තමුන්ගේම කාරණා සොයන්නෝය. (පිලිප්පි 2:21)**

සෑම සේවා ව්‍යාපෘතියක්ම මෙම ප්‍රශ්නයෙන් විමසා බැලිය යුතුය. *දේවරාජ්‍යය පැතිරවීමේ පැවරීම මෙමගින් සම්පූර්ණ වන්නේ කෙසේද?* අපි විවාහය, පවුල, අනාවැකි පැවසිම.... වැනි බොහෝ විෂයන් ගැන උගන්වන්නෙමු. දේශනා කරන්නෙමු. මේවා ඉතා හොඳ විෂයන් වන අතර අද ලෝකයට අත්‍යවශ්‍යය. අපගේ දේවස්ථානවල දේශනා කිරීමට ශ්‍රේෂ්ඨ කථිකයන් අපි පුහුණු කරන්නෙමු. එහෙත් සෑම පණිවුඩයක්ම මෙම ප්‍රශ්නය මගින් විමසා බැලිය යුතුය. *මෙම පණිවුඩය දේවරාජ්‍යයේ මූලධර්ම සන්නිවේදනය කරන්නේ කෙසේද?*

මෙම ප්‍රශ්න ඔබගෙන්ම අසන්න.

- දේවරාජ්‍යය පිළිබඳ පණිවුඩයක් ඔබ අසා ඇත්තේ කෙතරම් කාලයකට පෙරද?
- දේවරාජ්‍යය පැතිරවීම පිළිබඳ පැවරීම මාගේ සභාව කෙතරම් දුරට ඉටු කරන්නේද?
- දේවරාජ්‍යයේ තනාපතිවරයෙකු ලෙස මාගේ භූමිකාව මා පෞද්ගලිකවම ඉටු කරන්නේ කෙසේද?

අපගේ යාච්ඤාවන් දේවරාජ්‍යය කෙරෙහි යොමු කළ යුතු බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. අප මෙසේ යාච්ඤා කළ යුතුය.

> **...ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. (මතෙව් 6:9,10)**

අපගේ ජීවිතයේ ඉහළම ප්‍රමුඛත්වය විය යුත්තේ දේවරාජ්‍යය සෙවීම වේ.

> **නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා, මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)**
>
> **එහෙත් උන්වහන්සේගේ රාජ්‍යයම සොයාපල්ලා, එවිට මේ දේවලුත් නුඹලාට දෙනු ලබන්නේය. (ලූක් 12:31)**

ලෝකයේ ජාතීන් වෙත දේවරාජ්‍යය ගෙන යෑමේ උපකරණය ලෙස දෙවියන්වහන්සේ සභාව එසවූ සේක. බොහෝ සභාවන් වල මෙම කැඳවීමේ දර්ශනය නැතිවී ගොස් ඇත. ඔවුන් අවධාරණය කර ඇත්තේ තම සාමාජික සංඛ්‍යාව හා නිකාය වර්ධනය කර ගැනීම ගැන මිස දේවරාජ්‍යය ගොඩනැගීම ගැන නොවේ.

පාලකවරුන්, සභාවන් හා නිකායන් අතර තරගය නිසා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ එක්සත්කම බිඳී ගොස් ඇති. එක් එක්සත් දේවරාජ්‍යයක, එක් එක් පෙදෙස්වල සභාවන් කොටසක් වන්නේය යන දැක්ම දැන් ඇත්තේම නැත. දේවරාජ්‍යය පැතිරවීමේ මෙහෙය සඳහා එකිනෙකාට උපකාර කිරීම වෙනුවට, අපි අද විශාල ගොඩනැගිලි ඉදිකිරීමට, සාමාජික සංඛ්‍යාව වැඩිකර ගැනීමට, හා අපගේම රාජ්‍යයන් ගොඩනැගීමට මුදල් රැස් කිරීමට තරග කරන්නෙමු.

දෙවියන්වහන්සේගේ සැලැස්ම වුයේ සභාව දේවරාජ්‍යය ගැන දේශනා කිරීම පමණක් නොව දේවරාජ්‍යයේ ජීවමාන ආදර්ශයක්ද විය යුතු බවය. අපි එම අභියෝගයට මුහුණ දෙන්නෙමුද?

සභාව තම සාමාජික ලයිස්තුවට වඩා වැදගත් හේතුවක් උදෙසා තමාවම නැතිකර ගත යුතුය. එය ගොඩනැගිලි වැඩසටහන් හා සාමාජික සංඛ්‍යාවන් වැඩි කරගැනීම් වැනි දේ වලට වඩා වෙනත් දේවලට සිය වෙහෙස කැප කළ යුතුය. සභාව පළමුවෙන්ම දේවරාජ්‍යය සෙවිය යුතුය. එය නිකාය, සංස්කෘතිය

හා ජාතිය යන සීමා යන සියල්ල අභිබවා යයි. සභාව පළමුව දේවරාජ්‍යය සොයන්නේ නම් අනෙක් සියල්ල එක් කරනු ලැබේ.

## පැරණි ගිවිසුමෙන් නිදර්ශනයක්

දෙවියන්වහන්සේ මිනිසාට දුන් පළමු පැවරීම වූයේ “නුඹලා බෝවී වැඩිවෙමින් පොළව පූර්ණකොට එක යටත්කර ගනිව්“ (උත්පත්ති 1:28) යන්නය. අවධාරණය වූයේ මනුෂ්‍යයන් ගැන වේ. මෙහි ඉලක්කය වූයේ පොළව දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවන ලද පුරුෂයන්ගෙන් හා ස්ත්‍රීන්ගෙන් පිරවීම හා දෙවියන්වහන්සේ සමග පෞද්ගලික සබඳතාවක් ඇති කර ගැනීමය. එහෙත් උත්පත්ති 11:1-9 හි මේ අවධාරණය මිනිසා විසින් වෙනස් කළ බවක් පෙනේ. මෙම කොටස බයිබලයෙන් කියවන්න.

ෂිනාර්හි අවධාරණය වූයේ පොළොව ජනාකීර්ණ කිරීම නොව නගරයක් හා විශාල කොතක් ගොඩනැගීම විය. මෙහි පරමාර්ථය ආත්මාර්ථකාමී විය. ශ්‍රේෂ්ඨ නමක් ඇතිකර ගැනීම හා සෙනග විශාල සංඛ්‍යාවක් රැස්කර ගැනීම පරමාර්ථය විය .

බාබෙල් කොත අසළ දී සෙනගගේ වරද දැකබලා ගැනීම සඳහා දෙවියන්වහන්සේ වැඩි සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ඒ කාර්යය භාර දී තිබුනේ නැත. උන්වහන්සේ පැමිණියේ ඔවුන් කරන දේ බැලීමටය. අපගේ බොහෝ සභාවල තත්වය මෙය වේ. දේවරාජ්‍යය පැතිරවීමේ පැවරීම අප නොසලකා හැර ඇති අතර අපි නිකාය හා සාමාජික කොතවල් ගොඩනගන්නෙමු. අපි විශාල ගොඩනැගිලි ඉදිකරන්නෙමු. අප කරන දේ බැලීමට දෙවියන්වහන්සේ මෙලොවට පැමිනියහොත් උන්වහන්සේ කුමක් පවසන සේක්ද?

ෂිනාර්හි සෙනග පැවසුවේ “අපි නුවරක් සාදා ගනිමු“ යනුවෙනි. මිනිසුන් සාදන නුවරක් හා දෙවියන්වහන්සේ සාදන නුවරක් අතර වෙනසක් තිබේ. මේ මනුෂ්‍යයන් තමන්ගේම ආශාවන් සපුරා ගැනීම සඳහා තමන්ගේම ආයාසයෙන් ගොඩනැගිලි සෑදුවෝය.

දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වී ඔවුන්ගේ භාෂාව අවුල් කළ සේක.

> **යමු, අපි බැස ඔවුන්ට එකිනෙකාගේ කථාව නොතේරෙන ලෙස එහි ඔවුන්ගේ භාෂාව අවුල්කරමුයයි කීසේක. මෙසේ ස්වාමීන්වහන්සේ එතැනින් මුළු පොළෝතලයෙහි ඔවුන් විසිරෙවුසේක. ඔව්හුද නුවර ගොඩනැගීම අත්හැරියෝය. එහිදී ස්වාමීන්වහන්සේ මුළු පොළොවේ භාෂාව අවුල්කල බැවින් ඊට බාබෙල් නම් විය. එතැනින් ස්වාමීන්වහන්සේ මුළු පොළෝතලයෙහි ඔවුන් විසිරෙවුසේක.**
> **(උත්පත්ති 11:7-9)**

සෑම දෙනෙක්ම විවිධ භාෂාවන් කතා කිරීමට පටන් ගත් බැවින් ව්‍යාපෘතිය නැවතුණි.

අද අපට පරස්පර විරෝධී හඬවල් සභාවේ ඇසේ. අපගේ සන්නිවේදනයන් වියවුල් වූ විට අපි කොත පරීක්ෂා කළ යුතු වෙමු. ඇතැම් විට අපගේ ව්‍යාපෘතීන් දෙවියන්වහන්සේගේ නොවිය විය හැකිය. ඇතැම් විට, බාබෙල්හි සිදුවූවාක් මෙන් දේවරාජ්‍යය ව්‍යාප්ත කිරීම සඳහා ගොඩනැගීමක් නොව බිඳ දැමීමක් අවශ්‍යය විය හැකිය. ඇතැම් විට සමහර අය දේවරාජ්‍යයේ ව්‍යාප්ත කිරීමේ තම ව්‍යාපෘති නොනවත්වනු ඇත. ඊට හේතුව එය ඔවුන්ට එය රූප නමස්කාර කිරීමක් වී තිබීමය.

## අලුත් ගිවිසුමේ නිදර්ශනය

යේසුස්වහන්සේ මුල් සභාවට පැවරුවේ ලොව මුළුල්ලේම ගෝලයන් බිහි කිරීමට මිස යෙරුසලමේ විශාල මන්දිරයක් සෑදීමට නොවේ. එසේ වුවද සභාව ඉතා වේගයෙන් වර්ධනය වන බව අපට පෙනන අතර ඒ නිසා සංවිධාන හා කළමණාකාර පද්ධති වියවුල් විය (ක්‍රියා 6). ඔවුහු, ඔවුන්ට අණ කළ පරිදි

ලෝකයේ ජාතින් වෙතට නොගොස් යෙරුසලමේ බොහෝ ඇදහිවන්තයන් බිහි කිරීමට පටන් ගත්හ. මේ නිසා දෙවියන්වහන්සේ පීඩාවන් ඇතිවීමට ඉඩහැරිය අතර ඇදහිලිවන්තයෝ විසිරුණහ.

**ඔහු මරා දැමීම ගැන සාවුල්ද එකඟව සිටියේය. ඒ දවසේදී යෙරුසලමෙහි වූ සභාවට විරුද්ධව මහත් පීඩාවක් අටගත්තේය. එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ යුදයේද සමාරියේද පළාත්වල විසිරවනු ලැබුවෝය. (ක්‍රියා 8:1)**

මේ නිසා ඔවුන්ගේ මුල් පැවරීම වූ තානාපතිවරුන් වීමට නැවත පටන් ගත්හ.

**එබැවින් විසිරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශකළෝය. (ක්‍රියා 8:4)**

"ශ්‍රේෂ්ඨ සභාවන්" නැසී ගිය විටද දෙවියන්වහන්සේගේ සෙනග ජීවත් වෙති. විශාල ගොඩනැගිලි ඉදිකිරීමෙන් ලොව මුළුල්ලේම දේවරාජ්‍යය පැතිරෙන්නේ නැත. ව්‍යාපෘති තුළින් එය ව්‍යාප්ත වන්නේ නැත. එය පැතිරෙන්නේ දේවරාජ්‍යය ගැන තානාපතිවරුන් සාක්ෂි දැරීමෙන් හා ගෝලයන් තවත් ගෝලයන් බිහි කිරීමෙනි.

*"දේව රාජ්‍යය පිළිබඳ උපමා "* යන පරිච්ජේදයෙන් ලොව මුළුල්ලේ දේවරාජ්‍යය පැතිරෙන අයුරු විස්තර කෙරිනි. ලූක් 19 හා මතෙව් 25 යන පරිච්ජේදවල සඳහන් තලෙන්ත පිළිබඳ උපමාවෙන්, දේවරාජ්‍යය ආත්මික දීමනා හා හැකියාවන් ඥාණාන්විතව භාවිතා කිරීමෙන් පැතිරෙන බව එළිදරව් කරයි.

මුහුන් පිළිබඳ උපමාවෙන් (මතෙව් 13:33) එළිදරව් වුයේ දේවරාජ්‍යයේ ආරම්භය සුළු වුවද, මුහුන් රොටිවල පැතිරෙන්නාක් මෙන් එය නොනවත්වාම පැතිරෙන බවය. මුහුදට හෙළූ දැල පිළිබඳ උපමාවෙන් පෙනුවුයේ සියලු ජාතින්වල පුරුෂයන් හා ස්ත්‍රීන් දේවරාජ්‍යයට ඇදගන්නා බවය.

ශුභාරංචියේ බීජය මනුෂ්‍යයන්ගේ හදවත් තුළ තැන්පත් කිරීමෙන්ද දේවරාජ්‍යය පැතිරේ. ස්වාභාවික ලෝකයේ බීජයක් මෙන් දේවරාජ්‍යයේ ශුභාරංචිය වර්ධනය වනු ඇත. බිජය වැපුරු තැනැත්තාටවත් මෙම වර්ධන ක්‍රියාවලිය නොතේරේ (මාර්ක් 4:26-27).

## දේවරාජ්‍යය පැමිණේ

දේවරාජ්‍යය ස්ථිරව පිහිටුවා සාතන්ගේ රාජ්‍යය සම්පූර්ණයෙන්ම විනාශ කෙරෙන ශ්‍රේෂ්ඨ දිනයක් පැමිණෙන්නේය.

**එවිට : අපගේ දෙවියන්වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස් වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස් වහන්සේගේ ආණ්ඩුබලයද දැන් පැමුණුණේය. මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දාවල් අපේ සහෝදරයන්ට වරදතබන්නාවූ, ඔවුන්ගේ වරදතබන්නා පහත හෙළනු ලැබුවේය. (එළිදරව් 12:10)**

**උන්වහන්සේ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැතිකළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාරදෙනසේක. (1 කොරින්ති 15:24)**

**සත්වෙනි දේවදූතයාද පිම්බේය. එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වුයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම්කරනසේකැයි කියන මහත් ශබ්ද ස්වර්ගයෙහි විය. (එළිදරව් 11:15)**

**උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම්කරනසේක, උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේයයි කියේය. (ලූක් 1:33)**

ඒ මහත් දිනය පැමිණෙන තුරු ඔබට මේ පොරොන්දුව ඇත:

> **ස්වාමින්වහන්සේ හැම නපුරු වැඩවලින් මා මුදා ආරක්ෂාකොට, තමන්වහන්සේගේ ස්වර්ගීය රාජ්‍යයට මා පමුණුවනසේක. උන්වහන්සේට සදාකාලයටම මහිමය වේවා, ආමෙන්. (2 තිමෝති 4:18)**

ඔබට යාච්ඤාවක් මෙසේය :

> **එසේය, තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳවන දෙවියන්වහන්සේට ඔබිනලෙස නුඹලා හැසිරෙන හැටියට, පියෙකු තමාගේ දරුවන්ට මෙන්, අප විසින් නුඹලාට අවවාදකරමින්, ධෛර්යදෙමින්, අණදෙමින්, නුඹලා එක් එක්කෙනාට ක්‍රියා කළ හැටි නුඹලා දනිහුය.**
> **(1 තෙසලෝනික 2:11,12)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "තානාපති " යන වචනයේ තේරුම කුමක්ද?

3. "සාක්ෂිකරු" යන වචනයේ තේරුම කුමක්ද?

4. පාවුල්තුමා පැවසුවේ ඔහුගේ දේශනාව වචනයෙන් පමණක් නොව තව කවරක් ඒ හා සම්බන්ධ වන බවද?

5. දේවරාජ්‍යයේ පැතිරවීම වැදගත් වගකීමක් වන්නේ මන්ද?

6. යේසුස්වහන්සේගේ සේවය ප්‍රධාන තේමාව කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

අලුත් ගිවිසුමේ ක්‍රියා පොතේ සිය යුද් පොත දක්වා ඇදහිලිවන්තයන් තානාපතිවරුන් වීම සඳහා ලැබුණාවූ නියෝගයට දැක්වූ ප්‍රථම ප්‍රතිචාර වාර්තා කර ඇත. පහත කොටස් අධ්‍යයනය කර එය සම්පූර්ණ වූ ආකාරය සලකා බලන්න.

ක්‍රියා 1:3,6,9-11, 8:12, 14:22, 19:8, 20:25, 28:23,31

රෝම 14:17

1 කොරින්ති 4:20, 6:9-10, 15:24,50

ගලාති 5:19-21

එපීස 5:5

කොලොස්සි 1:13, 4:11

1 තෙසලෝනික 2:12

2 තෙසලෝනික 1:5

1 තිමෝති 6:15, 17:14, 19:16

2 තිමෝති 4:1, 18

හෙබ්‍රෙව් 1:8, 11:33, 12:28

යාකොබ් 2:5

2 පේත්‍රුස් 1:11

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොවමුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය, එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)

2. සියලු දේ ස්වාභාවික හෝ ආත්මික හෝ ලෙස බෙදීම (1 කොරින්ති.15:44-49 බලන්න)

3. සාතන්ගේ රාජ්‍යය හා දෙවියන්වහන්සේගේ රාජ්‍යය

4. සාතන්ගේ රාජ්‍යය සාතන් පාලය කරයි. ත්‍රිත්වය (දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ හා ශුද්ධාත්මය) දේවරාජ්‍යය පාලනය කරන සේක.

5. සාතන්ගේ රාජ්‍යයේ පදිංචිකරුවන් වන්නේ සාතන්, යක්ෂයන් හා පාපයෙන් ජිවත්වන හා දෙවියන්වහන්සේට කැරලි ගැසුවන් වේ.

6. දේවරාජ්‍යයේ පදිංචිකරුවන් වන්නේ පියවූ දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ, දේවදුතයන් හා දෙවියන්වහන්සේට කීකරුව, ධර්මිෂ්ඨව ජිවත්වන සියලු දෙනාය.

7. මේ දෙක අතර වෙනසක් නැත.

8. රාජ්‍යයක් යනු රජතුමෙකු පාලනය කරන ප්‍රදේශයක් හා එහි සෙනග වේ.

## දෙවන පරිච්ඡේදය

1. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම්කරනසේක, උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේයයි කීයේය. (ලූක් 1:33)

2. රජතුමා යනු ජාතියක, ගෝත්‍රයක හෝ රටක සර්වබලධාරි පාලකයා වේ. "සර්ව බලධාරී" යන වචනයේ තේරුම ඔහුට ශ්‍රේෂ්ඨතම බලයක්, හා මහත් ආධිපත්‍යයක් ඇති අතර බාහිර පාලනයන්ගෙන් නිදහස් බව වේ.

3. යේසුස්වහන්සේ

4. මතෙව්, මාර්ක්, ලූක් හා යොහන්

## තෙවන පරිච්ඡේදය

1. එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක් : මාගේ පියාණන් වහන්සේගෙන් ආශිර්වාදලත්තෙනි, වරෙල්ලා, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සුදානම්කර තිබෙන රාජ්‍යය උරුමකරගනිල්ලා. (මතෙව් 25:34)

2. ඔබගේ සාරාංශය තෙවන පරිච්ඡේදයේ ඇති දේවරාජ්‍යයේ ඉතිහාසය යන විස්තරය හා සසඳා බලන්න.

3. ඔබගේ සාරාංශය තෙවන පරිච්ඡේදයේ ඇති දේවරාජ්‍යයේ වර්තමානය යන විස්තරය සසඳා බලන්න.

4. ඔබගේ සාරාංශය තෙවන පරිච්ඡේදයේ ඇති දේවරාජ්‍යයේ අනාගතය යන විස්තරය හා සසඳා බලන්න.

5. තෙවන පරිච්ඡේදයේ සඳහන් දේවරාජ්‍යයේ පිළිබඳ මූලික කරුණු නැවත බලන්න.

## සතරවන පරිච්ඡේදය

1. ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. (මතෙව් 16:19)

2. සභාව

3. ඒවා නපුරු බලවේග බැඳ තබන, යහපත් බලවේග නිදහස් කරන හා ශුභාරංචිය පැතිරීම මගින් දේවරාජ්‍යයට දොරවල් විවෘත කෙරෙන ආත්මික බලවේග වේ.

4. පාපය ගැන පසුතැවිලිවීම, නැවත ඉපදීම අත්දැකීම

5. ආත්මික ඉපදීම අත්දකින්න, නැවත ඉපදෙන්න

6. ඇදහිල්ල මගින් අලුත් ඉපදීම ලැබූ පසු දේවරාජ්‍යට ඇතුළු වීම සහතික කර ගැනීම සඳහා අපි ආත්මික පරිණතය ලබා ගත යුතු වෙමු.

7. යමක් බඳිනවා යනු විලංගු හෝ බන්ධනයක් ඇති කිරීමක් හෝ වේ. එය කාමරයක දොරක් වසා අගුලු දැමීමක් වැනිය.

8. යමක් ලිහා දැමීම යනු එය මුදා හැරීමක් හෝ නිදහස් කිරීමක් හෝ වේ. එය කාමරයක දොරක් විවෘත කිරීමට සමානය.

## පස්වන පරිච්ඡේදය

1. ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට : ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21)

2. 1 කොරින්ති 6:9-10, හා ගලාති 5:19-21

3. a. අසත්‍යය b. සත්‍ය c. සත්‍ය d. සත්‍ය e.සත්‍ය f. අසත්‍ය g. සත්‍ය

4. 1 යොහන් 1: 8-9

5. a. 2
   b. 5
   c. 9
   d. 11

e. 6
f. 10
g. 12
h. 7
i. 3
j. 14
k. 8
l. 15
m. 23
n. 18
o. 19
p.20
q. 16
r.21
s.22
t. 17
u.3
v.4
w.1

## සයවන පරිච්ඡේදය

1. මේ සටහනේ සියලු වැඩ තේරුම්කර දුන්නාවූ ස්වාමින් වහන්සේගේ අතින් මා ලවා සියල්ලම ලියවා තිබේයයි දාවිත් කීවේය. (1 ලේකම් 28:19)

2. රටාවක් යනු අනුකරණය කිරීම සඳහා නිර්මාණය කරන ලද යම් දෙයක් හෝ අකෘතියක් හෝ වේ. එය කොපි කිරීමට හෝ අනුකරණය කිරීමට හෝ සැලසුම් කරන ලද්දකි.

3. මුලධර්මයක් යනු ක්‍රියාවක් හෝ හැසිරීමක් හෝ පදනම් කරගත් සත්‍යයක්, ක්‍රමයක් හෝ නියමයක් වේ.

4. බයිබලීය රටාවක් යනු අනුකරණය කිරීම සඳහා ශුද්ධ ලියවිල්ලේ ඇති ආත්මික නිදර්ශනයකි.

5. බයිබලීය මුලධර්මයක් යනු ශුද්ධලියවිල්ලේ උගන්වන ආත්මික සත්‍යයකි. එවැනි මුලධර්මයක් බොහෝ විට අතිරේක උප මුලධර්ම සම්බන්ධ කරගනී.

6. මේවා දේවරාජ්‍යයේ ජිවිතය පාලනය කෙරෙන බයිබලීය රටා හා මුලධර්මය.

## සත්වන පරිච්ඡේදය

1. එබැවින් මාගේ පියාණන් වහන්සේ මට රාජ්‍යයක් නියම කළාකමෙන්ම, (ලූක් 22:29)

2. ධර්මිෂ්ඨකම

3. පළමුවැන්න : දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම. දෙවැන්න : ඔබට මෙන් ඔබගේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.

4. දේවරාජයයේ පදිංචිය පවත්වාගෙන යෑම සඳහා ඔබ ඒවාට අනුකූලව පිවත්විය යුතුය.
මේවා වැදගත් බව යේසුස්වහන්සේ පැවසූ සේක.
දේවරාජ්‍යයේ එල වන්නේ ඒවා තිබේදැයි පරීක්ෂා කර බැලීමය.
අනාගත රාජ්‍යය පාලනය කිරීමට ඔබ එහි මුලධර්ම දැන ගත යුතුය.

5. a. 2 b.1 c.4 d.3 e.5 f.6

## අටවන පරිච්ඡේදය

1. මාගේ ප්‍රේමවන්තවන්ත සහෝදරයෙනි, අසාපල්ලා, ඇදහිල්ලෙහි ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්ඳන්ද තෝරා නොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට අගෞරවකළහුය. (යාකොබ් 2:5)

2. මෙම පරිච්ඡේදයේ මුලධර්ම නැවත බලන්න

a. ස්වර්ගරාජ්‍යය
b. සැනසීම
c. පොළව උරුමකරගන්නෝ
d. තෘප්තියට
e. දයාව
f. බාහිර
g. සමාදානය
h. ප්‍රතිලාභ
i. ශ්‍රේෂ්ඨතම
j. මහිමයට පත්කිරීම
k. නායකයෝ
l. පළමුවැන්නා
m. ශ්‍රේෂ්ඨයෝ
n. පහත් වටිනාකමක් දීම
o. ළමයින්
p. ජීවත්වීම
q. ගැළවීම
r. ප්‍රේමකිරීම
s. ලබාගැනීම
t. හැකිය
u. පෙනෙනු
v. සහනය දීම
w. පොළොවෙහි
x. එළිදරව් වේ

## නවවන පරිච්ඡේදය

1. එහෙත් සමූහයෝ එය දැනගෙන උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට කථාකොට, සුවය ඕනෑ අයට සුවකළ සේක. (ලූක් 9:11)

2. a. නව

   b. පැරණි

   c. පැරණි

   d. නව

   e. පැරණි

   f. නව

   g. පැරණි

   h. නව

   i. නව

j. පැරණි

k. නව

l. පැරණි

m. පැරණි

n. නව

o. නව

p. පැරණි

q. නව

r. පැරණි

s. පැරණි

t. නව

u. පැරණි

v. නව

w. නව

x. පැරණි

3. පිළිතුර b වේ.

4. අලුත් ගිවිසුමේ දේවරාජ්‍යය මුලධර්ම ප්‍රසාරණය කර ඇත්තේ පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව පදනම් කරගෙන වේ.

## දසවන පරිච්ඡේදය

1. උන්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : ස්වර්ගරාජ්‍යයේ රහස් දැනගැනිම නුඹලාට දී තිබේ, නුමුත් ඔවුන්ට දීලා නැත. (මතෙව් 13:11)

2. උපමාවක් යනු ආත්මික සත්‍යයක් පැහැදිලි කිරිමට ස්වාභාවික ලෝකයෙන් නිදර්ශනයක් භාවිතා කරන කථාවකි. "උපමාව" යන වචනයෙහි සැබෑ තේරුම "සැසඳීම සඳහා ඉතා කිට්ටුවෙන් තැබීම" වැන්නකි. උපමා කතාවලදි යේසුස්වහන්සේ ස්වාභාවික නිදර්ශනයක් භාවිතා කර එය ආත්මික සත්‍යයක් හා සැසඳු සේක. උපමාවක් යනු ස්වර්ගික තේරුමක් ඇති මෙලොව කතාවකි.

3. යේසුස්වහන්සේ දේවරාජ්‍යය පිළිබඳව ඉගැනිවිමට උපමා භාවිතා කළේ ආත්මික සිත් ඇති අයට පමණක් මේ වැදගත් මුලධර්ම ඉගෙනිමට හැකිවීම පිණිස වේ. මාංශික, පාපි සිත් ඇති අයට මේවා අවබෝධ කරගත නොහැකි විය. යේසුස්වහන්සේ උපමා භාවිතා කළේ මෙම ආත්මික මුලධර්ම නොහැදිලිවතුන්ගෙන් සඟවා තැබීමට වේ.

4. දේවරාජ්‍යය.

## එකළොස්වන පරිච්ඡේදය

1. නුඹලා යමින් - ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගින් සුවකරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගින් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ල. නුඹලා නොමිලේ ලැබුවහුය, නොමිලේ දිපල්ලා. (මතෙව් 10:7-8)

2. තනාපතිවරයෙකු යනු එක් රාජ්‍යයක් නියෝජනය කිරිමට හා විවිධාකාර ගනුදෙනු සඳහා තවත් රාජ්‍යයකට යවනු ලබන නියෝජිතයෙකි. ඔහු තමා නියෝජනය කරන රාජ්‍යයේ පණිවුඩකාරයෙකු මෙන්ම බලයලත් නියෝජිතයෙකි.

3. සාක්ෂිකාරයෙකු යනු තමාම අත්දුටු දෙයක් පිළිබඳව සාක්ෂිදිමට හා සහතික කිරිමට හැකි කෙනෙකි. ඔහු එය පෞද්ගලිකවම දකින නිරික්ෂණය කරන, අත්දකින හා අත්දුටු දෙයක් කිරිමට හැකි කෙනෙකු වේ.

4. බලය ප්‍රදර්ශනය කිරිම

5. මුළු ලෝකය පුරාම දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කරන තෙක් අවසානය පැමිණෙන්නේවත්, දේවරාජ්‍යය එහි අවසාන ආකාරයෙන් පිහිටු වන්නේවත් නැති නිසාය.

6. දේවරාජ්‍යයේ පණිවුඩය පැතිරවීම වේ.